# කාන්තාව

# පිළිබඳ

# බයිබලීය දැක්ම

## භාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනය

මෙම පාඨමාලාව **භාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනය** මගින් සකස් කරන ලද පාඨමාලාවක් වේ. මෙමගින් ඇදහිලිවතුන් සාර්ථක ආත්මික අස්වැන්නක් ලබා ගැනිම සඳහා පිළියෙල කිරීමට සකස් කරන ලද්දකි.

මෙම පුහුණුවේ තේමාව නම්, යේසුස්වහන්සේ ඉගැන්වූ දේ ඉගැන්වීමයි. මෙම ඉගැන්වීම්, මාළු අල්ලන්නන්, සුංගම් අයකරන්නන් යනාදී මනුෂ්‍යයන් ගෙන ශුභාරංචියේ බලය පෙන්නුම් කිරීම තුළින් ඔවුන් සිටියාවූ ලෝකය දිනාගැනීමට හැකි වූ කිතුබැතියන් ලෙසට වෙනස් කළේය.

මෙම අත්පොත මොඩියුල කීපයකින් සමන්විත විෂය මාලාවේ එක් පාඨමාලාවකි. ඇදහිලිවතුන් දර්ශනයක් තුළින් ක්‍රියාකාරී වීමෙන්, වර්ධනය වීමෙන්, සැලසුම් කිරීමෙන් හා සංවිධානය වීමෙන් එවැන්ජලිස්ත කිරීමේ ඉලක්කය කරා එළඹීම මෙහි අරමුණ වේ.

# පටුන


අත්පොත භාවිත කරන ආකාරය . . . . . . . . I
කණ්ඩායම් වැඩ සඳහා යෝජනා . . . . . . . . II
හැඳින්වීම . . . . . . . . 1
පාඨමාලාවෙහි අරමුණු . . . . . . . . 2

1. ආරම්භයේදී . . . . . . . . . . . 3

2. කාන්තාවගේ වැටීම . . . . . . . . . . 10

3. ඥානවන්ත සහ අන්‍ය ස්ත්‍රිය . . . . . . . . 20

4. රූත් පොත . . . . . . . . . . 32

5. එස්තර් පොත . . . . . . . . . . 44

6. යේසුස්වහන්සේ කාන්තාවන් වෙත දැරූ සම්බන්ධතාවය . . . . . 52

7. කාන්තාවන් උදෙසා යේසුස්වහන්සේගේ මෙහෙය . . . . . . 59

8. ක්‍රියා පොතෙහි සඳහන් කාන්තාවෝ . . . . . . . . 68

9. යැවුම්පත්‍රවල සඳහන් කාන්තාවෝ : විශේෂිත සේවාවන් . . . . 75

10. යැවුම් පත්‍රවල සඳහන් කාන්තාවන් : සභාවේ ස්ථානය . . . . . 80

11. යැවුම් පත්‍රවල කාන්තාවන් : විශේෂිත උපදෙස් . . . . . . 90

12. සේවයේ ඔබගේ ස්ථානය . . . . . . . . . . 101

13. අභියෝගයන් සහ විශිෂ්ටතාවයන් . . . . . . . . 115

14. කාන්තාවන්ට සේවය කිරීම . . . . . . . . 124

15. බයිබලයේ සඳහන් සියලු කාන්තාවෝ . . . . . . . . 135

ස්වයං පරීක්ෂණය . . . . . . . . . . 145

# අත්පොත භාවිත කරන ආකාරය

## අත්පොතේ සැකසුම

සෑම පාඩමකම පහත දැක්වෙන දේ අන්තර්ගත වේට

**අරමුණු:** සෑම පාඩමක්ම අධ්‍යයනය කිරීමෙන් පසු ඔබ මුදුන් පමුණුවා ගත යුතු ඉලක්කයන් වේ. පාඩම ආරම්භ කිරීමට පෙර ඒවා කියවන්න.

**ප්‍රධාන පදය:** පරිච්ජේදයක ප්‍රධාන සංකල්පය මෙම පදයෙන් අවධාරණය කෙරේ. එය කටපාඩම් කරන්න.

**පරිච්ජේදයක අන්තර්ගතය:** සෑම කොටසක්ම අධ්‍යයනය කරන්න. අත්පොතේ මුද්‍රණය කර නොමැති යොමු කිරීම් සඳහා බයිබලය බලන්න.

**ස්වයං ඇගයීම:** පරිච්ජේදයක් අධ්‍යයනය කර අවසන් කළ පසු මෙම ඇගයීමට පිළිතුරු සපයන්න. මෙම අත්පොත හෝ බයිබලය හෝ භාවිත නොකර ප්‍රශ්නවලට පිළිතුරු දීමට උත්සාහ කරන්න. ස්වයං-ඇගයීම අවසන් කළ පසු ඔබේ පිළිතුරු මෙම අත්පොතේ අවසානයේ දී ඇති පිළිතුරු හා සසඳා බලන්න.

**තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා:** දේව වචනය තවදුරටත් අධ්‍යයනය කිරීමටත් ඔබගේ අධ්‍යයන හැකියාවන් දියුණුකර ගැනීමටත්, ඔබ උගත් දේ ඔබගේ ජීවිතයටත් මෙහෙයටත් අදාළ කර ගැනීමටත් මෙම කොටස උපකාරී වේ.

**අවසාන පරීක්ෂණය:** ඔබ සම්මාන සඳහා මෙම පාඨමාලාවෙහි ලියා පදිංචි වූයේ නම්, පාඨමාලාව හා සමඟ අවසාන පරීක්ෂණය ද ඔබට ලැබෙන්නට ඇත. මෙම පාඨමාලාව සම්පූර්ණ කිරීමෙන් පසු මෙම පරීක්ෂණයට පිළිතුර සපයා, ඔබට ලැබී ඇති උපදෙස් අනුව ශ්‍රේණි පැවරීම සඳහා ආපසු එවන්න.

# කණ්ඩායම් වැඩ සඳහා යෝජනා

## පළමු රැස්වීම

**ආරම්භය:** යාච්ඤාවකින් හා හැඳින්වීමකින් ආරම්භ කරන්න. එකිනෙකා හඳුනාගෙන ශිෂ්‍යයන්ව ලියාපදිංචි කරන්න.

**කණ්ඩායම් ක්‍රියා පිළිවෙළ තහවුරු කරන්න:** රැස්වීම මෙහෙය වන්නේ කවුරුන්ද, කාර්යය සැසි දින, කාලය, ස්ථානය තීරණය කරන්න.

**ප්‍රශංසා කිරීම හා යාච්ඤා කිරීම:** ඔබගේ පුහුණු සැසි සඳහා ශුද්ධාත්මයාණන්වහන්සේගේ වැඩ සිටීම අයැදින්න.

**අත්පොත ශිෂ්‍යයින්ට බෙදා දෙන්න:** අත්පොතේ මුල් පිටු කීපයෙන් සපයා ඇති පොතේ මාතෘකාවද, සැකැස්මද, පාඨමාලාවේ අරමුණු ද හඳුන්වා දෙන්න.

**පළමු පැවරුම සකස් කරන්න:** ඊළඟ රැස්වීමට පෙර ශිෂ්‍යයන් ඔවුන්ට නියමිත පරිච්ඡේද කියවා ස්වයං-ඇගයීම්වලට පිළිතුරු සපයනු ඇත. එක් රැස්වීමකදී අධ්‍යයන කරනු ලබන පරිච්ඡේද සංඛ්‍යාව, ඒ ඒ පරිච්ඡේදයේ දිග ප්‍රමාණය, අන්තර්ගතය හා කණ්ඩායමේ දක්ෂතා මත රැඳී පවතී.

## දෙවන හා ඊළඟ රැස්වීම්

**ආරම්භය:** යාච්ඤා කරන්න. අලුතින් පැමිණි ශිෂ්‍යයන් ඇතිනම් ඔවුන්ව පිළිගෙන ලියාපදිංචි කර අත්පොත බැගින් දෙන්න. පැමිණීම ලකුණු කරන්න. ප්‍රශංසා කිරීමේ හා යාච්ඤා කිරීමේ කාලයක් ගත කරන්න.

**පුනරීක්ෂණය:** පසුගිය රැස්වීමේ දී උගත් දේ කෙටි සාරාංශයකින් ඉදිරිපත් කරන්න.

**පාඩම: තද කළු අකුරින් ඇති මාතෘකා:** ඉගැන්වීමේ සැකිල්ලක් ලෙස භාවිත කරමින්, පරිච්ඡේදයක එක් එක් කොටස සාකච්ඡා කරන්න. තමන් අධ්‍යයනය කළ දේ ගැන ප්‍රශ්න හෝ අදහස් හෝ ඇත්නම් ඉදිරිපත් කරන ලෙස ශිෂ්‍යයන්ට පවසන්න. ඒ ඒ පාඩම්, ඔබගේ ශිෂ්‍යයන්ගේ ජීවිතවලටත් සේවයටත් අදාළ කර ගන්න.

**ස්වයං-ඇගයීම්**: ශිෂ්‍යයන් පිළිතුරු සපයා ඇති ස්වයං-ඇගයීම් පුනරීක්ෂණය කරන්න (ස්වයං-ඇගයීම්වල පිළිතුරු ශිෂ්‍යයන් අතට යෑමට ඔබ අකමැති නම්, ඒවා සෑම අත්පොතකින්ම ගළවා ඉවත් කරන්න).

**තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා:** මෙහි ඇති ව්‍යාපෘති තනි තනිව හෝ කණ්ඩායම් වශයෙන් හෝ කළ හැකිය.

**අවසාන පරීක්ෂණය**: ඔබගේ කණ්ඩායම් සම්මාන සඳහා ලියා පදිංචි වී ඇත්නම්, පාඨමාලාව සමඟ අවසාන පරීක්ෂණය ලැබෙන්නට ඇත. පාඨමාලාව අවසන් කළ පසු සෑම ශිෂ්‍යයෙකුටම ඉන් පිටපත බැගින් දී, පරීක්ෂණයට පිළිතුරු සැපයීම අධීක්ෂණය කරන්න.

**මොඩියුලය :** සුවිශේෂී

**පාඨමාලාව :** කාන්තාව : බයිබලිය දැක්ම

# හැඳින්වීම

නූතනයෙහි කාන්තාව උදෙසා කතා කරන්නාවූ විවිධ හඬ ලොව පුරා පවතී.

- සමහර රටවල "කාන්තා විමුක්තිය" නමින් හඳුන්වන්නාවූ සෑම තැන්හිම සෑම කාන්තාවකටම සම අයිතිවාසිකම් ඉල්ලා සිටින කණ්ඩායම්වල හඬ අපට ඇසී තිබේ.

- තව සමහර ජාතීන් චාරිත්‍රානුකූලව කාන්තාව යටත්කොට පවත්වා ගැනීමට හඬ නඟති.

- දේවධර්ම විශාරදයෝ සභාවෙහි කාන්තාව සතු කාර්යභාරය පිළිබඳව දීර්ඝ ලෙස වාද විවාද පවත්වා තිබේ.

- කාන්තාව පිළිබඳව මනෝ චිකිත්සකවරු, අධ්‍යාපනඥයෝ, දර්ශනවාදීහු නොයෙක් මත ඉදිරිපත් කරමින් නඟන හඬ අපට ඇසීමට ලැබී තිබේ.

පොදුවේ ගත්කල, කාන්තාව පිළිබඳ විෂය ඇය සමාජයෙහි දරන තත්ත්වය හා අරමුණ කෙරෙහි අවධානය යොමු කරවා තිබේ. නූතනයෙහි කාන්තා විමුක්තිය සඳහා පෙනී සිටින බොහෝ සංවිධාන කාන්තාවන් මුහුණපාන ගැටලූ හා කාරණා පිළිබඳව වැඩිමනත් අයුරින් ප්‍රතික්‍රියා දක්වා ඇත.

කාන්තා විමුක්තිය සඳහා වන ව්‍යාපාරය අලුත් එකක් නොවේ. එය මිහිපිට පළමු කාන්තාව, එනම් ඒව දක්වා දිව යන අතර ඇය දෙවියන්වහන්සේගේ පාලනයෙන් විමුක්තිය සෙව්වාය. නමුත් සැබෑ විමුක්තිය කාන්තාව වෙත හිමිවනුයේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළින් හා දේව වචනයෙහි එනම්, බයිබලයෙහි කාන්තාව සඳහා දී ඇති රටාවන් හා ප්‍රතිපත්ති හඳුනාගැනීමෙන් පමණකි.

මෙම පාඨමාලාව බයිබලයෙහි කාන්තාව පිළිබඳව සඳහන් සියලු ඉගැන්වීම් සාරාංශ කොට දක්වයි. මෙය අධ්‍යයනයට මාර්ගෝපදේශකයක් පමණක් නොව, නිර්දේශය සඳහා මෙවලමක්ද වනුයේ, කාන්තාවන් පිළිබඳ බයිබලයෙහි සඳහන් සියලු ඡේද උපුටා දක්වා තිබෙන බැවින් හා දේව වචනයෙහි සඳහන් සෑම කාන්තාවක් පිළිබඳවම යොමු වී තිබෙන බැවින්ය.

දැන් අප *"කාන්තාව පිළිබඳව බයිබලයෙහි දැක්ම"* දේව වචනය ඇසුරින් ක්‍රමානුකූලව කාන්තාව පිළිබඳව ඉගෙන ගන්නා අතර "මුළු ලොවම එතුමාගේ හඬ අසන සේක්වා !"

# පාඨමාලාවෙහි අරමුණු

මෙම පාඨමාලාව අවසානයෙහි ඔබහට කළ හැකි වන කරුණු :

- බයිබලයෙහි එළිදරව් කර දී ඇති පරිදි කාන්තාවගේ ඉතිහාසය සාරාංශ කොට දැක්වීම.
- කාන්තාව මැවීම උදෙසා වූ පරමාර්ථයන් නම් කිරීම.
- හිතෝපදේශ පොතෙහි සඳහන් කර ඇති කාන්තාවන් දෙවර්ගය අතර චරිත ගුණාංග වෙනස පෙන්වා දීම.
- යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මිහිපිට සේවය සමයෙහි කාන්තාව දැරූ කාර්යභාරය පැහැදිලි කර දීම.
- ක්‍රියා පොතෙහි සහ යැවුම් පත්‍රවල එළිදරව් කර දී ඇති පරිදි කාන්තාව සතු බයිබලීය තත්ත්වය සාරාංශ කොට දැක්වීම.
- ක්‍රිස්තියානි කාන්තාව උදෙසා විවරව පවතින සේවා අවස්ථාවන් ශුද්ධ ලියවිල්ල ඇසුරින් පහදා දීම.
- රූත් පොත සාරාංශ ගත කිරීම.
- එස්තර් පොත සාරාංශ ගත කිරීම.
- ශුද්ධ ලියවිලි කෝණයෙන් කාන්තාව පිළිබඳ ස්වාධීන අධ්‍යයනය දිගටම සිදු කිරීම.
- ඔබ උගත් කරුණු අනෙක් කාන්තාවන් සමඟ සන්නිවේදනය කිරීම.
- කාන්තාවන් උදෙසා සේවාවක් ඇරඹීම.

# පළමුවන පරිච්ඡේදය

# ආරම්භයේදී

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අවසන් කිරීමෙන් පසුව ඔබහට කළ හැකි කරුණු :

- ප්‍රධාන පදය කටපාඩමින් ලිවීම
- කාන්තාවගේ මුලාරම්භය පිළිබඳ ශුද්ධ ලියවිලි සැපයීම
- කාන්තාවගේ දිව්‍යමය මැවීම සාරාංශ ගත කොට දැක්වීම
- ඇය දෙවියන්වහන්සේට හා මිනිසාට ඇත්තාවූ බයිබලීය සම්බන්ධතාවය විස්තර කරදීම
- කාන්තාව සහ පුරුෂයා මැවීම උදෙසා වූ මූලික පරමාර්ථය හඳුනා ගැනීම

**ප්‍රධාන පදය :**

> **දෙවියන්වහන්සේ තමන් ස්වරූපයෙන් මනුෂ්‍යයා මැවූ සේක. දෙවියන්වහන්සේගේ ස්වරූපයෙන් ඔහු මැවූ සේක. පුරුෂයාද ස්ත්‍රියද කොට ඔවුන් මැවූ සේක. (උත්පත්ති 1:27)**

**හැඳින්වීම**

ශුද්ධ වූ බයිබලයෙහි උත්පත්ති පොත, ආරම්භයෙහි පොත ලෙසද නම් කෙරේ. එහි ලොවෙහි ආරම්භය, පුරුෂයා හා ස්ත්‍රියගේ ආරම්භය, පාපය, ගැළවීම උදෙසා දෙවියන්වහන්සේගේ සැලැස්ම, ජාතීන් බිහිවීම පිළිබඳ ආරම්භය වාර්තා වේ.

උත්පත්ති පළමුවන පරිච්ඡේදය ලෝකයෙහි මැවීම සනිටුහන් කරයි. දෙවන පරිච්ඡේදයෙහි පුරුෂයා මැවීම පිළිබඳ වාර්තා කරමින් ස්ත්‍රිය සම්බන්ධව 1:27 පදයේ සඳහන් කරයි. කාන්තාවගේ මුලාරම්භය විස්තර කරන්නාවූ ප්‍රධාන බයිබල් පද ඇතුලත් වනුයේ උත්පත්ති 2 වන පරිච්ඡේදයෙහිය.

> **ස්වාමිවූ දෙවියන්වහන්සේ කථා කොට: මනුෂ්‍යයා තනිවම සිටීම හොඳ නැත. ඔහුට සුදුසු සහකාරියක් සාදා දෙන්නෙමියි කී සේක. (උත්පත්ති 2:18)**
>
> **ස්වාමි වූ දෙවියන්වහන්සේ මනුෂ්‍යයාට බරවූ නින්දක් පැමිණෙවූ සේක. ඔහු නිදාගත්තේය: උන්වහන්සේ ඔහුගේ ඉළ ඇටවලින් එකක් ගෙන ඒ ස්ථානය මාංසයෙන් පිරවූ සේක. ස්වාමි වූ දෙවියන්වහන්සේ මනුෂ්‍යයාගෙන් ගත් ඉළ ඇටයෙන් ස්ත්‍රියක් සාදා ඇය මනුෂ්‍යයා වෙතට පැමිණෙවූ සේක. එවිට මනුෂ්‍යයා කථා කොට: මැ මාගේ ඇටවලින් ඇටය: මාගේ මාංසයෙන් මාංසයය: මැ මනුෂ්‍යයාගෙන් ගන්නා ලද හෙයින් මනුෂ්‍ය දූ යයි කියනු ලබන්නියයි කිය. එබැවින් පුරුෂ තෙමේ තමාගේ පියාද මවුද අත්හැර තම භාර්යාවට ඇලුම්වන්නේය: ඔව්හු එක මාංසයක් වන්නෝය. (උත්පත්ති 2:21-24)**

බයිබලය එළිදරව් කර දෙන්නේ කාන්තාව :

## දෙවියන්වහන්සේ විසින් මවන ලද බවය:

උත්පත්ති 2:7හි, දෙවියන්වහන්සේ භූමියෙහි දූවිල්ලෙන් මිනිසා මැවූ බව ප්‍රකාශ කරයි. දෙවියන්වහන්සේ මිනිසා තුළට ජීවනයේ හුස්ම පිඹීමෙන් මිනිසා ජීවමාන ප්‍රාණියෙකු විය. ආදම් තනිව සිටීම හොඳ නැති බව දෙවියන්වහන්සේ තීරණය කළ සේක (උත්පත්ති 2:22). දෙවියන්වහන්සේ ආදම් ගැඹුරු නින්දකට පත් කොට, ඔහුගෙන් ඉළ ඇටයක් ගෙන, ලොව පළමු කාන්තාව වූ ඒව නිමැවූ සේක.

ආදම් තම සහකාරිය වූ ඇයට "ස්ත්‍රී" යයි නම් කළේය. එනම් "ඇය" - "ගැහැණු මිනිසා", "මිනිසාට සම්බන්ධ වූ" යනාදී අර්ථයෙන් යුත් කාන්තාව ලෙසට නම් කළේය. මෙයට හේතුව ඇය මිනිසාගෙන් පැමිණි බැවිනි. ස්ත්‍රී යන නමේ ආරම්භය මෙසේ සිදු විය.

## දෙවියන්වහන්සේගේ ස්වරූපයෙන් මවන ලදී :

උත්පත්ති 2:26-27හි සඳහන් වනුයේ දෙවියන්වහන්සේ ස්ත්‍රිය සහ පුරුෂයා යන දෙදෙනාම එතුමාගේ ස්වරූපයෙන් මැවූ බවය :

> **තවද දෙවියන්වහන්සේ: අපගේ ස්වරූපයෙන් අපගේ සමානත්වය ලෙස මනුෂ්‍යයා සාදමු; ඔව්හු මුහුදේ මත්ස්‍යයන් කෙරෙහිද ආකාශයෙහි පක්ෂීන් කෙරෙහිද තිරිසනුන් කෙරෙහිද මුළු පොළොව කෙරෙහිද පොළොව පිට බඩගා යන සියල්ලන් කෙරෙහිද ආණ්ඩු කෙරෙත්වයි කී සේක. දෙවියන්වහන්සේ තමන් ස්වරූපයෙන් මනුෂ්‍යයා මැවූ සේක. දෙවියන්වහන්සේගේ ස්වරූපයෙන් ඔහු මැවූ සේක. පුරුෂයාද ස්ත්‍රියද කොට ඔවුන් මැවූ සේක. (උත්පත්ති 1:26-27)**

## පුරුෂයාගේ පළමු වගකීම

දෙවියන්වහන්සේ විසින් ආදම් සහ ඒවට පවසන ලද්දේ :

- සඵලවත් වීමට
- බෝවීමට
- භූමිය පිට වැඩිවෙමින්
- භූමිය යටත් කර ගැනීමට
- පොළොවෙහි සියලු ජීවමාන දේ කෙරෙහි ආධිපත්‍ය බලය ක්‍රියා කිරීමට (උත්පත්ති 1:28).

මෙහිදී අවධානය යොමු කිරීමට වැදගත් කාරණයක් නම් දෙවියන්වහන්සේ විසින් මිනිසාට සහ කාන්තාවට දුන් පළමු ආඥාව වන "සඵලවත් වීමය." හාවස්ට්ටයිම් ජාත්‍යන්තර ආයතනයෙහි මෙම පාඨමාලාව විශේෂිත පාඨමාලාවක් ලෙස ඉදිරිපත් කරන අතර එහි විෂය මාලාවෙහි තේමාව ලෙස අනුගමනය කරන්නේ ආත්මික අස්වැන්නය, එනම් සඵලවත්වීමය. ආත්මික සඵලවත් බව යනු මෙම මූලික ආඥාවෙහි සිට බයිබලයෙහි අවසාන පොත වන එළිදරව් පොත දක්වා විහිදී පවතින බයිබලීය සංකල්පයකි.

ආදම් සහ ඒව ඔවුන්ගේ තුන් ආකාර ස්වභාවයන්හි එනම්, ශාරීරික, ආත්මික හා මානසික අංශයන්හි සඵලවත් වෙමින්, පොළොව අත්පත් කර ගැනීමටත්, එය යටත් කර ගැනීමෙන් පාලනය කරන ලෙසත් අපේක්ෂා කරන ලදී.

## කාන්තාව දෙවියන්වහන්සේ කෙරෙහි පැවති සම්බන්ධතාවය

කාන්තාව දෙවියන්වහන්සේ විසින්ද, එතුමාගේ ස්වරූපයෙන්ද, සදාතනික ප්‍රාණයක් සහිතවද (උත්පත්ති 2:7) දෙවියන්වහන්සේ සමඟ විශේෂ සම්බන්ධතාවයකින් යුතුවද මවනු ලැබිය. දෙවියන්වහන්සේ ආත්මයක් බැවින් (යොහන් 4:24) මෙම සම්බන්ධතාවය ආත්මික සම්බන්ධතාවයක් විය. දෙවියන්වහන්සේ ආදම් සහ ඒව සමඟ ආත්මික සම්බන්ධතාවය භුක්තිවින්ද සේක (උත්පත්ති 3:8). මනුෂ්‍යයා පාපයට වැටීමත් සමඟ මෙම සම්බන්ධතාවය කැඩී ගිය නමුත් දෙවියන්වහන්සේ මනුෂ්‍යා හට තම මැවුම්කරු සමඟ සම්බන්ධතාවය නැවත පිහිටුවා ගැනීමට හැකි වන පරිදි සැලසුමක් සපයා දුන් සේක. ඔබ මෙය සම්බන්ධයෙන් මීළඟ පරිච්ඡේදයෙහිදී වැඩි විස්තර ඉගෙන ගනු ඇත.

## කාන්තාව මිනිසා කෙරෙහි පැවති සම්බන්ධතාවය

කාන්තාව පිරිමියා සමඟ පැවති සම්බන්ධතාවය :

### ප්‍රේමයෙහි සම්බන්ධතාවයකි

මෙය බයිබලීය සංකේත පිළිබඳ අධ්‍යයනයක් නොවුවද කාන්තාව සහ පුරුෂයා මැවීමේ මූලාරම්භක සම්බන්ධතාවය අවබෝධ කර ගැනීම සඳහා එහි සංකේතාත්මක වටිනාකම පහදා දීම අවශ්‍ය වේ. අප බයිබලයෙහි කිසියම් සංකේතාත්මක සිද්ධියක් පිළිබඳව පවසන කල ඉන් අදහස් වනුයේ එම සිදුවීම සිදුවූ කල එහි පැවති වටිනාකම සේම එයින් නිරූපණය වන්නාවූ ඊට වැඩි වටිනාකමක් සහිත ආත්මික සත්‍යයක් ඉන් සංකේත වන බවයි.

පැරණි ගිවිසුමෙහි ජීවත් වූ බොහෝ පුද්ගලයන් සහ එහි සිදුවූ සිදුවීම් අලුත් ගිවිසුමෙහි එළිදරව් වූ ආත්මික සත්‍යයන්හි "සංකේත" විය. හාවස්ට්ටයිම් ජාත්‍යන්තර ආයතනයෙහි "නිර්මාණශීලි බයිබල් අධ්‍යයන ක්‍රම" නම් පාඨමාලාවෙහි බයිබල් අධ්‍යයන ක්‍රම අතුරින් එකක් ලෙස "සංකේත අධ්‍යයනය" ඇතුලත් කොට තිබේ.

පිරිමියා තුළින් කාන්තාව මැවීම පසු කලෙක යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සහ සභාව අතර පැවතීමට යන්නාවූ සම්බන්ධතාවය සඳහා සංකේතයක් විය. ආදම් නිදා සිටි අතර ඔහුගේ ඇලය විවර කොට කාන්තාව මැවිය. ශතවර්ෂ ගණනාවකට පසුව යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සියලු මිනිස් වර්ගයාගේ පාපය උසුලා ගනිමින් කුරුසියේ එල්ලී සිට මහත් නින්දට පත් වීමෙන් එතුමාගේ මරණය තුළින් සභාව නිපැයුණි. ක්‍රිස්තුස්වහන්සේගේ ඇලයට හෙල්ලකින් ඇණ සිදුරු කළ විට සභාව මුදා ගැනීමට ලේ දහරාවක් හා පවිත්‍ර කිරීමටත් සමත්වූ ජල දහරාවක් ගැලිය.

> **. . . ක්‍රිස්තුස්වහන්සේ සභාවට ප්‍රේම කොට, ඈ උදෙසා තමන්ම පාවාදුන්නාක් මෙන්ම, . . . එසේ කළේ සභාව ශුද්ධව, කැළලක් හෝ රැළි හෝ එබඳු යමක් නැතිව . . . වචනය නමැති වතුරෙන් සේදීමෙන්, උන්වහන්සේ එය පවිත්‍රකොට පිරිසිදු කරන පිණිසය. (එපීස 5:25-27).**

කාන්තාව මැවීම ප්‍රේම සම්බන්ධතාවයක් පිළිබඳ කතා කරයි. එය පසුකලෙක ක්‍රිස්තුස්වහන්සේ සහ සභාව අතර පැවති සම්බන්ධතාවයට සමාන වූවකි. මෙය බාහිර ආකර්ෂණය හා අලංකාරය මත බැදුනාවූ සම්බන්ධතාවක් නොව බොහෝ දුරකට ගියාවූ, ගැඹුරු, අඛණ්ඩව පවත්නා ආත්මික ප්‍රේමයකි.

## සහකාරීත්වය

මනුෂ්‍යයා තනිව සිටීම යහපත් නොවන බව දෙවියන්වහන්සේ පැවසූ සේක. පිරිමියා සහ කාන්තාව එකිනෙකා හට සහකරුවන් වීම උන්වහන්සේගේ අපේක්ෂාව විය.

## උපකාරකිරීම

දෙවියන්වහන්සේ මිනිසා හට සහකාරියක් එනම් "උපකාර කරන තැනැත්තියක්" මවා දෙන්නෙමියි පැවසූ සේක (උත්පත්ති 2:18). මෙහිදී "සහකාරිය" සඳහා බයිබලයෙහි භාවිත කර ඇති හෙබ්‍රෙව් පදය Azyer අස්යර්, පැරණි ගිවිසුමෙහි හතළිස් වතාවක් භාවිත කර තිබේ. එම සෑම අවස්ථාවකදීම පාහේ දෙවියන්වහන්සේ තම ජනතාවගේ උපකාරයාණෝ ලෙසට සඳහන් කිරීමට භාවිත කර තිබේ. එම පදයෙන් යටත් කර ගැනීමක් නියෝජනය නොවේ. සැබවින්ම දෙවියන්වහන්සේ මනුෂ්‍යයාට යටත් නැත. ඒ වෙනුවට ඉන් පෙන්නුම් කරනුයේ දෙන්නාවූ, ප්‍රේම කරන්නාවූ, සැලකිලිමත්වන්නාවූ, උපකාර කරන්නාවූ දෙවියන්වහන්සේ හා තම ජනතාව අතර පැවති ආකාරයේ ප්‍රේමණීය සම්බන්ධතාවයකි.

## කැපවීම

උත්පත්ති 2:24 හි පිරිමියා සහ කාන්තාව අතර සම්බන්ධතාවයෙහි කැපවීම පිළිබඳව පවසයි. පිරිමියා විසින් කළ යුතු කරුණු නම් :

| | |
|---|---|
| තමාගේ පියා ද මව ද අතහැර | : මානසික කැපවීම |
| තමාගේ භාර්යාවට ඇළුම් වේ | : හැගීම් මගින් කැපවීම |
| ඔව්හු එක මාංසයක් වන්නෝය | : ශාරීරික කැපවීම |

පිරිමියා සහ කාන්තාව අතර පැවතීම සඳහා දෙවියන්වහන්සේ සැලසුම් කළ සම්බන්ධතාවය නම් ප්‍රේමය, සහකාරීත්වය, කැපවීම හා අන්‍යෝන්‍ය උපකාරීත්වයෙන් යුතු සම්බන්ධතාවයකි.

## ස්වයං පරීක්ෂණය

1. කාන්තාව මැවීම විස්තර කරන්නාවූ ප්‍රධාන බයිබල් පද නම් කරන්න.

______________________________________________

______________________________________________

______________________________________________

**2.** දෙවියන්වහන්සේ විසින් පිරිමියා සහ කාන්තාව හට මූලික වශයෙන් භාර නොකළාවූ මූලික පරමාර්ථයක් නොවන කාරණාව පහත ලැයිස්තුවෙන් සලකුණු කරන්න.

______ බෝවීම
______ සවිලවත් වීම
______ පොළොව යටත් කර ගැනීම.
______ නගර සහ ප්‍රජාව සංවිධානය කිරීම.
______ ජීවමාන සියල්ල කෙරෙහි ආධිපත්‍ය බලය පැවැත්වීම.
______ පොළොවෙහි ව්‍යාප්තිය.

3. නිවැරදි එක් පිළිතුරක් සලකුණු කරන්න. දෙවියන්වහන්සේ හා කාන්තාව අතර සම්බන්ධතාවය :

______අප එතුමාගේ ස්වරූපයෙන් මවා ඇති බැවින් ශාරීරික පමණක් වේ.
______එය ශාරීරික පමණක් නොව ආත්මික සම්බන්ධතාවයක්ද වේ.
______මිනිසා පාපයට වැටීම හේතුවෙන් එය ඇති විය නොහැක.

4. කාන්තාව සහ පිරිමියා අතර පැවතිය යුතු ප්‍රධාන සම්බන්ධතා හතර නම් කරන්න. එක් එක් සම්බන්ධතාවය සඳහා සුදුසු බයිබල් පද උපුටා දක්වන්න.

සම්බන්ධතාවය                                        බයිබල් යොමුව.

1. ______________________________________________

2. ______________________________________________

3. ______________________________________________

4. ______________________________________________

5. "සහකාරිය" යන පදය උත්පත්ති 2හි සඳහන් වන පරිදි පිරිමියා සහ කාන්තාව අතර සම්බන්ධයේදී නිර්වචනය කිරීමට ඉතා සුදුසු ප්‍රකාශනය සලකුණු කරන්න. සහකාරියා යනු :

______ කාන්තාව පිරිමියාගේ වැඩකාරිය ලෙස විය යුතුය.
______ දෙවියන්වහන්සේ තම ජනතාවට උපකාර කරන්නාවූ තැනැන්වහන්සේ යන සමාන අර්ථයකින් සිටිය යුතුය.
______ කාන්තාව හා පිරිමියා අතර සම්බන්ධතාවය සඳහා ශුද්ධ ලියවිලි පදයක් නැත.

6. ප්‍රධාන පදය කටපාඩමින් ලියන්න.

(මෙම පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ දක්වා ඇත.)

## වැඩිදුර අධ්‍යයනය සඳහා

ආරම්භය පිළිබඳ ඔබගේ දැනුම පුළුල් කරගන්න. සපයා ඇති එක් එක් බයිබල් කොටස අධ්‍යයනය කර උදාහරණයෙහි පෙන්වා දී ඇති පරිදි එමඟින් මැවීම පිළිබඳව උගන්වන කරුණු සාරාංශ කොට ලියන්න.

| **යොමුව** | **සාරාංශය** |
|---|---|
| නික්මයාම 20:11 | දෙවියන්වහන්සේ දින හයක් ඇතුලත ලෝකය මැවූ සේක. හත්වන දින විවේක ගත් සේක. එය සබත් දිනය ලෙස නම් කෙරිනි. |
| නෙහෙමියා 9:6 | |
| යෝබ් 12:9 | |
| යෝබ් 26:7 | |
| යෝබ් 38:4-7 | |
| ගීතාවලිය 24:2 | |
| ගීතාවලිය 33:6 | |
| ගීතාවලිය 95:5 | |
| ගීතාවලිය 102:25 | |
| ගීතාවලිය 104:5 | |
| යෙසායා 40:28 | |
| යෙසායා 45:12 | |
| යෙසායා 48:13 | |
| ක්‍රියා 4:24 | |
| ක්‍රියා 7:50 | |

ක්‍රියා 14:15

හෙබ්‍රෙව් 11:3

# දෙවන පරිච්ඡේදය.

# කාන්තාවගේ වැටීම

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අවසන් කිරීමෙන් පසුව ඔබ හට කළ හැකි කරුණු :

- ප්‍රධාන පදය කටපාඩමින් ලිවීම
- කාන්තාව මූලික වශයෙන් පළමුවරට පාපයට වැටීම විස්තර කිරීම
- පාපයෙහි වන්දි නම් කිරීමට
- පළමුවරට ගැළවුම්කරුවෙකු පිළිබඳ බයිබලීය යොමුව හඳුනා ගැනීමට
- පරීක්ෂාව සහ පාපය යන චක්‍රය හඳුනා ගැනීමට

**ප්‍රධාන පදය :**

> **මම තා සහ ස්ත්‍රිය අතරෙහිද, තාගේ වංශය සහ ඇගේ වංශය අතරෙහිද සතුරුකම තබන්නෙමි. ඒ වංශය තාගේ හිස පොඩි කරන්නෙහිය. තෝ ඔහුගේ විලුඹ පොඩි කරන්නෙහියයි කී සේක.** (උත්පත්ති 3:15)

## හැඳින්වීම

උත්පත්ති 3 වෙනි පරිච්ඡේදය මුළු බයිබලයෙහිම ඇති ශෝකාකුලම පරිච්ඡේදය විය හැකි අතරම ඉතාමත්ම පුදුමාකාර පරිච්ඡේදයද වේ. මෙම පාඩමෙහි ඉදිරියට යාමට පෙර ඔබගේ බයිබලයෙන් උත්පත්ති 3 වෙනි පරිච්ඡේදය කියවන්න.

## පරීක්ෂාව

සාතන් උත්පත්ති 3 වෙනි පරිච්ඡේදයෙහි සර්පයෙකුගේ ආකාරයෙන් (සාතන්ට දී ඇති තවත් නමක් නම් සර්පයාය- එළිදරව් 12:9 බලන්න) දර්ශනයට ඇතුල් වේ. යක්ෂයා සැබවින්ම සර්පයෙකු නොහොත් නයෙකු ලෙස පෙනී සිටියේය. ඒවගේ පරීක්ෂාව සම්පූර්ණයෙන් වටහා ගැනීම පිණිස අපි දෙවියන්වහන්සේ මුලින්ම මනුෂ්‍යයා හට දුන්නාවූ උපදෙස් සලකා බැලිම වටී.

> **ස්වාමි වූ දෙවියන්වහන්සේ මනුෂ්‍යයාට ආඥා කරමින් : නුඹට උයනේ සියලූ ගස්වලින් කැමති ලෙස කන්ට පුළුවන. එහෙත් යහපත හා නපුර දැනගැනීමේ ගසෙන් කන්ට එපාය. මක්නිසාද, එයින් කෑ දවසෙහි නුඹ ඒකාන්තයෙන්ම නසින්නෙහියයි කී සේක.**
> **(උත්පත්ති 2:16-17)**

ඒව පාපයට වැටීමෙහි පළමු පියවර වූයේ ඇය වැරදි ස්ථානයෙහි සිටීමය. උත්පත්ති 3 වෙනි පරිච්ඡේදයෙහි දක්නට ලැබෙන පරිදි ඇය තහනම් ගස ළඟ සිටියාය. හිතෝපදේශයෙහි නපුරුකමේ මාවත පිළිබඳව පවසන්නේ :

> **එයින් වැළකී එහි නොගොස් එයින් අහකට හැරී පලයන්න (හිතෝපදේශ** 4:15).

දෙවනුව ඒව කිසිවිටෙකත් සාතන් සමඟ කතාබහට ඇතුළු නොවී සිටිය යුතු විය. සාතන්ගේ මුල්ම වචන වූයේ දෙවියන්වහන්සේ දී තිබූ උපදෙස් ප්‍රශ්න කිරීමකට ලක් කිරීමය.

> **ඌද, ඇත්තටම උයනේ කොයි ගසකින්වත් කන්ට එපාය කියා දෙවියන්වහන්සේ කීවාදැයි ස්ත්‍රියගෙන් ඇසීය (උත්පත්ති** 3:1).

සාතන් විසින් පරීක්ෂා කිරීමේ ක්‍රියාදාමය ඇරඹෙනුයේ සාමාන්‍යයෙන් දේව වචනයෙහි සත්‍යතාවය ප්‍රශ්න කිරීමකට ලක් කිරීමෙනි. ඒව සාතන්ට පිළිතුරු සපයමින් දේව වචනය වැරදි ලෙස උපුටා දැක්වූවාය. ඇය දෙවියන්වහන්සේගේ උපදෙස්වලට අමතර යමක් එකතු කළ අතර පාපයෙහි දඬුවම ලිහිල් කොට දැක්වූවාය.

**එහෙත් දෙවියන්වහන්සේ - නුඹලා නොනසින පිණිස උයන මැද තිබෙන ගහේ ගෙඩි කන්ටවත් ඊට අතගසන්ටවත් එපායයි කීසේකැයි සර්පයාට කීවාය (උත්පත්ති 3:3).**

මෙම පදය උත්පත්ති 2:16-17 සමඟ සසඳා බලන්න. දෙවියන්වහන්සේ "ඊට අතගසන්ට එපා" යයි පැවසුවේ නැත. මෙය ඒව විසින් එකතු කළ කොටසකි. මුලාරම්භයේ පටන් මනුෂ්‍යයා තම අදහස් උපදෙස් නීති දේව වචනයට ඈඳීමට පටන් ගති. දෙවියන්වහන්සේ පැවසුයේ "ඒකාන්තයෙන් නුඹ නසින්නෙහිය". එනම් එම ගසෙන් කෑමෙහි දඬුවම එය විය. ඒව එය වෙනස් කරමින් "නුඹලා නොනසින පිණිස . . ." යැයි එනම් "නුඹ මිය යා හැක" යන අරුත ඇතිව පැවසුවාය.

අද දින පවා පාපයෙහි දඬුවම ලිහිල් ලෙස සැලකීමේ එම ප්‍රවණතාවයම පවතී. මනුෂ්‍යයෝ පවසන්නේ "සැබවින්ම ධර්මිෂ්ඨ දෙවිකෙනෙකුට කිසිම කෙනෙකු අපායට යැවිය නොහැක! යනුවෙනි. සැබවින්ම දෙවියන්වහන්සේ කිසිවෙකු අපායට නොයවන සේක. මිනිසා තමාගේ පාපිෂ්ඨ ක්‍රියා හේතු කොටගෙන එහි යෑමට තෝරාගනී. පාපයෙහි දඬුවම දෙවියන්වහන්සේගේ අභිමුඛයෙන් සදාකාලයට වෙන්වී පාතාලයෙහි ගෙවීමය. මනුෂ්‍යයෝ බොහෝ විට පාපය, පාපය ලෙසින් හඳුනා නොගනිති. ගබ්සාව මිනිමැරීමක් ලෙස නොව "උපත් පාලන" ක්‍රමයක් ලෙස නම් කරති. කාමමිථ්‍යාචාරික සම්බන්ධතා සමහරවිට "සුහදකම්" ලෙසට හඳුන්වා දෙති.

සාතන් ඒවට පිළිතුරු සපයමින් දේව වචනයට පටහැනි විය:

**සර්පයාද : නුඹලා ඇත්තටම නසින්නේ නැත. මක්නිසාද, නුඹලා එයින් කන දවසෙහි නුඹලාගේ ඇස් ඇරෙන බවත් නුඹලා යහපත හා නපුර දැනගෙන දෙවියන්වහන්සේට සමාන වන බවත් දෙවියන්වහන්සේ දන්නා සේකැයි ස්ත්‍රීට කීය. (උත්පත්ති 3:4-5).**

පළමුවන පරීක්ෂාවෙහිදී දේව වචනය වැරදි අයුරින් භාවිත කළ ආකාරය පහත සඳහන් වගුව ආශ්‍රයෙන් බලන්න.

**පළමුව ප්‍රශ්න කළේය.**
උත්පත්ති 3:1
"දෙවියන්වහන්සේ කියා තිබේද?"

**දෙවනුව එකතු කිරීම.**
උත්පත්ති 3:3
"ඊට අතගසන්ටවත්"

**තුන්වෙනුව පාපයෙහි දඬුවම අවම කිරීම.**
උත්පත්ති 3:3
"ඔබ ඒකාන්තයෙන්ම නසී" වෙනුවට "නොනසින පිණිස".

**හතරවැනිව පටහැනි වීම.**
උත්පත්ති 3:4.
"ඇත්තෙන්ම ඔබ නසින්නේ නැත."

ඔබ මෙම රටාව හඳුනා ගැනීම වැදගත් වනුයේ අද දින පවා සාතන් ඔබව පාපයට ඇද දැමීමට පරීක්ෂා කරන කල භාවිත කරන්නාවූ ක්‍රමය මෙයම වන බැවිනි. සාතන් දේව වචනයට දොස් පවරන අතර ඒ පිළිබඳව නොසෑහීමකට යොමු කරවයි. ඒව අලංකාර උයනෙහි දෙවියන්වහන්සේ ඉදිරියෙහි ශුද්ධව සිටි නමුත් සාතන් ඇයව අතෘප්තිමත් වීමට ක්‍රියා කළේය. ඇයට දෙවියන්වහන්සේ මෙන් වී සියල්ල දැනගත හැකි බව විශ්වාස කිරීමට සැලැස්විය. නොසෑහීමකට පත් වීම පාපයකි. උදා: මුදල් සම්බන්ධව නොසෑහීමකට පත් වීම සොරකම් කිරීමට හා වංකව ක්‍රියා කිරීමට මනුෂ්‍යයන් පොලඹවයි. විවාහය සම්බන්ධව නොසෑහීමකට පත් වීම කාමමිථ්‍යාචාරික සම්බන්ධතා කෙරෙහි යොමු කරවයි.

සාතන්ට අවශ්‍ය වූයේ ඒව දෙවියන්වහන්සේගෙන් වෙන් කොට හුදකලා කිරීමටය. සාතන් ප්‍රකාශ කර සිටියේ මෙම ගසෙන් කෑවිට ඇය මහත් ප්‍රයෝජන ලබන බව දෙවියන්වහන්සේ දැන සිටි බවය. ඇය වැඩිපුර දැනුම ලබා දෙවියන්වහන්සේ මෙන් වනු ඇති බව සාතන් ප්‍රකාශ කර

සිටියේය. මෙහිදී සාතන් කියන්නට උත්සාහ දැරුවේ "මෙවන් අනගි ප්‍රස්තාවක් ඔබට නොදීමට දෙවියන්වහන්සේ ඔබ ගැන එතරම් නොසිතනවා විය හැකිය" යයි පැවසීමය. ඒව පිළිතුරු දිය යුතුව තිබුණේ "මම දැනටම දෙවියන්වහන්සේ වගේය" යනුවෙනි. මන්ද ඇය දෙවියන්වහන්සේගේ ස්වරූපයෙන් මවා තිබීමය.

නිරතුරුවම මතක තබා ගන්න : පාපය සාමාන්‍යයෙන් පැමිණෙනුයේ අවස්ථාවක් මෙන් වෙස්වලාගෙනය.

## වැටීම

මිනිස් ඉතිහාසයෙහි අඳුරුතම මොහොත උත්පත්ති 3:6හි විස්තර කරයි.

> **ස්ත්‍රී වනාහි ඒ ගස කෑමට හොඳ බවද එය ඇස්වලට ප්‍රිය බවද නුවණ ලැබීම සඳහා ආශාවිය යුතු ගසක් බවද දැක එහි ගෙඩි ගෙන කෑවාය. ඈ තමා සමඟ සිටි තමාගේ පුරුෂයාටත් දුන්නාය. ඔහුද කෑවේය. (උත්පත්ති 3:6)**

පාපය වෙතට ගමන් කරන මාර්ගය බලන්න.

ඇයට ඇසුණි : සාතන්ගේ හඬ
|
ඇය දුටුවාය : එය ඇයට ප්‍රිය විය.
|
ඇය ගත්තාය : ඇයට ලබා ගත්තාය.
|
ඇය කෑවාය : ගසෙහි ගෙඩිය අනුභව කළාය.
|
ඇය දුන්නාය : ආදම්ට පව් කිරීමට බලපෑමක් කළාය.
|
ඔහු කෑවේය : ඔහුද පව් කළේය.

මෙම රටාව සලකා බැලීම වැදගත් වේ. මනුෂ්‍යයෝ පාපයට වැටීමෙහිදී අද දින පවා අනුගමනය කරනුයේ මෙම ක්‍රියා පිළිවෙළමය. පළමුව ඒව වැරදි ස්ථානයෙහි සිටියාය. ඇය තමාව පරීක්ෂාවට ලක් විය හැකි ස්ථානයකට පත් කළාය. ඉන්පසු ඇය සතුරා වන සාතන්ට ඇහුම්කන් දුන්නාය.

ඉන් අනතුරුව ඇය දෙවියන්වහන්සේ තහනම් කොට තිබූ දෙය දෙස ආදරයෙන් බැලුවාය. මේ වනතුරුද පරීක්ෂාව ඇයට ඈතින් විය. නමුත් ඉන්පසුව ඇය තවදුරටත් ඉදිරියට යමින් ගසෙන් ගෙන කෑවාය. දෙවියන්වහන්සේ **පාපය** ලෙසට නම් කළ දෙයට ඇය සහභාගි විය.

අවසාන ලෙසට ඒව ආදම් වෙත ගෙඩිය දුන් කල ඔහු එය රැගෙන කෑ විට ඇගේ පාපය ආදම් වෙතද බලපාමින් ප්‍රතිඵල ගෙන දුනි. ඔබ පව් කරන කල එම පාපය ඔබ අවට සිටින පුද්ගලයන් කෙරෙහිද බලපායි. ඔවුහු පව් කළ විට පාපයෙහි විනාශකාරී චක්‍රයට ඇතුලත් වෙති.

ගීතිකාකරු මෙවන් වූ ක්‍රමානුකූලව ගැඹුරට යන පාපය පිළිබඳව අනතුරු අඟවයි :

> **දුෂ්ටයන්ගේ මන්ත්‍රණය අනුව නොයන්නාවූ පව්කාරයන්ගේ මාර්ගයෙහි නොසිටින්නාවූ නින්දා කරන්නන්ගේ ආසනයෙහි නොහිඳින්නාවූ ස්වාමීන්ගේ ව්‍යවස්ථාවෙහි ප්‍රීතිවන්නාවූ උන්වහන්සේගේ ව්‍යවස්ථාව රෑ දාවල් මෙනෙහි කරන්නාවූ මනුෂ්‍යයා ආශීර්වාද ලද්දේය. (ගීතාවලිය 1:1-2)**

පළමුව ඔබ පාපයෙහි පරීක්ෂාවෙහි ගමන් කරනු ඇත. ඔබ ඉන් ඉවත් වී පලා නොගියහොත් ඉතා ඉක්මණින් ඔබ එහි නැවති සිට එය පිළිබඳව සිතමින් කල් ගත කරනු ඇත. අවසානයෙහි ඔබ නින්දාකරන්නන්ගේ අසුනෙහි හෝ පාපයෙහි ස්ථානයෙහි වාඩි වෙනු ඇත.

පහත සඳහන් චිත්‍රය බලන්න. ඔබ පහත පෙනෙන චිත්‍රයෙහි පරීක්ෂාවෙහි සහ පාපයෙහි කුමන ස්ථානයක පසු වුවද ප්‍රශ්නයක් නැත. එය සියලු මනුෂ්‍යයන්ගේ සියලු පාප උදෙසා වන්දිය මුළුමනින්ම ගෙවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ බලය තුළින් කඩා බිඳ හෙළිය හැකිය.

**පාපයෙහි චක්‍රය**

පරීක්ෂාවෙහි ස්ථානයෙහි ගමන් කිරීම ⇒

අනෙක් අයට පව් කිරීමට පෙලඹවීම ⇒

සාතන්ගේ හඬ ඇසීම ⇒

එයට සහභාගි වීම : පාපයට ඇතුල් වීම ⇒

තහනම් කරන ලද පාපය දැකීම : එය වර්ණනා කිරීම ⇒

පව් කිරීමට පරීක්ෂාව පිළිගැනීම (ලබා ගැනීම)

පාපයෙහි චක්‍රය එහි ඕනෑම මට්ටමකදී යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ කුරුසියෙහි බලය තුළින් කඩා බිඳ හෙළිය හැකිය. කුරුසිය මතදී යේසුස්වහන්සේ පාපයෙහි වන්දිය ගෙවූ සේක. උන්වහන්සේ සාතන්ගේ හිස හෙවත් බලය පොඩි කළ බැවින් ඔබ හට පාපයෙහි බලයෙන් මෙන්ම වන්දියෙන්ද මිදීම ලැබිය හැකිය.

මෙම පාපිෂ්ඨ චක්‍රය ඔබගේ ජීවිතයෙහි කඩා නොදැමුවහොත් ඔබ අවට සිටින පුද්ගලයන් කෙරෙහි ඉන් බලපෑම් ඇති කරයි. ඔබ ඔවුන්වද පව් කිරීමට පොලඹවන අතර පාපයෙහි චක්‍රය ඔවුන්ගේ ජීවිතවල පවතීවි. මෙලෙස එය ලොව මුළුල්ලේ පැතිර යන දම්වැලක් බවට පවතීවි. මෙලෙස එය ලොව මුළුල්ලේ පැතිර යන දම්වැලක් බවට පත්වේ. එම චක්‍රය බිඳිය හැක්කේ සුභාරංචි පණිවුඩයේ බලය තුළින් පමණකි. එනම් පාපය උදෙසා යේසුස්වහන්සේගේ මරණයත්, මරණය පාතාලය හා සාතන්ට එරෙහිව එතුමාගේ නැවත නැගිටීමේ බලයත් තුළිනි.

ලෝකය තුළ මනුෂ්‍යයා පවතින චක්‍ර ඇත්තේ දෙකක් පමණි. එකක් නම් පාපයෙහි චක්‍රයය. අනෙක නම් ගැළවීමෙහි චක්‍රයය. එනම් ශුභාරංචිය ඇසීම, එය අවබෝධ කර ගැනීම එය සත්‍යය ලෙස පිළිගැනීම ගැළවීමේ සැලැස්මට සහභාගි වීම හා අනෙක් අය යේසුස් ක්‍රිස්තුස්වහන්සේ වෙතට මඟ පෙන්වීමය.

ඔබගේ ජීවිතය ගත කිරීමට අවශ්‍ය මෙයින් කුමන චක්‍රයෙහිද?

## වැටීමෙහි ක්ෂණික ප්‍රතිඵල

පාපයට වැටීමෙහි ක්ෂණික ප්‍රතිඵල කිහිපයක් විය. :

### නපුර සහ යහපත දැන ගැනීම :

ආදම් සහ ඒව පාපයට වැටුණු කෙණෙහිම තවදුරටත් ඔව්හු අහිංසක තත්ත්වයෙහි නොවූහ. ඔව්හු යහපත සහ නපුර අතර වෙනස හඳුනාගත් අතර තමුන් නිර්වස්ත්‍රව සිටින බව වටහා ගත්තෝය (උත්පත්ති 3:7).

### ස්වයං-ධර්මිෂ්ඨභාවය :

ආදම් සහ ඒව අත්තික්කා අතුවලින් ඇඳුම් සාදා ගැනීමට උත්සාහ කළහ. මෙය මනුෂ්‍යයා ආත්මිකව කිරීමට උත්සාහ කරන කාරණාවක සංකේතයකි (බාහිර උදාහරණයකි). අපි පව්කරුවන්

බව අවබෝධ වීමෙන් අපි වඩා යහපත් වීමට උත්සාහ කරමු. අපි ස්වයං-සංවර්ධනය මඟින් අපගේ පාපය නිවැරදි වනු ඇතැයි සිතමු (උත්පත්ති 3:7). එනමුත් ආදම් සහ ඒව ආවරණය කිරීමට අත්තික්කා අතු නොසැහුණාක් මෙන් අපගේ ස්වයං-ධර්මිෂ්ඨකමද නොසෑහේ.

> **අපි සියල්ලෝම අපවිත්‍ර කෙනෙකු මෙන් වී සිටිමුව. අපේ සියලු ධර්මිෂ්ඨකම්ද කිලුටු වස්ත්‍රයක් මෙන්ය. අපි සියල්ලෝම කොළයක් මෙන් පරවෙමුව. අපේ අයුතුකම්ද සුළඟ මෙන් අප පහකරගෙන යයි. (යෙසායා 64:6)**

## බය සහ ලැජ්ජාව :

දෙවියන්වහන්සේ ආදම් සහ ඒව සමඟ කතා කරමින් ඇවිදිමට පැමිණිකල ඔව්හු ලැජ්ජාවෙන් සහ භයෙන් සැඟවුණහ (උත්පත්ති 3:10). අතීතය පිළිබඳව ලජ්ජාව සහ අනාගතය පිළිබඳ බය අන් සියලු අසුබවාදී හැඟීම් හා ප්‍රතිචාර බිහිකරන්නාවූ මූලික හැඟීම් වේ.

## දෙවියන්වහන්සේගෙන් වෙන් වීම :

දෙවියන්වහන්සේ මනුෂ්‍යයාගේ අභිමුඛයෙන් තමා ඉවත් නොවූ සේක. ඒ වෙනුවට මනුෂ්‍යයා දෙවියන්වහන්සේගෙන් වෙන් විය. ආදම් සහ ඒව දෙවියන්වහන්සේගෙන් සැඟවීමට උත්සාහ කළෝය. මෙහි තව එක් වැදගත් රටාවක් දැකිය හැකිය. පහත සඳහන් වගුව දෙස බලා ආදම් සහ ඒව කළ දේ බලන්න. :

**දෙවියන්වහන්සේව සැක කළෝය**.
"දෙවියන්වහන්සේ කිවාද?"
උත්පත්ති 3:1

**දෙවියන්වහන්සේට අකීකරු වූවෝය**.
"ඇය එය රැගෙන කෑවාය."
උත්පත්ති 3:6

**එය පිළිනොගත්තෝය**.
"ආදම් සහ ඒව දෙවියන්වහන්සේ ඉදිරියෙන් සැඟවුණෝය."
උත්පත්ති 3:8

මනුෂ්‍යයාගේ වැටීමෙහි ක්ෂණික ප්‍රතිඵල ලෙස නපුර සහ යහපත දැනගැනීම, ස්වයං ධර්මිෂ්ඨකම, බය, ලැජ්ජාව හා දෙවියන්වහන්සේගෙන් වෙන්වීම මිනිසාට හිමි විය. අනෙකුත් ප්‍රතිඵල පාපයෙහි දඬුවම සමඟ පැමිණියේය.

## දෙවියන්වහන්සේ සමඟ හමුවීම

මිනිසාගේ වැටීම සමඟම දෙවින්වහන්සේ සමඟ විශේෂ හමුවීමක්ද පැවැත්විණි. මෙම සාකච්ජාවට දෙවියන්වහන්සේ, ආදම් සහ ඒව යන සියලු දෙනා සහභාගි වූහ.

**දෙවියන්වහන්සේ :** "නුඹ කොහේද?" දෙවියන්වහන්සේ ප්‍රශ්න කළේ ආදම් හා ඒව සැඟවී සිටියේ කොහේද යන වග දැනගැනීමට නොවේ. දෙවියන්වහන්සේ සියල්ල දන්නාවූ දෙවියන්වහන්සේ බැවින් ඔවුන් සිටි තැන දැන සිටිසේක. දෙවියන්වහන්සේගේ ප්‍රශ්න කිරීමට හේතුව නම්, ඔවුන්ගේ ආත්මික තත්ත්වය වෙත අවධානය යොමු කරවීමය. "ආදම් ඔබ කොතැනද?" ආත්මිකව ඔබ සිටින තැන කුමක්ද? ඔබට සිදුවූයේ කුමක්ද?

අද දින පවා පාපිෂ්ඨ මනුෂ්‍යයාගෙන් දෙවියන්වහන්සේ එම ප්‍රශ්නයම අසයි. අපි අපගේ සැබෑ ආත්මික තත්ත්වය වටහා ගත යුතුය. ක්‍රිස්තුස්වහන්සේගෙන් තොරව අපි ශුද්ධවූ දෙවියන් ඉදිරියෙහි වරදකරුවන් ලෙස නැඟී සිටිමු.

**ආදම් :** . . . ආදම් පිළිතුරු දෙමින් ඔහුට දෙවියන්වහන්සේගේ හඬ ඇසුණු බවද තමා නිර්වස්ත්‍රව සිටින බැවින් බියවී දෙවියන්වහන්සේ ඉදිරියෙන් සැඟවුණු බවද පැවසීය.

**දෙවියන්වහන්සේ** . . . දෙවියන්වහන්සේගේ ඊළඟ ප්‍රතිචාරයද ප්‍රශ්නයක් විය.

> **උන්වහන්සේ නුඹ නග්න බව නුඹට කීවේ කවුද? නොකන්ට මා ආඥා කළ ගසෙන් කෑවෙහිදැයි ඇසූ සේක. (උත්පත්ති 3:11)**

ආදම් ගසෙන් කෑ බව දෙවියන්වහන්සේ දැනටම දැන සිටි සේක. එනිසා දෙවියන්වහන්සේගේ ප්‍රශ්න කිරීමේ පරමාර්ථය වූයේ ආදම්ගෙන් තම පාපය ප්‍රකාශ කිරීමට සැලැස්වීමය.

> **අපේ පාපවල් කියාදෙමු නම්, අපේ පව් අපට කමාකරන්ටත් සියලු අධර්මිෂ්ඨකමින් අප පවිත්‍ර කරන්ටත් උන්වහන්සේ විශ්වාසව ධර්මිෂ්ඨව සිටින සේක. (1 යොහන් 1:9)**

**ආදම්** . . . ඔහුගේ පිළිතුර මඟින් වරද පිළිගැනීමට ඔහුට තිබූ නොහැකියාව පෙන්නුම් කළේය. ඔහු ඒවට දොස් පැවරීම මඟින් දෙවියන්වහන්සේටද දොස් පැවරීය :

> **මනුෂ්‍යයාද: මා සමඟ සිටින්ට ඔබවහන්සේ දුන් ස්ත්‍රී ගසෙන් මට දුන්නාය. මමද කෑවෙමියි කීය. (උත්පත්ති 3:12).**

**දෙවියන්වහන්සේ** : . . . ඉන් පසුව දෙවියන්වහන්සේ කාන්තාවගෙන් "නුඹ කළ මේ දෙය මොකද?" යැයි ඇසූ සේක.

**ඒව :** . . . ඒවද තම පුරුෂයා අනුගමනය කරමින් වරද පිළිගැනීම ප්‍රතික්ෂේප කොට, ඇගේ පාපය සඳහා සර්පයා පිට වරද පැවරීය.

**දෙවියන්වහන්සේ :** එම සාකච්ඡාවෙහි ඉතිරි කොටස දෙවියන්වහන්සේ පාපය සඳහා දඬුවම/වන්දිය ප්‍රකාශ කරමින් ඉදිරිපත් කළ සේක.

## පාපයෙහි දඬුවම

අපි මීට පෙර පාපයෙහි ක්ෂණික ප්‍රතිඵල සලකා බැලුවෙමු. දැන් පාපයෙහි දඬුවම ලෙස දෙවියන්වහන්සේ සර්පයා වෙත, මිනිසා වෙත සහ කාන්තාව වෙත නිකුත් කළාවූ විනිශ්චයන් සලකා බලමු.

### සර්පයා වෙත :

1. ශාරීරික ස්වරූපය වෙනස් කළේය. සාතන් විසින් පරීක්ෂා කිරීම සඳහා යොදාගත් ශාරීරික ස්වරූපය ශාපලත් එකක් බවට පත්විය. සර්පයා ආරම්භයේදී කෙළින් ඇවිද ගිය සතෙක් විය. නමුත් එම මොහොතේ සිට දූවිල්ලෙහි බඩ ගා යන්නෙක් බවට පත් විය.

2. මනුෂ්‍යයා සහ සාතන් අතර සතුරු බව : මෙය අප "ආත්මික යුද්ධයක්" ලෙස නම් කරන කාරණාව, එනම් සාතන් මිනිසාගේ ප්‍රාණය කෙරෙහි පොර බැදීමෙහි මූලාරම්භය වේ. මෙම යුද්ධය අද වන තුරුම පවතී. හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනය *"ආත්මික උපක්‍රම"* නම් පාඩමාලාවක් ඉදිරිපත් කරන අතර එහි ආත්මික සටන හා සතුරාගෙන් ජය ගැනීමට උපක්‍රම සපයා දී තිබේ.

3. පොඩි කරන ලද හිස : සර්පයා වෙත නිකුත් කරන ලද තුන්වන දඬුවම සැබවින්ම පාපිෂ්ඨ මිනිසා උදෙසා වූ පොරොන්දුවකි. සාතන් පාපය තුළින් ආත්මිකව මිනිසාගේ "විලුඹ තුවාල කරන" නමුත්, ස්ත්‍රියගෙන් පැවත එන බීජය (පරම්පරාවේ කෙනෙක්) සාතන්ගේ හිස පොඩි කරනු ඇත (උත්පත්ති 3:15). මිනිසාගේ පාපය උදෙසා ගැළවුම්කරුවෙකු එවන බවට දුන්නාවූ මුල් පොරොන්දුව මෙය විය. සාතන් පාපය කරණකොටගෙන මනුෂ්‍යයාට බලපෑම් කළත් මිනිස් සංහතියෙහි පාපය උදෙසා ස්ත්‍රියක් තුළින් ගැළවුම්කරුවෙකු එවා පාපයෙහි බලය පොඩි කර දමනු ඇත. පාපය නමැති ඛේදජනක බව එක් කාන්තාවකගේ වැටීම හේතුවෙන් පැමිණි සේම, මිදීමද එක් කාන්තාවක් තුළින් ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ බිහිවීම මඟින් පැමිණෙනු ඇත.

## ආදම් වෙත :

1. වෙහෙසින් යුක්තව වැඩ කිරීම : පාපයට පෙර ආදම් සතුටින් භූමිය රැක බලා ගත්තේය. නුමුත් දැන් ඔහුට එය වෙහෙසකර විය. භූමියෙහි පරිසරය වෙනස් විය. වරක් සශ්‍රීකව, කෘමි හා වල් උවදුරුවලින් තොරව පැවති භූමිය දැන් කටු ගොකටුවලින් ගහණ විය.

2. මරණය : ස්වාභාවික මරණය නම් දඬුවම ආදම් වෙත නිකුත් කරන ලදී. ඔහුගේ සිරුර භූමියට නැවත හැරී යනු ඇති බව දෙවියන්වහන්සේ ප්‍රකාශ කළ සේක. " . . . නුඹ දූවිලිය, දූවිල්ලට හැරී යන්නෙහිය." ආත්මික මරණයද පාපයෙහි එක් දඬුවමකි. දෙවියන්වහන්සේ පවසන්නේ, "පව් කරන ප්‍රාණයම නසිනවා ඇත" (එසකියෙල් 18:20) යනුවෙනි. පව්සමාවෙන් තොරව, මනුෂ්‍යයා දෙවියන්වහන්සේගෙන් සදාකාලයට වෙන්වී ආත්මික මරණය අත් විඳිනු ඇත.

## ඒව වෙත :

ස්ත්‍රියද ඇගේ පාපය උදෙසා දඬුවමට පත්වූවාය.

1. දරුවන් බිහිකිරීමෙහිදී වේදනා විඳීම : ශෝකය හා වේදනාව නම් ශාපය දරුවන් බිහිකිරීමෙහිදී අත්විඳීමට සිදු විය.

2. යටත්වීම : ඒව ඇයගේ පුරුෂයාගේ බලපෑමට යටත්වනු ඇත. (අපි මෙම පාඨමාලාවෙහි යැවුම් පත්‍ර ඉගෙන ගන්නා විට යටත්වීම නම් සංකල්පය පිළිබඳ වැඩිදුර අධ්‍යයනය කරනු ඇත.)

## ආදම් සහ ඒව යන දෙදෙනාම උදෙසා දඬුවම

දෙවියන්වහන්සේ, ආදම් සහ ඒව ඒදන් උයනෙහි අලංකාර පරිසරයෙන් ඉවත් කොට, වේදනාව, දුක, කටු සහ මරණය සහිත ලොවට පිටමං කළ සේක.

## ක්‍රිස්තුස්වහන්සේගේ පොරොන්දුව

උත්පත්ති 3 වෙනි පරිච්ජේදයෙහි ඇති දීප්තිමත් එකම ස්ථානය නම්, සාතන්ගේ බලය පොඩි කර දැමීමට පැමිණෙන්නාවූ මිදුම්කරුවෙකු පිළිබඳ පොරොන්දුව වේ (උත්පත්ති 3:15).

මෙය යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ සම්පූර්ණ වූ ආකාරය සලකා බලන්න.:

| **පාපය ගෙන ආ කරුණු . . .** | **යේසුස්වහන්සේ තුළ සම්පූර්ණ වූ කරුණු** |
|---|---|
| වේදනාව | යේසුස්වහන්සේ අප උදෙසා වේදනාව වින්ද සේක (යෙසායා 53:11). |
| යටත් කරනු ලැබීම | උන්වහන්සේ ව්‍යවස්ථාවට යටත් කරනු ලැබුවේ අපව ව්‍යවස්ථාවෙන් මුදවා ගනු පිණිසය (ගලාති 4:4). |
| දහඩිය | උන්වහන්සේගේ දහඩිය අප උදෙසා මහා ලේ බිඳු මෙන් හෙළූ සේක (ලූක් 22:44). |
| කටු | අප වෙනුවෙන් උන්වහන්සේගේ හිස මත කටු ඔටුන්නක් තැබිය. (මතෙව් 27:29) |
| ශෝකය | සැබවින්ම උන්වහන්සේ අපගේ ශෝකය උසුලා ගත් සේක (යෙසායා 53:4-5). |
| මරණය | උන්වහන්සේ සදාකාල ජීවනය ගෙනා සේක (යෙසායා 3:16). |

යේසුස්වහන්සේ පාපයෙහි සියලු දඬුවම් වින්ද සේක. උන්වහන්සේගේ ජීවිතය, මරණය සහ නැවත නැගිටීම තුළින් සාතන්ගේ හිස (බලය) පොඩි කරන ලදී.

## ආරම්භය සහ අවසානය

පළමුවන කාන්තාව මැවූ පසු සිදුවූ සියල්ල අප පළමුවන පරිච්ඡේද දෙකෙහි අධ්‍යයනය කළෙමු. එළිදරව් පොත ආරම්භය සහ අවසානය අතර පවතින වැදගත් පරස්පර බව පෙන්වා දෙයි. එළිදරව් 21 හා 22 පරිච්ඡේද කියවා බලන්න. එම යුගයෙහි අවසාන දින කිහිපය සහ එතුමාගේ ජනතාව උදෙසා දෙවියන්වහන්සේ සැලසුම් කොට ඇත්තාවූ අලුත් පොළොව සහ අලුත් ස්වර්ගය පිළිබඳව විස්තර කරයි. පහත සඳහන් වගුව ඇසුරින් පාපයෙහි ප්‍රතිඵල ලෙස වූ සියලු දඬුවම් ඉවත් වී ඇති ආකාරය වටහා ගන්න.

| **උත්පත්ති** | **එළිදරව්** |
|---|---|
| පාරාදීසය වසන ලදී .<br>3:23 | පාරාදීසය විවර වී ඇත.<br>21:25 |
| පාපය හේතුවෙන් අස්ථාන ගතවීම<br>3:24 | අනුග්‍රහය යටතේ නැවත ස්ථානගත කිරීම.<br>21:24 |
| ශාපය ප්‍රකාශ කිරීම<br>3:17 | ශාපය ඉවත් කිරීම.<br>22:3 |
| ගසට ප්‍රවේශ විම තහනම් කිරිම<br>3:24 | ගසට ප්‍රවේශ විමට අවසර ලැබේ.<br>22:14 |
| ශෝකය හා මරණය ඇරඹුම<br>3:16-19 | ශෝකය හා මරණය නිමවීම<br>21:4 |
| උයන කිලුටුවීම<br>3:5-7 | අපවිත්‍රතාවයක් නොමැත.<br>21:27 |
| මිනිසාගේ ආධිපත්‍ය බලය බිඳීම<br>3:19 | ආධිපත්‍යය නැවත පිහිටුවීම<br>22:5 |
| නපුර ජයගැනීම<br>3:13 | යහපත ජයගැනීම.<br>20:10 |
| දෙවියන්වහන්සේ සමඟ මිනිසාගේ ගමන අතරමැද බාධා වීම<br>3:8-10 | සම්බන්ධතාවය නැවත පිහිටුවීම<br>21:3 |

මිනිසා පාපයට වැටීම ඉතිහාසයෙහි ශෝකජනක මොහොතක් වුවද මිනිස් සංහතිය උදෙසා අනාගතය යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළින් මහත් බලාපොරොත්තුවක් සහිත ප්‍රීතිමත් එකකි.

## ස්වයං පරීක්ෂණය

1. ශුද්ධ ලියවිල්ලෙහි ගැළවුම්කරුවකු සම්බන්ධයෙන් දි ඇති පළමුවන බයිබල් පොරොන්දුව වනුයේ කුමන බයිබල් පදයද?

_______________________________________________

2. ප්‍රධාන බයිබල් පදය කටපාඩමෙන් ලියන්න.

_______________________________________________

_______________________________________________

3. සත්‍යය වාක්‍යය ඉදිරියෙන් “ස” යනුවෙන්ද අසත්‍ය වාක්‍ය ඉදිරියෙන් “අ” යනුවෙන්ද සටහන් කරන්න.

අ. ________________ ඒව සාතන්ට පිළිතුරු දිමේදී දේව වචනය වැරදි ලෙස උපුටා දැක්වුවාය.

ආ. ________________ ආදම් තම පාපය උදෙසා සර්පයාට දොස් පැවරීය.

ඇ. ________________ ඒව තම පාපය උදෙසා ආදම්ට දොස් පැවරීය.

ඈ. ________________ ඒව, පාපය සඳහා දෙවියන්වහන්සේට අනතුරු අඟවා තිබූ දඬුවම ලිහිල් කොට දැක්වීමට උත්සාහ කළාය.

ඉ. ________________ පරීක්ෂාවේ චක්‍රය යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ බලය තුළින් ඕනෑම අවස්ථාවකදී බිඳ හෙලිය හැකිය.

4. එක් එක් පාපය සඳහා දුන් දඬුවම් පහතින් සඳහන් වේ. එය කියවා බලන්න. එක් එක් දඬුවම ඉදිරියෙන් පහත දි ඇති සංකේතවලට අනුව නිවැරදි සංකේතය සටහන් කරන්න.

ස - සර්පයාට දුන් දඬුවමකි.
පු - පුරුෂයාට දුන් දඬුවමකි.
කා - කාන්තාවට දුන් දඬුවමකි.
කාපු - කාන්තාවට හා පුරුෂයාට යන දෙදෙනාටම දුන් දඬුවමකි.

අ. ___________________ ආත්මික මරණය
ආ. ___________________ නපුර හා යහපත දැනගැනීම.
ඇ. ___________________ බය හා ලජ්ජාව.
ඈ. ___________________ ඔහු නුඹේ හිස පොඩි කරනු ඇත.
ඉ. ___________________ වෙහෙසින් යුතුව වැඩ කිරීම.
ඊ. ___________________ දරුවන් බිහිකිරීමේදී වේදනාව

(මෙම පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ දක්වා ඇත.)

## වැඩිදුර අධ්‍යයනය සඳහා

එළිදරව් 20-22 අධ්‍යයනය කරමින්, ලෝකයෙහි ආරම්භය සහ අවසානය අතර පවතින ප්‍රතිවිරුද්ධ තාවයන් පිළිබඳව සලකා බලන්න.

**ආරම්භය**
**උත් 1-3**

දෙවියන්වහන්සේ අහස පොළොව මැවූසේක 1:1
ආලෝකය වේවා 1:3-5
මුහුද නම් ජලකඳ 1:10
ජීවනයේ වෘක්ෂයට පිවිසීමක් නැත. 2:8-9
ඒදනෙන් පිටතට ගංගාව. 2:10
ගසෙන් මරණය 2:17
ශාපය පිහිටුවීම 3:17
වේදනාව 3:17
ඇතුළුවීම වසා දමා ඇත. 3:24
දෙවියන්වහන්සේගේ අභිමුඛයෙන් නෙරපා දමා 3:8
මරණය පිහිටුවීම 2:17
යක්ෂයා රැවටීම 3:4-6
දුෂ්ටකම් කිරීමට සාතන් මුදාහැරීම 3:4-6
ශෝකය 3:17
දෙවියන්වහන්සේගේ නිර්මාණශීලි බලය 1:1
එය ආරම්භය 1:1

**අවසානය**
**එළිදරව් 20-22**

අලුත් අහස සහ පොළොව 21:1
ආලෝකය අවශ්‍ය නැත. 21:23, 22:5
මුහුද තවදුරටත් නැත. 21:1
ජීවන වෘක්ෂයට පිවිසුම් තිබේ. 22:2
ජීවනයේ ගඟ. 22:1
ගසෙන් ජීවනය 22:2
තවදුරටත් ශාපය නැත. 22:3
තවදුරටත් වේදනාව නැත. 21:4
දොරටු වසා නැත. 21:25
සදාකල් දෙවියන්වහන්සේ අභිමුඛයේ 20:12
මරණය තුරන් කිරීම. 20:14
යක්ෂයාට රැවටිය නොහැකිය. 20:3
යක්ෂයා බැඳ දැමීම. 20:3
ශෝකය තවදුරටත් නැත. 21:4
විනාශකාරී බලය 20:9
එය අවසන්ය 21:6

# තුන්වන පරිච්ඡේදය

# ඥානවන්ත සහ අනන්‍ය ස්ත්‍රිය

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අවසන් කිරීමෙන් පසුව ඔබ හට කළ හැකි කරුණු :

- ප්‍රධාන පදය කටපාඩමෙන් ලිවීමට
- හිතෝපදේශ පොතෙහි සඳහන් ස්ත්‍රීන් දෙවර්ගය හඳුනාගැනීමට
- අනන්‍ය ස්ත්‍රියගේ චරිත ගුණාංග විස්තර කිරීමට
- ඥානවන්ත ස්ත්‍රියගේ චරිතගුණාංග විස්තර කිරීමට

**ප්‍රධාන පදය :**

**රූපශ්‍රීය රැවටිලි සහිතය. ශෝභනකම නිෂ්ඵලය. ප්‍රශංසාව ලැබෙන්නේ ස්වාමින්වහන්සේ කෙරෙහි භය ඇති ස්ත්‍රියටය (හිතෝපදේශ 31:30)**

## හැඳින්වීම

දෙවියන්වහන්සේ මුලින්ම ස්ත්‍රිය මැවීමේදී ඇය අලංකාරවූත් පාපය රහිතවූත් තත්වයකින් මවන ලදී. එනමුත් ඇය පාපයට වැටීමේ හේතුවෙන් සියලු ස්ත්‍රීහු දැන් මෙම තත්ව දෙකෙන් එකකට අයත් වෙති.

**දෙවියන්වහන්සේගෙන් තොරවූ ස්ත්‍රිය.** යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තම ගැළවුම්කරු ලෙස පිළිගෙන නොමැති හා ඇගේ පාපයට කමාව ලබා නොගත් පාපිෂ්ට කාන්තාව.

**දෙවියන්වහන්සේගේ ස්ත්‍රිය:** වරක් ඇය පව්කාරියකව සිටි නමුත් තමාගේ පාපය පාපොච්චාරණයෙන් හා යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තම ගැළවුම්කරු ලෙස පිළිගැනීමෙන් ඇය දැන් දෙවියන්වහන්සේ ඉදිරියෙහි (ශුද්ධවූ) ඥානවන්ත ගුණවත් ස්ත්‍රියක් සේ නැඟී සිටියි.

පැරණි ගිවිසුමෙහි හිතෝපදේශ පොතෙහි මෙම වර්ගයන් දෙක තුළ පවතින පරස්පර බව අවධාරණය කරයි. දෙවියන්වහන්සේගෙන් තොරවූ කාන්තාව අනන්‍ය ස්ත්‍රිය ලෙසද, දෙවියන්වහන්සේගේ ස්ත්‍රිය ප්‍රඥාවන්ත ස්ත්‍රිය හෝ ගුණවත් ස්ත්‍රිය ලෙසද එහි හඳුන්වා දෙයි.

“අනන්‍ය” ස්ත්‍රියගේ විෂය මුළු හිතෝපදේශ පොත පුරා නූලක් මෙන් දිවයයි. එහි අවසාන පරිච්ඡේදයෙහි ගුණවත් ස්ත්‍රියගේ චරිත ගුණාංග ඉස්මතු කරමින් ඇයව ඉහළ වර්ණනාවකට යොමු කරයි. මෙලෙස ස්ත්‍රී වර්ග දෙක අතර පරස්පර බව විදහා දක්වයි.

## හිතෝපදේශ පොත

හිතෝපදේශ පොත “තිරස් ජීවිතයක් උදෙසා සිරස් ප්‍රඥාව” නමින් හැඳින්වෙයි. එය දෙවියන්වහන්සේ විසින් මනුෂ්‍යයා වෙත (සිරස්) අන්‍යයන් සමග තම ජීවිතය පවත්වා ගෙන යාම උදෙසා (තිරස්) සපයන ලද ප්‍රඥාවන්ත ප්‍රතිපත්ති ප්‍රකාශන සමූහයක එකමුතුවකි.

දෙවියන්වහන්සේ

අනෙක් අය ______________________ අනෙක් අය

අනෙකුත් අය සමග තිරස් සම්බන්ධතාවය සඳහා

“හිතෝපදේශ” යන්නෙහි අර්ථය නම්, “බොහෝ වචන රාශියක් වෙනුවට කෙටි ප්‍රකාශනයකි“. හිතෝපදේශ පොතෙහි සෑම පරිච්ඡේදයක්ම එක් වැදගත් සත්‍යයක් පිළිබඳ නිශ්චිත සාරාංශයකි.

හිතෝපදේශ වැඩි ප්‍රමාණයක් ලියන ලද්දේ දාවිත් රජුගේ පුත්‍රයා වූ සාලමොන් රජු විසිනි. සාලමොන් රජු දේවානුභාවයෙන් යුක්තව හිතෝපදේශ තුන් දහසක් ප්‍රකාශ කළ බව 1 රාජාවලිය 4:32 හි වාර්තා වේ. මෙයින් සමහරක් ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් අප හට හිතෝපදේශ පොතෙහි ආරක්ෂා කොට තබා තිබේ.

ප්‍රඥාවන්ත සහ අන්‍ය ස්ත්‍රීන් පිළිබඳ සාලමොන්ගේ අවධාරණයන් සමහරක් ඔහුගේම විවාහ සම්බන්ධතා ඇසුරින් ඔහු ලත් දැනුම විය. සාලමොන් එක් භාර්යාවකට වඩා විවාහ කරගනිමින් පව් කළේය. ඔහුගේ සමහර භාර්යාවෝ අන් දෙවිවරු ඇදහූ “අන්‍ය” කාන්තාවෝ වූහ.

## අන්‍ය ස්ත්‍රීන්

හිතෝපදේශ පොතෙහි “අන්‍ය” ස්ත්‍රිය ලෙස හඳුන්වන වචනයෙහි අරුත වනුයේ, “විදේශී, පිටස්තර, කාමමිථ්‍යාචාරික” වූ කාන්තාවක් ලෙසය. එමගින් දෙවියන්වහන්සේගෙන් වෙන්වූ එතුමාගේ ධර්මිෂ්ඨකමට විදේශිකයෙක් වූ කාන්තාවක් විස්තර කරයි. ස්ත්‍රිය උදෙසා දෙවියන්වහන්සේගේ නියමිත සැලැස්ම වූයේ ඇය උන්වහන්සේගේ ශරීරයෙහි කොටසක්, එනම් සභාවෙහි කොටසක් වීමය. මෙලෙස අඥාන ස්ත්‍රිය දෙවියන්වහන්සේ සමග ඇති සම්බන්ධතාවය පාපිෂ්ට ජීවිතයකට හරවාගෙන ඇති බැවින් ඇය කාමමිථ්‍යාචාරී ස්ත්‍රියක් බවට පත් කර ගනී.

හිතෝපදේශ පොත “අන්‍ය ස්ත්‍රියකගේ” චරිත ගුණාංග කිහිපයක් හඳුන්වා දෙයි. පාපිෂ්ට කාන්තාවකගේ ජීවිතයෙහි මෙම සියලු චරිත ගුණාංග නොමැති විය හැකි නමුත් ඉන් ඕනෑම එකක් හෝ පෙන්නුම් විය හැකිය.

### අවංක නොවන :

අන්‍ය ස්ත්‍රිය වැරදි අරමුණකින් යුතුව ඉච්චා බස් යොදමින් ප්‍රශංසා ඉදිරිපත් කරයි. එවන් කාන්තාවක් මග හැරිය යුතු බව හිතෝපදේශ අපට උගන්වයි.

> **එසේම අන්‍ය ස්ත්‍රියෙක් වන. තමාගේ වචනවලින් ඉච්චා කරන්නාවූ තම යෞවන වයසේ මිත්‍රයා අත්හරින්නාවූ (හිතෝපදේශ 2:16)**
>
> **මක්නිසාද නපුරු ස්ත්‍රියගෙන්ද අන් තැනැත්තියෙකුගේ දිවේ ඉච්චාවෙන්ද නුඹ ආරක්ෂාකරන පිණිස (හිතෝපදේශ 6:23)**
>
> **අන් ස්ත්‍රියක් වන තමාගේ කිම්වලින් ඉච්චා කරන අන්‍ය තැනැත්තියගෙන් නුඹ ආරක්ෂා වෙන පිණිස, (හිතෝපදේශ 7:4)**

### නපුරු :

හිතෝපදේශයෙහි එක් පරමාර්ථයක් නම් ප්‍රතිපත්ති සපයා දීමයි.

> **නපුරු ස්ත්‍රියගෙන් . . . නුඹ ආරක්ෂා කරන පිණිස (හිතෝපදේශ 6:23).**

### විනාශකාරී :

අන්‍ය ස්ත්‍රියක් අනෙක් අය තමාගේ පාපය වෙත ඇද ගැනීමෙන් ඔවුන්ව විනාශ කිරීමට සොයයි.

> **මක්නිසාද වේශ්‍යා ස්ත්‍රියෙක් නිසා මනුෂ්‍යයෙකුට ඉතුරුවන්නේ රොටි කැබැල්ලක් පමණක්ය. මිථ්‍යාචාරී ස්ත්‍රීද අනර්ඝ ප්‍රාණය අල්ලාගන්ට ලුහුබඳින්නිය. (හිතෝපදේශ 6:26)**

### අසංවර :

පාපිෂ්ඨ ස්ත්‍රිය අසංවර ඇඳුමින් සැරසී සිටින්නිය.

**එවිට වේශ්‍යාවකගේ වස්ත්‍ර ඇඳ සිටි . . . ස්ත්‍රියෙක් ඔහුට මුණ ගැසුණාය. (හිතෝපදේශ 7:10)**

## උපායශිලි :

අන්‍ය ස්ත්‍රිය රැවටිලිකාරය - උපායශිලිය

**. . . රැවටිලි සිත් ඇති ස්ත්‍රියක් ඔහුට මුණ ගැසුණේය. (හිතෝපදේශ 7:10)**

ඇයව පෙන්වා ඇත්තේ අනෙක් අයට වැටීමට සලස්වන වංචාකාරී වලක් ලෙසටය.

**මක්නිසාද, වේශ්‍යාවක් වනාහි ගැඹුරු අගළක්ය. අන් ස්ත්‍රිය ද පටු වළක්ය. (හිතෝපදේශ 23:27)**

ඇය වංචාකාර වචන කතා කරමින් අනෙක් අයව පාපයට හසුකර ගනී.

**මක්නිසාද, අන් ස්ත්‍රියෙකුගේ තොල්වලින් මී පැණි වැස්සෙන්නේය. ඇගේ මුඛය තෙල්වලටත් වඩා සිනිඳුය. (හිතෝපදේශ 5:3)**

## තරඟකාරීත්වය :

"තරඟකාරිත්වය" යනු නිරන්තරයෙන්ම වාද කරන්නාවූ, විරුද්ධ මතවලට පැටලෙන්නාවූ ස්වභාවය වේ.

**භාර්යාවකුගේ තරඟද නොනවතින වතුර බින්දු වැටීමක්ය. (හිතෝපදේශ 19:13)**

**තද වර්ෂා දවසක නොකඩව වතුර බින්දු වැටීමක් ද ඩබරකාර ස්ත්‍රියෙක්ද ඒකාකාරය. (හිතෝපදේශ 27:15)**

**ඩබරකාර තරඟ ගති ඇති ස්ත්‍රියෙක් සමග විසීමට වඩා කාන්තාර දේශයක සිටීම හොඳය. (හිතෝපදේශ 21:19)**

## ඩබරකාරකම :

අන්‍ය ස්ත්‍රියකගේ දබරකරගැනීම පිළිබඳව පද දෙකක් සඳහන් වේ. "ඩබරකිරීම" යනු මහ හයියෙන් ශබ්ද නගමින් රණ්ඩු වීමය. හිතෝපදේශ අනතුරු අඟවමින්:

**ඩබරකාර ස්ත්‍රියෙකු සමග පොදු ගෙයක සිටීමට වඩා පියස්සේ මුල්ලක ඉඳීම හොඳය. (හිතෝපදේශ 21:9)**

වහලයේ කොනක් පවා ඇයට වඩා ආශාවිය යුතු බව දන්වයි.

**ඩබරකාර ස්ත්‍රියෙකු සමග පොදු ගෙයක සිටීමට වඩා පියස්සේ මුල්ලක ඉඳීම හොඳය. (හිතෝපදේශ 25:24)**

## කාමමිථ්‍යාචාරික :

පාපිෂ්ට ස්ත්‍රිය කාමමිථ්‍යාචාරික ශාරීරික සම්බන්ධතාවයන්හි නියැලිය හැකිය. සැබවින්ම ඇය දෙවියන්වහන්සේ සමග වූ සම්බන්ධතාවය අතහැර දමා ඇති බැවින් සත්‍ය ලෙසම කාමමිථ්‍යාචාරිකාවක් වී සිටී.

**මිථ්‍යාචාරික ස්ත්‍රියෙකුගේ මාර්ගයත් එසේමය. ඈ කාලා කට පිහදමා මම දුෂ්ටකමක් නොකළෙමියි කියන්නිය. (හිතෝපදේශ 30:20)**

**එසේය, මාගේ පුත්‍රය, නුඹ මක්නිසා අන්‍ය ස්ත්‍රියෙකු කෙරෙහි ප්‍රීතිමත්ව, අන්‍ය තැනැත්තියෙකුගේ ළය වැළඳගන්නෙහිද? (හිතෝපදේශ 5:20)**

## ස්වයං-ධර්මිෂ්ඨ බව :

පාපිෂ්ඨ ස්ත්‍රිය ඇගේ සැබෑ ආත්මිකතාවය පිළිනොගනියි.

**මිථ්‍යාචාරික ස්ත්‍රියෙකුගේ මාර්ගයත් එසේමය. ඈ කාලා කට පිහදමා මම දුෂ්ටකමක් නොකළෙමියි කියන්නිය. (හිතෝපදේශ 30:20)**

## පිළිකුල් සහගත :

හිතෝපදේශය පවසන්නේ අන් ස්ත්‍රිය "පිළිකුල් සහගත" එනම් වෛර කරන්නාවූ කෙනෙකු ලෙසය.

**ආශා නූපදවන විවාහවූ ස්ත්‍රියක්ය. (හිතෝපදේශ 30:23)**

## කෝපය :

**ඩබරකාර තරහ ගති ඇති ස්ත්‍රියෙක් සමග විසීමට වඩා කාන්තාර දේශයක සිටීම හොඳය. (හිතෝපදේශ 21:19)**

## ප්‍රයෝජනයක් නොමැති :

අන්‍ය ස්ත්‍රියක් හේතුවෙන් මූල්‍යමය විනාශය ඇතිවන බව පද දෙකකින් එළිදරව් වේ.

**අන්‍යයෙකුට ඇපවෙන්නාගේ වස්ත්‍රය ගන්න. අන් ස්ත්‍රියකුට ඇපවන්නාගෙන්ද උකසක් ගන්න. (හිතෝපදේශ 27:13)**

**අන්‍යයෙකුට ඇපවෙන්නාගේ වස්ත්‍රය ගන්න. අනුන් නිසා ඔහුගෙන් උකසක් ගන්න (හිතෝපදේශ 20:16)**

## මෝඩ සහ ඝෝෂාකාරිය :

මෝඩකම යනු ප්‍රඥාව මදිකමය. "ඝෝෂාකාරි" යනු ශබ්ද නගා වැරදි කිම සහ බලෙන් ඉල්ලා සිටීමය.

**අඥාන ස්ත්‍රිය ඝෝෂාකාරිය . . . (හිතෝපදේශ 9:13)**

## දැනුම නොමැති බව :

**අඥාන ස්ත්‍රිය ඝෝෂාකාරීව, මෝඩව, කිසිත් නොදැන සිටින්නිය. (හිතෝපදේශ 9:13)**

## නුවණ නැතිකම :

මෙහි තේරුම නම් ඇයට බුද්ධිමත්ව ක්‍රියා කළ නොහැකි බවය. හිතෝපදේශය බුද්ධියෙන් තොර රූපවත් කාන්තාව ඌරෙකුගේ හොස්සේ පැලඳූ රන් මුදුවකට සමාන කරයි.

**ඌරෙකුගේ හොස්සේ ලූ රන් මුදුවක් යම්සේද නුවණ නැති රූපත් ස්ත්‍රියද එසේමය. (හිතෝපදේශ 11:22)**

හිතෝපදේශ පොත අන්‍ය ස්ත්‍රිය අප්‍රසන්න කෙනෙකු ලෙසට විස්තර කරයි. ඇය සමග වාසය කිරීමට වඩා වහලයේ විසීම (හිතෝ. 21:9), කාන්තාරයෙහි වාසය (හිතෝ. 21:19), වහලයේ කොනක ජීවත්වීම (හිතෝ. 25:24) වඩා යහපත් බව පැවසේ.

## ප්‍රතිවිරුද්ධතා කිහිපයක්

හිතෝපදේශ පොතෙහි යහපත් කාන්තාව නොහොත් නුවණැත්තිය සහ අනඥ කාන්තාව නොහොත් බුද්ධිය නොමැති කාන්තාව අතර පවතින වෙනස්කම් රාශියක් ඉදිරිපත් කොට තිබේ.

| **අනඥ ස්ත්‍රිය (මෝඩ)** | **ගුණවත් (බුද්ධිමත්)** |
|---|---|
| ඇගේ නිවස විනාශ කරයි (14:1) | ඇගේ නිවස ගොඩනඟයි (14:1) |
| ඝෝෂාකාරී, මෝඩ, කිසිත් නොදනියි (9:13) | ගෞරවය රැකගනී (11:6) |
| ඌරෙකුගේ හොස්සෙහි දැමූ රන් මුදුවක් වැනිය (11:22) | ඇගේ පුරුෂයාට ඔටුන්නකි (12:4) |

## කාන්තාව භාර්යාවක් ලෙස

හිතෝපදේශ පොත කාන්තාවක් භාර්යාවක් ලෙසට ඇගේ කාර්යභාරය පිළිබඳව නිරීක්ෂණ කිහිපයක් ඉදිරිපත් කරයි. මෙම අදහස් අනඥ ස්ත්‍රිය සහ ගුණවත් ස්ත්‍රිය අතර වෙනස සංසන්දනය දක්වා වර්ධනය වෙයි.

> **ගුණවත් ස්ත්‍රියෙක් ඇගේ ස්වාමිපුරුෂයාට ඔටුන්නක්ය. එහෙත් ලජ්ජා උපදවන තැනැත්ති ඔහුගේ ඇටවල දිරවීමක් මෙන්ය. (හිතෝපදේශ 12:4)**

ස්ත්‍රීන් සමග කාමමිථ්‍යාචාරික සම්බන්ධතා පිළිබඳව පුරුෂයාට අනතුරු අඟවා තිබේ.

> **තමාගේ අසල්වාසියාගේ භාර්යාව වෙතට එළඹෙන්නා එසේමය. ඈට අතගසන කිසිවෙක් අච්චු නොලැබ නොසිටින්නේය. (හිතෝපදේශ 6:29)**
>
> **ස්ත්‍රියෙකු හා සමග කාමමිථ්‍යාචාරය කරන්නා නුවණ නැති කෙනෙක්ය. එය කරන්නා තමාගේම ප්‍රාණය නාස්තිකරගන්නේය. (හිතෝපදේශ 6:32)**

පුරුෂයෙකු තමාගේ භාර්යාවගෙන් තෘප්තිමත් විය යුතුය. අනඥ ස්ත්‍රියකගෙන් නොවේ.

> **නුඹේ උල්පතට ආශිර්වාද ලැබේවා. නුඹේ යෞවන වයසේ භාර්යාව කෙරෙහිම ප්‍රීතිවෙන්න. (හිතෝපදේශ 5:18)**

ගුණවත් භාර්යාවක් ස්වාමින්වහන්සේගෙන් ලැබෙන ත්‍යාගයකි.

> **භාර්යාවක් සොයාගන්නා යහපතක් සොයාගන්නේය. ඔහුට ස්වාමින්වහන්සේගෙන් කරුණාවද ලැබේ. (හිතෝපදේශ 18:22)**
>
> **ගෙයක් හා සම්පත් පියවරුන්ගෙන් ලැබෙන උරුමයක්ය. නුමුත් නුවණින් හැසිරෙන භාර්යාවක් ලැබෙන්නේ ස්වාමින්වහන්සේගෙන්ය. (හිතෝපදේශ 19:14)**

අනඥ ස්ත්‍රිය තරඟකාරී, නොනවතින කරදරයකි.

> **භාර්යවකගේ තරඟද නොනවතින වතුර බින්දු වැටීමක්ය. (හිතෝපදේශ 19:13)**

## ගුණවත් ස්ත්‍රිය

අනඥ ස්ත්‍රිය පිළිබඳව මුළු හිතෝපදේශ පොත පුරාවට විස්තර කිරීමෙන් අනතුරුව ලේඛකයා ගුණවත් ස්ත්‍රිය පිළිබඳ මහිමාන්විත සංසන්දනයකින් වෙනස පෙන්වා දෙමින් අවසන් කරයි. ඇය පිළිබඳ විස්තරය ප්‍රශ්නයක් සහ ප්‍රකාශනයකින් ආරම්භ කරයි.

**ගුණවත් ස්ත්‍රියෙක් කාට සම්බවේද? ඇගේ අගය රතුකැටවලට වඩා වැඩිය. (හිතෝපදේශ 31:10)**

ගුණවත් ස්ත්‍රිය පිළිබඳ සවිස්තරාත්මක චරිත ගුණාංග දැක්වීම ඇතුළත් හිතෝ. 31:10-31 කියවන්න. ඔබ ඇයගේ පෞද්ගලිකත්වයෙහි ගුණාංග පුනරීක්ෂණය කිරීමෙහිදී මෙම බයිබල් කොටස විවෘතව තබාගන්න.

පාපිෂ්ට කාන්තාවක් සතු චරිත ගුණාංග සියල්ලම එක් කාන්තාවක් තුළ දක්නට නොලැබෙන ලෙසම, පහත සඳහන් සියලු යහපත් ගුණාංග එක් ගුණවත් ස්ත්‍රියක් තුළ නොතිබිය හැකි බව මතක තබාගන්න. කෙසේ වෙතත් මෙය දෙවියන්වහන්සේ තුළ නියම කාන්තාවගේ නිදර්ශන චිත්‍රයක් වන අතර, ආත්මික පරිණත බව තුළින් මෙම තත්වයට ළඟාවිය හැකිය.

ගුණවත් ස්ත්‍රිය පිළිබඳ පදයෙන් පදයට සිදුකරන අධ්‍යයනයක් පහත දැක්වේ.

## 10 වෙනි පදය:

ගුණවත් ස්ත්‍රිය දුර්ලභය. ලේඛකයා විමසන පරිදි, "ගුණවත් ස්ත්‍රියක් කාට සම්බවේද?". ගුණවත්වීම යනු සදාචාරාත්මකව යහපත් වීමය. මෙවන් ස්ත්‍රියකට රතු කැටවලට වඩා අගනා වූ සදාකාලික වටිනාකමක් හිමිවේ. බයිබලයේ තවත් අනුවාදයක් මෙය තවදුරටත් පුළුල් කර දක්වමින් ඇය සතුව බුද්ධිමය හා දක්ෂතාවයද ඇති බව පෙන්වයි.

## 11 වෙනි පදය:

ඇය විශ්වාසවන්තය "ඇගේ පුරුෂයා ඔහුගේ සිතින් ඇයව විශ්වාස කරයි"

## 12 වෙනි පදය:

ඇගේ සම්බන්ධතා නිවැරදිය. ඇය ඇගේ ස්වාමියා උදෙසා යහපතම පතන්නිය, සිදුකරන්නිය. බයිබලයේ තවත් අනුවාදයක "යහපත" යන වචනය , ඇගේ පුරුෂයාව සැනසීම සහ දිරිගැන්වීම යන සංකල්ප නියෝජනය කර දක්වයි.

## 13 වෙනි පදය:

ඇය ව්‍යාපාරික කාන්තාවක් මෙන්ම කැමැත්තෙන්ම වැඩ කරන්නියකි.

## 14 වෙනි පදය:

ඇය ඇගේ නිවැසියන්ට සපයන්නිය. මෙම පදයෙන් අර්ථවත් වනුයේ ආත්මික හා ශාරීරික අවශ්‍යතා සැපයීමය. බයිබලයේ තවත් අනුවාදයක් මෙය වඩා පුළුල් කොට දක්වමින් "ඇය තම පවුලෙහි ශාරීරික, ද්‍රව්‍යමය සහ ආත්මික අවශ්‍යතා සපයා දෙන්නිය" යයි පවසයි.

## 15 වෙනි පදය:

ඇය අනුන් ගැන සලකන්නාවූත් වගකීම් දරන්නාවූත් කෙනෙකි. ඇය උදෑසනින් නැගිට තම පවුලට අවශ්‍ය දෑ සකසයි. මෙය උදෑසනින් නැගිට දෙවියන්වහන්සේ සමග හමුවීමෙන් ආත්මික සැපයීමටද සූදානම් කිරීමකි. ගුණවත් ස්ත්‍රිය යහපත් පරීක්ෂකවරියකි. ඇය තමාට සේවය කරන අය හට ද සපයා දෙන්නිය.

## 16 වෙනි පදය:

ඇය ව්‍යාපාරික කාන්තාවකි. ඇය සලකාබලා, සැලසුම් කොට, ක්‍රියා කිරීමට පෙර සිතා බලයි. දෙවියන්වහන්සේ ඇයට දී ඇති "මිදි වත්තෙහි" ඇය සිඝ්‍රයෙන් ක්‍රියාශීලීව වැඩ කරයි. ඵල නිපදවයි. බයිබලයේ තවත් අනුවාදයක් පෙන්වා දෙන්නේ ඇය වෙනත් වැඩ භාර ගැනීමෙන් ඇගේ වර්තමාන වැඩ අතපසු නොකරන බවය "ඇය ප්‍රඥාවන්ත ලෙස ව්‍යාප්ත වන්නීය".

## 17 වෙනි පදය:

ගුණවත් ස්ත්‍රිය ශක්තිමත්ය. බයිබලයේ තවත් අනුවාදයක් ප්‍රකාශ කරනුයේ, "ඇය දෙවියන්වහන්සේ තමාට දුන් කාර්යය උදෙසා ආත්මිකව, මානසිකව හා ශාරීරිකව යෝග්‍යතාවයෙන් යුතුව වර්ධනය වන්නිය" යනුවෙනි.

## 18 වෙනි පදය:

ඇයට යහපත් ස්වඅභිමානයක් ඇති බැවින් අවට බාහිර සිදුවීම් ඇය කෙරෙහි බලපෑම් ඇති නොකරයි. බයිබලයේ තවත් අනුවාදයක් අනුව කරදර හා ශෝකය නම් අන්ධකාර රාත්‍රියෙහි ඇගේ දිරිගැන්වීම නම් පහන දැල්වී - බය, සැකය හා අවිශ්වාසය පලවා හරියි.

## 19 වෙනි පදය:

ඇය ඇගේ කර්මාන්තයෙහි නිපුණතා දක්වයි. හොඳින් පුහුණුව ලබා ඇත. ඇය "කර්මාන්තයෙහි ආයුධ මැනවින් හැසිරවීමට" දනී.

## 20 වෙනි පදය:

ගුණවත් ස්ත්‍රිය දුප්පතුන්ට ත්‍යාගශීලිය, අවශ්‍යතාවයෙන් පෙළෙන අය වෙත සේවය කිරීමට ඉදිරිපත් වන්නිය. බයිබලයේ තවත් අනුවාදයක් පවසනුයේ "ඇය අන්‍යයන්ගේ ශරීරයට, මනසට හා ආත්මයට මෙහෙකරන්නිය" යනුවෙනි.

## 21 වෙනි පදය:

ගුණවත් ස්ත්‍රිය බියෙන් තොරය. ඇය තම පවුලට ශාරීරිකව පමණක් නොව ආත්මිකවද වස්ත්‍ර සපයා දෙන්නිය. හෙබ්‍රෙව් 9:19-21 දක්වා යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ලෙයින් ලැබෙන ආත්මික ආවරණය පිළිබඳ ප්‍රකාශ කරයි.

## 22 වන පදය:

මෙම කොටස තුළින් ගුණවත් ස්ත්‍රිය නිර්මාණශීලි නිවෙසක් සාදන්නියක් සේම නියමාකාරයෙන් ඇඳ පැළඳ සිටින බව පෙන්වා දෙයි.

## 23 වන පදය:

ඇය තම පුරුෂයාගේ තත්වයට සහාය දක්වයි.

## 24 වන පදය:

ඇය හොඳ ව්‍යාපාරික කාන්තාවකි.

## 25 පදය:

ඇය ශක්තිමත්, ගරු කටයුතු හා අනාගතය දෙස ප්‍රීතියෙන් බලන්නාවූ කෙනෙකි.

## 26 පදය:

ඇය ප්‍රඥාවන්තය, ඇගේ මුඛයේ වචනයෙන් සේවය කරන්නිය. ඇය තම දිව පාලනය කරගන්නා අතර කාරුණිකය.

## 27 වන පදය:

ඇය ඉතා හොඳින් කරුණු සලකා බලයි. ඇගේ පවුලේ කාරණා මැනවින් ඉටු කරයි (වගකීම්). ඇය අලස නැත, ක්‍රියාශීලිය, ජවසම්පන්නය. බයිබලයේ තවත් අනුවාදයක් පවසන්නේ ඇය "අලසයන්ගේ ඕපදූප, අතෘප්තිකර බව හෝ ආත්මානුකම්පාවේ කෑම නොකන්නිය" යනුවෙනි.

## 28 පදය:

ගුණවත් ස්ත්‍රිය පරිපූර්ණ භාර්යාවක් හා මවක් වේ.

## 29 පදය:

ඇය සියලු දෙනාට වඩා උතුම්ය. ඇගේ ජීවිතයෙහි මෙන්ම සේවයෙහිද අතිවිශිෂ්ට බව දැකිය හැකිය.

## 30 වන පදය:

ඇය සාර්ථකය "අන් අය එය හඳුනාගනිති" ඇය දෙවියන්වහන්සේට බිය වන්නීය.

## 31 වන පදය:

ඇය සවිලවත් වනු ඇත (විලදරනු ඇත). ඇගේ දායකත්වය උදෙසා අන් අය ඇයට ගරු කරනු ඇත. ඇගේම කර්මාන්තය ඇයව පසසයි. ඇය පුරසාරම් දෙඩිය යුතු නොවේ.

## ගුණවත් ස්ත්‍රියගේ රහස

ගුණවත් ස්ත්‍රියගේ රහස කුමක්ද? ඇයට මෙම සියලු සුබවාදී ගතිගුණ ලැබුනේ කෙසේද?

ඇය දෙවියන්වහන්සේට බයවන්නිය. ඇගේ සියලු ධර්මිෂ්ඨකම, ඇගේ සියලු අගනා ගුණාංග පැන නගින්නේ ඇය දෙවියන්වහන්සේ සමග පවත්වාගෙන යන්නාවූ නිවැරදි සම්බන්ධතාවය තුළිනි.

දෙවියන්වහන්සේට බියවීම යනු උන්වහන්සේට ගරු කිරීමට වඩා වැඩි යමකි. එයට ඇතුලත් වන කාරණා නම්, උන්වහන්සේව දෙවියන්වහන්සේ ලෙස පිළිගැනීම, පාපය හඳුනාගෙන පාපොච්චාරණය කිරීම, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ඔබගේ පෞද්ගලික ගැළවුම්කරු ලෙස පිළිගැනීමය. ඔබ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ අලුත් මැවිල්ලක් බවට පත්වූ කල සියලු පරණ කාරණා පහවී යනු ඇත.

> **එබැවින් යමෙක් ක්‍රිස්තුස්වහන්සේ තුළ සිටින්නේ නම් ඔහු අලුත් මැවිල්ලක්ය. පරණ දේ පහව ගියේය. මෙන්න සියල්ලම අලුත්වී තිබේ. (2 කොරින්ති 5:17)**

ඒවගේ මූලික පාපය හේතුකොට ගෙන, සියලු මනුෂ්‍යයන් කෙරෙහි පැමිණි පාපය ගුණවන්ත ස්ත්‍රිය වෙතට වරක් පැවති බැවින් ඇය පව්කාරියක්ව සිටියාය. ඇය සහ අන්‍ය පාපිෂ්ට කාන්තාව අතර වෙනස නම් දැන් ඇය තවදුරටත් පාපිෂ්ට කෙනෙක් නොවීමය. ඇය යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මිදීමේ බලයෙන් පවිත්‍ර කරනු ලැබ සිටීමය.

ඔබගේ ජිවිතය පාපය හේතුවෙන් විනාශ වී තිබිය හැකිය. ඔබ තුළ පාපිෂ්ට කාන්තාව සතු චරිත ගුණාංග බොහෝමයක් පැවතිය හැකිය. මේ මොහොතෙහිම ඔබට කිස්තුස්වහන්සේ තුළින් පාපිෂ්ට කාන්තාවගේ සිට ගුණවන්ත කාන්තාවක් වෙතට වෙනස් විය හැකිය. ඔබට දෙවියන්වහන්සේ සමග සම්බන්ධතාවය නැවත පිහිටුවා ගැනීමෙන් මෙම අලංකාර චරිත ගුණාංග ඔබ තුළ වර්ධනය කිරීමට එතුමාට ඉඩ හැරිය හැකිය.

ඔබ කළ යුතු වන්නේ ඔබගේ පාපය පාපොච්චාරණය කොට යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ඔබගේ ගැළවුම්කරු ලෙස පිළිගැනීම පමණකි. ඔබ මීට පෙර මෙම කැපවීම කර නොමැති නම්, ඔබගේම වචනයෙන් දෙවියන්වහන්සේට කතාකොට එය කරන්න.

## සාරාංශය

හිතෝපදේශ පොත කාන්තාවන් පිළිබඳව උගන්වන විෂය සම්බන්ධයෙන් එක් පදයක් මගින් කැටිකොට ඉදිරිපත් කරයි. එය අන් ස්ත්‍රිය සහ ගුණවත් ස්ත්‍රිය අතර අවසාන සංසන්දනාත්මක පරස්පරය වේ.

> **රූපශ්‍රීය රැවටිලි සහිතය. ශෝභනකම නිෂ්ඵලය. ප්‍රශංසාව ලැබෙන්නේ ස්වාමින්වහන්සේ කෙරෙහි භය ඇති ස්ත්‍රියටය. (හිතෝපදේශ 31:30)**

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය කටපාඩමින් ලියන්න.

______________________________________________

______________________________________________

2. "හිතෝපදේශ" යන වචනයෙහි අර්ථය කුමක්ද?

______________________________________________

3. "අනඝ" යන වචනයෙන් හිතෝපදේශ පොතෙහි භාවිත කර ඇති පරිදි තේරුම් යන්නේ කුමක්ද?

______________________________________________

4. "ගුණවත්" යන වචනයෙන් හිතෝපදේශ පොතෙහි භාවිත කර ඇති පරිදි තේරුම් යන්නේ කුමක්ද?

______________________________________________

______________________________________________

5. පහත සඳහන් චරිත ගුණාංග කියවා බලන්න. එය "අනඝ" ස්ත්‍රියගේ ගුණාංගයක් නම් එයට ඉදිරියෙන් "අ" කියාද "ගුණවත්" ස්ත්‍රියගේ ගුණාංගයක් නම් එයට ඉදිරියෙන් "ගු" කියාද ලියන්න.

i. ___________ අවංක නොවන
ii. ___________ නපුරු
iii. ___________ හදවතින් උපායශීලි
iv. ___________තරඟකාරී
v. ___________තම පුරුෂයාට ඔටුන්නකි
vi. ___________ ඌරාගේ හොස්සෙහි මුදුව
vii. ___________ පිළිකුල් සහගත
viii. ___________ සොයාගැනීමට අපහසු
ix. ___________ තේරුම් නැති
x. ___________තරඟ
xi. ___________ අනුවණ
xii. ___________ ව්‍යාපාරික
xiii. ___________ දක්ෂ
xiv. ___________ ස්වයං-ධර්මිෂ්ඨ
xv. ___________ දඹරකාරී
xvi. ___________ විශ්වාසවන්ත
xvii. ___________ දෙවියන්වහන්සේට බය ඇති
xviii. ___________ ශුද්ධවූ

(මෙම පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ දක්වා ඇත.)

## වැඩිදුර අධ්‍යයනය සඳහා

1. ඔබ යේසුස් ක්‍රිස්තුස්වහන්සේට විශේෂ කැපවීමක් කළා නම්, පාපයට සමාව ඉල්ලා සිටියා නම්, ඔබගේ ගැළවුම්කරු ලෙස උන්වහන්සේ පිළිගත්තා නම්, අප ඒ බව දැනගැනීමට කැමැත්තෙමු. අපට ඒ බව ලියා දක්වන්න.

2. හිතෝපදේශ පොත ස්ත්‍රිය පිළිබඳ වැඩිදුර අධ්‍යනය සඳහා අපි ඔබ වෙත එම විෂය හා සම්බන්ධ සෑම පදයක්ම ඉදිරිපත් කර ඇත්තෙමු. දි ඇති හිස් තැනෙහි එක් එක් පදයෙහි ඇතුළත් කරුණු සාරාංශ කොට ලියන්න.

**උපුටාගැනීම** **සාරාංශය**

2:16 ______________________________

______________________________

5:3 ______________________________

______________________________

5:18 ______________________________

______________________________

5:20 ______________________________

______________________________

6:24 ______________________________

______________________________

6:26 ______________________________

______________________________

6:29 ______________________________

______________________________

6:32 ______________________________

______________________________

7:5 ______________________________

______________________________

7:10 ______________________________

______________________________

9:13 ______________________________

______________________________

10:16 ______________________________

______________________________

11:22 ______________________________

______________________________

12:4 ______________________________

14:1 ______________________________

18:22 ______________________________

19:13 ______________________________

19:14 ______________________________

20:16 ______________________________

21:9 ______________________________

21:19 ______________________________

23:27 ______________________________

25:24 ______________________________

27:13 ______________________________

27:15 ______________________________

30:20 ______________________________

30:23 ______________________________

31:10-31

______________________________

# හතරවන පරිච්ඡේදය

# රූත් පොත

**අරමුණ :**

මෙම පාඩම සම්පූර්ණ කළ පසු පසුව ඔබ හට කළ හැකි කරුණු :

- ප්‍රධාන පදය කටපාඩමෙන් ලිවීමට
- රූත්ගේ කතාව සාරාංශ කොට දැක්වීමට
- පොතෙහි පරමාර්ථයන් හඳුනාගැනීමට
- බෝවස් සහ රූත් අතර සම්බන්ධතාවය, යේසුස්වහන්සේ හා සභාව අතර සම්බන්ධතාවය සඳහා සංකේතයක් ලෙසට විස්තර කිරීමට හැකිවීම
- දෙවියන්වහන්සේ, බාහිර තත්වයන් හා සිදුවීම් උන්වහන්සේගේ සැලැස්ම හා පරමාර්ථය ඉටු කිරීමට භාවිත කරගන්නා බව හඳුනාගැනීමට

## ප්‍රධාන පදය

> **රූත් කියන්නී, නුඹ අත්හැර හැරියන ලෙස මට පෙරැත්ත නොකරන්න. මක්නිසාද නුඹ යන තැනට මමත් යමි. නුඹ නවතින තැන මමත් නවතිමි. නුඹේ සෙනඟ මාගේ සෙනඟ වන්නේය. නුඹේ දෙවියන්වහන්සේ මාගේ දෙවියන්වහන්සේ වන සේක. නුඹ නසින තැන මමත් නැසී, එතැනම තැන්පත් කරනු ලබන්නෙමි. මරණය මිස වෙන කිසිවක් නුඹත් මාත් වෙන්කළොත්, ස්වාමින්වහන්සේ එසේද ඊට වැඩියෙන්ද මට කරන සේක්වායි කීවාය. (රූත් 1:16-17)**

## හැඳින්වීම

බයිබලයෙහි ස්ත්‍රීන්ගේ නමින් ඇති පොත් දෙකක් තිබේ. එම පොත් දෙක නම් රූත් සහ එස්තර්ය. මෙම පරිච්ඡේදයෙහිදී අපි රූත් පොත අධ්‍යයනය කරමු. ඇය යුදෙව් ජනතාව අතර දෙවියන්වහන්සේට සේවය කළාවූ අන්‍ය ජාතික කාන්තාවක් විය. ඊළඟ පරිච්ඡේදයෙහිදී අපි එස්තර් පිළිබඳ අධ්‍යයනය කරමු. ඇය අන්‍යජාතිකයන් මධ්‍යයේ දෙවියන්වහන්සේට සේවය කළාවූ යුදෙව් ස්ත්‍රියක් වූවාය. මෙම පරිච්ඡේදයෙහි අධ්‍යයනය කටයුතු තවදුරටත් සිදුකරගෙන යාමට පෙර රූත් පොතෙහි පරිච්ඡේද හතර කියවන්න.

## පොතෙහි නම

මෙම පොත නම් කොට ඇත්තේ නයෝමි නම් යුදෙව් කාන්තාවගේ යෙහෙළිය (ලේලි) වූ මෝවබ් ජාතික රූත් වෙනුවෙනි. මෝවබ්වරු ලොත්ගෙන් පැවත එන්නන් වූ අතර අන්‍ය ජාතිකයෝ වූහ. මතෙව් පොතෙහි 1 පරිච්ඡේදයෙහි මෙසියස්වහන්සේගේ පෙළපතෙහි සඳහන් කර ඇති කාන්තාවන් හතර දෙනාගෙන් එක් අයෙක් නම් රූත්ය. අනෙක් තිදෙනා වූයේ තාමාර්, රාහබ් සහ බෙත්ෂෙබාය.

## කර්තෘ

පොතෙහි කර්තෘ කවුරුදැයි නොදනී.

## කාලය

රූත් පොතෙහි පළමුවන පරිච්ඡේදයෙහි පළමුවන පදයෙන් සිදුවීම් සිදුවූ වකවානුව දැක්වේ. මෙම සිදුවීම් වූයේ ඉශ්‍රායෙල් ජනතාවගේ ඉතිහාසයෙහි, දෙවියන්වහන්සේගේ ජනතාව කරදරකාරී වකවානුවක් ගත කළාවූ විනිශ්චයකාරවරුන්ගේ යුගයේදීය. එකල ඉශ්‍රායෙල්හි රජෙක් නොවීය. සෙනඟ තමුන්ට රිසි පරිදි ජීවත්වෙමින් දෙවියන්වහන්සේගෙන් ඉවත්ව ගියහ.

**ඒ දවස්වල ඉශ්‍රායෙල්හි රජෙක් නොසිටියේය. එක් එක්කෙනා තම තමාගේ ඇස් හමුයෙහි හරිව තිබුණ දේ කළේය (විනිශ්චයකාරයා 17:6).**

විනිශ්චයකාරයාගේ පොත ඉශ්‍රායෙල්හි මෙම අඳුරු යුගය වාර්තා කරයි. මනුෂ්‍යයෝ නැවත නැවතත් පව් කළෝය. දෙවියන්වහන්සේගේ විනිශ්චය අත් දුටුවෝය. මිදීම සඳහා නැවත දෙවියන්වහන්සේ වෙතට හැරී ආවෝය. එම සෑම අවස්ථාවකම දෙවියන්වහන්සේ ඔවුන් මුදාගැනීම සඳහා භක්තිවන්ත විනිශ්චයකරුවෙකු (දේවභක්තික නායකයෙකු) එසවූ සේක.

## පසුබිම

මෙම පොතෙහි ඇතුළත් සිදුවීම් ස්ථාන දෙකකදී සිදුවිය.
නයෝමි සහ ඇගේ පවුල ඉශ්‍රායෙල්හි පැවති සාගතයෙන් මිදීම පිණිස පිටත්ව ගියාවූ මෝවබ් දේශය (1 වෙනි පරිච්ඡේදයෙහි 1-18 දක්වා පද).

කතාවෙහි වැඩි කොටස සිදුවූයේ ඉශ්‍රායෙල්හි බෙතේලෙහෙමේදීය. (1:19-22 සිට 4 පරිච්ඡේදය දක්වා)

## ලියන ලද්දේ කවුරුන් උදෙසා ද

මෙම පොත ඉශ්‍රායෙල්වරු සඳහා ඉශ්‍රායෙල් ඉතිහාසයෙහි කොටසක් ලෙස වාර්තාගත කරන ලද්දකි. එසේම එය යේසුස් ක්‍රිස්තුස් නම් මිදුම්කරුගේ (ළග ලේ නෑයා) සම්බන්ධතාවය විස්තර කරදීම උදෙසා සියලු ඇදහිලිවතුන් උදෙසා ලියන ලද්දකි.

## චරිත

රූත් පොතෙහි ඇතුලත් ප්‍රධාන චරිත වනුයේ:

**නයෝමි :** ඉශ්‍රායෙල්හි පැවති සාගතයෙන් බේරීම සඳහා තම පුරුෂයා සහ පුතුන් දෙදෙනා සමග මෝවබ් දේශයට පැන ගියාවූ ඉශ්‍රායෙල් කාන්තාවකි.

**එලිමෙලෙක් :** මෝවබ් දේශයෙහිදී මිය ගියාවූ, නයෝමිගේ පුරුෂයා

**මාලොන් සහ කිලියොන් :** නයෝමිගේ පුතුන් දෙදෙනා වන අතර ඔව්හු මෝවබ් දේශයෙහිදී මිය ගියෝය.

**ඕර්පා :** මෝවබ් දේශයෙහිම රැඳී සිටීමට තෝරාගත්, නයෝමිගේ මෝවබ් ජාතික ලේලිය.

**රූත් :** නයෝමි සමග ඉශ්‍රායෙල් දේශයට යාමට තෝරාගත්, නයෝමිගේ මෝවබ් ජාතික ලේලිය.

**බෝවස් :** රාහබ් නම් වේශ්‍යාවකගේ පුත්‍රයාය. රූත්ව මුදාගත් ළඟ ලේ නෑයා වූයේ ඔහුය. පසුව ඔහු රූත් විවාහ කරගත්තේය.

**නම සඳහන් නොවූ තවත් ළඟ ලේ නෑයෙක් :** මෙම නම සඳහන් නොවූ ලේ නෑයා හට නයෝමිගේ ඉඩකඩම් බේරා ගැනීමටත්, එසේ කිරීමෙන් රූත්ව තම භාර්යාව කරගැනීමටත් පළමු හිමිකම සහිත වුවද ඔහු එසේ කිරීමට තෝරා නොගත්තේය.

## පරමාර්ථය

රූත් පොතෙහි පරමාර්ථ කිහිපයක් ඇත.

1. එය සියලු මනුෂ්‍යයන් උදෙසා දෙවියන්වහන්සේගේ සැලකීම විදහා දක්වයි. රූත් අන්‍යජාතික මෝවබ් කාන්තාවක් වූ නමුත්, දෙවියන්වහන්සේ මෙම රූමත් ස්ත්‍රිය, යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ බිහිවීමට පාදක වූ පෙළපත ගොඩනඟන පිණිස එම පවුලෙහි කොටසක් බවට පත් කළ සේක. රූත් දාවිත් රජුගේ මිත්තණිය වූ අතර මෙසියස්වහන්සේ එම පරම්පරාවෙන් පැවත එන්නෙක් විය.

මෙය දෙවියන්වහන්සේ තම පවුලට, තම පුත්‍රයාවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ලෙය තුළින් ලොවෙහි වෙසෙන "අන්‍ය ජාති" සෙනඟ පුත්‍රකමට හදාගැනීමට සලස්වන ක්‍රමයෙහි එක් උදාහරණයක් හෝ සංකේතයකි.
**එවිට පේතෘස් තමාගේ මුඛය හැර කථාකොට, සැබවින් දෙවියන්වහන්සේ මනුෂ්‍යයන්ගේ තරාතිරම් නොබලන කෙනෙක්ය. සියලු ජාතීන් අතරේ උන්වහන්සේ කෙරෙහි භය ඇතිව ධර්මිෂ්ඨකම් කරන තැනැත්තේ උන්වහන්සේට ප්‍රසන්න බව සැබවින්ම මට පෙනේ (ක්‍රියා 10:34-35)**

2. එය යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පෙළපත ලේඛනගත කරයි. අවසාන පරිච්ඡේදයේ පවුල් ඉතිහාසය දාවිත් රජ තෙක් පෙන්නුම් කර දෙයි.

3. නයෝමි සහ රූත් අතර පැවති කැපවීමෙහි සම්බන්ධතාවය, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ හා සභාව අතර පැවතිය යුතු කැපවීමෙහි සංකේතයකි.

4. නයෝමිගේ ජීවිතය, දෙවියන්වහන්සේ විසින් යම් කෙනෙකුගේ ජීවිතයෙහි තික්ත අත්දැකීම් රැගෙන එය මිහිරි ලස්සන දෙයකට පරිවර්තනය කරන ලද ආකාරය පිළිබඳ කදිම නිදසුනකි.

5. බෝවස් සහ රූත් අතර සම්බන්ධතාවය, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ හා උන්වහන්සේගේ සභාව අතර මිදීමේ සම්බන්ධතාවය සංකේතවත් කරයි.

## සැකිල්ල

## පළමු පරිච්ඡේදය

### මෝවබ් දේශය කරා ගමන (1:1-2)

රූත් පොතෙහි පළමු පදයෙන් පෙන්වා දෙන සිදුවීම් විනිශ්චයකාරවරුන්ගේ යුගයේදී සිදුවුනාවූ කාරණාය. එසේම පළමු පරිච්ඡේදයෙහි 1-18 පද වල සඳහන් කරුණු මෝවබ් දේශයෙහිදී සිදු විය.

මෝවබ් දේශය පිහිටා තිබුනේ බෙත්ලෙහෙම්හි සිට සැතපුම් 50 ක් පමණ ඔබ්බෙන් මළ මුහුදට ඉදිරි දිගාවෙහිය. ඉශ්‍රායෙල්හි පැවති සාගතයෙන් බේරීම උදෙසා එලිමෙලෙක් තම භාර්යාවවූ නයෝමි සහ තම පුතුන් දෙදෙනා ද කැටුව එම ප්‍රදේශයට පිටත්ව ගියේය.

ඉශ්‍රායෙල්වරු දෙවියන්වහන්සේට එරෙහිව පව් කොට අන් දෙවිවරු නමස්කාර කළ අවස්ථාවලදී පැරණි ගිවිසුමෙහි දෙවියන්වහන්සේ දඬුවම් කිරීමට භාවිත කළ එක් ක්‍රමයක් නම් දේශයට සාගතය එවීමය (2 රාජා. 8:1, යෙරෙමියා 16:3-13 සහ එසකියෙල් 5:11-17 බලන්න).

එලිමෙලෙක් මෝවබ් දේශයට නොයා යුතු විය, මන්ද එය ඔහු දෙවියන්වහන්සේගේ නිවැරදි කිරීමෙන් පලායාමක් විය. සාගත කාලයේ වුව දෙවියන්වහන්සේගේ දේශය, මෝවබ් දේශයෙහි සශ්‍රිකකමට වඩා යහපත්ය. මෝවබ්හි ජනතාව කෙමොෂ් නම් දෙවි කෙනෙකුට නමස්කාර කළ අතර ඔව්හු තම දරුවන් බිලි පූජා ලෙස ඔප්පු කරමින් එම දෙවියාට ගරු කළහ (විනිශ්චයකාරයා 11:24 බලන්න).

### මෝවබ්හි සිදුවූ විපත (1:3-5)

මෝවබ් දේශයෙහි සිටින අතර නයෝමිගේ පුරුෂයාවූ එලිමෙලෙක් මිය ගියේය. ඔහුගේ පුතුන් දෙදෙනා මෝවබ් ස්ත්‍රීන් වන රූත් සහ ඕර්පා සමග විවාහ විය. දෙවියන්වහන්සේ යුදෙව්වරු හට මෝවබ්වරුන් හා විවාහවීම තහනම් කොට තිබුණි (ද්විතිය කථාව 7:3, නෙහෙමියා 13:23, 25). නැවතත් මෙම පවුල වෙත විපත ළඟාවී නයෝමිගේ පුත්තු දෙදෙනා ද මිය ගියහ. (මාලොන් යන නමෙහි අර්ථය "රෝගී" වීම සහ කිලියොන් හි අර්ථය "ඇමිනීම" බැවින් ඔව්හු දෙදෙන නිතරම රෝගීව සිටින්නට ඇත).

## බෙතේලෙහෙමට නැවත හැරී ඒම (1:6-18)

ඉශ්‍රායෙල්හි සාගතය අවසන් වූ පසුව නයෝමි නැවතත් බෙත්ලෙහෙමට හැරී ඒමට තීරණය කළහ. ඇය තම යෙහෙළියන් දෙදෙනා වන ඕර්පා සහ රූත්ට මෝවබ් දේශයෙහිම රැඳී සිටින මෙන් දිරි ගැන්වූවාය. ඇය ඔවුනට ලබාදුන් තීරණය සැබවින්ම ආත්මික වූ තීරණයකි. ඔව්හු සතුටු නම් ඔවුනට තම මෝවබ් දේශයෙහිම රැඳී සිටිමින් තම ජනතාව සමග ජීවත්වී එම දෙවිවරුන්ට සේවය කළ හැකි විය. නයෝමි තම යෙහෙළියන් දෙදෙනා ඇයට දැරූ නැකම මත හෝ වෙන කිසියම් හේතුවක් මත ඇය සමග ඒමට අකමැතිවූ අතර එය දෙවියන්වහන්සේ උදෙසා යන්නාවූ ආත්මික තීරණයක් මත සිදු විය යුතු විය.

රූත් සහ ඕර්පා තම ජනතාව සමග රැඳී සිටියහොත් ඔවුනට නැවත විවාහවීමට ද අවස්ථාවක් ඇති බව නයෝමි පෙන්වා දුන්නාය. ඔබ දෙවියන්වහන්සේගේ මාර්ගයෙහි ගියහොත් ඔබහට අනාගතයක් නොමැතිවාක් මෙන් පෙනෙන්ට පුළුවනි. නමුත් අවස්ථාවන් අල්ප වූ දෙවියන්වහන්සේගේ මාර්ගය රූත් තෝරාගත් බැවින් ඇයට දෙවියන්වහන්සේ ආශිර්වාද කළ ආකාරය ඔබ දකිනු ඇත.

ඕර්පා මෝවබ් දේශයෙහිම රැඳී සිටීමට උනන්දු කරවන ලද අතර ඇය නයෝමිව සිප වැළඳගෙන ඇගෙන් සමු ගත්තාය. බොහෝ මනුෂ්‍යයන් යේසුස් ක්‍රිස්තුස්වහන්සේට ප්‍රේම කරන නමුත් තම පැරණි ජීවිතය අත්හැරීමට නොහැකි බැවින් ගැළවීම කරා ළඟා නොවෙති. ඔව්හු ඕර්පා මෙන් ලෝකයෙහි සැනසුම සොයමින් නැවත හැරී යති.

නයෝමි, රූත්හට තම යෙහෙළිය වූ ඕර්පා සමග නැවත හැරී යාමට අවසරය හා අවස්ථාව දුන්නාය. නමුත් රූත් තම නැන්දම්මාට සහ ඇගේ දෙවියන්වහන්සේට තමා තුළ වූ අනගි කැපවීම පොරොන්දු වෙමින් නැන්දම්මා සමගම රැඳී සිටියාය. 18 පදයෙහි රූත්ගේ පැරණි ජීවිතයට දොරගුලු දැමූ එය වසා ලූ නිගමනය වාර්තා කරයි. යේසුස්වහන්සේ කෙරෙහි සැබෑවූ කැපවීම ඔබගේ පැරණි ජීවිතයෙහි දොර වසා දැමීමක් අපේක්ෂා කරයි.

ඔබ යේසුස්වහන්සේ සමග ඇති සම්බන්ධතාවයෙහි අඩයාලමක් ලෙසට රූත්ගේ කැපවීමෙහි පැවති මූලිකාංග කිහිපයක් සලකා බලන්න.

1. **පිළිගැනීම** : ඇය නයෝමිගේ මාර්ගය පිළිගත්තාය. ඇය නයෝමි සමග යනු ඇත. යේසුස්වහන්සේ වෙත කැපවීමෙහි පළමුවන පියවර නම්, යේසුස්වහන්සේගේ ගැළවීමේ මාර්ගය පිළිගැනීමය.

2. **පැවතීම** : ඇය නයෝමි සමග වාසය කොට, එහි පදිංචි වී ස්ථායි තත්වයකට පත් වනු ඇත. ඔබ යේසුස්වහන්සේ පිළිගැනීමෙන් පසුව, ඔබගේ සම්බන්ධතාවයෙහි ස්ථායි තත්වයට වර්ධනය විය යුතුයි.

3. **හැඩගැසීම** : රූත් නයෝමි සමග ඇගේ ජනතාව, ප්‍රතිපත්ති හිමි තැන හා ගැටලු පිළිබඳව සම මට්ටමකට හැඩ ගැසුණි.

   *ජනතාව* : දෙවියන්වහන්සේගේ ජනතාව සමග ඇදහිලිවන්තයෝ එකට සිටගත යුතු ලෙසම රූත් නයෝමිගේ ජනතාව සමග එකට සිටගත්තේය. .

   *ප්‍රතිපත්ති :* ඇය නයෝමිගේ ප්‍රතිපත්ති, එනම් ඇගේ දෙවියන්වහන්සේ කෙරෙහි ඇදහිල්ල හා ප්‍රතිපත්ති සම්පාදනය වී ඇති දේව පදනම ඇය පිළිගෙන එයට හැඩ ගැසුණාය. ඇදහිලිවන්තයෙකු ලෙස ඔබ දේව වචනය මත පදනම් වූ ප්‍රතිපත්තිවලට හුරු විය යුතුය.

   *තත්වය :* නයෝමි ජීවත්වන ඕනෑම තැනක රූත්ද ජීවත්වීමට තෝරාගත්තාය. ඔබද එසේම ක්‍රිස්තුස්වහන්සේගේ වැඩය උදෙසා ඕනෑම ස්ථානයක සිටීමට එකඟවිය යුතුය.

   *ගැටලු :* ඇය නයෝමි සමග සෑම කල්හිම, එනම් යහපත් කාලවලදී මෙන්ම අයහපත් කාල වලදීද රැඳී සිටිනු ඇත. මරණයෙහිදී පවා ඇය සමග ජීවත් වනු ඇත. ඔබ යේසුස්වහන්සේ උදෙසා ඇති කැපවීම යහපත් කාලය සඳහා පමණක් සීමාවූ කෙටි කාලීන කැපවීමක් නොව, මරණය දක්වා කැපවීමක් විය යුතුය.

## බෙත්ලෙහෙමට පැමිණීම (1:19-22)

නයෝමි බෙත්ලෙහෙමට පැමිණි කල ඇගේ පැරණි මිතුරන්ට ඇයව හඳුනා ගැනීම පවා අපහසු විය. "මේ නයෝමිනේද?" යැයි ඔව්හු ප්‍රශ්න කළහ. සමහර විට මෝවබ් දේශයෙහි ඇය ගෙවූ දැඩි අපහසු කාල පරිච්ඡේදය ඇයව වියපත් කොට ඇගේ පෙනීම වෙනස් කිරීමට තුඩු දෙන්නට ඇත. බෙත්ලෙහෙමින් පිටත්ව ගිය නයෝමිගේ හැඩරුව සැබවින්ම වෙනස් වී ඇත. වෙනස්කම් සලකා බලන්න.

1. ඇය "මිහිරි" ව පිටත්ව ගොස් "තික්ත" ව හැරී ආවාය. නයෝමි කතාකොට "මට තව දුරටත් 'නායෝමි' - එනම් 'මිහිරි' නොකියා 'මාරා' - එනම් 'තික්තකම' යයි අමතන්න" යි පැවසුවාය.

2. ඇය සම්පූර්ණව පිටව ගොස් හිස්ව නැවත හැරී ආවාය. නයෝමි තමා පත්වූ තත්වය පිළිබඳ සාතන්ට දොස් තැබුවේ නැත. නයෝමි තමා අන්‍ය ජාතික දේශයකට යාමෙන් දෙවියන්වහන්සේ ඇය සමග ගනුදෙනු කරන බව වටහාගත්තාය.

   බොහෝ අවස්ථාවලදී අපි ආත්මිකව වර්ධනය වීමත්, ඉදිරියට යාමත් අත්නොදකිනුයේ දෙවියන්වහන්සේ අපව නිවැරදි කිරීමට තැත් කරන කාරණා අවබෝධකර නොගෙන අපගේ පාපිෂ්ට මාර්ගයෙන් නොහැරී සාතන්ට දොස් තබමින් සිටීම නිසාය. දෙවියන්වහන්සේ පුද්ගලයෙකු හරි ගස්සන පරමාර්ථය හොෂෙයා පොතේ දක්වා තිබේ.

   **වරෙල්ලා, අපි ස්වාමින්වහන්සේ වෙතට හැරීයමු. මක්නිසාද ඉරාදැමුවේ උන්වහන්සේය. උන්වහන්සේ අප සුවකරනවා ඇත. පහරදෙන උන්වහන්සේ අපේ තුවාල බඳිනවා ඇත. (හොෂෙයා 6:1)**

   නිවැරදි කිරීම නයෝමිව නැවත දෙවියන්වහන්සේ වෙතට ළඟා කරවීය. වැඩි කල් නොගොස් නයෝමිගේ තික්තකම පහවී යනු ඇත. ස්වාමින්වහන්සේ ඇයව සුවකොට මුළු මිනිස් සංහතියෙහි මිදීම උදෙසා වන අලංකාර සැලසුමෙහි ඇයද කොටස්කාරියක් බවට පත් කරනු ඇත.

   නයෝමි ස්වාමින්වහන්සේ සඳහා භාවිත කළ වචනය (හෙබ්‍රෙව් භාෂාවෙන් "එල් ෂඩායි") මගින් ඇය තවම දෙවියන්වහන්සේ කෙරෙහි වූ විශ්වාසය නැති කර ගෙන නොමැති බව විදහා දක්වයි. එහි අර්ථය තම දෙවියන්වහන්සේ සෑහේ යන්නය. නයෝමි හිස්ව තික්තව සිටිය නමුත් දෙවියන්වහන්සේ ඇගේ අවශ්‍යතා සැපයීමට සෑහෙන බව ඇය පිළිගත්තාය. ඇය පැවසුවේ, "මම අවශ්‍යතාවයෙන් පෙළෙමි, නමුත් දෙවියන්වහන්සේට සැපයීමට හැකිය" යනුවෙනි.

3. ඇය සාගත කාලයක පිටව ගොස් අස්වැන්නේ කාලයෙහි හැරී ආවාය. මෙම තුන්වන පරස්පර සංසඳනය බැලූ බැල්මට පෙන්නුම් නොවුවත් 22 පදයෙන් එය පෙනී යයි. නයෝමි සාගත කාලයෙහිදී ඉශ්‍රායෙල් රටෙන් පිටව ගියාය. ඇය නැවත පැමිණියේ ශාරීරික මෙන්ම ආත්මික ද වූ අස්වැන්නක් නෙලීම සඳහාය.

# දෙවන පරිච්ඡේදය

## රූත් බෝවස්ගේ කෙතට යාම (1-17)

එකල යෞවනියන්ගේ පිළිගත් රැකියාවක් වූ කෙතෙහි කරල් ඇහිදීමට රූත් ද බෝවස්ගේ කෙතට ගියාය. කුඹුරු අයිතිකරුවනට දෙවියන්වහන්සේ ආඥා කර තිබුණේ, අස්වැන්නෙන් කොටසක් දුප්පතුන් හට අහුලා ගැනීම සඳහා කරල් කපන විට කෙතෙහි අත්හැර දැමිය යුතු බවය.

රූත් කරල් ඇහිදීමට යාමෙන් මූලිකත්වය ගෙන ක්‍රියා කළාය. දෙවියන්වහන්සේ ඔබගේ ජීවිතයෙහි ක්‍රියා කරන පිණිස ඔබ ඔහේ වාඩිවී බලා හිඳිය නොහැකිය. ඔබ දෙවියන්වහන්සේ සමග සහයෝගයෙන් ක්‍රියා කළ යුතුය. රූත් අවශ්‍ය දෙය කළාය. ජීවිතයෙහි එදිනෙදා පැවැත්ම සඳහා අවශ්‍ය කාරණා පවා දෙවියන්වහන්සේගේ මහිමය උදෙසා කරන කල (1 කොරි. 10:31) එය ප්‍රයෝජනවත් වනු ඇත.

ක්‍රිස්තියානි කෙනෙකුගේ ජීවිතයෙහි ඉරණම කියා දෙයක් නොමැත. රූත් කරල් ඇහිඳීම පිණිස නයෝමිගේ ළඟ නෑයෙක් වූ බෝවස්ගේ කුඹුරට යාම ද ඉරණම විසින් සිදු කළ දෙයක් නොවේ. දෙවියන්වහන්සේ ඔබගේ ජීවිතයෙහි ක්‍රියා කරන අතර, ජීවිතයෙහි දිනපතා කාර්යයන්හිදී මෙන්ම අසීරු තත්වයන්වලදී පවා උන්වහන්සේ ඔබට මගපෙන්වනු ඇත. බෝවස් රූත් වෙත කාරුණිකව සලකා බලා අස්වැන්නේ මුළු කාලය පුරාම තම කුඹුරුවල රැඳී සිටීමට ඇයට පැවසුවේය. ආහාර ගැනීමේ අවස්ථාවලදී ඔහු ඇයට විශේෂත්වයක් දැක්විය.

## රූත් නයෝමි වෙත නැවත පැමිණීම (18-23)

රූත් නැවත ගෙදර ඇවිත්, දවසේ සිදුවීම් සියල්ල නයෝමි සමග පැවසුවාය. නයෝමි දෙවියන්වහන්සේගේ හස්තය එහි ක්‍රියාකරනු හඳුනාගත්තාය. බෝවස් ඔවුන්ගේ ළඟ ඥාතියෙක් වූ බැවින් නයෝමි හා රූත් සම්බන්ධයෙන් ව්‍යවස්ථාවෙන් පවරන ලද වගකීමක් ඔහු සතුවිය.

# තුන්වන පරිච්ඡේදය

## නයෝමිගේ සැලැස්ම (1-5)

දෙවියන්වහන්සේගේ හස්තය හඳුනාගත් නයෝමි, රූත් සමග සැලැස්මක් බෙදා ගත්තාය. බෝවස් ඔවුන්ගේ ළඟ ඥාතියෙක් බැවින් නයෝමිට අයිති ඉඩ කඩම් බේරාගැනීමටත්, රූත් විවාහ කර ගැනීමටත්, පවුලේ නම ඉදිරියට ගෙන යාම සඳහා දරුවන් ඇති දැඩි කිරීමටත් වගකීමක් ඔහුට පැවරී තිබුණි (ද්විතිය කථාව 25). බෝවස්ට ප්‍රසිද්ධියේ මහජනතාව ඉදිරියට පමුණුවා රූත්ව නිදහස් කරගන්නා ලෙස බල කරනු වෙනුවට, රූත් රහසින් රාත්‍රියෙහි ඔහු වෙත යාමෙන් ඇයව පිළිගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට අවස්ථාව සපයා දුන්නාය.

## ප්‍රතිඵලය (6-13)

රූත් තමාව "මුදාගන්නා" ලෙස (විවාහ කරගන්නා) බෝවස්ගෙන් ඉල්ලා සිටීම ඇයගේ අයිතිවාසිකමක් විය. බෝවස් එයට කැමති වී වගකීම දැරීමට උනන්දුවිය. එහෙත් තමාට වඩා තම අයිතිවාසිකමට වැඩි හිමිකමක් සහිත තව සමීප ඥාතියෙක් සිටින බවත් ඔහුට පළමු කැමැත්ත අයිති බවත් දැන්වීය. දෙවියන්වහන්සේගේ සැලසුමට අනුව ක්‍රියා කිරීම පමණක් නොසෑහේ. එය උන්වහන්සේගේ ක්‍රමයටද සිදු කළ යුතුය. බෝවස් පළමුවෙන්ම අනෙක් ඥාතියා හමුවී ඔහුට හිමි පළමු අයිතිවාසිකම එනම් රූත් මුදාගැනීමට පවතින නිසි අයිතියේ, අවස්ථාව සපයා දිය යුතුය.
ඔහු රූත්ට කතාකොට, උදෑසන වන තුරු ඔහු සමග සිටීමටත්, ඉන්පසු නිවසට ගොස්, ඔහු කාරණා එකලස් කරන තුරු රැඳී සිටීමටත් උපදෙස් දුන්නේය.

## නයෝමි වෙත නැවත පැමිණීම (14-18)

රූත් නයෝමි වෙත පැමිණ සිදුවූ සියල්ල පැවසුවාය. නයෝමි ඇයට පැවසුයේ, ඉවසීමෙන් සිටින ලෙසය. බෝවස් මෙම කාරණාව සමථයකට පත් කරන තුරු විවේක නොගනු ඇත යයි ඇය පැවසුවාය. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළින් මුළු මිනිස් සංහතිය උදෙසා මිදීම සපයා දෙන තුරු දෙවියන්වහන්සේ නිවාඩු නොගත් සේක. ඔබ තුළ පෞද්ගලිකව මිදීම සිදු වන තුරු, ඔබගේ ජීවිතයෙහි සිදුවීම්, වාතාවරණය සැකසීම දෙවියන්වහන්සේ අත් නොහරිනු ඇත. රූත් නයෝමි වෙත පැමිණියේ හිස් අතින් නොවන බව සටහන් කරගන්න (18 පදය). නයෝමි පළමුවෙනි පරිච්ඡේදයෙහි සඳහන් කළාවූ ඇගේ "හිස්" දවස් අවසාන වීමට ඉතා සමීපය.

# හතරවන පරිච්ඡේදය

## මිදීමේ ක්‍රියාවලිය (1-12)

බෝවස්, නම සඳහන් නොකළ ළඟ ඥාතියා හමුවිය. මෙය සිදුවුයේ නුවර දොරටුව අසලදීය. එකල සියලු ව්‍යාපාරික හා නීතිමය ගනුදෙනු සිදු කරනු ලැබුවේ නුවර වැඩිමහල්ලන් ඉදිරියෙහි නුවර දොරටුව අසලදීය. අනෙක් ඥාතියා රූත්ව මුදාගැනීමට ඇති අයිතිය ප්‍රතික්ෂේප කළේය. එයට හේතුව වුයේ ඔහු නයෝමිගේ ඉඩකඩම් බේරාගැනීමට ඉදිරිපත් වුවහොත් අනිවාර්යයෙන්ම රූත්ව ද විවාහ කරගත යුතුය. ඔවුනට පුතෙකු බිහිවුවහොත් ඔහුගේ ඉඩකඩම්වලින් කොටසක් ඔහුගේ දරුවනට අයිතිවීම වෙනුවට එලිමෙලෙක්ගේ පරම්පරාවට අයිති වනු ඇති බැවිනි.

බෝවස් චාරිත්‍රානුකූලව, සාක්ෂිකරුවන් ඉදිරියෙහි රූත්ව මුදාගත්තේය. ඔහුගේ මුදාගැනීම ක්‍රිස්තුස්වහන්සේ අපව පාපයෙන් මුදාගැනීමේ සංකේතයකි. ව්‍යවස්ථාවට අනුව මිදුම්කරුවීමට තිබිය යුතු සුදුසුකම් නම්:

1. ළඟ ඥාතියෙකු වීම (ද්වි. 25)
2. මුදාගැනීමට කැමති වීම (යොහ. 10:18, යෙසා. 53:7, ගලාති 2:20)
3. මුදාගැනීමට හැකියාව තිබීම (යොහ. 10:11-18)
4. ඔහු නිදහස් කෙනෙකු වීම, යේසුස්වහන්සේ පාපයෙන් තොරව නිදහස්ව සිටී සේක.
5. මිදීමේ මිලය සහිත වීම, එනම් ලේ නෑයෙකු වීම, අප මුදාගෙන ඇත්තේ යේසුස්වහන්සේගේ ලෙය කරණකොටගෙනය (1 පේතෘස් 1:18-19, ලෙවී. 17:11, හෙබ්‍රෙ. 10:4)

බෝවස්, රූත් මුදාගැනීම පිණිස ස්වභාවික ලෙස මෙම සියලු සුදුසුකම් දැරූ ලෙසම යේසුස්වහන්සේ මිනිසාව මුදා ගැනීම සඳහා මෙම සියලු අවශ්‍යතා ආත්මිකව සපුරාලූ සේක.

## රූත් සහ බෝවස් එකතු වීම (13-17)

රූත් සහ බෝවස් විවාහ වී දරුවකු බිහි කළෝය. නයෝමි තවදුරටත් තිත්ත නොවීය. ඇය දැන් ස්වාමින්වහන්සේගෙන් ආශිර්වාද ලද්දියකි. ඇගේ ලේ උරුමය දිගටම පැවති අතර ඉඩකඩම් මුදාගනු ලැබීය. නයෝමි දරුවාට සාත්තු සප්පායම් කළාය. රූත් පොතෙහි අවසාන පරිච්ඡේදයෙහි අවසන් කොටසෙහි ඉස්මතු කර පෙන්වාදෙන්නේ රූත් නොව නයෝමිවය. නයෝමිගේ ජිවිතය අප්‍රසන්න තික්තකමින් ප්‍රසන්න මිහිරි බවට පරිවර්තනය වී ඇත.

ඔබගේ ජිවිතයෙහි වාතාවරණය කුමක්වුවත්, දෙවියන්වහන්සේ ඔබගේ තික්ත බව මිහිරි බවට හැරවීමට කැමැත්තෙන් සිටී. ඔබගේ නම "මාරා" සිට "නයෝමි" බවට පත්කිරීමට කැමති සේක. උන්වහන්සේ ඔබගේ පරිසරයෙහි වාතාවරණයෙහි ක්‍රියාකරමින් ඔබට අහිමි වූ සියල්ල නැවත ලබාදීමට සහ උන්වහන්සේගේ සැලසුමෙහි කොටසක් බවට පත් කර ගැනීමට ක්‍රියා කරන සේක.

## දාවිත්ගේ පරම්පරාව (18-22)

රූත් පොත අවසාන වන්නේ රූත් සහ දාවිත් අතර පවතින ඥාති සම්බන්ධතාවය ඉදිරිපත් කරමිනි. දාවිත් යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මෙසියස් පරම්පරාවට ඥාතිකම දරයි. රූත් පොතෙහි අවසාන සටහන මගින් පෙන්වා දෙන්නේ මිනිස් ජිවිතය ඔහේ ආවට ගියාට ගෙවී යන දෙයක් නොව ඉතිහාසයෙහි දෙවියන්වහන්සේගේ සැලැස්මට හා පරමාර්ථයකට අනුව සිදුවන දෙයක් බවය. ලොවෙහි ජාතීන් වෙත ගැළවීමේ සැලසුම ගෙන දෙන පිණිස දෙවියන්වහන්සේ මිනිසාගේ ජිවිතයේ සිදුවීම්, අවස්ථා හා වාතාවරණ තුළින් ක්‍රියා කරන සේක.

## රූත්ගේ චරිත ගුණාංග

රූත්ගේ පුද්ගලිකත්වය තුළ දැකිය හැකි මනරම් චරිත ගුණාංග කිහිපයක් පවතී. මෙම දෙවියන්වහන්සේගේ කාන්තාව තුළ පැවති අලංකාර ගුණාංග හා ස්වභාවය පිළිබඳව දී ඇති බයිබල් පද ඇසුරින් අධ්‍යයනය කරන්න. චරිත ගුණාංග ඔබ තුළ ද බිහිකරන ලෙස දෙවියන්වහන්සේගෙන් ඉල්ලා සිටින්න.

| බයිබල් පදය | චරිත ගුණාංගය |
|---|---|
| 1:16-17 | ප්‍රේමය, කැපවීම, |
| 1:18 | ස්ථිරබව |
| 2:2 | යටහත්කම (කරල් ඇහිඳීමට), ව්‍යාපාරික<br>ගෞරවණීය (ඇය නයෝමිගෙන් අවසර ඉල්ලයි) |
| 2:14 | පමණ දැන හැසිරීම (අවශ්‍ය ප්‍රමාණය පමණක් කෑවාය) |
| 2:18-19 | ගණන් දීම (ඇගේ වැඩ පිළිබඳව නයෝමිට) |
| 2:23 | විශ්වාසවන්ත |
| 3:5 | කීකරු |
| 3:10 | දෙවියන්වහන්සේගේ ආඥාවට යටහත්වූ (තරුණ පිරිමි නොසොයා, දේව සැලැස්ම සෙවීම, සදාකාලික වටිනාකම්, වස්තුව පිළිබඳ සිතේ දරා නොගෙන) |
| 3:14 | පාපය ලෙස පෙනීම පිළිබඳ සැලකිලිමත් වූ (එළිය වැටෙන්නට පෙර පිටවීම). |
| 3:18 | ඉවසීම (ඇයට කළ හැකි දේ කොට, ප්‍රතිඵල දෙවියන්වහන්සේට භාරදී සිටීම) |

## ස්වයං පරීක්ෂණය

1. පහතින් සපයා ඇති නම් ලයිස්තුව බලන්න. 2 වෙනි ලයිස්තුව කියවා බලන්න. එහි සපයා ඇති තොරතුරු වඩාත්ම හොඳින් ගැළපෙන පුද්ගලයාගේ නම ඉදිරියෙන් ගැළපෙන විස්තරයෙහි අංකය සඳහන් කරන්න. පළමුවැනි ගැළපීම අපි ඔබට නිදර්ශනයක් ලෙස පෙන්වා දී තිබේ.

| | |
|---|---|
| __3__ මාලොන් හා කිලියොන් | 1. තම පවුල සමග මෝවබ් දේශයට ගියාවූ ඉශ්‍රායෙල් ස්ත්‍රියෙකි. |
| _____ නයෝමි | 2. නයෝමිගේ පුරුෂයා, මෝවබ් දේශයේදී මිය ගිය පුද්ගලයෙකි. |
| _____ එලිමෙලෙක් | 3. මෝවබ් දේශයේදී මිය ගියාවූ නයෝමිගේ පුත්‍රයන් දෙදෙනාය. |
| _____ රූත් | 4. රූත්ව මුදාගත්තාවූ ළඟ ඥාතියෙකි. |
| _____ ඕර්පා | 5. මෝවබ් දේශයෙහි රැඳී සිටියාවූ නයෝමිගේ යෙහෙලිය. |
| _____ බෝවස් | 6. නයෝමි සමග ඉශ්‍රායෙලයට හැරී ආවාවූ යෙහෙළිය. |

2. රූත් පොත සඳහා වූ පරමාර්ථ තුනක් නම් කරන්න.
   (1) ________________________________________
   (2) ________________________________________
   (3) ________________________________________

3. රූත් පොතෙහි ඇතුළත් සිදුවීම් ඉශ්‍රායෙල් ඉතිහාසයෙහි කුමන වකවානුවක සිදුවූ කාරණාද?

________________________________________________

________________________________________________

4. මෙම පොතෙහි ඇතුළත් සිදුවීම් සිදුවූ ස්ථාන දෙක මොනවාද?

   ____________________ සහ ____________________

5. රූත් පොත ලියන ලද්දේ කවුරුන් විසින්ද?

________________________________________________

6. ප්‍රධාන පදය කටපාඩමෙන් ලියන්න.

________________________________________________

________________________________________________

________________________________________________

7. පහත සඳහන් ප්‍රකාශන කියවා බලා සත්‍යය නම් “ස” අකුරද අසත්‍ය නම් “අ” අකුරද ප්‍රකාශනය ඉදිරියෙහි සඳහන් කරන්න.

______ අ. ඉශ්‍රායෙල් විනිශ්චය කිරීමට හා හරි ගැස්වීමට දෙවියන්වහන්සේ සාගතය පාවිච්චි කළ සේක.

______ ආ. “නයෝමි” යන්නෙහි අරුත “තික්තකමය”.

______ ඇ. “මාරාහි” අරුත “ප්‍රසන්න-මිහිරිය”.

______ ඈ. රූත් මුදාගැනීමෙහි පළමු අයිතිය බෝවස් හට තිබුණි.

______ ඉ. නම සඳහන් නොකළ ඥාතියා රූත්ව මුදා නොගත්තේ ඔහු රූත්හට අකමැති වූ බැවිනි.

______ ඊ. බෝවස් සහ රූත් අතර සම්බන්ධතාවය, යේසුස්වහන්සේ හා ඇදහිලිවන්තයා අතර සම්බන්ධතාවයෙහි සංකේතයකි.

(මෙම පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ දක්වා ඇත.)

## වැඩිදුර අධ්‍යයනය සඳහා

1. යෝෂුවා 2 වෙනි පරිච්ඡේදයෙහි රාහබ් නම් වේශ්‍යාව පිළිබඳව කතාව කියවා බලන්න. ඉන්පසු හෙබ්‍රෙව් 11:31 බලන්න. මහත් ඇදහිල්ලක් පෙන්නුම් කළාවූ පැරණි ගිවිසුමෙහි අයගේ ලයිස්තුවට පාවුල් ඇයවද ඇතුළත් කොට තිබේ.

   රාහබ් බෝවස්ගේ මව වූවාය. එබැවින් ඇය යේසුස්වහන්සේගේ පරම්පරාවට ඇතුළත් කොට තිබේ. සියලු ජාතීන්ගෙන් (අන්‍ය ජාතික රූත් මෝවබ්වරියකි) හා සියලු පසුබිම්වලින් (රාහබ් වේශ්‍යාවකි) පුද්ගලයන්ට යේසුස්වහන්සේගේ භෞමික පවුලට දෙවියන්වහන්සේ ඇතුලත් කර තැබීම කොතරම් අනගිද?

   ඇදහිලිවන්තයන්ගෙන් සමන්විත ආත්මික පවුලද එවැනිමය. ඔබ කුමන ජාතියකට, කුලයකට, ගෝත්‍රයකට, සංස්කෘතික පසුබිමක කෙනෙක් වුවද, දෙවියන්වහන්සේ කෙරෙහි ඇදහිල්ල, පාපයෙන් පසුතැවීම, සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ඔබගේ පෞද්ගලික ගැළවුම්කරු ලෙස පිළිගැනීම තුළින් ඔබට දේව පවුලෙහි කොටසක් බවට පත්විය හැකිය.

2. රූත් පොතෙහි සඳහන් සිදුවීම් සිදුවූ වකවානුව පිළිබඳ වැඩිපුර තොරතුරු දැනගැනීම සඳහා විනිශ්චයකාරයාගේ පොත කියවා බලන්න. ඉශ්‍රායෙල් ජනතාව අත්විඳි චක්‍රිය හත එනම් පව්කරීම, විනිශ්චය හා මිදීම අත්විදීම සලකා බලන්න. ඔබ අධ්‍යයනය කරන අතරතුර පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න. උදාහරණයක් ලෙස පළමු චක්‍රය අපි ඔබට සමපූර්ණ කොට දන්වා ඇත්තෙමු.

**විනිශ්චයකාරවරුන්ගේ චක්‍රය**

**පළමුවන චක්‍රය** — විනිශ්චයකාරයා 3:7-11

පාපය : රූප නමස්කාරය

දඬුවමේ කාලය : අවුරුදු අටකි

මුදාගත්තාවූ විනිශ්චයකරු : ඔත්නියෙල්

**දෙවන චක්‍රය** — විනිශ්චයකාරයා 3:12-31

පාපය : ____________________

දඬුවම : ____________________

මිදුම්කරු හා විනිශ්චයකරු: ____________________

**තුන්වන චක්‍රය** — විනිශ්චයකාරයා 4,5

පාපය : ____________________

දඬුවම : ____________________

මිදුම්කරු හා විනිශ්චයකරු: ____________________

**හතරවන චක්‍රය** — විනිශ්චයකාරයා 6 - 8:32

පාපය : ____________________

දඬුවම : ____________________

මිදුම්කරු හා විනිශ්චයකරු: ____________________

**පස්වන චක්‍රය** විනිශ්චයකාරයා 8:33-10:5

පාපය :______________________________

දඬුවම :______________________________

මිදුම්කරු හා විනිශ්චයකරු: ______________________________

**හයවන චක්‍රය** විනිශ්චයකාරයා 10:6-12 පරිච්ඡේදය

පාපය : ______________________________

දඬුවම : ______________________________

මිදුම්කරු හා විනිශ්චයකරු:______________________________

**සත්වන චක්‍රය** විනිශ්චයකාරයා 13-16

පාපය :______________________________

දඬුවම :______________________________

මිදුම්කරු හා විනිශ්චයකරු:______________________________

# පස්වන පරිච්ඡේදය

# එස්තර් පොත

**අරමුණ:**

මෙම පරිච්ඡේදය අවසන් කිරීමෙන් පසුව ඔබහට කළ හැකි කරුණු :

- ප්‍රධාන පදය කටපාඩමෙන් ලිවීමට
- එස්තර් පොතෙහි කථාව සාරාංශ කොට දැක්වීමට
- පොතෙහි පරමාර්ථය හඳුනාගැනීමට
- ඔබ උදෙසා දෙවියන්වහන්සේ සතුව විශේෂ සැලැස්මක් ඇති බව හඳුනාගැනීමට.

**ප්‍රධාන පදය**

> **මක්නිසාද, මේ ප්‍රස්තාවේදී නුඹ නිශ්ශබ්දවම සිටියොත් වෙන තැනකින් යුදෙව්වරුන්ට නිදහසත් ගැළවීමත් පැමිණෙනවා ඇත. නුමුත් නුඹ සහ නුඹේ පියවංශය නැතිවන්නේය. නුඹ රාජ්‍යයට පැමිණුනේ මෙවැනි ප්‍රස්තාවක් නිසාම නොවේදැයි දන්නේ කවුදැයි කියා කියන්ට අණ කළේය. (එස්තර් 4:14)**

## හැඳින්වීම

පසුගිය පාඩමෙහිදී ඔබ යුදෙව් ජනතාව අතර ජීවත් වූ අන්‍ය ජාතික කාන්තාව පිළිබඳ රූත්ගේ පොත අධ්‍යයනය කළේය. මෙම පරිච්ඡේදයෙහිදී ඔබ එස්තර් නම් යුදෙව් කාන්තාව අන්‍ය ජාතික රටක රජ බිසව ලෙසට සේවය කළ කතාව ඉගෙන ගනු ඇත. එස්තර් බිසවගේ නමින් ලියවී ඇති මෙම පොතෙහි, මුළු යුදෙව් සංහතිය සමූල ඝාතනය කිරීම සඳහා ඇටවූ උගුලක්, එනම් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ බිහිවීමට නියමිතවූ පෙළපත සහමුලින් විනාශ කිරීමේ උගුලක් පිළිබඳව පවසයි.

එස්තර් පොතෙහි දෙවියන්වහන්සේ, නමින් සඳහන් කර නොමැති වුවත්, උන්වහන්සේ තම ජනතාවගේ කාරණ සම්බන්ධයෙන් දක්වන සැලකිල්ල සහ තම දිව්‍යමය පරමාර්ථය ඉෂ්ට කිරීමට දක්වන උනන්දුව සියලු සිදුවීම් තුළින් විදහා දක්වයි. එසේම දෙවියන්වහන්සේගේ සැලැස්මෙහි අප එක් එක්කෙනා හට ඇත්තාවූ විශේෂ කොටස එහි පෙන්වා දෙයි. මෙම අධ්‍යයනය තවදුරටත් ඉදිරියට ගෙනයාමට පෙර, එස්තර් පොත කියවන්න.

## නම

මෙම පොත එහි ප්‍රධාන චරිතය වන එස්තර්ගේ නමින් නම් කොට ඇත. මුලිකව හෙබ්‍රෙව් බසින් ඇගේ නම හදස්සා විය. ඇගේ නමෙහි අර්ථය නම් "පෙරදිග තරුව" යන්නය.

## කර්තෘ

මෙම පොතෙහි කර්තෘ නොදනියි.

## කාලය

පවතින සාක්ෂි මත, එස්තර් පොතෙහි කතාව හා සිදුවීම් ගැළපෙන්නේ සාමාන්‍ය ඉතිහාසයෙහි සර්ක්සීස් නමින් හඳුන්වන රජුගේ රජකම් කිරීමෙහි කාලයටය. එස්තර් පොතෙහි මෙම රජුට භාවිත කර ඇති නම ග්‍රීක සර්ක්සීස් හි හෙබ්‍රෙව් නාමය වන අහස්වේරොෂ්ය. බලකොටුවෙහි විස්තර, සමාජ චාරිත්‍ර චාරිත්‍ර, කාරණ හැසිරවූ අන්දම යනාදිය සලකා බැලීමේදී එය ක්‍රි.පූ. 473 දී රජකම් කළ සර්ක්සීස් රජ සමයේ ඉතිහාසයට මනාව ගැළපෙයි.

## පසුබිම

මෙහි පසුබිම බබිලෝනියේ සිට නැගෙනහිරට සැතපුම් 150 ක් පමණ ඈතින් පිහිටි ඒලම් නම් ප්‍රදේශයෙහි පිහිටි ෂූෂන් මාලිගාවෙහි සිදුවිය. එස්තර්ගේ කාල වකවානුවෙහි යුදෙව්වෝ මිලියන දෙකක් තුනක් පමණ එහි ජීවත්වූවෝය.

## ලියන ලද්දේ කාටද?

මෙම පොත මුළු පර්සියාව පුරා විසිරී සිටි යුදෙව්වන් සහ පලස්තීනයෙහි විසූ යුදෙව්වන් හට දෙවියන්වහන්සේ ඔවුන්ව මරණයෙන් බේරාගත් ආකාරය පිළිබඳව පැවසීමට ලියන ලද්දක් විය හැකිය. කිතුබැතියා හට මෙයින් දෙවියන්වහන්සේ තම ජනතාව උදෙසා මැදිහත් වන ආකාරය පෙන්වා දෙයි.

## ප්‍රධාන චරිත

**අහස්වේරොෂ් :** ඉන්දියාවේ සිට ඉතියෝපියාව දක්වා රාජ්‍ය ප්‍රාන්ත 127 ක රජකම් කළ රජතුමා.

**වස්ති :** රජුගේ ආඥාවට අකීකරු වීම හේතුවෙන් රැජිණ තනතුර අහිමි වූ බිසව.

**එස්තර් :** නව රැජිණි, හෙබ්‍රෙව් ජාතික කාන්තාව

**මොර්දෙකයි :** එස්තර්ගේ ඥාති සොහොයුරා, කුඩා කල පටන් එස්තර්ව හදා වඩාගත් පුද්ගලයා.

**හාමාන් :** යුදෙව්වරු සමූල ඝාතනය කිරීමට උපාය යෙදූ සතුරා.

## පරමාර්ථය

එස්තර් පොතෙහි පරමාර්ථයන්:

1. යුදෙව් ඉතිහාසයෙහි වැදගත් වූ එක් කතා මාලාවක් එනම් පර්සියාවේ සහ පලස්තීනයෙහි විසූ යුදෙව්වන් බේරාගැනීමට දෙවියන්වහන්සේ මැදිහත් වූ ආකාරය විදහා පාන සිද්ධියක් එස්තර් පොතෙහි ඇතුළත් වේ.

2. දෙවියන්වහන්සේ තම ජනතාව උදෙසා ක්‍රියාකරන අන්දම එහි විදහා දක්වයි. දෙවියන්වහන්සේ තම කැමැත්ත ඉටු කරන පිණිස මනුෂ්‍යයාගේ ජීවිතයෙහි සිදුවීම් අතරට මැදිහත් වී නියමිත ස්ථානයෙහි නියමිත පුද්ගලයා නියමිත කාලයෙහි තැබීමෙන් උන්වහන්සේගේ රාජ්‍යය ඉදිරියට ගෙන යන සේක.

## සැකිල්ල

## පළමු පරිච්ඡේදය

### මහත් මංගල්‍යය කෑම (1-9) :

අහස්වේරොෂ් රජ තම රාජ්‍යයෙහි ප්‍රාන්ත රජවරු හා රාජ්‍ය සේවකයන් සඳහා දින 180 ක් පුරා රාජ්‍ය මංගල්‍යයක් පැවැත්විය. ඒ අතර වස්ති අග බිසව ඇගේ මාලිගයෙහි ස්ත්‍රීන් සඳහා වෙනම මංගල්‍යයක් පැවැත්වූවාය.

### නිවසෙහි ගැටලුවක් (10-12) :

මංගල්‍යයෙහි සත්වන දින රජතුමා වස්ති බිසවට පැමිණ ඔහුගේ මිතුරන් ඉදිරියෙහි ඇගේ රූපශ්‍රීය පෙන්වීමට ආරාධනා කළේය. ඇය එතුමාගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කළ බැවින් රජ උදහස් විය.

**රාජකීය ආඥාව (13-22) :**

රාජකීය පුරෝහිතයෝ වස්ති බිසව රැජිණකමින් ඉවත්කොට, එම තනතුර වෙන කෙනෙකුට දෙන ලෙස රජතුමාට උපදෙස් දුන්නෝය.

## දෙවන පරිච්ඡේදය

**නව රැජිණක් සෙවීම (1-4) :**

රජතුමා අලුත් බිසවක් සෙවීම ඇරඹීය. මුළු රාජ්‍යය පුරා සිටි ශෝභන යෞවනියන් තෝරා එතුමාගේ පරීක්ෂාව සඳහා සූදානම් කරනු ලැබීය.

**එස්තර් තරගයට ඇතුල්වීම (5-11) :**

මොර්දෙකයි නම් යුදෙව් මනුෂ්‍යයෙක් තමාගේ බාප්පාගේ දුව වන එස්තර් නම් අනාථ දැරිය කුඩා කල පටන් හදා වඩා ගත්තාය. එස්තර් රැජිණ බවට පත්වීම සඳහා පැවති තරඟයට ඇතුළත් වූවාය. රජ මාලිගාවේ සිටින අයට ඇය යුදෙව් කාන්තාවක් බව නොකියන ලෙසට මොර්දෙකයි ඇයට උපදෙස් දුන්නේය. ඉන්පසු සිදුවන දෙය බලා සිටියේය.

**එස්තර් රජ බිසව ලෙස තෝරාගනු ලැබීය (12-21) :**

රජ බිසව සඳහා පැවති තරඟයට එක් එක් යෞවනිය රජතුමා ඉදිරියෙහි පෙනී සිටිය යුතු විය. එස්තර්ගේ වාරය පැමිණි විට රජතුමා ඇයව තෝරාගත් අතර, ඇයට ගරු කිරීම සඳහා විශේෂ මංගල්‍යයක් ද පවත්වන ලදී.

**රජුට එරෙහි කුමන්ත්‍රණය (22-23) :**

බිග්තාන් හා කෝරෙෂ් නම් පුද්ගලයන් දෙදෙනා රජ මැරීමට කුමන්ත්‍රණය කළෝය. මොර්දෙකයි මෙම සැලසුම එස්තර්ට දැන්වූ අතර එස්තර් එය රජතුමාට දැන්වූවාය. එම මිනිස්සු දෙදෙනා එල්ලා මරනු ලැබූහ.

## තුන්වන පරිච්ඡේදය

**හාමාන් උසස් කරනු ලැබීම (1-6) :**

අහස්වේරොෂ් රජ තමාගේ එක් සේවකයෙක් වූ හාමාන් උසස්කොට ඔහු අනෙකුත් සියලු අධිපතීන්ට ඉහළින් තනතුරට පත් කළේය. සියලු ජනතාව ඔහුට ගෞරව දැක්වූ නමුත් මොර්දෙකයි පමණක් ගරු බුහුමන් නොදැක්වීය. මේ පිළිබඳව හාමාන් කෝපවිය.

**හාමාන්ගේ උපාය (7-15) :**

මොර්දෙකයි යුදෙව්වෙක් බව දැනගත් හාමාන්, රජතුමා වෙත ගොස් රජතුමාව එකඟ කරවා ගනිමින්, නියමිත එක් දිනකදී සියලු යුදෙව්වරු විනාශ කර දැමීමට නියෝගයක් නිකුත් කිරීමට ඉල්ලා සිටියෝය. රජතුමා එම නියෝගයට අත්සන් කළ අතර එය මුළු රාජ්‍යය පුරා නිකුත් කරන ලදී.

## හතරවන පරිච්ඡේදය

**යුදෙව්වන්ගේ මහත් වැලපීම (1-11) :**

මෙම භයාංකර නියෝගය යුදෙව්වන් වෙත පැමිණි කල, ඔව්හු මහත් හඬින් වැලපීමට පටන්ගත්තෝය. මොර්දෙකයි ගෝනි රෙදි ඇඳගෙන අළු තවරා ගත්තේය. ඒ කාලයේ යමෙක් ශෝකයෙන් වැලපෙන කල එය දැක්වීමට මෙසේ කිරීම සිරිත විය.

## එස්තර්ට ආරංචිය ඇසීමට ලැබීම (9-12) :

රජ වාසලෙහි ආරක්ෂිතව සිටි එස්තර් මෙම අලුත් නියෝගය පිළිබඳව දැන නොසිටියාය. මෝර්දෙකයි ගෝනි රෙදි ඇඳ අළු තවරාගෙන සිටින බව දැනගන්නට ලැබීමෙන් ඇය මෝර්දෙකයි වෙත ඇඳුම් යැව්වාය. ඔහු එම වස්ත්‍ර ප්‍රතික්ෂේප කොට ආඥාවෙහි පිටපතක් ඇය වෙත යැව්වේය.

## මිදීම සඳහා සැලසුම (10-17) :

එස්තර් සහ මෝර්දෙකයි එකතුව මිදීම සඳහා සැලසුමක් සැදුවෝය. යුදෙව්වෝ එස්තර් උදෙසා නිරාහාරව සිට යාච්ඤා කළ යුතු විය. ඇය තම ජනතාව උදෙසා උපකාර පැතීමට රජ වෙත යනු ඇත.

රජතුමා  තම අභියසට පැමිණෙන ලෙස ආරාධනාවකින් තොරව රජ හමුවීමට යාමෙන් මරණය පවා හිමි විය හැකි නමුත් එස්තර් එම මිළය ගෙවීමට සූදානම් වූවාය. “මා නැසුණොත්, නැසුණාවේ” යි ඇය පැවසුවාය.

එස්තර් පොතෙහි ප්‍රධාන පදය වන 4:14 හි වැදගත් සත්‍යයක් ඉදිරිපත් කරයි. මිදීම උදෙසා දෙවියන්වහන්සේ සතුව සැලැස්මක් විය. එස්තර් තමාට හිමි කාර්යභාරය ඉටු නොකළහොත්, යුදෙව්වරුන්ට ගැළවීම වෙන කිසියම් මාධ්‍යයකින් පැමිණෙනු ඇත.

දෙවියන්වහන්සේගේ සම්පූර්ණ සැලැස්මෙහි මුළු ලොව වෙත ශුභාරංචිය ගෙන යාමට අප එක් එක් පුද්ගලයා උදෙසා විශේෂ සැලැස්මක් පවතී. උන්වහන්සේගේ ආශාව නම්, ඔබගේ ස්ථානය සොයාගෙන උන්වහන්සේගේ කැමැත්ත ඉටු කිරීමය. දේව රාජ්‍යයෙහි ඔබට නියමිත ස්ථානය ඔබ සොයා නොගතහොත්, දෙවියන්වහන්සේ තම සැලැස්ම ඉදිරියට ගෙන යන අතර, මිදීම වෙනයම් මාධ්‍යයක් තුළින් ක්‍රියාත්මක වනු ඇත.

එස්තර් මෙන්ම ඔබද දෙවියන්වහන්සේගේ රාජ්‍යයට විශේෂ පරමාර්ථයක් සහිතව ඇතුළු වී සිටී. ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයෙහි ඔබට හිමි ස්ථානය හා කාර්යභාරය මැනවින් හඳුනාගැනීම වැදගත් වනුයේ එබැවිනි.

# පස්වැනි පරිච්ඡේදය

## මංගල්‍යය කෑමක් සඳහා ආරාධනාව (1-8) :

එස්තර් රජතුමා ඉදිරියට පැමිණි අතර රජතුමා ඇයව පිළිගත්තේය. ඇය රජතුමා සහ හාමාන් හට කෑමකට ආරාධනා කළාය. එදින මංගල්‍යය කෑමේදී ඊළඟ දින පැවැත්වීමට යන විශේෂ මංගල්‍යය කෑමකට ඇය ඔවුන් දෙදෙනාට ආරාධනා කළාය.

## හාමාන්ගේ උඩඟුකම (9-14) :

හාමාන් රැජිණියගේ අභිමුඛයෙන් පිටත්ව ගොස් ඔහුගේ සියලු මිතුරන් සමග ඔහුට ලැබුණාවූ ආරාධනාව පිළිබඳ පුරසාරම් දෙඩුවේය. එහෙත් මෙම උසස් ගෞරවය පවා ඔහුට ප්‍රීතිය ගෙන නොදුන්නේ මෝර්දෙකයි තවමත් ඔහුට හිස නමා ගෞරව නොදැක්වූ බැවිනි. එනිසා හාමාන්ගේ භාර්යාව හා යහළුවෝ ඔහුට යෝජනා කළේ එල්ලුම් ගසක් සාදා මෝර්දෙකයි එහි එල්ලන ලෙසටය. හාමාන් එයට සතුටුවී එල්ලුම් ගසක් සැදුවේය (එල්ලුම්ගසක් යනු උස, ලියෙන් සාදන ලද ආකෘතියකි. එහි කඹයක් මගින් මිනිසුන් එල්ලා මරා දැමීම සිදු කෙරේ).

# හයවන පරිච්ඡේදය

## මෝර්දෙකයි උසස්කරනු ලැබීම (1-14) :

එදින රජුට නින්ද නොයන කැලඹිලි රාත්‍රියක් විය. එබැවින් රජු ගබඩාවෙහි වාර්තා නැවත බලමින් සිටි අතර මෝර්දෙකයි විසින් රජුගේ ජීවිතයට එරෙහිව තිබූ කුමන්ත්‍රණයකින් රජගේ ජීවිතය

බේරාගැනීම සම්බන්ධයෙන්වූ වාර්තාව ගැන දැනගන්නට විය. මෙම යහපත් ක්‍රියාව සඳහා මොර්දෙකයි හට ලබාදුන් ත්‍යාගය කුමක්දැයි රජ විමසූ විට කිසිම ත්‍යාගයක් ඔහුට සපයා දී නොමැති බව දැනගත්තේය.

## හාමාන් පහත හෙලනු ලැබීම (12-14) :

මේ අතරතුර හාමාන් විසින් මොර්දෙකයි එල්ලා මැරීමට අවසර පතන පිණිස රජ මාලිගයට පැමිණෙමින් සිටියේය. ඔහු රජුට කතාකිරීමට පෙර රජතුමා කතාකොට මොර්දෙකයි රාජ්‍යය උදෙසා කළ යහපත් කම පිණිස ඔහුව ගෞරවයට පමුණුවන්නැයි කීවේය. හාමාන් අකමැත්තෙන් රාජ අණ ඉටු කළේය. තමාගේ සතුරාව ගෞරවයට පත් කිරීම පිළිබඳ ඔහු සිත්තැවුලෙන් පසු විය.

# හත්වන පරිච්ඡේදය

## එස්තර්ගේ මංගල්‍යය (1-6) :

එස්තර් විශේෂ මංගල්‍යයක් පවත්වා රාත්‍රි භෝජන සංග්‍රහය අතරතුර ඇගේ සැබෑ අනන්‍යතාවය සහ හමාන් විසින් ඇයව සහ යුදෙව්වන්ව මැරීමට කර ඇති උපාය රජුට එළි කළාය.

## හාමාන්ට දඬුවම් කිරීම (7-10) :

රජතුමා විසින් හාමාන්ව මොර්දෙකයි උදෙසා සෑදූ එල්ලුම් ගසෙහි එල්ලා මරණ ලෙස නියෝග කළේය.

# අටවන පරිච්ඡේදය

## රජුගෙන් අලුත් ආඥාවක් (1-14):

එස්තර් බිසව තම ජාතියේ සෙනඟ බේරාගැනීම සඳහා නියෝගයක් නිකුත් කරන මෙන් රජුගෙන් අයැද සිටියාය. රජතුමා යුදෙව්වන්ගේ මිදීම සඳහා නියෝගයක් නිකුත් කර හැරියේය.

## මොර්දෙකයි උසස්කරනු ලැබීම (15-17):

මොර්දෙකයි රජ වෙතින් අමතර ගෞරවය ලැබුවේය. මුළු රාජධානිය පුරා යුදෙව්වන් ප්‍රීතිවීමටත්, මංගල්‍යය පැවැත්වීමටත් යෙදුනාහ. කලින් යුදෙව්වන් විනාශ කිරීම සඳහා දුන්නාවූ නියෝගය මනුෂ්‍යයා වෙත පාපය මගින් ගෙන ආ මරණයෙහි සංකේතයක් වැනිය. බයිබලයෙහි වාර්තාකරනුයේ "පව්කරන ප්‍රාණය, මරණයට පත්විය යුතුය" යනුවෙනි.

දෙවෙනි වර නිකුත් කළ නියමය මරණය වෙනුවට ජීවනය ගෙන දුනි. එය ක්‍රිස්තුස්වහන්සේගේ පැමිණීම හේතුකොටගෙන පාපිෂ්ට මිනිසා වෙත ජීවනය ගෙන දීම වැනිය. එමගින් පාපයට දඬුවම වූ මරණය අවලංගු නොවන අතර, අහස්වේරොෂ් රජ නිකුත් කළ අණ මගින් ගැළවීමට මාර්ගයක් සපයා දුන් ලෙසම මිනිසාට ගැළවීමට මාර්ගයක්ද සපයා දෙයි.

# නමවන පරිච්ඡේදය

## යුදෙව්වන්ගේ මිදීම (1-11) :

යුදෙව්වන් මරණයෙන් මුදා ගනු ලැබීය. රජුගේ අවසරයෙන් යුතුව ඔව්හු තම සතුරන්ට එරෙහිව සටන් කොට ජයගත්හ.

## හාමාන්ගේ නිවස විනාශ කර දැමීම (12-16) :

යුදෙව්වරු වෙත අවසාන මිදීම අත්පත් වූයේ ඔවුන්ගේ සතුරා වූ හාමාන්ද ඔහුගේ පවුලේ සියලු දෙනාද විනාශ කර දැමූ පසුවය.

## පූරිම් මංගල්‍යය (17-32) :

යුදෙව්වරුන්ගේ මිදීම සැමරීම සඳහා විශේෂ මංගල්‍යයක් වේ. සෑම වසරකම එම දිනය සැමරීම සඳහා මංගල්‍යයක් නියම කරන ලදි.

## දහවෙනි පරිච්ජේදය

මෝර්දෙකයි රජ සමග සේවය කිරීමට තෝරාගත් අතර ඔහු තම ජාතිය සහ තම ජාතියේ කටයුතු නියෝජනය කළේය. මෝර්දෙකයි සහ හාමාන් බලය නිසි ලෙස පාවිච්චි කිරීමේ හා අනිසි භාවිතයෙහි කදිම ප්‍රතිවිරුද්ධ නිදර්ශන පෙන්වා දෙයි. එක් අයෙක් තමා සතු නිලය මනුෂ්‍යයන්ට උපකාර කිරීමටත් අනෙක් පුද්ගලයා එය විනාශ කිරීමටත් භාවිත කළෝය.

## එස්තර් සතුවූ චරිත ගුණාංග

එස්තර් අගනා චරිත ගුණාංග කිහිපයක් ඇගේ ජීවිතයෙන් පෙන්නුම් කළාය. පහතින් සඳහන් පද අධ්‍යයනය කරන්න. මෙම ගුණාංග කිහිපයක් ඔබගේ ජිවිතයට ද ඇතුලත් කරන මෙන් දෙවියන්වහන්සේගෙන් ඉල්ලා සිටින්න.

| **බයිබල් පදය** | **ගුණාංග** |
|---|---|
| 2:15 | අලංකාර සහ නිහතමානි |
| 2:9-17, 5:1-3 | ශෝභන ප්‍රසන්න |
| 2:10 | කීකරු |
| 2:15 | තමා අවට සිටියවුන් සමග හොඳින් හැසිරීම |
| 2:22 | තමාගේම කාරණ පමණක් නොසොයන (මෝර්දෙකයිගේ නමින් කුමන්ත්‍රණය හෙළිකිරීම, ඒ සඳහා ඇය ගෞරවය නොසොයා) |
| 4:16 | යටහත් |
| 4:16, 7:6 | ධෛර්යවත් |
| 2:22, 8:1-2, 7:3-4 | පක්ෂපාති |

## වැදගත් පාඩමක්

එස්තර් පොතෙහි ඇති එක් වැදගත් පාඩමක් නම්, දුෂ්ටයෝ සඵලවත් වනවා මෙන් පෙනන්නට ලැබුණද, අවසානයෙහි දෙවියන්වහන්සේගේ ජනතාව ජයගනු ඇත.

දාවිත් මේ බව ගීතාවලියෙහි පවසයි. එක් ආකාරයකින් දාවිත් එස්තර් පොතෙහි එක් සංකල්පයක් සාරාංශ කොට දක්වා තිබේ.

> **දුෂ්ටයා ඉතා බලවත්ව ජන්ම භූමියෙහි වැවෙන අමු ගසක් මෙන් විශාලවෙනවා දුටිමි. එහෙත් යමෙක් ළඟින් ගිය කල, බලව ඔහු එහි නැත. එසේය, ඔහු සෙවුවෙමි. නුමුත් මට සම්බ නොවීය.**
> **නිර්දෝෂ තැනැත්තා කල්පනාකොට අවංක තැනැත්තා බලාගනුව. මක්නිසාද ඒ මනුෂ්‍යයාගේ අනාගතය සමාදානය වේ.**
> **අපරාධකාරයෝ එකට විනාශකරනු ලබන්නෝය. දුෂ්ටයන්ගේ දිවි කෙළවර සිඳිනු ලබන්නේය.**
> **නුමුත් ධර්මිෂ්ඨයන්ගේ ගැළවීම ස්වාමින්වහන්සේගෙන්ය. විපත්ති කාලයේදී උන්වහන්සේ ඔවුන්ගේ බලකොටුව වන සේක.**
> **ස්වාමින්වහන්සේ ඔවුන්ට පිහිටව, ඔවුන් මුදන සේක. ඔවුන් උන්වහන්සේ සරණගත් නිසා, උන්වහන්සේ ඔවුන් දුෂ්ටයන්ගෙන් මුදා ගළවන සේක. (ගීතාවලිය 37:35-40)**

# ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය කටපාඩමෙන් ලියන්න.

______________________________

______________________________

______________________________

2. එස්තර් පොත සඳහා පරමාර්ථ දෙකක් නම් කරන්න.

(1) ______________________________

(2) ______________________________

3. පළමු ලයිස්තුවේ සඳහන් නම් බලන්න. දෙවන ලයිස්තුවේදී ඇති විස්තරය වඩාත්ම හොඳින් ගැළපෙන නම ඉදිරියෙන් එම විස්තරයට අදාළ අංකය සඳහන් කරන්න.

| | |
|---|---|
| _________ වස්ති | 1. අලුත් රැජිණ, හෙබ්‍රෙව් කාන්තාවකි. |
| _________ එස්තර් | 2. එස්තර්ව හදා වඩාගත් ඥාතියා |
| _________ මොර්දෙකයි | 3. යුදෙව් ජනතාවගේ සතුරා |
| _________ හාමාන් | 4. රජුගේ ආඥාව ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් බිසව තනතුර අහිමි වූ බිසව |

4. එස්තර් පොත ලියුවේ කවුද?

______________________________

5. මෙම කතාව සිදුවූයේ කොහේද?

______________________________

(මෙම පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ දක්වා ඇත.)

## වැඩිදුර අධ්‍යයනය සඳහා

රූත් සහ එස්තර් පිළිබඳ පරිච්ජේදවලදී අපි ඔබ හට ඔවුන්ගේ චරිත ගුණාංග පිළිබඳ විශ්ලේෂණයක් ඉදිරිපත් කළෙමු. බයිබලයෙහි සඳහන් භක්තිමත් නායකයන්ගේ චරිත ගුණාංග ඉගෙනීමෙන් ඔබ හට සුභවාදී චරිත ගුණාංග පිළිබඳ දැනුමක් ලැබෙන අතර එම ගුණාංග ඔබ තුළද සංවර්ධනය කරගැනීමට සෙවිය හැකිය. අභක්තිමත් චරිත ගුණාංග අධ්‍යයනය කොට හඳුනාගැනීමෙන් ඔබගේ ජීවිතයේ එම ගුණාංග අත්හැරීමට අනතුරු හඟවනු ඇත.

එස්තර් පොත පිළිබඳව ඔබගේ දැනුම පුළුල් කරගැනීම සඳහාද චරිත අධ්‍යයන කිරීමේ නිපුනතාව දියුණු කර ගැනීම සඳහාත් හාමාන්ගේ සහ මොර්දෙකයිගේ චරිත විශ්ලේෂණය කරන්න. මෙම පුද්ගලයන් දෙදෙනා සුබවාදී හා අසුබවාදී චරිත ගුණාංග ඉදිරිපත් කරයි. නැවත වතාවක් එස්තර් පොත කියවා එක් එක් පුද්ගලයාගේ චරිත ගුණාංග නිරීක්ෂණය කරන්න. ඔබගේ අධ්‍යයනය පහත සඳහන් වගුවෙහි වාර්තා කරන්න.

**මොර්දෙකයිගේ චරිත ගුණාංග**

බයිබල් පද චරිත ගුණාංග

________________________________________

________________________________________

________________________________________

________________________________________

**හාමාන්ගේ චරිත ගුණාංග**

බයිබල් පද චරිත ගුණාංග

________________________________________

________________________________________

________________________________________

________________________________________

## හයවන පරිච්ඡේදය

# යේසුස්වහන්සේ කාන්තාවන් වෙත දෑරූ සම්බන්ධතාවය

### අරමුණු :

මෙම පරිච්ඡේදය අවසන් කිරීමෙන් පසුව ඔබහට කළ හැකි කරුණු :

- ප්‍රධාන පදය කටපාඩමෙන් ලිවීමට
- යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ භෞමික සේවා කාලය තුළ කාන්තාවන් සමග සම්මුඛ වූ ප්‍රධාන සිදුවීම් සාකච්ඡා කිරීම
- ඔබ යේසුස්වහන්සේට දක්වන සම්බන්ධතාවය පදනම් වී ඇත්තේ දේව කැමැත්ත මත බව වටහාගැනීම

### ප්‍රධාන පදය :

**මක්නිසාද ස්වර්ගයේ සිටින මාගේ පියාණන්වහන්සේගේ කැමැත්ත කරන කවුරු නුමුත් මාගේ සහෝදරයාත් සහෝදරීත් මෑණියොත්යයි කීසේක (මතෙව් 12:50)**

### හැඳින්වීම

මෙම පරිච්ඡේදයෙහි දී ඔබ කාන්තාවන් හා යේසුස්වහන්සේ දෑරූ සම්බන්ධතාවය අධ්‍යයනය කරනු ඇත. ඊළඟ පරිච්ඡේදයෙහිදී ඔබ මෙම පරිච්ඡේදයෙහිදී ලද පොදු පසුබිම් පුළුල් කරමින් යේසුස්වහන්සේ කාන්තාවන් සමග සන්නිවේදනය කළ හා කාන්තාවනට පැවසූ කාරණා ඉගෙන ගනු ඇත.

දෙවියන්වහන්සේගේ පෞද්ගලිකත්වයෙහි පිය ගුණාංග සේම මව් ගුණාංගද එකට මුසුවී පවතිනු දැකිය හැකිය. පරණ ගිවිසුමෙහි යෙසායා දෙවියන්වහන්සේගේ වචන වාර්තා කිරීමේදී මව් තනතුරු පෙන්වා දෙයි.

> **ස්ත්‍රියෙක් ඇගේ කුසේ පුත්‍රයාට අනුකම්පා නොකරන ලෙස ඇගේ කිරි දරුවා මතක නැති කරන්ට ඇට පුළුවන්ද? එසේය, මොවුන්ට මතකනැතිවෙන්ට පුළුවන. එහෙත් මම නම් නුඹ මතක නැති නොකරන්නෙමි. (යෙසායා 49:15)**

> **මනුෂ්‍යයෙකු තමාගේ මව් විසින් සනසනු ලබන්නාක් මෙන් මම නුඹලා සනසන්නෙමි. යෙරුසලම තුළද නුඹලා සැනසෙනවා ඇත. (යෙසායා 66:13)**

යේසුස්වහන්සේ මව් කෙනෙකුගේ හැඟීම් පෙන්නුම් කරමින් මෙසේ පැවසූ සේක.

> **කිකිළි ඇගේ පැටවුන් පියාපත් යටට එකතුකරගන්නාක් මෙන් නුඹේ දරුවන් එකතුකරගන්ට මම කී වරක් කැමති වුණෙම්ද? එහෙත් නුඹලා කැමති වුණේ නැත. (මතෙව් 23:37)**

යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ඉගැන්වීම් "ලිංග භේදයෙන් තොරය". කිසිම ස්ථානයකදී එතුමා කාන්තාවනට පමණක් බලපාන උපදෙස් නුදුන් සේක. පුරුෂ පාර්ශවයට පමණක් බලපාන උපදෙස් ස්වල්පයක් උන්වහන්සේ තම ගෝලයන්ට දුන්සේක (උදා: ලෙස මතෙව් 5:28, 32, සහ 23:8 බලන්න).

### කාන්තාවෝ සහ ගෝලත්වය

ක්‍රිස්තුස්වහන්සේ තම ඉගැන්වීම්වලදී කාන්තාවන් ඇතුළත් කරගත් සේක. මාර්ක් 7:10-11 හි උන්වහන්සේ දෙමව්පියන්ට ගරු කිරීම පිළිබඳව කතා කරයි. පද දෙක ඇතුලත "මව්" සහ "පිය" යන වචනය, හතර වතාවක් යොදා ගත් සේක. ග්‍රීක භාෂාවේ දෙමව්පියන් සඳහා භාවිත කළ හැකි

එක් පදයක් තිබූ නමුත් උන්වහන්සේ මව සහ පියා යන දෙදෙනාම එක හා සමානව ගෞරවයට පාත්‍ර විය යුතු බව අවධාරණය කිරිමට උත්සාහ දරන්නට ඇත.

යේසුස්වහන්සේ ගෝලත්වය පිළිබඳව කතා කිරිමේදී ස්ත්‍රින් ද ඇතුළත් කළ සේක.

> **පොළොවට සමාදානය දෙන පිණිස මම ආවෙමියි නුඹලා සිතවුද? එසේ නොව, භේද උපදවන පිණිසයයි නුඹලාට කියමි. ...පියා පුත්‍රයාටත් පුත්‍රයා පියාටත් මවු දුවටත් දුව මවුටත් නැන්දා යෙහෙළිටත් යෙහෙළි නැන්දාටත් විරුද්ධව භේද වන්නෝයයි කිසේක. (ලූක් 12:51, 53)**

ගෝලත්වය සම්බන්ධ තවත් කොටසකදී කාන්තාවන් පිළිබඳව ද සඳහන් කර තිබේ.

> **යේසුස්වහන්සේද: සැබවක් නුඹලාට කියමි. මා නිසාද ශුභාරංචිය නිසාද ගෙය හෝ සහෝදරයන් හෝ සහෝදරියන් හෝ මවු හෝ පියා හෝ දරුවන් හෝ ගම්බිම් හෝ අත්හැරිය කවරෙක් නුමුත්, දැන් මේ කාලයේදී ගෙවල්ද සහෝදරයන්ද සහෝදරියන්ද මව්වරුන්ද දරුවන්ද ගම්බිම්ද පීඩාත් සහිතව සියක් ගුණයක් හා, අනාගත ලෝකයේදී සදාකාල ජීවනයද නොලබා නොසිටින්නේය. (මාර්ක් 10:29-30)**

එක්තරා අවස්ථාවකදී යේසුස්වහන්සේ මහත් සමූහයකට කතා කරමින් සිටියදී උන්වහන්සේගේ සහෝදරයෝත් මවත් උන්වහන්සේ සොයමින් එතැනට පැමිණියෝය. ඔව්හු උන්වහන්සේ සොයන බව දැන්වූ කල උන්වහන්සේ මෙසේ පැවසූ සේක.

> **මාගේ මෑණියෝ කවුද? මාගේ සහෝදරයෝ කවුරුදැයි කියා, තමන් ගෝලයන් දෙසට අත දිගුකොට, මෙන්න, මාගේ මෑණියෝ සහ මාගේ සහෝදවරයෝ ! මක්නිසාද ස්වර්ගයේ සිටින මාගේ පියාණන්වහන්සේගේ කැමැත්ත කරන කවුරු නුමුත් මාගේ සහෝදරයාත් සහෝදරීත් මෑණියොත්යයි කිසේක. (මතෙව් 12:46-50, මාර්ක් 3:31-35)**

මෙම පදය ඔබ යේසුස්වහන්සේ කෙරෙහි පවතින සම්බන්ධතාවය පිළිබඳ වැදගත් සත්‍යයක් ඉදිරිපත් කරයි. ඔබගේ සම්බන්ධතාවය පදනම් වී ඇත්තේ ඔබ ගැහැණු ද පිරිමිද, තරුණ ද මහලු ද විවාහක ද අවිවාහක ද යන කරුණු මත නොවේ. එය පදනම් වී ඇත්තේ දේව කැමැත්ත කිරිම මතය. “දේව කැමැත්තෙහි” එක් කොටසක් නම් යේසුස්වහන්සේ ඔබගේ පෞද්ගලික ගැළවුම්කරු ලෙස පිළිගැනිමය.

දෙවියන්වහන්සේගේ කැමැත්ත නම්,

> **නුමුත් සියල්ලන්ම පසුතැවිලිවනවාට මිස කිසිවෙක් විනාශවෙනවාට උන්වහන්සේ නොකමැතිව, නුඹලා කෙරෙහි බොහෝකල් ඉවසන සේක. (2 පේතෘස් 3:9)**

## කාන්තාවන් ආරක්ෂා කිරීම

අවස්ථා දෙකකදී යේසුස්වහන්සේ කාන්තාවන් රැකගැනිමට ඉදිරිපත් වූ සේක. තම දරුවනට ආශිර්වාද ලබාගැනිම උදෙසා මව්වරු යේසුස්වහන්සේ වෙතට දරුවන්ව ගෙනා කල ගෝලයෝ ඔවුනට තරවටු කළ නමුත් යේසුස්වහන්සේ පැවසූයේ,

> **ළදරුවන් මා ළඟට එන්න ඉඩහරින්න, ඔවුන් වළක්වන්න එපා. මක්නිසාද දෙවියන්වහන්සේගේ රාජ්‍යය මෙබඳුවන්ගේය (මාර්ක් 10:14)** . . . . යනුවෙනි.

බෙතානියෙහිදී මරියා මිළ අධික සුවඳ විලවුන් යේසුස්වහන්සේ වෙත වැගිරෙවූ අවස්ථාවෙහිදී ගෝලයෝ එය නාස්තියක් ලෙසින් පැවසූහ. නමුත් යේසුස්වහන්සේ පැවසූයේ තමාගේ මරණය හා භූමදානය සඳහා ඇය උන්වහන්සේ සූදානම් කිරීමක් ලෙස මෙම ආලේප කිරීමේ ක්‍රියාව කළ බවත් ඇය උන්වහන්සේගේ මරණයෙහි සැලසුම අවබෝධ කරගත් බැවින් ශුභාරංචිය පවසන සෑම ස්ථානයකදී මෙය සිහිකරනු ලබන බවත්ය.

## ක්‍රිස්තුස්වහන්සේ සමග පංගුකාරකම දැරූ කාන්තාවෝ

ක්‍රිස්තුස්වහන්සේ තම ප්‍රසිද්ධ මෙහෙය ආරම්භයේදී ගෝලයන් දොළොස් දෙනාගෙන් කෙනෙකු විමට කාන්තාවක් තෝරාගත්තේ නැත. එවන් සමීප සම්බන්ධතාවයක් පැවැත්වීම සඳහා කාන්තාවක් තෝරාගැනීම එතරම් සුදුසු නොවනු ඇත. එනමුත් යේසුස් වහන්සේගේ සංචාරක සේවාවන්හිදී සේවයෙහි නියුතු වූ කාන්තාවන් පිළිබඳව බයිබලයෙහි වාර්තා වී තිබේ.

> **ඉන්පසු උන්වහන්සේ දේශනාකරමින්, දෙවියන්වහන්සේගේ රාජ්‍යයේ ශුභාරංචිය ප්‍රකාශකරමින්, නුවරවලත් ගම්වලත් සංචාරණය කළ සේක. උන්වහන්සේ සමග ගෝලයෝ දොළොස්දෙනාද, දුෂ්ටාත්මවලින් හා දුර්වලකම්වලින් සුවවුණාවූ සමහර ස්ත්‍රීයෝද, තමා කෙරෙන් යකුන් සත්දෙනෙක් දුරුව ගියාවූ මග්දලේනා නම් මරියාද, හෙරෝද්ගේ ගබඩාකාරවූ කූසාගේ භාර්යාවවූ යොවන්නාද, සුසානාද, තමුන්ගේ වස්තුවෙන් උන්වහන්සේට උපස්ථාන කළ වෙනත් බොහෝ ස්ත්‍රීයෝද සිටියෝය. (ලූක් 8:1-3)**

සමහර පුද්ගලයෝ විශ්වාස කරන පිළිවෙළට යේසුස්වහන්සේ තම මූලික ගෝලයන් දොළොස ලෙස කාන්තාවන් තෝරා නොගත් බැවින් සභා නායකත්වයෙහි කාන්තාවෝ නොසිටිය යුතුය. එසේ නම්, උන්වහන්සේ අන්‍ය ජාතිකයන් ද මූලික ගෝලයන් ලෙස තෝරා නොගත් සේක. එනමුත් ශුභාරංචිය අන්‍යජාතිකයන් වෙතට ව්‍යාප්තවී ඉතා අනගි නායකයන් අප හට ලැබී ඇත. අද දින පවතින සභාවෙහි බොහෝ අංග එතුමා විසින් පිහිටවූ කාරණා නොවේ. දේව ධර්මයෙහි පුහුණුව ලත් එක් සභාපාලකවරයෙක්, සබත් පාසල්, සභාවේ විධායක මණ්ඩල යනාදිය යේසුස්වහන්සේ සංවිධානය කළ කාරණා නොවන නමුත් අපි නිදහසේ අපගේ සභා ආකෘතියට ඒවා ඇදා ගෙන සිටිමු.

## ක්‍රිස්තුස්වහන්සේ කාරුණිකව සැලකූ අන්දම

ක්‍රිස්තුස්වහන්සේ සැමවිටම කාන්තාවනට කාරුණිකව සැලකූ සේක. උන්වහන්සේ කිසිවිටකත් කාන්තාවනට පහත් ලෙස හෝ කෝපයෙන් කතා කළේ නැත. වයස අවුරුදු දොළොසේදී උන්වහන්සේ තම මාපියන් සමග යෙරුසලමෙහි පාස්කු මංගල්‍යයට සහභාගි වීමට ගිය සේක. නැවත නිවස කරා එන ගමනෙහි දවසක දුර ගෙවීමෙන් පසුව උන්වහන්සේගේ දෙමව්පියනට ඔහු තවලමේ නොමැති බව වැටහී නැවතත් හැරී යෙරුසලමට ගියෝය. අවසානයේ උන්වහන්සේ දේව මාලිගයෙහි ආගමික නායකයන් සමග සිටිනු සම්බ විය. උන්වහන්සේගේ මෑණියෝ ඔහුට තරවටු කළ විට උන්වහන්සේගේ ප්‍රතිචාරය වූයේ සරල පැහැදිලි කිරීමකි. ඉන්පසු උන්වහන්සේ තම දෙමව්පියන් සමග හැරී ගෙදර ගිය අතර ඔවුනට යටත්ව (කිකරුව) කල් ගෙවූ සේක (ලූක් 2).

යේසුස්වහන්සේ එතරම් කාරුණික නොවන ලෙස කතා කළ සේ පෙනෙන එක් අවස්ථාවක් නම් කනාහි සරණ මංගල්‍යයේදීය. මංගල්‍යයෙහි බීම අවසන් වූ කල යේසුස්වහන්සේගේ මෑණියෝ ඒ බව උන්වහන්සේට පැවසූ විට උන්වහන්සේගේ පිළිතුර වූයේ,

> **යේසුස්වහන්සේද, ස්ත්‍රිය, නුඹෙන් මට කම මොකද? මාගේ වේලාව තවම පැමිණුණේ නැතැයි ඈට කීසේක. (යොහන් 2:4)**

මෙයින් එතුමා පැවති ගැටලුව සඳහා තමා විසින් යමක් කළ යුතු බවට ලැබුණු යෝජනාව කෙරෙහි ගරුකිරීමක් නොකළ බව නොපෙන්වයි. "ස්ත්‍රිය" යන වචනය අගෞරවයෙන් යෙදූ පදයක් නොවේ. නියමිත වේලාවේදී, මරියා අපේක්ෂා කළ දෙය යේසුස්වහන්සේ ආශ්චර්යවත් ලෙස ඉටු කරමින් වතුර මුද්‍රිකපානය බවට පත් කළ සේක. උන්වහන්සේගේ පිළිතුරින් මරියා අමනාපයට පත් වූයේ නැත. ඒ වෙනුවට ඇය සේවකයන්ට පැවසුවේ.

> **උන්වහන්සේගේ මෑණියෝ: උන්වහන්සේ නුඹලාට කියන කොයි දෙයක් නමුත් කරන්නැයි මෙහෙකරුවන්ට කීවාය. (යොහන් 2:5)**

යාකොබ් සහ යොහන්ගේ මවු ස්වර්ග රාජ්‍යයෙහිදී තමාගේ පුතුන් දෙදෙනා උන්වහන්සේගේ දෙපසින් වාඩිකරගන්නා ලෙසට ආත්මාර්ථකාමී යෝජනාව ගෙන ආ විට උන්වහන්සේ ඇයට තරවටු කළේ නැත. උන්වහන්සේ පිළිතුරු දෙමින්,

**නුමුත් යේසුස්වහන්සේ උත්තරදෙමින්: නුඹලා ඉල්ලන්නේ කුමක්දැයි නුඹලා දන්නේ නැත. . . . නුමුත් මාගේ දකුණු පැත්තේද වම් පැත්තේද ඉන්ට දීම මට අයිති නැත. එහෙත් මාගේ පියාණන්වහන්සේ විසින් ඒවා යමෙකුට නියමකරන ලද්දේද ඔවුන්ටයයි කීසේක. (මතෙව් 20:20-23)**

මතෙව් 15:21-28 අන්‍ය ජාතික කාන්තාවක් තම දියණිය සුවකර දෙන ලෙස ඉල්ලා සිටීම කියවා බලන්න. යේසුස්වහන්සේගේ පිළිතුරෙහි, "බල්ලන්" යන පදය ඇතුලත්වීමෙන් එය අගුරුකිරීමක් නොපෙන්වයි. අන්‍ය ජාතිකයන්[1] හැඳින්වීමට එය පොදුවේ සාමාන්‍යයෙන් භාවිත වූ පදයකි. මෙම කාන්තාව සමග සිදුවූ වචන හුවමාරුව අවසන් වූයේ ඉහළම පැසසුම ක්‍රිස්තුස්වහන්සේ ඇයට පිදීමෙනි. එනම්, "ස්ත්‍රිය, නුඹගේ ඇදහිල්ල ශ්‍රේෂ්ඨය".

යේසුස්වහන්සේ කාමමිථ්‍යාචාරී කාන්තාවනට මෙහෙ කළාවූ අවස්ථා තුනක් ශුද්ධ ලියවිල්ලේ සඳහන් වේ. මෙම බයිබල් පද පෙරලා බලා කියවන්න.

| | |
|---|---|
| යොහන් 8:2-11 | කාමමිථ්‍යාචාරයෙහි යෙදී සිටියදී අල්ලාගත් ස්ත්‍රිය |
| ලූක් 7:38-39 | යේසුස්වහන්සේගේ පාද පිසදැමූ පව්කාරිය |
| යොහන් 4:5-30 | ළිඳ ළඟ හමුවූ කාන්තාව |

මෙම සෑම සිදුවීමකදීම යේසුස්වහන්සේ කාරුණික බව, ප්‍රේමය හා පව් සමාව විදහා දැක්වූ සේක.

යේසුස්වහන්සේ සමාරිය ස්ත්‍රිය සමග ළිඳ ළඟ ඇතිවූ සම්මුඛවීම ක්‍රිස්තුස්වහන්සේ කාන්තාවන් කෙරෙහි දැක්වූ සම්බන්ධතාවය පිළිබඳ අධ්‍යයනයට වැදගත් වෙනු ඇත. සමාරිතයෝ යුදෙව්වන්ගේ සතුරන් වූ අතර නුගත් හා සටනට බර කණ්ඩායමක් ලෙස සලකන ලදී. ඒ මදිවට, මෙම කාන්තාව කාමමිථ්‍යාචාරිනියක් වූවාය.

නුමුත් යේසුස්වහන්සේ, තමා මෙසියස්වහන්සේ බව හෙළිදරව් කිරීමට (ශුද්ධ ලියවිල්ලෙහි වාර්තා වී ඇති පරිදි), පළමුවෙන්ම තෝරා ගත්තේ මෙම අන්‍ය ජාතික, පාපිෂ්ඨ කාන්තාවය. මෙම මහත් ආත්මික සත්‍යය ඇයට අල්ලා ගැනීමට හැකි බව උන්වහන්සේ සැලකූ සේක. ඇය ක්ෂණයකින් ඉවැන්ජලිස්ත ප්‍රචාරිකාවක් බවට පත් වී ක්‍රිස්තුස්වහන්සේ වෙතට සෙනඟ රැගෙන ඒමට නුවරට දිව ගියාය. එහි ප්‍රතිඵලය වූයේ :

**වෙනත් බොහෝ දෙනෙක් උන්වහන්සේගේ වචන නිසා අදහා, ස්ත්‍රියට කතා කොට: අප දැන් අදහන්නේ නුඹේ කීම නිසා නොවේ. මක්නිසාද අපිම අසා, සැබැවටම මුන්වහන්සේ ලෝකයාගේ ගැළවුම්කාරයාණන් බව දනිමුයයි කීවෝය. (යොහන් 4:41-42)**

යේසුස්වහන්සේ මාර්තා සහ මරියාගේ නිවසට ගිය අවස්ථාවකදී මාර්තා ගෙදර වැඩ ගැන කරදර වෙමින් සිටියාය. මරියා යේසුස්වහන්සේගේ පාද පාමුල සිටීම හැර වෙන කිසිවක් නොකිරීම පිළිබඳ කණගාටු වෙමින් ඒ පිළිබඳව මාර්තා යේසුස්වහන්සේට පැවසූ විට, මරියාට තරවටු නොකර යේසුස්වහන්සේ පිළිතුරු ලෙස පැවසූයේ :

**මාර්තා, මාර්තා, නුඹ බොහෝ දේවල් ගැන නලංගු වී කැළඹෙන්නෙහිය. නුමුත් ඕනෑකරන්නේ එක දෙයක්ය. මරියා වනාහි ඈ කෙරෙන් බැහැර ගනු නොලබන්නාවූ යහපත් කොටස තෝරාගත්තායයි කීසේක. (ලූක් 10:41)**

දුප්පත් වැන්දඹුව කුඩා කාසි දෙකක් සම්මාදම් පෙට්ටියට දමනු දුටු යේසුස්වහන්සේ එම දීමනාව ප්‍රශංසාවෙන් යුතුව ප්‍රකාශ කළ සේක.

**උන්වහන්සේ ගෝලයන් තමන් වෙතට කැඳවා: සැබවත් නුඹලාට කියමි - ගබඩාවේ මුදල් දමන සියල්ලන්ට වඩා මේ දිළිඳු වැන්දඹුව දැමුවාය. මක්නිසාද ඒ සියල්ලෝ තමුන්ගේ වැඩිමනත් දෙයින් දැමුවෝය. නුමුත් මැ වනාහි තමාගේ හිඟකමෙන් තමාගේ රක්ෂාවීමට තිබුණු සියල්ලම දැමුවායයි කී සේක. (මාර්ක් 12:43-44)**

---

[1] අන්‍ය ජාතිකයන් යනුවෙන් සැලකුයේ යුදෙව් නොවන ජාතීන්ය.

ශුභාරංචි පොත් අපට පෙන්වා දෙන්නේ යේසුස්වහන්සේ කාන්තාවන් සන්නිවේදනයට වටිනා, ගැඹුරු ආත්මික සත්‍යයන් අවබෝධ කර ගත හැකි, ශ්‍රේෂ්ඨ ඇදහිල්ලක් ක්‍රියාත්මක කළ හැකි, පූජාවීමෙන් යුතුව දීමට ප්‍රමිතීන් සැලසිය හැකි පුද්ගලයන් ලෙසට සැලකූ බවය.

## කාන්තාවන් කෙරෙහි දැක්වූ අනුකම්පාව

ක්‍රිස්තුස්වහන්සේ කාන්තාවන් කෙරෙහි දැක්වූ එක් විශේෂ ගුණාංගයක් නම් අනුකම්පාවය. නායින් නුවර වැන්දඹුවගේ පුතා මරණින් නැගිටුවීමෙහිදී ඇය කෙරෙහි වූ අනුකම්පාව මූලික විය.

> **ස්වාමින්වහන්සේ ඈ දුටු කල ඈ කෙරෙහි අනුකම්පා කොට අඬන්ට එපා යැයි ඈට කී සේක.** (ලූක් 7:13)

ප්‍රසිද්ධිය සලකා යාච්ඤා කිරීමෙන් පසුව වැන්දඹුවන්ගෙන් සොරකම් කළාවූ අය කෙරෙහි එතුමාගේ කෝපය අවුළුවනු ලැබුවේ එතුමා වැන්දඹුවන් කෙරෙහි දැක්වූ අනුකම්පාවය.

> **. . . වැන්දඹුවන්ගේ ගෙවල් කොල්ලකමින්, වංචා පිණිස දීර්ඝ යාච්ඤා කරන්නාවූ ලියන්නන්ගෙන් ප්‍රවේසම් වෙන්න.** (ලූක් 20:46-47)

උන්වහන්සේ මහත් සමූහයකට ආහාර සැපයීමෙහිදී එතැන කාන්තාවන්ද විය. එබැවින් උන්වහන්සේ අනුකම්පාවෙන් පොලඹවනු ලැබීය. මේ පිළිබඳව මාර්ක් 6 (විශේෂයෙන් 34 පදය බලන්න) හා මාර්ක් 8 (විශේෂයෙන් 2 පදය බලන්න).

යෙරුසලමෙහි අනාගත විනාශය පිළිබඳ යේසුස්වහන්සේ පවසන කල මෙම අනුකම්පා සහගත බව එයට ඇතුලත් කළ සේක.

> **නුමුත් ඒ දවස්වලදී ගර්භණීන්ටත් කිරිදෙන ස්ත්‍රීන්ටත් දුක්වේ ! ශීත කාලයේදී මේවා සිද්ධ නොවන පිණිස යාච්ඤා කරන්න.** (මාර්ක් 13:17-18)

යේසුස්වහන්සේ කුරුසිය උසුලාගෙන ගොල්ගොතාවට යන ගමන් මගෙහි සොල්දාදුවන් සහ සිරකරුවන් සමඟ බොහෝ කාන්තාවෝ සිටියහ. මෙම කාන්තාවෝ උන්වහන්සේ ගැන දුක්වූහ. උන්වහන්සේ තමා පිළිබඳව සිතීමට වඩා ඔවුන් පිළිබඳව සැලකිලිමත් වූ සේක. උන්වහන්සේ ඔවුන්ට මෙසේ පැවසූ සේක:

> **යේසුස්වහන්සේ ඔවුන් දෙසට හැරී: යෙරුසලමේ දූවරුනි, මා නිසා නොහඬා, නුඹලා සහ නුඹලාගේ දරුවන් නිසාත් හඬන්න. මක්නිසාද වඳ ස්ත්‍රීහුද දරුවන් බිහි නොකළ කුසද කිසිකලෙක කිරි නුදුන් තනද වාසනාවන්තයයි කියන දවස් පැමිණෙන්නේය.** (ලූක් 23:28-29)

උන්වහන්සේගේ මිහිමත සේවයෙහි අවසානය දක්වා, තමාගේම වේදනාව මධ්‍යයේ පවා කාන්තාවන් සඳහා එතුමා දැක්වූ සැලකීම හා අනුකම්පාව කිසිවිට හීන නොවීය.

# ස්වයං පරීක්ෂණය

1. ඔබ යේසුස්වහන්සේට ඇති සම්බන්ධතාවය පදනම් වී ඇත්තේ කුමක් මතද? :

______________________________________________

2. ප්‍රධාන පදය කටපාඩමින් ලියන්න.

______________________________________________

______________________________________________

______________________________________________

3. පළමු ලැයිස්තුවේ නම් කියවා බලන්න. දෙවන ලැයිස්තුවේ යේසුස්වහන්සේ එම පුද්ගලයාට හෝ කණ්ඩායමට පැවසූ දෙය කියවන්න. ගැළපෙන කියමන සහිත අංකය පුද්ගලයා ඉදිරියෙන් ලියන්න.

| | |
|---|---|
| ______දරුවන් ඇති කාන්තාවෝ | 1. ඇය සිහිකිරීම පිණිස මෙය පවසනු ඇත. |
| ______යේසුස්වහන්සේගේ මව් වූ මරියා | 2. යේසුස්වහන්සේ මෙසියස් බව ඇයට පැවසූ සේක. |
| ______පාද සේදූ පව්කාර ස්ත්‍රිය | 3. "දරුවන් මා වෙතට එන්ට ඉඩ හරින්න." |
| ______තමාගේ දුවගේ සුවය පැතූ අන්‍ය ජාතික කාන්තාව | 4. යේසුස්වහන්සේ ඇගේ දීමනාව පිළිබඳව පැවසූ සේක. |
| ______මාර්තා | 5. "මරියා වඩා යහපත් දෙය තෝරාගත්තාය" |
| ______දුප්පත් වැන්දඹුව | 6. "නුඹේ ඇදහිල්ල ශ්‍රේෂ්ඨය !" |
| ______ලිඳ ළඟ සිටි කාන්තාව | 7. "ස්ත්‍රිය, නුඹෙන් මට ඇති කම මොකද?" |

(මෙම පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ දක්වා ඇත.)

# වැඩිදුර අධ්‍යයනය කිරීම සඳහා

යේසුස්වහන්සේ කාන්තාවන් කෙරෙහි දැක්වූ සම්බන්ධතාවය පිළිබඳ ඔබගේ අධ්‍යයනය තවදුරටත් කරගෙන යාම සඳහා උන්වහන්සේ ඔවුන් සමඟ කළාවූ සංවාද පිළිබඳ පහත සඳහන් වාර්තා අධ්‍යයනය කරන්න.

| | මතෙව් | මාර්ක් | ලූක් | යොහාන් |
|---|---|---|---|---|
| උන්වහන්සේගේ මෑණියන් : | | | | |
| ළමා කාලයෙහි | | | 2:41-50 | |
| කානාවලදී | | | | 2:1-11 |
| කුරුසියෙහිදී | | | | 19:25-27 |
| මාර්තා: | | | | |
| සේවයෙහිදී | | | 10:38-42 | |
| ලාසරුස් නැගිටුවීමෙහිදී | | | | 11:1-44 |
| බෙතානියේ මරියා : | 26:6-13 | 14:3-9 | | 12:1-9 |
| මග්දලායේ මරියා: | 28:9-10 | | 8:2 | 14:14-18 |
| සමාරීය ස්ත්‍රිය: | | | | 4:1-42 |
| කාමමිථ්‍යාචාරික ස්ත්‍රිය: | | | | 8:1-11 |
| පව්කාරිය: | | | 7:36-50 | |
| සිරෝෆිනීසිය කාන්තාවගේ දුව : | 15:22-28 | 7:24-30 | | |
| යායිරස්ගේ දුව සහ මහ ලේ ස්ත්‍රිය: | 9:20-25 | 5:25-42 | | 8:43-56 |
| පේත්‍රුස්ගේ නැන්දම්මා: | 8:14-15 | 1:30-31 | | 4:38-39 |
| වැන්දඹුවගේ පුතා : | | 7:11-15 | | |
| කුදු ස්ත්‍රිය : | | | 13:11-13 | |

# හත්වන පරිච්ඡේදය

# කාන්තාවන් උදෙසා යේසුස්වහන්සේගේ මෙහෙය

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අවසන් කිරීමෙන් පසුව ඔබහට කළ හැකි කරුණු :

- ප්‍රධාන පදය කටපාඩමින් ලිවීමට.
- යේසුස්වහන්සේගේ උපමා කතා ඇසුරින් ඇති කාන්තාවන් පිළිබඳ ජනතාවගේ මතය, ගැටලු හා ප්‍රතිපත්ති සාකච්ඡා කිරීම
- උපමා කතාවල ඇති ප්‍රතිපත්ති ඔබගේම ජීවිතයට හා සේවාවට අදාළ කර ගැනීම
- යේසුස්වහන්සේගේ හාස්කම් ඇසුරින් ඇති කාන්තාවන් පිළිබඳ ජනතාවගේ මතය, ගැටලු හා ඉදිරිපත් කිරීම සාකච්ඡා කිරීම
- යේසුස්වහන්සේ කාන්තාව උදෙසා කළ මෙහෙය පිළිබඳව තව දුරටත් අධ්‍යයනය කිරීම

**ප්‍රධාන පදය :**

> **යේසුස්වහන්සේ කළ වෙනත් බොහෝ දේවල්ද ඇත්තේය. ඒවා එකින් එක ලියනලද්දේ නම් ලියනු ලබන පොත් දරන්ට ලෝකයත් මදියයි සිතමි. (යොහන් 21:25)**

## හැඳින්වීම

පසුගිය පරිච්ඡේදයේ අපි යේසුස්වහන්සේ කාන්තාවන් කෙරෙහි දැක්වූ සම්බන්ධතාවය පිළිබඳව අධ්‍යයනය කළෙමු. යේසුස්වහන්සේ වැදගත් කරුණු කාන්තාවන්ට පැවසූ අතර කාන්තාවන් පිළිබඳව කීමට වැදගත් දෑ එතුමා සතුවිය. උන්වහන්සේ කාන්තාවන් වැඩි උනන්දුවක් දක්වන විෂයයන් පිළිබඳ ඉගැන්වූ සේක. උන්වහන්සේ සමහර උපමා කතාවලට කාන්තාවන්ද ඇතුලත් කළ සේක. එතුමාගේ භෞමික සේවා කාලය තුළ කාන්තාවන්ට ආශ්චර්යවත් විලසින් මෙහෙ කළ සේක. මෙම පරිච්ඡේදයෙන් ක්‍රිස්තුස්වහන්සේ කාන්තාවන් උදෙසා කළ එම සේවයෙහි අංශය සොයා බලමු.

## යේසුස්වහන්සේගේ උපමා කතා

යේසුස්වහන්සේ මිහිපිට තම සේවයෙහිදී ඉගැන්වීමේ මාධ්‍යයක් ලෙස උපමා කතා නිරතුරු භාවිත කළ සේක. උපමා කතාවක් යනු "ස්වර්ගයීය අර්ථයකින් යුත් භෞමික වූ කතාන්දරයකි." උපමා කතාවකදී අසන්නා හට පහසුවෙන් වටහාගත හැකි අයුරින් ආත්මික සත්‍යයන් කතාවක ආකාරයෙන් ඉදිරිපත් කරනු ලබයි.

යේසුස්වහන්සේ වැදගත් ආත්මික සත්‍යයන් ඉගැන්වීමට කාන්තාවන් පිළිබඳ විශේෂ උපමා කතා හතරක් යොදාගත් සේක. මෙම පාඩම තව දුරටත් කිරීමට ප්‍රථම උපමා කතා හතර ඔබගේ බයිබලයෙන් කියවන්න. එක් එක් උපමාව දෙස බලනුයේ පහත සඳහන් කරුණු ඇසුරිනි:

**පුද්ගලයා** : උපමාවෙහි ඇතුලත් පුද්ගලයා

**ගැටලුව :** උපමාවෙහි ඇතුලත් පුද්ගලයන් මුහුණ පෑ තත්ත්වය (භෞමික කතාව)

**ප්‍රතිපත්තිය :** යේසුස්වහන්සේ ඉගැන්වූ වැදගත් සත්‍යය (ස්වර්ගිය සත්‍යය)

දැන් උපමා කතා අධ්‍යයනය කරන්න.

## නැතිවූ කාසිය : ලූක් 15:8-10

**පුද්ගලයා :** රිදී කාසි දහයක් තිබූ කාන්තාව

**ගැටළුව :** එක රිදී කාසියක් නැතිවිය.

**ප්‍රතිපත්තිය :** යේසුස්වහන්සේ මෙම උපමාව සමඟ තවත් උපමා දෙකක් භාවිත කොට සමාන වූ සත්‍යයක් විදහා දක්වයි. නැති වූ කාසියට පෙර සඳහන් නැතිවූ බැටළු පැටවාගේ උපමාව කියවන්න (ලූක් 15:3-7). ඉන්පසුව අකීකරු පුත්‍රයාගේ උපමා කතාව කියවන්න (ලූක් 15:11-32).

යේසුස්වහන්සේ මෙම උපමා කතා පෙළ භාවිත කළේ, උන්වහන්සේ පව්කරුවන් පිළිගෙන, ඔවුන් සමඟ ආහාර ගන්නා බවට ඵරිසිවරු කළාවූ චෝදනාවලට පිළිතුරු සැපයීම සඳහාය. යුදෙව්වරුන්ට එසේ කිරීම තහනම් කොට තිබිණි (1-2 පද බලන්න).

යේසුස්වහන්සේ නැතිවූ ආත්ම පිළිගැනීමේ වටිනාකම විදහා දක්වමින් සිටි සේක. පව්කරුවන්ට ගැළවීමේ පණිවුඩය ලබාදීම සඳහා ඔවුන් පිළිගෙන ඔවුන්ට කතා බහ කළ යුතු වේ. මෙම සත්‍යය පැහැදිලි කිරීම සඳහා උන්වහන්සේ නැතිවූ බැටළු පැටවාගේ, නැතිවූ කාසියේ හා අකීකරු පුත්‍රයාගේ උපමා කතා පාවිච්චි කළ සේක. හිමිකම්, මුදල් හා පවුල යනාදී කරුණු ඵරිසිවරුන් විසින් ඉතා වටිනා ලෙස සැලකූ කාරණා බැවින් මෙම උදාහරණ ඔවුන්ට මනාව අවබෝධ විය.

යේසුස්වහන්සේ, කාන්තාවක් තමාගේ නැතිවුණු කාසිය සෙවීම මෙන්ම පුරුෂයෙක් තමාගේ නැතිවූ බැටළු පැටවා සෙවීම මෙහිදී උපමාවට ගත් සේක. නැතිවූ පුද්ගලයන් සොයා ගැනීම උදෙසා කාන්තාව සතුව විශේෂ වූ කාර්ය භාරයක් පවතී. උපමා කතාවෙහි කාන්තාව මෙන් අපිද අපේ ආත්මික ආලෝකය විහිදුවා ඉතා ඕනෑකමින් නැතිවූ දෙය සෙවිය යුතුය. අපගේ ස්වාමීන්වහන්සේ වෙතට නැතිවූ කෙනෙකු ගෙන එන විට ස්වර්ගයෙහි දූතයන් ඉදිරියෙහි ප්‍රීති ප්‍රමෝදය ඇති වෙයි. ඔබ ඉතා ඕනෑකමින් නැතිවූවන් සොයනවාද?

## අඛණ්ඩව උත්සාහ කළාවූ වැන්දඹුව : ලූක් 18:1-8

**පුද්ගලයා :** දෙවියන්වහන්සේ හෝ මනුෂ්‍යයාට භය නොවූ දුෂ්ඨ විනිශ්චයකරුවෙකුගෙන් සාධාරණය සෙවූ වැන්දඹුවක්

**ගැටලුව :** ඇය ඇගේ "විරුද්ධකාරයා" උදෙසා සාධාරණය සෙවීය. උපමාවෙහි විරුද්ධකාරයා කවුද කියා හෝ කළ වරද කුමක්ද කියා හෝ සඳහන් නොවේ. මුලින්ම විනිශ්චයකරුවා වැන්දඹුව උදෙසා කිසිවක් නොකළේය. නමුත් ඇය දිගටම ඔහු වෙත ගොස් කාරණය ඉදිරිපත් කළාය. එබැවින් තවදුරටත් ඇය ඔහුට කරදර කිරීමෙන් වැළකෙන පිණිස ඔහු ඇයට පක්ෂව සාධාරණය ඉටු කිරීමට තීරණය කළේය.

**ප්‍රතිපත්තිය :** යේසුස්වහන්සේ මෙහිදී විදහා දැක්වූයේ අඛණ්ඩ උත්සාහය දෙවියන්වහන්සේගෙන් ප්‍රතිචාර ගෙන දෙන බවය. යාච්ඤා කිරීමේදී අත්නැර සිටිය යුතු බව තම අනුගාමිකයන්ට පෙන්වීමට යේසුස්වහන්සේ මෙම උදාහරණය භාවිත කළ සේක (1 පදය).
ධර්මිෂ්ඨ විනිසුරුවරයෙකු අවසානයෙහි ප්‍රතිචාර දැක්වූවා නම් සාධාරණ දෙවියන්වහන්සේ එතුමාගේ ජනතාවගේ අඛණ්ඩ ඉල්ලීමට ප්‍රතිචාර දක්වමින් ඔවුන්ගේ ඉල්ලීමට පිළිතුරු සපයනු ඇත.

> **ධර්මිෂ්ඨ මනුෂ්‍යයෙක් ඔප්පු කරන කන්නලව්ව කරණ කොටගෙන මහත් දේ ඉෂ්ට වෙයි. (යාකොබ් 5:16 ආ)**

## කන්‍යාවන් දසදෙනා : මතෙව් 25:1-13

**පුද්ගලයෝ :** ප්‍රඥාවන්ත කාන්තාවන් පස්දෙනෙක්, අඥාන කාන්තාවන් පස්දෙනෙක් සහ මනාලයා පැමිණෙන බව අනතුරු අඟවන කණ්ඩායමක්.

**ගැටලුව :** කාන්තාවන් දසදෙනෙකු මනාලයා පැමිණෙන තුරු බලා සිටියහ. ඉන් පස්දෙනෙකු ප්‍රඥාවන්ත වූ අතර ඔවුන්ගේ පහන් සඳහා වැඩිපුර තෙල් රැගෙන විත් සිටියහ. පස්දෙනෙක් අඥාන වූ අතර වැඩිපුර තෙල් නොගෙන ආහ.

බලාගෙන සිටින අතරතුර කාන්තාවෝ සියලු දෙන නින්දට වැටුණහ. හදිසියේ මනාලයා පැමිණෙන බව ශබ්දනගන හඬ ඇසිණි. එකල කාන්තාවෝ සියලු දෙනා අවදි වී තම පහන් දල්වන්නට වූහ. අඥාන කාන්තාවන්ට වැටහී ගියේ තෙල් නොමැතිව තම පහන් නිවී ගොස් ඇති බවය. ඔව්හු ප්‍රඥාවන්ත කාන්තාවන්ගෙන් තෙල් ටිකක් අතමාරුවට ඉල්ලා ගැනීමට උත්සාහ කළ නමුත් ප්‍රතික්ෂේප කරනු ලැබූහ.
අඥාන කාන්තාවෝ තෙල් මිලට ගැනීම පිණිස පිටත්ව ගිය අතරතුර මනාලයා පැමිණියේය. නුවණැති කාන්තාවෝ පස්දෙනා මංගල්‍යය සාදයට ඔහු සමඟ ඇතුළු වූහ. අඥාන කාන්තාවෝ නැවත පැමිණි කල දොර වසා තිබිණි. ඔවුන්ට ඇතුල් විය නොහැකි විය. ප්‍රමාද වූවා වැඩිය. ඔව්හු සූදානම් වීමට ඕනෑවට වඩා කල් බල බලා සිටියහ.

**ප්‍රතිපත්තිය :** මෙම උපමාව යේසුස්වහන්සේ තම ගෝලයන් සමඟ ලෝකාන්තිමය පිළිබඳ සාකච්ඡාවක් පැවති අවස්ථාවකදී භාවිත කළ සේක. 24 පරිච්ඡේදයෙහි මෙම සාකච්ඡාවෙහි ආරම්භය පිළිබඳව කියවා බලන්න.

25 වෙනි පරිච්ඡේදය එය සාකච්ඡාවෙහිම කොටසකි. යේසුස්වහන්සේ තම ගෝලයන්ට පැවසූයේ අවසාන කාලයේ ආත්මික තත්ත්වයද කන්‍යාවන් දසදෙනාගේ උපමා කතාවේ තත්ත්වය ලෙස පවතිනු ඇති බවය. සමහර මනුෂ්‍යයෝ ආත්මිකව ස්වාමින්වහන්සේ මුණගැසීමට සූදානම්ව සිටිනු ඇත. නුමුත් ඔව්හු එතුමාගේ පැමිණීමට අවදියෙන් නොසිට "නිදාගෙන" සිටිනු ඇත. මෙම කණ්ඩායම "ඥානවන්ත කන්‍යාවෝ" ලෙස හඳුන්වා ඇත.

මෙම කණ්ඩායම ගැළවීම ලබා සිටින නමුත් මනාලයා ඉතා ඉක්මණින් එන බව අවට සිටින අයට දැන්වීම සඳහා අනතුරු ඇඟවීමට කිසිවක් නොකරති. කෙසේවෙතත් එතුමාගේ පැමිණීමට ක්ෂණයකට පෙර ඔවුන් ආත්මිකව පුබුදුවනු ලැබී එතුමා මුණගැසීමට සැරසී සිටිනු ඇත.

නුවණ නැති කන්‍යාවන්ගෙන් විදහා දක්වන තවත් ජන කොටසක් වේ. ඔව්හු යේසුස්වහන්සේගේ පැමිණීමට සූදානම් නැත. ඔව්හු තම ආත්මික භාජන පුරවා ගැනීමට ඕනෑවට වඩා ප්‍රමාද වීම හේතුවෙන් පසුව උත්සාහ කරන නමුත් ක්‍රිස්තුස්වහන්සේ හා සමඟ යාමට නොහැකි වනු ඇත.

ඔව්හු ඥානවන්ත කන්‍යාවන්ගේ සූදානම් වී සිටීමේ පදනම මත යැපෙමින් ඇතුළු වීමට උත්සාහ දරති. එනමුත් එය සිදු කළ නොහැක. ඔබහට වෙන කිසියම් කෙනෙකුගේ අත්දැකීම් පදනම් කරගෙන දේව රාජ්‍යයට ඇතුළු විය නොහැක. ඔබම ඔබගේ ඇතුළු වීම සඳහා අවශ්‍ය කරන සූදානම් වීම කළ යුතු වේ.

මෙම උපමාවෙහි තුන්වන ජන කොටසක් සිටිති. උපමා කතාවෙහි ඥානවන්ත සහ අඥාන කන්‍යාවන් ලෙස හැඳින්වූ දෙපාර්ශවය නින්දට ගිය නමුත් මනාලයා පැමිණෙන බව සංඥාකර ශබ්ද නැඟීමට කවුරුන් හෝ අවදියෙන් සිට ඇත. ක්‍රිස්තුස්වහන්සේගේ පැමිණීමෙහිදී එතුමා එන බව දැන අවදියෙන් කල්ගෙවන, ඒ සඳහා සූදානමින් සිටින දෙවියන්වහන්සේගේ ජන කොටසක් සිටිනු ඇත. එම කණ්ඩායම නින්දෙහි පසුවන දෙවියන්වහන්සේගේ ජනතාවට එතුමාගේ පැමිණීමට ඇති ඉතා ස්වල්ප කාලය පිළිබඳ දැනුම් දීමට දෙවියන්වහන්සේ පාවිච්චි කරනු ඇත.

ඔබ අයත් වනුයේ මෙයින් කුමන කණ්ඩායමටද? ඔබ ආත්මිකව ස්වාමින්වහන්සේගේ නැවත පැමිණීමට සූදානම් වන නමුත් එතුමා ඉතා ඉක්මණින් පැමිණෙන බවට අවදියෙන් තොරව සිටීද? ඔබ අනෙක් අයට එතුමාගේ පැමිණීමට සූදානම් වන ලෙස දන්වා පණිවුඩයක් නිකුත් නොකර ආත්මික නින්දෙහි පසුවනවාද?

එසේ නොමැති නම් ඔබ අඥාන කන්‍යාවෝ මෙන්ද? සමහරවිට ඔබ තවම යේසුස්වහන්සේ හමුවීමට ආත්මිකව සූදානම් නොවී සිටිය හැක. ඔබගේ භාජනයෙහි තෙල් නැත. ඔබ ආත්මිකව හිස්ව නින්දේ පසුවිය හැක. එතුමාගේ පැමිණීමේ ඝෝෂාව ඇසී ප්‍රමාද නොවී දැන්මම එතුමා හමුවීමට සූදානම් වන්න.

ඔබ, නමින් සඳහන් කර නොමැති තුන්වන ජනකොටස වැනිද? ස්වාමීන්වහන්සේගේ පැමිණීම ඉතා සමීප බව දැන අවදියෙන් සිටිමින් අනෙක් අයට අනතුරු අඟවමින් හා ඔවුන් සූදානම් කරමින් සිටිද? ඔබ අයත් වන්නේ මෙම ජනකොටස් තුනෙන් කුමන කණ්ඩායමටද?

**මුහුන් පිඬ සහිත කාන්තාව : මතෙව් 13:33, ලූක් 13:20-21**

**පුද්ගලයා :** නමක් සඳහන් නොවූ කාන්තාවක්

**ගැටලුව :** ඇය රොටි සෑදීම සඳහා පිටි නැලි තුනක් පමණ පිපීමට මුහුන් යොදා ගනී. "නැලියක්" යනු එක් වේලකට සෑහෙන තරම් පිටි ප්‍රමාණයකි.

**ප්‍රතිපත්තිය :** මෙය යේසුස්වහන්සේ "ස්වර්ග රාජ්‍යය" ලෙසට තම රාජ්‍යය හඳුන්වමින් එහි සත්‍යයන් පහදා දීම සඳහා භාවිත කළාවූ උපමාවලින් එකකි.

ශුද්ධ ලියවිල්ලෙහි බොහෝ අවස්ථාවලදී මුහුන් භාවිත කර ඇත්තේ නපුරෙහි උදාහරණයක් විලසිනි. නපුර ඉතා ස්වල්ප ප්‍රමාණයක් වුවත් නැවත නිපදවමින් මුහුන් ටිකකින් විශාල පිටි ප්‍රමාණයක් පිපෙන ලෙසට නපුර බලවත් වන ක්‍රමය පෙන්නුම් කිරීමට මුහුන් උදාහරණයට ගනී. නමුත් මෙම උදාහරණයේදී මුහුන් භාවිත කර ඇත්තේ සුබවාදී අයුරිනි. දේව රාජ්‍යයෙහි ඉතා කුඩා ක්‍රියාවක් පවා ගුණනය වී මහත් අස්වැන්නක් ලබා දීම විදහා දැක්මටය.

මහත් පිටි ප්‍රමාණයක් පිපෙන පිණිස මුහුන් ස්වල්පයක් දැමීම මෙන් දේව වචනය නමැති මුහුන් පිපී නැවත ඵල නිපදවනු ඇත. මෙය අපි *"මුහුන් වලට සමාන ධර්ම ප්‍රචාරණය"* සඳහා යොදාගන්නා ප්‍රතිපත්තිය භාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනය මෙනමින් පාඨමාලාවක් පවත්වයි. එය ලොව පුරා ශුභාරංචිය ව්‍යාප්තිය සඳහා ධර්මදූත ප්‍රවේශය කේන්ද්‍රිය කොට ගෙන පවත්වයි.

මෙම උපමා කතාවෙන් වැදගත් ප්‍රතිපත්ති කිහිපයක් උදාහරණවත් කරයි. පළමුවැන්න නම්, ඔබට මුහුන් (දේව වචනය) තිබිය හැක, එය යෙදීම සඳහා පිටි ප්‍රමාණයක්ද (ලෝකය) තිබිය හැක. එනමුත් එම (මුහුන් ටික) වචනය ලොවෙහි වෙසෙන ජනයාගේ හදවත්වලට (පිටි පිඬට) නොදැමුවහොත් කිසිම ඵලක් නොවේ.

දෙවනුව දෙවියන්වහන්සේ පිටි පිඬ වෙත මුහුන් යෙදීමට භාවිත කරනුයේ මිනිසා නම් නියෝජිතයාය. දෙවියන්වහන්සේ ඔබ වැනි මිනිසුන් ලෝකය වෙත දේව වචනය ගෙන යාමට තෝරා ගනී.

තුන්වනුව දෙවියන්වහන්සේගේ වාණිජයට අනුව කුඩා ප්‍රමාණයන් මහත් ශ්‍රේෂ්ඨ ප්‍රමාණයක් බවට නැවත නිෂ්පාදනය විය හැක. මුහුන්වල ක්‍රියාකාරීත්වය මෙන් ලෝකය නමැති පිඬ වෙත යොදන කුඩා ශුභාරංචි ප්‍රකාශන ප්‍රයත්නයක් විසිරී ගොස් මහත් අස්වැන්නක් කරා ව්‍යාප්ත විය හැකිය. සෙකරියා අනාගතවක්තෘ පැවසූ අයුරින් :

> **මක්නිසාද, කුඩා දේවල දවස හෙළා දැක්කේ කවුද? (සෙකරියා 4:10)**

## උපමා කතාවල සාරාංශය

යේසුස්වහන්සේ එතුමාගේ රාජ්‍යය පිළිබඳ මහත් සත්‍යයන් විදහා දැක්වීමට කාන්තාවන් උපයෝගි කර ගත් සේක. වැන්දඹුව පිළිබඳ උපමාව මඟින් යාච්ඤාවෙහිදී අඛණ්ඩව පැවැත්වීමෙහි ඇති වැදගත්කම පෙන්වා දෙයි. ස්වර්ග රාජ්‍යය නිසි ලෙස පිහිටුවීමට, සතුරා පරාජය කිරීමට, දෙවියන්වහන්සේගේ ජනතාවට සාධාරණය ඉටු වීමට යාච්ඤාවෙහි ඇති වැදගත්කම විදහා දක්වයි. මුහුන් පිඬ සහිත කාන්තාවගේ උපමාවෙන් දේව රාජ්‍යයෙහි ක්‍රියාව සඳහා පවතින වැදගත්කම විදහා දක්වයි. ඔබ ලෝකය නමැති පිටි පිඬ මත දේව වචනය නමැති මුහුන් ඉසිය යුතුය !

වැපිරීම පමණක් නොසෑහේ. ඔබ එම අස්වැන්න නෙලා ගැනීමටද ඉගෙන ගත යුතුය. මෙය නැතිවූ කාසිය සහිත කාන්තාවගේ උපමාවෙන් විදහා දක්වයි. ඇය තම කාසිය හමුවන තෙක් සෙව්වාය. ඔබ දේව වචනය නමැති මුහුන් වැපිරීම පමණක් නොසෑහේ. තම නැතිවූ ජනතාව සොයා ඔවුන් වෙත ගොස් අස්වැන්න නෙළා ගත යුතුය.

අවසාන වශයෙන්, කන්‍යාවන්ගේ උපමාවෙන් එළිදරව් කර දෙන්නේ කාලය අවසානයෙහිදී ජනතාවගෙන් සමහර අය දේව රාජ්‍යයට ඇතුළු වීමට සූදානමින් සිටින අතර සමහරු සූදානම් නොවී සිටින බවය. මෙම උපමා සියල්ල එක්කොට ගත් කල යේසුස්වහන්සේ නිරූපණය කරන කාන්තාව නම්, දේව රාජ්‍යයෙහි ක්‍රියාශීලී, යාච්ඤාවෙහි අඛණ්ඩව නිරත වන්නාවූ, දේව වචනයෙහි බීජය වපුරන්නාවූ, විනාශවූවන්ගෙන් අස්වැන්න නෙළා ගන්නාවූ, ආත්මික නින්දෙහි සිටින අයට අනතුරු ඇඟවීමේ හඬ නඟන්නාවූ කාන්තාවකි.

## යේසුස්වහන්සේගේ හාස්කම්

යේසුස්වහන්සේගේ මිහිපිට සේවයෙහි මුල් අවදියෙහිදී කාන්තාවන් ඇතුලත්වූ හාස්කම් කිහිපයක් එතුමා සිදු කළ සේක. මෙම අධ්‍යයනයෙහි ඔබගේ අදහස් ඔබම වාර්තා කරනු ඇත. උපමා කතා අධ්‍යයනය කිරීමට භාවිත කළ ක්‍රමය නැවත පුනරීක්ෂණය කරන්න. එම ක්‍රමයම යේසුස්වහන්සේ තම හාස්කම්වලදී කාන්තාවන් යොදාගත් ආකාරය වාර්තා කිරීමට භාවිත කරන්න. ඔබගේ අධ්‍යයනය මෙම කාරණ අනුව වාර්තා කරන්න.

**පුද්ගලයෝ :** යේසුස්වහන්සේ සිදු කළ හාස්කම්වලට සම්බන්ධ වූ අය

**ගැටලුව :** යේසුස්වහන්සේට මුහුණ පෑමට සිදුවූ අවශ්‍යතාවය

**සිදුකළ දෑ :** එම අවශ්‍යතාවයට යේසුස්වහන්සේ දැක්වූ ප්‍රතිචාරය කුමක්වීද? උන්වහන්සේ කළාවූ හාස්කම කුමක්ද? එය කළේ කෙසේද? හාස්කමෙහි ප්‍රතිඵලය කුමක්වීද?

### පේත්‍රුස්ගේ නැන්දම්මා

මතෙව් 8:1-15, මාර්ක් 1:30-31, ලූක් 4:38-39

**පුද්ගලයෝ :**

**ගැටලුව :**

**සිදු කළ කාරණා :**

### මහ ලේ රෝගී කාන්තාව

මතෙව් 9:20-22, මාර්ක් 5:25-29, ලූක් 8:43-48

**පුද්ගලයෝ :**

**ගැටලුව :**

**සිදු කළ කාරණා :**

### කානානිය ස්ත්‍රියගේ දුව

මතෙව් 15:21-28, මාර්ක් 7:24-30

**පුද්ගලයෝ :**

**ගැටලුව :**

**සිදු කළ කාරණා :**

**කුදු ස්ත්‍රිය :**

ලූක් 13:11-13

**පුද්ගලයෝ :**

**ගැටලුව :**

**සිදු කළ කාරණා :**

**යායිරස්ගේ දියණිය**

මතෙව් 9:18-19, 23-25, මාර්ක් 5:22,24, 38-42, ලූක් 8:41-42, 49-56.

**පුද්ගලයෝ :**

**ගැටලුව :**

**සිදු කළ කාරණා :**

**නායින් නුවර වැන්දඹුවගේ පුත්‍රයා**

ලූක් 7:11-15

**පුද්ගලයෝ :**

**ගැටලුව :**

**සිදු කළ කාරණා :**

**මරියා සහ මාර්තාගේ සොහොයුරා**

යොහාන් 11:1-44

**පුද්ගලයෝ :**

**ගැටලුව :**

**සිදු කළ කාරණා :**

## භාස්කම්වල සාරාංශය

යේසුස්වහන්සේ කාන්තාවන් සම්බන්ධයෙන් සිදු කළාවූ භාස්කම් සියල්ලෙහි කැපී පෙනෙන ලක්ෂණයක් වූයේ ඒ සියල්ල අනුකම්පාව පෙරදැරිකරගෙන සිදු කිරීමය. එය පේත්‍රුස්ගේ නැන්දම්මාට තිබූ කෙටි කාලීන රෝගයක් වූ උණ සුවකිරීම වුවද නැතහොත් මහලේ රෝගී කාන්තාව හා කුදු ස්ත්‍රිය මෙන් දිගුකාලීනව පැවති ආබාධයක් වුවද එතුමා සැලකිල්ල හා අනුකම්පාව දැක්වූ සේක.

යේසුස්වහන්සේගේ භාස්කම්වල කිසියම් රටාවකින් වර්ධනය වීමක් පෙන්නුම් කළ බව දැකීමට හැකිය. පළමුවෙන් උන්වහන්සේ කෙටිකාලීන රෝගී තත්ත්වයන් වන උණ වැනි රෝග සුවකළ සේක. ඉන්පසු දිගුකාලීනව පැවති රෝගවන මහලේ රෝගය, කුදු ස්ත්‍රියගේ කුදුබව වැනි රෝග සුව කළ සේක. මළවුන් නැගිටුවීමේද ක්‍රමානුකූල සංවර්ධනයක් පෙන්නුම් කළේය. පළමුව උන්වහන්සේ වැන්දඹුවගේ පුත්‍රයා සහ යායිරස්ගේ දුව වැනි මරණයට පත්වී කෙටි කලක් වූ අය

නැවත-නැගිටෙවූ සේක. ඉන්පසුව උන්වහන්සේ ලාසරුස්ව, එනම් මියගොස් දින කිහිපයක් සොහොන් ගෙයි ගත කළ කෙනෙකු ජීවනයට ගෙනා සේක.

යේසුස්වහන්සේ යායිරස්ගේ දුව මියගිය විගසම ඇගේ නිවසේදීම මරණින් ජීවනයට පත් කළ සේක. වැන්දඹුවගේ පුත්‍රයා තැන්පත් කිරීමට ගෙන යන අතරමඟදී නැගිටවූ සේක. ලාසරුස් මියගොස් දින කිහිපයක් ගතවී සොහොනෙහි තැන්පත් කළ පසුව නැවත-ජීවනයට ගෙන එනු ලැබීය. යේසුස්වහන්සේ ඔබගේ ජීවිතයෙහි ගැටලුවලට අවතීර්ණ වනුයේ කුමන තත්ත්වයේදී වුවත් එය ප්‍රශ්නයක් නොවේ. ඔබගේ අවශ්‍යතාවයෙහි ඕනෑම පියවරකදී එය විසඳීමට එතුමාගේ බලය සෑහේ.

## කාන්තාවන් උදෙසා හා කාන්තාවන් පිළිබඳව යේසුස්වහන්සේගේ වදන්

කාන්තාවන් සම්බන්ධ කරගෙන උපමා කතාවන් හා හාස්කම්වලට අමතරව යේසුස්වහන්සේ කාන්තාවන්ට වැදගත් වූ මාතෘකා පිළිබඳවද බොහෝ කාරණා පැවසූ සේක. මේ අතර විවාහය, කාමමිථ්‍යාචාරය, දරුවන් වැනි මාතෘකාද විය. බොහෝ අවස්ථාවලදී යේසුස්වහන්සේ සෘජුවම කාන්තාවන් සමඟ කතා බහ කළ සේක.

මෙම පරිච්ඡේදයෙහි වැඩිපුර අධ්‍යයනය සඳහා කොටසෙහි යේසුස්වහන්සේ කාන්තාවන්ට කතා කළාවූ වැදගත් වූ මාතෘකා ලැයිස්තුවක් සපයා ඇත. මෙම කොටස් සැලසුම් කර ඇත්තේ හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනයෙහි පාඩම් මාලාවෙහි කොටසක් වන දේව වචනය තව දුරටත් අධ්‍යයනය කිරීමට ඔබව යොමු කරවන පිණිසය. ඔබම දේව වචනයෙහි සත්‍යතාවය සෝදිසි කර බැලීම අවශ්‍යය. එබැවින් යේසුස්වහන්සේ කාන්තාව උදෙසා කළ මෙහෙය පිළිබඳ අධ්‍යයනය ඉදිරියට ගෙන යාමෙන් මෙම කොටසින් එය ඉටු කළ හැකිය.

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය කටපාඩමින් ලියන්න.

______________________________

______________________________

______________________________

2. යේසුස්වහන්සේ පැවසූ කාන්තාවන් හා සම්බන්ධිත උපමා කතා හතරක් නම් කරන්න.

(1) ______________________________

(2) ______________________________

(3) ______________________________

(4) ______________________________

3. කාන්තාවන් සම්බන්ධිත යේසුස්වහන්සේ ඉටු කළ හාස්කම් හතරක් නම් කරන්න.

(1) ______________________________

(2) ______________________________

(3) ______________________________

(4) ______________________________

(මෙම පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ දක්වා ඇත.)

## වැඩිදුර අධ්‍යයනය සඳහා

යේසුස්වහන්සේ කාන්තාවන්ට වැදගත් වූ විෂයයන් කිහිපයක් පිළිබඳව අදහස් ප්‍රකාශ කළ සේක. ඉන් සමහරක් නම් විවාහය, දික්කසාදය සහ දරුවන්ය. කාන්තාවන් උදෙසා සහ පිළිබඳව යේසුස්වහන්සේගේ සේවය පිළිබඳ දැනුම පුළුල් කරගනු සඳහා පහත සඳහන් ප්‍රකාශන පිළිබඳව සමීක්ෂණය කරන්න.

### විවාහය :

මතෙව් 19:4-6, 22:30
මාර්ක් 10:6-9, 12:25
ලූක් 20:34-35

### දරුවෝ :

මතෙව් 9:14, 18:3-5,6,10,14, 21:16
මාර්ක් 9:37,42, 10:14-15
ලූක් 9:48, 18:17

### දික්කසාදය - කාමමිථ්‍යාචාරය :

මතෙව් 5:27-28, 31-32, 15:19, 19:8-9, 11-12, 17-18
මාර්ක් 7:21-22, 10:3,5, 11-12, 19
ලූක් 16:18, 18:20

### කාන්තාවන් සම්බන්ධයෙන් :

මතෙව් 5:28, 9:20,22, 11:11, 13:33, 14:21, 15:38, 19:8,22, 24:41, 26, 27:55, 28:5
මාර්ක් 5:7, 10:12, 12:22, 14:3, 15:40-41
ලූක් 1:28,42, 4:26-27, 7:8, 8:2,43,47, 10:38, 11:27, 13:11,12,16,21, 15:8, 17:27,35, 20:32, 22:57, 23:27, 49, 55, 24:10,22,24
යොහන් 2:4, 4:7,9,11,15,17,19,20,21,25,27,28,39,42, 8:3,4,9,10, 16:21, 19:26, 23:13,15

# අටවන පරිච්ඡේදය

# ක්‍රියා පොතෙහි සඳහන් කාන්තාවෝ

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අවසන් කිරීමෙන් පසුව ඔබහට කළ හැකි කරුණු :

- ප්‍රධාන පදය කටපාඩමින් ලිවීමට.
- මුල් සභාවෙහි කාන්තාව ඉටු කළ මෙහෙයයන් හඳුනා ගැනීමට
- ක්‍රියා පොතෙහි සඳහන් කාන්තාවන් පිළිබඳව අධ්‍යයන තමා විසින්ම  තවදුරටත් කරගෙන යාමට

**ප්‍රධාන පදය :**

> **එසේය, ඒ දවස්වලදී මාගේ දාසදාසීන් කෙරෙහි මාගේ ආත්මය වගුරුවන්නෙමි. ඔව්හු අනාගත වාක්‍ය කියන්නෝය. (ක්‍රියා 2:18)**

## හැඳින්වීම

මෙම පරිච්ඡේදයෙහිදී ඔබ ක්‍රියා පොතේ කාන්තාවන් පිළිබඳ සඳහන් එක් එක් පදය අධ්‍යයනය කරනු ඇත. ක්‍රියා පොතින් සභාව තුළට ඇදහිලිවන්තයන් සංවිධානාත්මක කළ ආකාරය පවසන බැවින් මෙම අධ්‍යයනය මුල් සභාවේ කාන්තාවන් සේවයේ දැරූ ස්ථානය හා කළ සේවය ඉගෙනීමට දැනුම සපයනු ඇත.

මුල් සභාවෙහි කාන්තාවන් දැරූ ස්ථානය අවබෝධ කරගැනීම වැදගත් වේ. එයට හේතුව අද දින සභාවෙහි කාන්තාවන්ගේ සේවයෙහි පදනම තහවුරු වන බැවින්ය. එමඟින් කාන්තාවක් ලෙස එතුමාගේ ශරීරයෙහි, එනම් සභාවෙහි ඔබහට හිමි විශේෂ සේවය අනාවරණය කර ගැනීමට උපකාරී වනු ඇත.

## පොදු යොමුවන්

ක්‍රියා පොතෙහි කාන්තාවන් පිළිබඳව සඳහන් වූ වාර අනන්තය. මුල් කාලීන සභාවෙහි අධ්‍යයනයන්ට අයත් නොවන ප්‍රසිද්ධ කාන්තාවන් පිළිබඳ පද හයක් ඇතුලත් වේ :

- ඵාරාවෝගේ දියණිය - ක්‍රියා 7:21
- කන්දකී - පිලිප්ගේ ශුභාරංචි ප්‍රකාශය මඟින් හැරීම ලද නපුංසකයා සේවය කළාවූ කාන්තාව. ක්‍රියා 8:27
- දෘසිල්ලා - ෆිලික්ස් ආණ්ඩුකාරයාගේ බිරිඳ - ක්‍රියා 24:24
- බර්නිකී - අග්‍රිපා රජුගේ සහෝදරිය - ක්‍රියා 25:23
- අර්තෙමිස් දේවතාවිය - පිරිමින්ගේ සහ දෙවිවරුන්ගේ මව ලෙස සැලකෙන වන්දනාමාන ලබන දේවතාවිය. පැරණි ලෝකයෙහි ලෝක පුදුම හතෙන් එකක් ලෙස සැලකූ එපීසයේ දේවාලය ඇය වෙනුවෙන් සෑදුවකි. - ක්‍රියා 19:27
- පාවුල්ගේ සොහොයුරිය - ක්‍රියා 23:16

ඉතිරි යොමුවන් සියල්ල සභාවෙහි කාන්තාවන්හට හිමි ස්ථානය හා සේවය යටතේ පොදු මාතෘකාවකට ගොනු කොට තිබේ.

## සභාවෙහි සාමාජිකයෝ

ශුභාරංචිය ප්‍රකාශ කරන ලද බොහෝ ස්ථානවලදී විශ්වාස කළ අය අතර (යුදෙව් මෙන්ම අන්‍යජාතික) බොහෝ කාන්තාවෝ සඳහන්වේ. යෙරුසලමෙහිදී මහත් පිරිසක් ස්ත්‍රීන් මා පුරුෂයන් විශ්වාස කළහ (ක්‍රියා 5:14). සමාරියෙහිදී, පිලිප්ගේ දේශනාවෙහි ප්‍රතිඵලයක් ලෙස බොහෝ ස්ත්‍රීහු සහ පුරුෂයෝ අදහා ගත්තෝය (ක්‍රියා 8:12). යොප්පාවෙහි, දොර්කස් සහ අනෙකුත් ස්ත්‍රීහු මුල් කාලීන සභාවෙහි සාමාජිකයෝ වූහ (ක්‍රියා 9:36-43). ලුස්ත්‍රාවෙහි විසූ තිමෝතිගේ මව යුනිස් සහ ආච්චි ඇදහිලිවන්තියෝ වූහ (ක්‍රියා 16:1).

පිලිප්පියෙහි, ලිදියා යුරෝපයෙහි ක්‍රිස්තුස්වහන්සේ වෙතට හැරීම ලැබූ පළමුවන කාන්තාව වූවාය. එම සභාවට අයත් නම් සඳහන් නොකළ කාන්තාවෝ සිටියෝය (ක්‍රියා 16:13-15). තෙසලෝනිකයෙහි සහ බෙරීයයෙහි ප්‍රධාන කාන්තාවෝ බොහෝ දෙනෙකු අදහා ගත්තෝය (ක්‍රියා 17:4,12). අදහාගත් වැඩිම කාන්තාවන් කණ්ඩායමක් පිළිබඳ සඳහන් වන්නේ මකිදෝනියෙහි සභාවෙහිය. පාවුල්ගේ දේශනා කිරීමට අඩුම ප්‍රතිචාරය හිමිවූ අතිනසයෙහි පවා දමරිස් නම් කාන්තාවක් සහ තව කිහිප දෙනෙකු අදහාගත්තෝය (ක්‍රියා 17:34).

මෙහි කාන්තාවෝ ක්‍රියාශීලි නොවූ නරඹන්නන් නොවූහ. ඔව්හු සැබෑ ඇදහිලිවන්තයන්ව ශුභාරංචිය විශ්වාස කොට සභාවට බව්තිස්මය ලැබ එකතු වූහ.

> **නුමුත් ඔව්හු දෙවියන්වහන්සේගේ රාජ්‍යයද යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයද ගැන ශුභාරංචිය දේශනා කළාවූ පිලිප් විශ්වාස කොට, පුරුෂයෝද ස්ත්‍රීහුද බව්තිස්ම කරනු ලැබුවෝය**. (ක්‍රියා 8:12).

## මැදිහත්කාරකරුවන්

මුල් කාලීන සභාවෙහි කාන්තාවෝ යාච්ඤාවෙහි මැදිහත්කරුවෝ වූහ. යේසුස්වහන්සේගේ මව් වූ මරියා ශුද්ධාත්මයාණන්ගේ පැමිණීම අපේක්ෂාවෙන් යාච්ඤාවෙන් රැඳී සිටි පුරුෂයන් සමඟ යාච්ඤාවෙහි නිරත වූවාය.

> **මේ සියල්ලෝම ස්ත්‍රීන්ද යේසුස්වහන්සේගේ මවු වූ මරියාද උන්වහන්සේගේ සහෝදරයන්ද සමඟ එක්සිත්ව නොකඩවම යාච්ඤා කරමින් සිටියෝය**. (ක්‍රියා 1:14)

හෙරොද් විසින් පේත්‍රුස්ව සිරභාරයට ගත්විට ඇදහිලිවන්තයෝ යොහන් මාර්ක්ගේ මව් වූ මරියාගේ නිවසෙහි රැස්වී යාච්ඤා කළෝය. දේව දූතයා පේත්‍රුස්ව හිරගෙයින් මුදාගත් පසු, යාච්ඤා මධ්‍යස්ථානයෙහි දොරකඩ ළඟ සිටි පේත්‍රුස් දැක රෝදා, ජයග්‍රහණයේ පණිවිඩය යාච්ඤා කරමින් සිටි අනෙකුත් ඇදහිලිවන්තයන් වෙත රැගෙන ගියාය (ක්‍රියා 12:12-16).

පිලිප්පි නුවර කාන්තාවෝ කණ්ඩායමක් ගඟ අසල යාච්ඤාව සඳහා රැස්වූවෝය.

> **සබත් දවසේදී අපි පිටත් වී නුවර දොරටුවෙන් පිට යාච්ඤා ස්ථානයක් ඇතැයි අපට කල්පනාවුණ ගංගාවක් අද්දරට ගොස් හිඳ, රැස්ව සිට ස්ත්‍රීන්ට කතා කළෙමුව**. (ක්‍රියා 16:13)

මෙහි "කල්පනා වුණ බැවින්" යන පදයෙන් පෙන්නුම් වන්නේ මෙම කාන්තාවෝ සිරිතක් ලෙස මෙහි රැස්වී යාච්ඤා කළ බවකි.

## ශුද්ධාත්මයාණන්වහන්සේ ලැබුවන්

ක්‍රියා 2:1හි ලූක් වාර්තාකරනුයේ "ඔව්හු සියලු දෙන එක ස්ථානයක එක සිතින් රැඳී සිටියෝය" යනුවෙනි. මෙහි සඳහන් වන "සියලු දෙනා" නම් 1:14-15 සඳහන් කණ්ඩායමටය. ඔව්හු දෙවියන්වහන්සේගේ බලය වැගිරෙන තුරු බලා සිටියහ. මෙසේ බලා සිටි කෙනෙක් ලෙස මරියා සඳහන් කර ඇත. මෙයින් වැටහි යන්නේ ශුද්ධාත්මයාණෝ "සියල්ලන්" මත වැගිරෙන විට එහි කාන්තාවෝද සිටි බවය. මෙය නරඹමින් සිටි අය සිදුවන්නේ කුමක්දැයි විමසූ කල පේත්‍රුස් දුන් පිළිතුර වූයේ අනාගතවක්තෘ යෝවෙල්ගේ අනාගත කීම සපිරුණු බවය. එම අනාගත කීමෙහි කාන්තාවන් කෙරෙහිද ආත්මය වැගිරෙන බව පැහැදිලිව ප්‍රකාශ වී තිබිණි.

**මක්නිසාද දැනට දවල් තුන්වෙනි පැය පමණක් බැවින් නුඹලා සිතන්නා සේ මොවුන් මත්වෙලා නොවේ. නුමුත් මේ වනාහි අනාගතවක්තෘ වූ යෝවෙල් කරණ කොටගෙන කියන ලද කාරණයය. කෙසේදයත් : අන්තිම දවස්වලදී මාගේ ආත්මය සියලු මනුෂ්‍යයන් පිට වගුරුවන්නෙමි. නුඹලාගේ පුත්‍රයෝද දූවරුද අනාගතවාක්‍ය කියන්නෝය, නුඹලාගේ තරුණයෝද දර්ශන දකින්නෝය, නුඹලාගේ මහල්ලන් ද ස්වප්න දකිනවා ඇත. එසේය, ඒ දවස්වලදී මාගේ දාස දාසීන් කෙරෙහි මාගේ ආත්මය වගුරුවන්නෙමි, ඔව්හු අනාගත වාක්‍ය කියන්නෝය. (ක්‍රියා 2:15-18)**

ශුද්ධාත්මයාණන්ගේ පැමිණීමට ගත වර්ෂ ගණනකට පෙර දෙවියන්වහන්සේ එතුමාගේ බලය විදහා දැක්වීමට කාන්තාවන් ඇතුලත් කර තැබූ සේක.

## අනාගතවක්තෘවරියන්

යෝවෙල් අනාගතවක්තෘගේ අනාගත කීම කාන්තාවෝ සම්පූර්ණ කළ ආකාරය ක්‍රියා පොතෙහි වාර්තා කරයි.

**ප්‍රොපේතවාක්‍ය කියන්නාවූ කන්‍යා දූවරු සතර දෙනෙක් ඔහුට සිටියෝය. (ක්‍රියා 21:9)**

මෙම කොටස එනම් යෝවෙල් විසින් දෙන ලද අනාගත කීම් සහ පසුව ඔබට ඉදිරිපත් කරන්නාවූ පාවුල්ගේ ඉගැන්වීම් කිහිපයක් උදෙසා ඔබ "අනාගතකීම" යන පදයෙහි තේරුම දැන සිටීම වැදගත් වේ. බයිබල් අකාරාදිවලින් අගනා දෙකක් වූ ස්ට්‍රොන්ගේ (Strong's) සහ යන්ගේ(Young's) විවරණවලට අනුව මෙන්ම වයින් (Vine) විසින් නිෂ්පාදිත බයිබල් වචන පිළිබඳ අනර්ඝ අධ්‍යයනයට අනුව "අනාගතකීම" යන වචනය මෙසේ නිර්වචනය කොට දක්වා ඇත.

- ආනුභාවය යටතෙහි කතා කිරීම
- දෙවියන්වහන්සේගේ කැමැත්ත, සිත, මන්ත්‍රණය සහ මාර්ග එළිදරව් කිරීම
- ප්‍රසිද්ධියේ විස්තර කිරීම

"අනාගතකීම" සඳහා දෙවියන්වහන්සේගේ ආනුභාවය යටතෙහි ඉගැන්වීම හා දේශනා කිරීමද ඇතුලත් වේ. එසේම ශුද්ධාත්ම දීමනා අතර ඇති විශේෂ දීමනාවක් වූ අනාගත කීමේ දීමනාවද ඇතුලත්ය. ආත්මික දීමනා සම්බන්ධයෙන් කාන්තාවගේ කාර්යභාරය යටතේ ඔබ මෙම මාතෘකාව පසුව වැඩිදුර ඉගෙන ගනු ඇත.

## දෙවියන්වහන්සේගේ කාර්යයෙහි සහායකයෝ

ක්‍රියා පොතහෙි සඳහන් කාන්තාවෝ දෙවියන්වහන්සේගේ සේවය සඳහා භාණ්ඩමය සහාය සැපයූහ. පාවුල්ගේ මිෂනාරී කණ්ඩායමට ඉඳුම්හිටුම් සැපයුවේ ලිදියාය. දොර්කස් වැන්දඹු කාන්තාවන්හට ඇඳුම්පැළඳුම් සැපයීමේ මෙහෙවරක යෙදුණාය. කොරින්තියෙහිදී පාවුල්, අකිලා සහ ප්‍රිස්කිලාගේ නිවසෙහි නවාතැන් ගත්තේය. ප්‍රිස්කිලා තම ස්වාමියාගේ රැකියාවට සහාය සැපයුවා පමණක් නොව කොරින්ති සභාවෙහි වැදගත් ස්ථානයක්ද දැරුවාය. පාවුල් කොරින්තියේ ගතකල කාලයෙහි ඔව්හු තම ව්‍යාපාරයෙහි යෙදීමට පාවුල්ව සහභාගි කරගත්හ.

## පීඩාවට ලක්වීම සහ පීඩාවට ලක්කිරීම

මුල් කාලීන සභාවට පැමිණි පීඩාවලදී කාන්තාවෝ බොහෝ සේ පීඩාවට ලක්වූහ. ප්‍රේරිත වූ පාවුල් හැරීම ලැබීමට පෙර ඔහු නමස්කාර ස්ථානවලට, නිවෙස්වලට හා දේවස්ථානවලට ඇතුල් වී ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයම බැඳ යෙරුසලම වෙත ගෙන යාමට ක්‍රියා කළ බව දේව වචනය වාර්තා කරයි (ක්‍රියා 8:3 සහ 9:2). පසුව පාවුල් ඔහුගේ ක්‍රියාවන් පිළිගනිමින් කීවේ,

**පුරුෂයන්ද ස්ත්‍රීන්ද බැඳ හිරගෙවලට භාරදෙමින්, මරණය දක්වා මේ ලබ්ධි මාර්ගයට පීඩා කළෙමි (ක්‍රියා 22:4),** කියාය.

එසේම මුල් කාලීන සභාවට පීඩා කළාවූ කාන්තාවෝ සිටියහ. පිසිදියෙහි අන්තියෝකියෙහි "භක්තිවන්ත සහ ගරුකටයුතු" යුදෙව් කාන්තාවෝ පිරිසක් පාවුල් සහ බාර්ණබස්ට එරෙහිව පීඩාවක් ගොඩනැංවූහ.

## වගකිවයුතු පව්කරුවෝ

කාන්තාවන් පාපය පිළිබඳව වග කිව යුතු වේ. මින් ඉතාමත්ම දුක්ඛිත සිදුවීම නම්, ක්‍රියා 5:1-11හි සඳහන් සප්පිරා නම් කාන්තාව තම පුරුෂයා සමඟ වංචාකාරී මුදල් ගනුදෙනුවකට සහභාගි වීමය. ඔබ මෙම කතාව කියවාගෙන යන අතර මෙය ආදම් ඒවගේ සිදුවීමෙහි ප්‍රතිවිරුද්ධ චිත්‍රයක් බව පෙනී යනු ඇත. මෙහිදී සාතන් පුරුෂයාගේ සිතට වංචාකාරී සැලසුම ඇතුල් කළ අතර සප්පිරා එයට එකඟ වූවාය. සප්පිරා තම පුරුෂයා කළාවූ පාපය ඉතා හොඳින් දැන සිට එයට සහභාගි වීම හේතුවෙන් එක සමානවම වරදකරුවෙක් වූවාය. සදාචාරාත්මක කාරණාවලදී ස්ත්‍රිය තම පුරුෂයා හට අන්ධානුභාවයෙන් කීකරුවෙමින් යටත් වූ බව පවසමින් පාපයෙන් නිදහසට කරුණු දැක්විය නොහැක.

ක්‍රිස්තුස්වහන්සේගේ අනුගාමිකයන්ගෙන් එක හා සමාන ප්‍රමිතියක ශුද්ධභාවයක් අපේක්ෂා කෙරේ. එය ගැහැණු මෙන්ම පිරිමි පාර්ශවයෙන්ද එක සේ අපේක්ෂා කෙරේ.

# ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය කටපාඩමින් ලියන්න.

______________________________________________________________________

______________________________________________________________________

______________________________________________________________________

2. ක්‍රියා පොතෙහි වාර්තා කර ඇති පරිදි කාන්තාවෝ යෙදී සිටි සේවාවන් අතුරින් හතරක් නම් කරන්න.

(1) ____________________________________________________________

(2) ____________________________________________________________

(3) ____________________________________________________________

(4) ____________________________________________________________

3. පහත සඳහන් ප්‍රකාශන කියවා බලන්න. සත්‍ය ප්‍රකාශන ඉදිරියෙන් “ස” යනුවෙන්ද අසත්‍ය ප්‍රකාශන ඉදිරියෙන් “අ” යනුවෙන්ද සලකුණු කරන්න.

________අ. මුල් කාලීන සභාවෙහි කාන්තාවට අනාගත කීමට අවසර නොලැබුණි.

________ආ. කාන්තාවකගේ සහකරු ඇයට පව්කිරීමට පැවසූ විට එම කාන්තාව පාපය පිළිබඳ වගකිව යුතු නොවීය.

________ඇ. කාන්තාවන්ට යාච්ඤා කොට ශුද්ධාත්මයාණන්වහන්සේ ලබා ගැනීමට අවසර නොවීය.

________ඈ. සභාවෙහි පැවති යාච්ඤා රැස්වීම්වලට කාන්තාවෝ සහභාගි වූ බව දැක්වෙන වාර්තා කිසිවක් නොමැත.

(මෙම පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ දක්වා ඇත.)

## වැඩිදුර අධ්‍යයනය සඳහා

1. ක්‍රියා පොතෙහි වාර්තා කරනුයේ මුල් කාලීන සභාවෙහි කාන්තාවෝ අනාගතවක්තෘවරියන් ලෙස ක්‍රියා කළ බවය. පැරණි ගිවිසුම වාර්තා කරන්නේ ක්‍රිස්තුස්වහන්සේගේ පැමිණීමට පෙර කාන්තාවෝ මෙම මෙහෙයෙහි සේවයේ යෙදුණු බවය. පැරණි ගිවිසුමෙහි සඳහන් අනාගතවක්තෘවරියන් සම්බන්ධව පහත සඳහන් බයිබල් පද අධ්‍යයනය කර බලන්න.

| | | |
|---|---|---|
| මිරියම් | : | නික්මයාම 15:20 |
| දෙබෝරා | : | විනිශ්චයකාරයන්ගේ පොත 4:4 |
| හුල්දා | : | 2 රාජාවලිය 22:14, 2 ලේකම් 34:22 |
| නෝවාදියා | : | නෙහෙමියා 6:14 |
| නම සඳහන් නොවූ කාන්තාව | : | යෙසායා 8:3 |

2. ක්‍රියා පොතෙහි කාන්තාවන් සම්බන්ධ සියලුම උපුටා ගැනීම් පහතින් සඳහන් වේ. මෙම ලැයිස්තුව ඇසුරින් ඔබගේ අධ්‍යයනය තවදුරටත් කරගෙන යන්න. සමහර යොමුවන් වලදී නම් සඳහන් නොකොට ස්ත්‍රී කාණ්ඩයක් ලෙස සඳහන් කර ඇත. එක් එක් යොමුව පිළිබඳ ඔබගේ අදහස් ලිවීමට එක් කොටසක් වෙන් කර ඇත. ඔබ උදෙසා නිදර්ශන ලෙස පළමු යොමු දෙක පුරවා ඇත.

| ක්‍රියා පොතේ යොමුව | කාන්තාව | අදහස් |
|---|---|---|
| 1:14 | මරියා | ගෝලයන් සමඟ දිගටම යාච්ඥා කළාය. |
| 2:17 | දූවරු | අනාගත වාක්‍යයන් පවසනු ඇත. |
| 2:18 | | |
| 5:1-11 | | |
| 5:14 | | |
| 6:1 | | |
| 7:21 | | |
| 8:3 | | |
| 8:12 | | |
| 8:27 | | |
| 9:2 | | |
| 9:36 | | |
| 12:12-16 | | |
| 13:50 | | |
| 16:1 | | |
| 16:13 | | |
| 16:14-40 | | |

| |
|---|
| 17:4 |
| 17:12 |
| 17:34 |
| 18:2 |
| 18:18 |
| 18:26 |
| 19:27 |
| 21:5 |
| 22:9 |
| 22:4 |
| 23:16 |
| 24:24 |
| 25:13 |
| 25:23 |
| 26:30 |

# නමවන පරිච්ඡේදය

# යැවුම්පත්‍රවල සඳහන් කාන්තාවෝ : විශේෂිත සේවාවන්

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අවසන් කිරීමෙන් පසුව ඔබහට කළ හැකි කරුණු :

- ප්‍රධාන පදය කටපාඩමින් ලිවීමට.
- යැවුම් පත්‍රවල සඳහන් සේවයෙහි නියුතු කාන්තාවන් හඳුනා ගැනීමට
- මෙම කාන්තාවන් යෙදී සිටි සේවාවන් සාරාංශ කොට දැක්වීම
- යැවුම් පත්‍රවල ස්වාධීන අධ්‍යයනයෙහි යෙදීම

**ප්‍රධාන පදය :**

**එබැවින් විසුරුවනු ලැබූ ඔව්හු ගිය ගිය ස්ථානවල වචනය ප්‍රකාශ කළෝය.** (ක්‍රියා 8:4)

## හැඳින්වීම

අපි මීට පෙර ක්‍රියා පොතෙහි වාර්තා කර ඇති පරිදි මුල් කාලීන සභාවෙහි කාන්තාව දැරූ තත්ත්වය පිළිබඳව අධ්‍යයනය කළෙමු. යැවුම් පත්‍ර ලෙස නම් කරන්නාවූ පොත්වල මුල්කාලීන සභාවෙහි කාන්තාවන් කළාවූ සේවාවන් පිළිබඳ අමතර දැනුමක් සපයා දෙයි. එසේම කාන්තාවන් සඳහා විශේෂිත උපදෙස් ද සපයයි.

මෙම පරිච්ඡේදය සහ මීළඟ පරිච්ඡේද දෙක “යැවුම් පත්‍රවල කාන්තාවෝ” කෙරෙහි අවධානය යොමු කරනු ඇත. මෙම පරිච්ඡේදයෙහි මෙම පොත්වල සඳහන් කර ඇති විශේෂ සේවාවන් සහිත වූ කාන්තාවන් පිළිබඳව සාකච්ඡා කරමු. මීළඟ පරිච්ඡේදයෙහි යැවුම් පත්‍රවල උගන්වා ඇති පරිදි මුල්කාලීන සභාවෙහි කාන්තාවට හිමි වූ පොදු ස්ථානය පිළිබඳව සාකච්ඡා කරමු.

“යැවුම් පත්‍රවල සඳහන් කාන්තාවෝ” පිළිබඳ අවසාන පරිච්ඡේදයෙහිදී අපි මෙම පොත්වලින් ආමන්ත්‍රණය කර ඇති විශේෂිත කණ්ඩායම් පිළිබඳ අවධානය යොමු කරමු. (උදා: අවිවාහක, දික්කසාද වූ, විවාහ වූ, තරුණ, මහලු, මව්වරු . . . යනාදී ලෙස). එසේම කාන්තාවගේ ඇඳුම සහ පැවැත්ම, හැසිරීම පිළිබඳව විශේෂ උපදෙස් සලකා බලමු.

## යැවුම් පත්‍ර

අලුත් ගිවිසුම සම්පිණ්ඩනය වී ඇත්තේ ප්‍රධාන පොත් කාණ්ඩ හතරකිනි. එයට ශුභාරංචි පොත් වන මතෙව්, මාර්ක්, ලූක් සහ යොහන් පොත් ඇතුලත්ය. ශුභාරංචි පොත් කාණ්ඩය යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ජීවිතය සහ මෙහෙය විස්තර කරයි.

ක්‍රියා පොත මුල් කාලීන සභාව පිහිටුවීම පිළිබඳ විශේෂ විස්තරයක් ඇතුලත් කොටසකි.

අලුත් ගිවිසුමෙහි අනාගත වාක්‍යමය වූ එක් විශේෂ පොතක් ඇත. එය එළිදරව් පොතය.

මේ හැර අලුත් ගිවිසුමෙහි ඇතුලත් ඉතිරි සියලු පොත් යැවුම් පත්‍ර නමින් හැඳින්වේ. එම පොත් ලියුම් ආකාරයෙන් විශේෂිත ඇදහිලිවතුන් කණ්ඩායම් උදෙසා ලියූ බැවින් යැවුම් පත්‍ර ලෙස නම් කරනු ලැබේ. එම යැවුම් පත්‍ර මුලින්ම ලියූ කණ්ඩායමට මෙන්ම සියලු ඇදහිලිවන්තයින්ට අදාළ වන්නාවූ දේවානුභාවයෙන් යුක්ත දේව වචනයෙහි කොටසකි.

පහත දැක්වෙනුයේ යැවුම් පත්‍රවල ලැයිස්තුවකි. ශුද්ධාත්මයාණන්ගේ ආනුභාවය යටතෙහි එම පොත් ලියූ කතෘවරුද සඳහන් කොට තිබේ.

රෝම
1 කොරින්ති
2 කොරින්ති
ගලාති
එපීස
පිලිප්පි
කොලොස්සි
1 තෙසලෝනික
2 තෙසලෝනික
1 තිමෝති
2 තිමෝති
තිතස්
පිලෙමොන්
හෙබ්‍රෙව්

☞මේ යැවුම් පත්‍ර සියල්ල අපෝස්තුළු පාවුල් විසින් ලියන ලදී.

| | |
|---|---|
| යාකොබ් | යාකොබ් |
| 1 පේත්‍රුස් | පේත්‍රුස් |
| 2 පේත්‍රුස් | පේත්‍රුස් |

☞ මෙම පොත් එය ලියනු ලැබූ පුද්ගලයාගේ නමින් නම් කරන ලදී.

| | |
|---|---|
| 1 යොහන් | යොහන් |
| 2 යොහන් | යොහන් |
| 3 යොහන් | යොහන් |
| යූද් | යූද් |

## යැවුම් පත්‍රවල සඳහන් සේවාවන් සහිත වූ කාන්තාවෝ

### රෝමයෙහි සිටි කාන්තාවෝ

පේබී නම් කාන්තාව රෝමයෙහි විසූ ඇදහිලිවතුන් වෙතට රෝම පොත නම් ශ්‍රේෂ්ඨ දේවධර්ම ප්‍රකාශනය රැගෙන ගියාය. මුල් ග්‍රීක පිටපතෙහි පේබී හඳුන්වා දී ඇත්තේ "ඩියකොනස්" කෙනෙකු යනුවෙනි. මෙම පදය අලුත් ගිවිසුමෙහි 22 වතාවක් සඳහන් වේ. මෙයින් 18 වතාවක් එය "සේවකයා" ලෙසටද තුන්වතාවක් "ඩිකන්/උපස්ථායකයා" ලෙසටද පරිවර්තනය කර ඇත. පේබී පිළිබඳ සඳහනෙහිදී පරිවර්තකයෝ එය වැඩකාරයා ලෙසට වෙනස් කර ඇත. සමහර විට එය පරිවර්තකයෝ දැරූ අදහස මත සිදුකරන්ට ඇත.

පාවුල් විසින් පේබී රෝමයෙහි ඇදහිලිවතුන් වෙත හඳුන්වා දෙනු ලබමින් පවසන්නේ:

> **ඇට නුඹලාගෙන් ඕනෑකරන කවර කාරණයකදී නමුත් උපකාර කරන ලෙසත්, නුඹලාට ඇ භාර කරමි. මක්නිසාද ඈ බොහෝ දෙනෙකුගේද මාගේද උපකාරකාරියෙක්ව සිටියාය. (රෝම 16:2)**

මෙම කොටස ඇසුරින් සමහරු සිතන්නේ ජේබී පාවුල් හට ආගන්තුක සත්කාර සපයා දෙමින් කෑම බීම දෙමින්, රෙදි සේදීම කළ බවය. නුමුත් "උපකාරකයා" නමින් හැඳින්වූයේ උපකාර කිරීම සහ "ඉදිරියෙහි නැගී සිටින්නා, ප්‍රධාන නායකයා" යනුවෙනි. පාවුල් මෙහිදී ඉල්ලා සිටින සැලකිල්ල නම් 1 තෙසලෝනික 5:12-13 සහ 1 තිමෝති 5:17හි පුරුෂ පාර්ශවයේ වැඩිමහල්ලන් හා නායකයන් හට දක්වන සැලකීම ජේබීටද දක්වන ලෙසය.

රෝම 16හි පාවුල් රෝමයෙහි විසූ අකිලා නම් කෙනෙකු හා විවාහ වී සිටි ප්‍රිස්කා නම් කාන්තාවක් පිළිබඳව ප්‍රකාශ කරයි. ලූක් විසින් ඇය ප්‍රිස්කිලා ලෙස හඳුන්වයි. ප්‍රිස්කා යනු එම නමෙහි කෙටි යෙදුමකි. අපි අටවැනි පරිච්ඡේදයෙහිදී ඇය පිළිබඳව ඉගෙන ගතිමු.

පාවුල් ඇයව හඳුන්වා දීමට භාවිත කළ "සහකාරිය" යන පදය පාවුල්ගේ "සේවයෙහි කොටස්කාරිය" වූ බව අදහස් වෙයි. පාවුල් තවදුරටත් අවධාරණය කරමින් අකිලා හා ප්‍රිස්කිලා අන්‍ය ජාතික සභාව උදෙසා සේවයෙහි ඉතා වැදගත් කාර්යයක් ඉටු කළ බවත් ඒ සඳහා ජීවිතය පවා පරදුවට තැබූ බවත් පවසයි.

රෝමයෙහි විසූ අනිකුත් කාන්තාවන් පිළිබඳව පාවුල්ගේ ලැයිස්තුවට ඇදහිලිවතුන් උදෙසා වෙහෙසව ක්‍රියා කළ මරියා ඇතුලත් වේ. ගෘහ මූලික තනතුර දැරූ බව පෙනෙන නාර්කිසස්, තෘපේනා, තෘපෝසා නම්වල අරුත සියුමැලි, හුරුබුහුටි යනුය. ස්වාමීන්වහන්සේ තුළ බොහෝ වෙහෙස දැරූ "ප්‍රිය වූ පර්සිස්" තවත් එහි ජුලියා නම් කාන්තාවක් සඳහන් වේ. ඇය පිළිබඳ විස්තර කර නැත. රූපස්ගේ මව සහ නේරියස්ගේ සහෝදරියද වූ කාන්තාවන් දෙදෙනෙකු පිළිබඳ සඳහන් වුවද ඔවුන්ගේ නම් නොපැවසේ. යූනියස් නම් කාන්තාව පිළිබඳ රෝම 16:7හි සඳහන් වේ. ඇයගේ ඇදහිල්ල පිළිබඳව පාවුල්තුමා සඳහන් කරන අතර ක්‍රිස්තුස්වහන්සේ උදෙසා ඇය පාවුල් සමඟ හවුල් හිරකාරියක්ද වූවාය.

## අනෙක් යැවුම් පත්‍රවල සඳහන් කාන්තාවෝ

ක්ලොයි පිළිබඳව 1 කොරින්ති 1:11හි සඳහන් වේ. ඇය කොරින්ති සභාවෙහි සිදුවන ගැටලුවක් පිළිබඳව ඇය පාවුල්ට වාර්තාවක් යැවූවාය. පිලෙමොන් පොතෙහි පාවුල් පිලෙමොන්ගේ භාර්යාවවූ අපියාව ආමන්ත්‍රණය කරයි. මෙම යුවල තම නිවසෙහි සභාවක් පැවැත්වූහ. ලිදියා සහ නිම්පියා එසේ කළහ.

එවෝදියා සහ සින්තිකි නම් දෙදෙනා පිළිබඳ පිලිප්පි 4:2හි සඳහන් වේ. ඔව්හු පාවුල් සමඟ ධර්මදූත සේවයෙහි යෙදුණාවූ අය විය හැකිය. මන්ද ඔවුන් පිළිබඳව පවසමින් පාවුල් "මාගේ අනෙකුත් හවුල් සේවකයන් සමඟ මාගේ ශුභාරංචි සේවයෙහි වැඩ කළෝය" කීවේය.

2 තිමෝති 4:21හි පාවුල් "ක්ලෞදියා සහ සියලු ඇදහිලිවතුන්" වෙත ආචාර කරයි. එනමුත් මෙම කාන්තාව පිළිබඳව අපට කිසිවක් විස්තර සපයා නැත.

## සාරාංශය

යැවුම් පත්‍රවල සඳහන් කාන්තාවන් පිළිබඳ පුනරීක්ෂණය කිරීමෙහිදී පෙනී වන කරුණ නම් මුල් කාලීන සභාවෙහි කාන්තාව අක්‍රිය අය නොවූ බවය. ඔව්හු පුරුෂයන් සමඟ ඔවුන් හා සමානවම ශුභාරංචිය ව්‍යාප්ත කිරීමෙහි වෙහෙස දැරුවෝය.

දේව භක්තික කාන්තාවෝ සම සේවකයන් මෙන් සේවයෙහි නිරත වූහ. මහත් වගකීම් දැරූහ. තම නිවෙස්වල ගෘහ සභා සංවිධානය කළෝය. තම ඇදහිල්ල උදෙසා සිරගත කරනු ලැබූහ. ඔව්හු සියලු ඇදහිලිවතුන් මෙන් පීඩාවට ලක්වූහ. ඔව්හු යෙරුසලමෙන් නෙරපනු ලැබූ කල ගියාවූ සෑම තැන්හිදී ශුභාරංචිය පතල කළෝය.

**එබැවින් විසුරුවනු ලැබූ ඔව්හු ගිය ගිය ස්ථානවල වචනය ප්‍රකාශ කළෝය. (ක්‍රියා 8:4)**

මෙම කාන්තාවෝ ලෝකයෙහි ආත්මික සරුබිම්වල අස්වැන්න නෙලීමට තමාට හිමි ස්ථානය සොයමින් සිටින සියලු කාන්තාවන්ට ආදර්ශයක් හා ආකෘතියක් සමඟ පෙලඹවීමක් සපයති.

# ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය කටපාඩමින් ලියන්න.

_______________________________________________

_______________________________________________

_______________________________________________

2. පළමු ලැයිස්තුවේ නම් බලන්න. දෙවන ලැයිස්තුවෙහි සඳහන් විස්තරය වඩාත්ම හොඳින් ගැළපෙන නම ඉදිරියෙන් එම අංකය ලියන්න.

| | |
|---|---|
| _________පේබී | 1. පාවුල් බේරා ගැනීමට තම ජීවිතය අවදානමට ලක් කළාය. |
| _________යුනියස් | 2. රෝම පොත පාවුල් වෙතින් රෝම සභාව වෙතට රැගෙන ගියාය. |
| ________ලිදියා | 3. කොරින්තියේ සභාව පිළිබඳ වාර්තාව පාවුල් වෙතට යැවීය. |
| ________ක්ලෝයි | 4. පාවුල් සමඟ හවුලේ සිරගත වූ කාන්තාවකි. |
| ________ප්‍රිස්කා | 5. ඇගේ නිවසෙහි සභාවක් පවත්වා ගෙන ගියාය. |

(මෙම පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ දක්වා ඇත.)

# වැඩිදුර අධ්‍යයනය සඳහා

යැවුම් පත්‍රවල කාන්තාවන් පිළිබඳව ඇති විශේෂ කාරණාවලට අමතරව ඉතා වැදගත් මාතෘකා එනම් ඇදහිලිවන්තයින්ගේ ජීවිතවලට අදාළ කරගත හැකි සංකල්ප බොහෝ ඇතුලත් වේ. එබැවින් මෙම ප්‍රතිපත්ති පිළිබඳ ඔබගේ දැනුම පුළුල් කර ගැනීම උදෙසාත් කාන්තාව නම් විෂයය පිළිබඳ යැවුම් පත්‍රවල ඇතුලත් කාරණා වඩා හොඳින් පුනරීක්ෂණය සඳහාත් ඔබ මෙම පොත් කියවන මෙන් අපි යෝජනා කරමු. වෙනම කොල භාවිත කොට එක එක පොත සඳහා වගුව බැගින් සාදන්න. එක එක වගුවෙහි පහත සඳහන් කරුණු ඇතුලත් කරන්න.

**පොතෙහි නම :** පොතේ නම ලියන්න.
**කතෘ** : (මෙම පරිච්ඡේදයෙහි ඇතුලත් කරුණු වලදී සපයා ඇත).
**ලියන ලද්දේ කාටද?** සැබවින්ම යැවුම් පත්‍රයේ පළමුවන පරිච්ඡේදයෙහි මෙය ලියන ලද්දේ කාහටද යන වග සඳහන් වේ. මෙම එක එක යැවුම් පත්‍රය මුල් කාලීන සභාවට විශේෂ ඇදහිලිවන්තයින් කණ්ඩායමකට ලියන ලද නමුත් දේවානුභාවයෙන් යුතුව ලියන ලද බැවින් සියලු ඇදහිලිවතුන්හට අදාළ වන බව මතක තබාගන්න.

**ඔබ එක එක පරිච්ඡේදය කියවන ගමන්, එම වගුවෙහි පහත සඳහන් විස්තර ලියන්න.**

**පරිච්ඡේදයෙහි අංකය :** ඔබ අධ්‍යයනය කරන පරිච්ඡේදයෙහි අංකය.
**පරිච්ඡේදයෙහි සාරාංශය :** සාරාංශය මඟින් ඔබ ඉගෙන ගන්නාවූ පරිච්ඡේදයෙහි මධ්‍ය පණිවුඩය (කේන්ද්‍රිය පණිවුඩය) ඔබගේ වචනයෙන් ලියන්න.
**පරිච්ඡේදයෙහි ප්‍රධාන පදය :** ප්‍රධාන පදය වනුයේ සම්පූර්ණ පරිච්ඡේදයෙහිම ඇතුලත් සංකල්ප හෝ මූලික ප්‍රතිපත්ති කැටිකොට දක්වන පදයකි.
**පෞද්ගලික අදාළ කරගැනීම :** ඔබහට උගන්වන ලද කරුණු ඔබගේ පෞද්ගලික ජීවිතයෙහිදී අදාළ කරගන්නා ක්‍රමය? මෙම පරිච්ඡේදය ඔබහට පෞද්ගලිකව බලපාන ආකාරය විස්තර කරන්න.

**මෙම අධ්‍යයන රටාව ඔබහට පැහැදිලි කරදීම සඳහා යූද්ගේ කෙටි යැවුම් පත්‍රය ඇසුරින් පහතින් නිදර්ශනයක් සපයා ඇත.**

**පොතෙහි නම :** යූද්
**කතෘ :** යූද් (1 පදය)
**ලියන ලද්දේ :** පියවූ දෙවියන්වහන්සේ තුළ පවිත්‍ර කරනු ලැබූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ ආරක්ෂා කරනු ලැබූ සහ කැඳවනු ලැබූවන්ට (1 පදය)
**පරිච්ඡේද අංකය :** එක
**සාරාංශය :** යූද් ඇදහිලිවතුන්ට අනතුරු දක්වමින් වංචාකාරයන්ගෙන් ප්‍රවේසම්වන ලෙසත් සැබෑ ඇදහිල්ලේ ස්ථිරවට සිටින ලෙසත් ඉල්ලා සිටියි.
**ප්‍රධාන පදය :** නුමුත් ප්‍රේමවන්තයෙනි, අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේරිතයන් විසින් පළමු කියන ලද වචන, ... සිහි කරන්න (17 පදය)
**අදාළ කර ගැනීම :** මාව යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ ඇති සැබෑ ඇදහිල්ලෙන් වෙන් කිරීමට උත්සාහ කරන වංචාකාරයන් (රැවටිලිකාරයන්) සිටිය හැක. එබැවින් මෙම 20-21 පදවල සඳහන් උපදෙස් පිළිපැද ඔවුන්ගෙන් බේරිය යුතුය.

## දහවන පරිච්ඡේදය

# යැවුම් පත්‍රවල සඳහන් කාන්තාවන් : සභාවේ ස්ථානය

### අරමුණු :

මෙම පරිච්ඡේදය අවසන් කිරීමෙන් පසුව ඔබහට කළ හැකි කරුණු :

- ප්‍රධාන පදය කටපාඩමෙන් ලිවීමට
- කාන්තාවන් පිළිබඳව අපොස්තුළු පාවුල්තුමා විසින් ලියන ලද ඡේදයන් විග්‍රහ කිරීමට
- මුල් සභාවේ කාන්තාවන්ගේ ස්ථානය පිළිබඳ යැවුම් පත්‍රවල ඇති ඉගැන්වීම් සාරාංශ කිරීමට.

### ප්‍රධාන පදය

**නුඹලා සියල්ලන් ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ එක්කෙනෙක්ව සිටින නිසා, යුදෙව්වෙක් හෝ ග්‍රීකයෙක් නැත්තේය. දාසයෙක් හෝ නිර්දාසයෙක් නැත්තේය, පුරුෂයෙක් හා ස්ත්‍රියෙක් නැත්තාහ (ගලාති 3:28).**

### හැඳින්වීම

පසුගිය පරිච්ඡේදයෙන් යැවුම්පත්‍රවල විශේෂ සේවාවන් සහිත කාන්තාවන් පිළිබඳව සාකච්ඡා කරන ලදී. මෙම පොත්වලම සභාවේ කාන්තාවන්ගේ සාමාන්‍ය ස්ථානය ගැන එළිදරව් කර ඇති දේ දැන් අපි අධ්‍යයනය කරමු.

අපොස්තුළු පාවුල් විසින් කාන්තාවන් ගැන කර ඇති ඉගැන්වීම්වලින් සමහරක් තේරුම් ගැනීමට අපහසුය. ශුද්ධාත්මයාණන්වහන්සේගේ ආනුභාවයෙන් පාවුල් විසින් බෙදාගෙන ඇති කරුණු විග්‍රහ කිරීමේ අපහසුතාවය පිළිබඳව පේත්‍රැස් අපොස්තුළුවරයා විසින් ද සඳහන් කර තිබේ.

**එමෙන්ම සියලු ලියුම්වලත් ඔහු මේ දේවල් ගැන කතාකර තිබේ. එහි තේරුම්ගන්ට අමාරු සමහර දේ තිබේ, නූගත් අස්ථිර තැනැත්තෝ අන් ලියවිලිමෙන් තමුන්ගේම විනාශයට ඒවාත් පෙරළති. (2 පේත්‍රැස් 3:16)**

සමහර කරුණු තේරුම් ගැනීමට අපහසු බව පේත්‍රැස් සඳහන් කරන නමුත් මේවා පිළිබඳව තර්ක කරන්නේ ඉගෙනුමක් නැති අස්ථිර අය විසින් පමණක් බව පෙන්වා දෙයි. මෙසේ තර්ක කිරීමෙන් තමන්ටම හානි කරගන්නා බවද කියවේ. වෙනස් ආකාරයකින් පවසන්නේ මේ කරුණු ගැන තර්ක කිරීමෙන් කිසිවෙකුට ප්‍රයෝජනයක් ඇති නොවන නමුත් තර්ක කරන අයට ඒවා හානියක් වන බවය.

විවිධ විචාරකයන් කාන්තාවන් පිළිබඳ පාවුල්ගේ ඉගැන්වීම් විවිධාකාරයෙන් විග්‍රහ කර ඇත. එහෙත් අප විසින් මතකයේ තබා ගත යුතු කරුණක් නම් විග්‍රහයන් විවිධාකාරවීම නිසා ඇදහිලිවතුන් අතර වාද විවාද මතුවිය යුතු නොවන බවය.

මෙම අත්පොතෙහි ඇතුළත් සාකච්ඡාව ඔබගේම විග්‍රහයට අනුව හෝ ඔබගේ නිකාය දරන විග්‍රහයට හෝ වෙනස් නම් එය භේදයක් ඇතිකිරීම අරමුණුකොට කර ඇති දෙයක් නොවන බව කාරුණිකව සලකන්න. ඇතැම් අංශයන් පිළිබඳව ඔබ විසින් ඒත්තුගන්නා ලද විග්‍රහයන් තිබේ නම් හෘදය සාක්ෂිය උදෙසා එම අදහස්වලම සිටීම අවශ්‍ය බව සලකන්න. පාවුල්තුමාද එසේ පවසා ඇත. මෙහිදී මතකයේ තබාගත යුතු වැදගත් කරුණක් නම් පාවුල්තුමාගේ යැවුම් පත්‍රවලත් අනිකුත් යැවුම් පත්‍රවලත් ඉදිරිපත් කර තිබෙන අදහස් කාන්තාවන් සභාවේ ක්‍රියාකාරී සේවයේ යෙදී සිටි විටය. ක්‍රියා සහ අනිකුත් යැවුම් පත්‍රවල කාන්තාවන්ගේ සේවාවන් ගැන අප විසින් කලින් පරිච්ඡේදවල අධ්‍යයනය කර තිබේ. මුල් සභාවේ ආකාරයට ක්‍රිස්තියානි ක්‍රියාකාරී සේවයේ කාන්තාවන් යෙදීම තහනම් කළ හැකි කිසිම ඡේදයක් යැවුම් පත්‍රවලින් යොදා ගැනීම කළ නොහැකිය.

# ඉගැන්වීම සහ දේශනා කිරීම

සභාවේ කාන්තාවන්ගේ භූමිකාවට බලපාන යැවුම් පත්‍රවල එන ජේදවලින් දුෂ්කර වූ ජේදයක් 1 කොරින්ති පොතේ සඳහන් වේ.

> **මක්නිසාද දෙවියන්වහන්සේ වියවුල්කමේ නොව සමාදානයේ දෙවියන්වහන්සේය. ශුද්ධවන්තයන්ගේ සියලු සභාවන්හි එසේමය. ස්ත්‍රීහු සභාවලදී නිශ්ශබ්දව සිටිත්වා. මක්නිසාද කථාකරන්ට ඔවුන්ට අවසර නැත. ව්‍යවස්ථාවෙත් කියා තිබෙන ලෙස ඔව්හු යටත්ව සිටිත්වා. ඔව්හු යමක් දැනගන්ට කැමති නම්, ගෙදරදී තමුන්ගේම පුරුෂයන්ගෙන් විචාරත්වා. මක්නිසාද සභාවේදී කථාකිරීම ස්ත්‍රියකට ලජ්ජාවක්ය. (1 කොරින්ති 14:33-35)**

සභාවේ දේශනාකිරීම සහ ඉගැන්වීම කාන්තාවන්ට තහනම් කිරීම පිණිස මෙම ජේදය බොහෝ අවස්ථාවල භාවිත කර ඇත. කාන්තාවන් සම්පූර්ණයෙන් නිශ්ශබ්දව සිටිය යුතු බව පාවුල් මෙයින් අදහස් කළේ නැත. ඊට කලින් පරිච්ජේදයේ කාන්තාවන් යාච්ඤා කිරීමේදී හෝ අනාගත වාක්‍යයන් පැවසීමේදී කෙසේ තම හිස වසාගෙන සිටිය යුතුද ආදි වශයෙන් බොහෝ විස්තර සාකච්ජා කරයි (මේ පරිච්ජේදයේ පසු අවස්ථාවක අපි මේ පිළිබඳව සාකච්ජා කරමු). ඔවුන් සභාවේ කොහෙත්ම කථා නොකළ යුතු නම් ඔහු මේ ආකාර සාකච්ජාවකට කාලය නාස්තිකරන්නේ ඇයි?

ශුද්ධාත්මයාණන්වහන්සේ පැමිණි අවස්ථාවේ ජේත්‍රුස් විසින් එම සිද්ධිය යෝවෙල් අනාගතවක්තෘගේ අනාවැකිය සම්පූර්ණ කළ බව පැවසූ බව ක්‍රියා පොත අධ්‍යයනයේදී ඔබ ඉගෙන ගත්තේය. මෙම අනාවැකියෙන් ශුද්ධාත්මයාණන් “දූවරුන් හා දාසීන්” මත පැමිණෙන බවත් ඔවුන් අනාවැකි පවසන බවත් පවසා ඇත.

පාවුල්තුමාගේ තේරුම්ගැනීමට දුෂ්කර ජේදයන්ගෙන් එකක් ලෙස ජේත්‍රුස් විසින් පවසා ඇත්තේ 1 කොරින්ති 14 වන්නට පුළුවන. මෙම ජේදයේ එන ග්‍රීක් භාෂාවෙන් පරිවර්තනය කර ඇති 34 වෙනි පදයේ සඳහන් “කථාකිරීමට” යන වචනයේ නියම අර්ථය මේ පිළිබඳ ඉතා වැදගත් ඉඟියක් වේ. මේ වචනයේ අර්ථය ප්‍රසිද්ධියේ කථාකිරීම යන අර්ථය නොව “එකිනෙකා අතර කථාව, ප්‍රශ්න කිරීම් හා තර්ක කිරීම්” වැනි දේ අදහස් කරයි.

ඔබගේ බයිබලයේ 1 කොරින්ති 14 කියවන්න. මේ පරිච්ජේදයේ අදහස් අනුව පාවුල්ගේ පරමාර්ථය සභාව තුළ වියවුල්කම වැළැක්වීමය. නමස්කාර මෙහෙයකදී සියලුම දේ පිළිවෙළට සිදු කළ යුතුය යන්න ඔහුගේ අවධානය විය. මේ නිසා පාවුල් කාන්තාවන්ට කියන්නේ සභාවේ මෙහෙය තුළදී එකිනෙකාට කථා නොකරන ලෙසත් ප්‍රශ්න නොඅසන ලෙසත් හා කාන්තාවන් විසින් ගෙදරදී තම පුරුෂයන්ගෙන් එම කාරණා පැහැදිලි කරගත යුතු බවත්ය.

මෙම උපදේශය දීමට පසුබිම්වූ සංස්කෘතික පසුබිම පිළිබඳවත් සලකා බැලිය යුතුය. යුදා සභාවන්හි කාන්තාවන් එක් පාර්ශවයකත් පුරුෂයන් වෙනත් පාර්ශවයකත් වාඩි වූහ. මේ හේතුව නිසා කාන්තාවන් එකිනෙකා සමග කථාකිරීම පමණක් නොව පුරුෂ පාර්ශවයේ සිටි පුරුෂයන්ගෙන් ශබ්ද නගා ප්‍රශ්න අසන්ට ඇත. යුදා ජනතාව අතර වැඩකරන එක් අයෙක් පවසන අන්දමට අද පවා සිනගෝගයේ ප්‍රධානියා දේශනා කුඩුවේ සිට ශබ්ද නගා කාන්තා පක්ෂයට නිශ්ශබ්ද වන ලෙස පැවසීම සිදුවේ.

මෙම ජේදයේ පාවුල්ගේ අවධානය වූයේ නියමානුකූල පිළිවෙළ වන අතර, මේ ජේදය හා ඔහු සභාවේ සාමාන්‍ය මෙහෙය පිළිබඳව කෙරෙන විස්තරයේ අඩංගු කරුණු අතර පරස්පර විරෝධී බවක් නැත.

> **එසේවී නම්, සහෝදරයෙනි, කිමෙක්ද? නුඹලා රැස්වන කල එක් එක්කෙනාට ගීතිකාවක්ද ගුරුකමක්ද එළිදරව්කිරීමක්ද අන් භාෂාවක්ද තේරුම්කරදීමක්ද ඇත්තේය. සියල්ල වර්ධනයවීම පිණිස කරනු ලැබේවා. යමෙක් අන් භාෂාවකින් කථාකෙරේ නම්, දෙදෙනෙක් නොහොත් වැඩිවුණොත් තුන්දෙනෙක් පමණක් එක්කෙනෙක් පාසා එක්කෙනෙක් එසේකෙරේවා, එක්කෙනෙක් තේරුම්කරදේවා. ...ධර්මවාක්‍ය කියන්නෝ දෙදෙනෙක් නොහොත් තුන්දෙනෙක් කථාකරත්වා. අනික් අය විමසා බලත්වා. ...මක්නිසාද සියල්ලන් ඉගෙනගන්නා පිණිසත්, සියල්ලන් ධෛර්යවෙන පිණිසත්, සියල්ලන්ට එක්කෙනෙකු බැගින් ධර්මවාක්‍ය කියන්ට පුළුවන. (1 කොරින්ති 14:26-27, 29, 31)**

නමස්කාර මෙහෙයක් උදෙසා පාවුල් විස්තර කරන ක්‍රියා පිළිවෙළ ඉතාම සරල රැස්වීම් ආකාරයක් වේ. ගීතිකාවක්, ධර්ම වාක්‍යයක්, අන් භාෂාවක්, එළිදරව්වක් හෝ පරිවර්තනයක් ඇති සෑම කෙනෙක්ම ඒවා පිළිවෙළට ඉදිරිපත් කළ යුතු බව ඔහු පවසයි. මෙහි සෑම කෙනෙක්ම යන්නට කාන්තාවන් ද ඇතුලත් වේ.

## සම්පූර්ණ නිශ්ශබ්දතාවයද?

කොරින්ති පොතේ තිබුණ ඡේදයට සමාන යැවුම් පත්‍රවල ඇති තවත් ඡේදයක් ගැන මෙහිදී සාකච්ඡා කළ යුතුය.

> **ස්ත්‍රී නිශ්චලව සියලු ආකාර යටත්කම ඇතුව ඉගෙනගනීවා. උගන්වන්ටවත් පුරුෂයා කෙරෙහි බලය පවත්වන්ටවත් ස්ත්‍රියෙකුට ඉඩ නාරිමි. ඈ නිශ්ශබ්දව සිටීවා. මක්නිසාද පළමුකොට ආදම්ද පසුව ඒවද සාදනු ලැබිය. තවද ආදම් රැවටුණේ නැත. නුමුත් ස්ත්‍රී රැවටී, වරදට වැටී සිටින්නිය. (1 තිමෝති 2:11-14)**

“නිශ්ශබ්දව” යන වචනයෙන් කාන්තාවන් කිසිවිටෙක කථා නොකළ යුතුය යන්න අර්ථවක් නොවේ. ඔවුන් සම්පූර්ණ නිශ්ශබ්දතාවයෙන් ඉගෙන ගත යුතු වුවා නම් ඔවුන්ට තමන් ඉගෙන ගන්නා දේ ගැන කිසිවිටෙකත් ප්‍රශ්න ඇසීමට හෝ සාකච්ඡා කිරීමට නුපුළුවන. පාවුල් විසින් “නිශ්ශබ්දව” යන වචනය භාවිත කිරිමෙන් අදහස් කරන ලද්දේ සන්සුන්, ඉගෙන ගැනීමට බාධා නොවන ආකාරයේ ඉගෙන ගැනීමට විවෘත ආත්මයක් ඇතිව සිටීමයි.

“බලය පවත්වන්ටත්” යන වචනවලින් අදහස් කරන්නේ පුරුෂයාට ඉහළින් බලය පවත්වන්ටත් අණ දීම හා කෙනෙක් තමාගේම පුද්ගලික ආධිපත්‍යයෙන් ක්‍රියා කිරීමය. අප කිසිවෙක් තමාගේම පුද්ගලික ආධිපත්‍යයෙන් ක්‍රියා නොකළ යුතුය. අප එකිනෙකාට යටත්වීමේ විෂය ගැන සාකච්ඡා කරන විට අප සෑම කෙනෙක්ම එකිනෙකාට යටහත් විය යුතු බව එනම් පුරුෂයන් හා ස්ත්‍රීන් සැමදෙනම එකිනෙකාට යටත් විය යුතු බව ඉගෙන ගන්නවා ඇත. නමුත් මේ ඡේදයෙන් පාවුල් විශේෂයෙන් කාන්තාවන්ට අවවාද කරන්නේ පුරුෂයන්ට ඉහළින් ආධිපත්‍යයක් පවත්වන ආකල්පයක් ඔවුන් විසින් ඇතිකර නොගත යුතු බවයි.

## වඩා පාපකාරී ලිංගභේදය කුමක්ද?

පාවුල් මේ ඡේදයෙන් පාපයට වැටීමේ ක්‍රියාවලිය තුළ කාන්තාවන් හෙළා දැකීමක්වත් හෝ කාන්තාවන් වඩා පාපකාරී ලිංගය ලෙස හෝ දක්වා නැත. පාවුල් පෙන්වා දෙන්නේ ඒව ඇගේ මාංසයෙන් සහ ආධිපත්‍ය තුළ ක්‍රියා කිරීමෙන් මුළාවීමකට හසුවූ බවය. ඔබ අණ දෙන ආධිපත්‍ය බලය පවත්වන ආත්මයකින් කථාකිරීම හෝ ක්‍රියාකරන විට ඔබ මුළාවීමටත් පාපයටත් විවෘතව සිටින බව අදහස් කරයි.

පාපයට වැටීමේ ක්‍රියාවලියෙන් පුරුෂයාගේ වගකීමෙන් ඔහු නිදහස් කිරීමක් පාවුල් කිසිසේත් අදහස් නොකරයි. ඒව මුළාවට හසුවී තමා දෙවියන්වහන්සේ හා සමාන වෙතියි සිතුවාය. ආදම් මුළාවට පත් නොවූ නමුත් තමා කරන දෙයින් එහි විපාකයක් පිළිබඳ හොඳ තේරුමක් ඇතිව පාපය කළේය.

## ආවරණය කිරීම

බොහෝ සාකච්ඡාවට භාජනයවූ තවත් ඡේදයක් නම් ඉහත කෙටියෙන් සඳහන් කළ කාන්තාවට අදාළ ඇගේ ආවරණය පිළිබඳවය. මෙම ඡේදය 1 කොරින්ති එකළොස්වන පරිච්ඡේදයේ හමුවේ. මෙම සාකච්ඡාවේ දිගටම යන්ට කලින් 3 පදයේ සිට 16 පදය දක්වා කියවන්න.

මෙම ඡේදයෙහි එන “හිස” යන වචනය පුරුෂයා ස්ත්‍රියට ඉහළින් පාලනය කරන්නා යන අර්ථය දෙන ආකාරයට ඇතැම් අය විග්‍රහ කරති. මේ සඳහා භාවිතා කරන ලද හෙබ්‍රෙව් වචනය “පාලනය කිරීම” යන අර්ථයෙන් මෙන්ම “ආරම්භය” යන අර්ථයෙන්ද භාවිත කර ඇත. පාවුල්තුමා යේසුස්වහන්සේ සභාවේ “ආරම්භය” මෙන්ම “පාලනය කරන්නා” ලෙසද හඳුන්වමින්, මනුෂ්‍යයා

දෙවියන්වහන්සේගේ ස්වරූපයෙන් පළමුවෙන් මවන ලද බැවින් ඔහු ස්ත්‍රියගේ “ආරම්භය” සහ ඇය ඔහුගෙන් වන ලෙස පෙන්වා දෙයි. ඊළඟ පරිච්ඡේදයේ යැවුම් පත්‍රවල භාර්යාවට අදාළව කරනු ලබන උපදේශයන්හිදී “හිස” සහ යටහත්වීම පිළිබඳව විස්තර සාකච්ඡා කරනු ලැබේ. අපගේ අවධානය වන්නේ මේ ජේදය තුළ දැක්වෙන කාන්තාවන් කෙසේ යාච්ඥාවේ හා ධර්මවාක්‍ය පැවසීමේ යෙදිය යුතුද යන කරුණය.

මේ උපදෙස්වලින් ගම්‍ය වන්නේ ස්ත්‍රීන් දිග හිසකෙස් ඇතිව සිටිය යුතු බවත් එය තමන්ගේ ආවරණය නිසා කිසිවිටෙක නොකැපිය යුතු බව යයි ඇතැම් අය සිතති. අනෙකුත් සමහරෙක් මෙයින් ගම්‍යවන්නේ සභාවේ මෙහෙයයන්ට සහභාගිවීමේදී කාන්තාවන් තමන්ගේ හිස ආවරණය කරගැනීම පිණිස තොප්පියක් පැළඳ සිටිය යුතු බව යයි විශ්වාස කරති. එහෙත් මතක තබා ගත යුතු වැදගත් කරුණ නම් මේ ජේදය විග්‍රහ කිරීමේදී ඔහු අවසානයේ 16 වන පදයෙන් කරන ප්‍රකාශනයය.

> **එහෙත් යමෙක් (ඒ ගැන) වාදකරන්ට කැමැත්තේ නම් අපටවත් දෙවියන්වහන්සේගේ සභාවලටවත් එයාකාර සිරිතක් නැත. (1 කොරින්ති 11:16)**

මේ විෂය පිළිබඳව වාද කරන්ට අවශ්‍ය නැති බව ඔහු පවසයි. 18 වන පදයෙන් කොරින්ති සභාවේ තිබුණු එවැනි භේදයන් ගැන තමාගේ අවධානය ගැන සඳහන් කරයි. පාවුල්ගේ මහත්ම අවධානය වූයේ සභාවේ පිළිවෙළ සහ ඒකත්වය ගැනය. එබැවින් මෙම ජේදවලට දෙන කුමන විග්‍රහයක් නමුත් භේදයට හේතු නොවිය යුතුය.

මෙම ජේදයෙන් මිනිසා පළමුවෙන් සෑදූ බවත් පසුව ස්ත්‍රිය සෑදූ බවත් ගම්‍ය වේ. එමෙන්ම එක්කෙනෙකු නොමැතිව අනිකා අසම්පූර්ණ බවත්ය. මිනිසා සහ ස්ත්‍රිය මැවුවේ ඔවුන් එකිනෙකාට සහනයක් ආශිර්වාදයක් වන පිණිස මිස එක් අයෙක් ඒකාධිපතියෙක්ව අනිකා වහල් කරගැනීම පිණිස නොවේය. ස්ත්‍රිය පළමුවෙන් මනුෂ්‍යයාගෙන් සෑදූ අතර එතැන් සිට ස්ත්‍රියගේ ශරීරයෙන් මිනිසා සාදන ලද්දේය. දේව කැමැත්තේ ප්‍රකාරයට තම ස්වාමි පුරුෂයාට නිසි යටහත්වීමේ ස්ථානයේ ස්ත්‍රිය සිටිය යුතු අතර දේව කැමැත්තේ ප්‍රකාරයට පුරුෂයාද තමාට දී ඇති නායකත්වයේ වගකීම් අනිසි ලෙස භාවිත නොකළ යුතුය.

ස්ත්‍රියක් යාච්ඥා කිරීමේදී තමාට සුදුසු ආවරණයක් හිසෙහි ඇතිව එසේ කිරීමේ වැදගත්කම පාවුල් කථා කරයි. පාවුල්ගේ සමයේ විවාහක කාන්තාවක් තම හිසෙහි වැස්මක් පැළඳ සිටීමෙන් තමා ස්වාමිපුරුෂයාට යටත්ව සිටීම ප්‍රකාශ කරන ලදී. එය අභ්‍යන්තර ආකල්පය බාහිර චාරිත්‍රයකින් ප්‍රකාශ කිරීම විය. ස්ත්‍රියගේ හිසකෙස් ද මෙවැනි ආවරණයක සංකේතයක් වන බව පාවුල් ප්‍රකාශ කරයි (15 පදය). තමා ස්ත්‍රියට ආවරණයක් වන බැවින් පුරුෂයන් හිසෙහි ආවරණයක් පැළඳීම අවශ්‍ය නොවීය. පුරුෂයා ඇයව ප්‍රේමයෙන් මගපෙන්වමින් ආරක්ෂා කිරීම දෙවියන්වහන්සේ විසින් නියම කරන ලද තත්වය විය.

අවිවාහක කාන්තාවන් යාච්ඥා කිරීම හෝ ධර්මවාක්‍ය පැවසීම සභාවේදී නොකළ යුතුය යන අර්ථයන් මෙම පරිච්ඡේදයෙන් නොකිය වේ. එහි අර්ථය, කාන්තාවන් යාච්ඥා කිරීමේදී හෝ ධර්මවාක්‍ය පැවසීමේදී දෙවියන්වහන්සේටත්, ඇය විවාහක නම් තම ස්වාමි පුරුෂයාටත් යටත්වීමේ ආකල්පයක් ඇතිව එසේ කළ යුතු බවයි. එම ආකල්පයේ ප්‍රතිඵලය දෙවියන්වහන්සේගේත් උන්වහන්සේගේ දූතයන්ගේත් බලය ඇය කෙරෙහි පැමිණීමයි. කැරළිකාර ආකල්පයකින් යාච්ඥා කිරීම හෝ ධර්මවාක්‍ය පැවසීම ප්‍රතිඵලදායක නොවේ. බලවත් මෙහෙයක් සඳහා දෙවියන්වහන්සේ සමඟත් තම සහකරුවා සමගත් නිවැරදි සබඳතාවයක් ඇතිව සිටීම අත්‍යවශ්‍ය වේ.

තමාගේ සිතේ නියම ආකල්පය සංකේතවත් කිරීම පිණිස නමස්කාරයේදී හිසෙහි තොප්පියක් හෝ වෙනත් ආවරණයක් චාරිත්‍රානුකූලව පැළඳීම ඇතැමෙක් තවමත් පවත්වති. ඒ කාරණය සඳහාම කාන්තාවක් විසින් තම හිසකෙස් දිගට වැවීම කළයුතු යයි යන මතය ඇතැමෙක් දරති. මෙම මතයන් තමාගේ හෘද සාක්ෂියට එකගව ඇති වන ඒත්තු ගැනීම් හෝ චාරිත්‍රයක් විසින් ඇති වන මතයන් නිසා මේවාට ගරු කළ යුතු අතර එය භේදයට හේතුවක් කර නොගත යුතුය.

පාවුල්ගේ ඉගැන්වීමේ වැදගත් සංකල්පය මෙසේය. කිතුනු කාන්තාවක් ඇය ක්‍රිස්තුස්වහන්සේට දක්වන ආකල්පයට සමාන ප්‍රේමයෙන් යටත්වීමේ ආකල්පයක් තමාගේ ස්වාමි පුරුෂයාට ද ඇතිව නියම සබඳතාවයක් සහිතව සිටිය යුතුවේ. මෙම ආකල්පය නොමැතිව සේවය ඵලදායක නොවේ. පාවුල්තුමාගේ කාලයේ මෙන් චාරිත්‍රයක් තුළින් සංකේතවත් කිරීම පිණිස හිසට ආවරණයක් ඇතිව සිටීම හෝ දිගු හිසකෙස් පැළඳ සිටීම ප්‍රධාන කාරණයක් නොවේ.

## සාරාංශ කිරීම

මේ පාඩමෙහි සාකච්ජා කරන ලද එකම ජේදයක්වත් සභාවේ කාන්තාවන්ගේ සේවයකට බාධාවක් ලෙස අපට විග්‍රහ කිරීම කළ නොහැකිය. කාන්තාවන් ඉගැන්වීමෙන් දේශනාකිරීමෙන් සම්පූර්ණයෙන් වැළකී නිශ්ශබ්දව සිටීම නීතිය වුයේ නම් අලුත් ගිවිසුමේ කාන්තාවන්ට තමන්ගේ නිවෙස්වල සභාවන් සංවිධානය කළහැකි වුයේ කෙසේද? මෙම නායකත්ව භූමිකාවන් කාන්තාවනට වැරදි දෙයක් වුයේ නම් පාවුල් තම යැවුම් පත්‍රවල එවැනි කාන්තාවන්ට ආචාර කිරීම් සහ ප්‍රශංසාකිරීම් ලියා යැව්වේ ඇයි? එසේම ඔවුන් සභාවේ ධර්මවාක්‍ය පැවසීමේදී (කථා කිරීමේදී) නියමානුකූල ආවරණයක් ඇතිව කළ යුතු බවට විස්තර සහිත උපදෙස් දුන්නේ කුමන හේතුවක් නිසාද?

අප විසින් මෙම විෂයට අදාළව කාන්තාවන් කෙරෙහි පාවුල් දැක්වූ ස්ථාවර දැක්මට අනුකූලව අප මෙම ජේදයන් දෙස බැලිය යුතුය. මේ පිළිබඳ ඔහුගේ අවසාන සාරාංශ කිරීම මෙබඳු වේ.

> **නුඹලා සියල්ලන් ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ එක්කෙනෙක්ව සිටින නිසා, යුදෙව්වෙක් හෝ ග්‍රීකයෙක් නැත්තේය. දාසයෙක් හෝ නිර්දාසයෙක් නැත්තේය, පුරුෂයෙක් හා ස්ත්‍රියෙක් නැත්තාහ (ගලාති 3:28).**

යේසුස්වහන්සේ තුළ සියලුම සංස්කෘතික බාධාවන් කැඩිගොස් තිබේ. සැබෑ ඇදහිලිවතුන් ලෙස අප ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයට ඇතුළුවන විට සියලුම පන්ති භේදයන්ද දියවී ගොස් ඇත. වහලෙක් (බැඳුණු) හෝ ස්වාමියෙක් (නිදහස්) වුවත් ක්‍රිස්තුස්වහන්සේ තුළ අප එක්කෙනෙක් වේ. ස්ත්‍රියෙක් හෝ පුරුෂයෙක් ක්‍රිස්තුස්වහන්සේ තුළ නැත යන්න කාන්තාවන් සඳහා විශේෂයෙන් වැදගත් වේ. සේවයට දෙවියන්වහන්සේම පත්කර, ආලේපකර සන්නද්ධ කරන බැවින් පුරුෂයන් සඳහා විවෘත සෑම සේවාවක්ම කාන්තාවන්ට ද විවෘතය.

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට

___________________________________________

___________________________________________

___________________________________________

2. පහත සඳහන් සෑම ප්‍රකාශයක්ම කියවන්න. ප්‍රකාශය සත්‍යය නම් ඉදිරියෙන් ඇති හිස් තැනෙහි "ස" අකුර යොදන්න. ප්‍රකාශය වැරදි නම් ඉදිරියෙන් ඇති හිස්තැනෙහි "අ" අකුර යොදන්න.

   අ. _________ තේරුම් ගැනීමට දුෂ්කර සමහර දේ පාවුල්ගේ ලියවිලිවල අඩංගු බව පේත්‍රුස් ප්‍රකාශ කළේය.

   ආ. _________ කාන්තාවන් සභාවේදී සම්පූර්නයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය.

   ඇ. _________ කාන්තාවන් සභාවේදී ඉගැන්වීම හෝ දේශනාකිරීම නොකළ යුතුය.

   ඈ. _________ ශුද්ධාත්මයාණන්වහන්සේගේ ආලේපය තුළ කාන්තාවන් ධර්මවාක්‍ය පවසන බව යෝවෙල්ගේ අනාවැකියෙන් අදහස් කෙරේ.

   ඉ. _________ පාවුල් විසින් භාවිත කරන ලද "නිශ්ශබ්දව සිටීම" යන වචනයෙන් නිශ්චල, වියවුල් බවක් නැති ආත්මයක් අදහස් කර ඇත.

   ඊ. _________ වඩා පාපකාරී ලිංගය කාන්තාවන් ලෙස පාවුල් විසින් ඉදිරිපත් කර ඇත.

   උ. _________ ආදම් මුළාවට හසුවූ බැවින් ඔහු පාපයට වැටුණේය.

   ඌ. _________ ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ ස්ත්‍රියෙක් හෝ පුරුෂයෙක් වශයෙන් භේදයක් නැත.

(මෙම පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ දක්වා ඇත.)

## වැඩිදුර අධ්‍යයනය සඳහා

යැවුම් පත්‍රවල අඩංගුවන කාන්තාවන්ට හෝ කාන්තාවන්ට අදාළ විෂයයන්ට අදාළ සඳහන් කිරීම් ලයිස්තුවක් පහත ඉදිරිපත් කර ඇත. කාන්තාවන්ට අදාළ යැවුම්පත්‍රවල අඩංගු කරුණු පිළිබඳව අධ්‍යයනය වර්ධනය කරගැනීමට මෙම ලයිස්තුව භාවිත කරන්න. සෑම සඳහනක්ම බලා එහි සාරාංශය සපයා ඇති හිස් ඉඩෙහි සඳහන් කරන්න.

**සඳහන් කිරීම** **සාරාංශය**

**රෝම** 1:26

1:27

7:2

7:3

7:4

16:13

**1 කොරින්ති** 5:1

7:1

7:2

7:3

7:4

7:8

7:9

7:10

7:11

7:12

7:13

7:14

7:16

7:27

7:28

7:29

7:32

7:33

7:34

7:36

7:38

7:39

9:5

11:3

11:5

11:6

11:7

11:8

11:9

11:10

11:11

11:12

11:13

11:15

14:34

14:35

**ගලාති** 1:15

4:4

4:22

4:23

4:26

4:30

4:31

**එපිස** 5:23

5:24

5:25

5:28

5:31

5:33

6:2

**පිලිප්පි** 4:3

**කොලොස්සි** 3:19

**1 තෙසලෝනික** 5:3

**1 තිමෝති** 1:9

2:9

2:10

2:11

2:12

2:14

3:2

3:11

3:12

4:3

4:7

5:2

5:9

5:11

5:14

5:16

**2 තිමෝති** 1:5

3:6

**තිතස්** 1:6

2:3

2:4

**හෙබ්‍රෙව්** 7:3

**1 පේත්‍රැස්** 3:1

3:5

3:7

## එකළොස්වන පරිච්ඡේදය

# යැවුම් පත්‍රවල කාන්තාවන් : විශේෂිත උපදෙස්

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අවසන් කිරීමෙන් පසුව ඔබහට කළ හැකි කරුණු :

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- යැවුම්පත්‍රවල පහත දැක්වෙන සඳහන් කිරීම්වලට අදාළව ඔබගේ තේරුම්ගැනීම ප්‍රකාශ කිරීමට
    - වැන්දඹුවන්
    - මව්වරුන්
    - අවිවාහක කාන්තාවන්
    - වැඩිහිටි කාන්තාවන්
    - තරුණ කාන්තාවන්
    - විවාහක කාන්තාවන්
    - දික්කසාද වූ කාන්තාවන්
- කාන්තාවන්ගේ ඇඳුම් සහ ඔවුන්ගේ චරිත ස්වභාවයට අදාළ බයිබලීය ඉගැන්වීම් සාරාංශ කිරීමට.

## ප්‍රධාන පදය

**ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි භය ඇතිව එකිනෙකාට යටත් වෙයල්ලා (එපීස 5:21)**

### හැඳින්වීම

යැවුම්පත්‍රවල අවිවාහක, විවාහක, වැන්දඹු, මහලු සහ තරුණ කාන්තාවන් පිළිබඳව කතා කරයි. මේ පරිච්ඡේදය තුළ මෙම කාන්තාවන්ට මෙන්ම විශේෂ වර්ගයන්ට අයත් කාන්තාවන්ට දෙන ලද උපදෙස් පිළිබඳව ඔබ ඉගෙන ගන්නවා ඇත. කාන්තාවන්ගේ සුදුසු ඇඳුම් පිළිබඳවත් ඔවුන්ගේ චරිත ස්වභාවය (ආකල්පය) ගැනත් ඔබ ඉගෙන ගන්නවා ඇත.

### විවාහය

කොරින්තියේ ඇදහිලිවතුන් විවාහය පිළිබඳවත් අවිවාහක සිටීම පිළිබඳවත් (තනිව සිටිමින් දෙවියන්වහන්සේට කැපවූ සේවයක නියුක්තවීම) පාවුල්ගෙන් විමසන ලදී. පාවුල්ගේ පුද්ගලික විශ්වාසය වූයේ අවිවාහකව සහ වැන්දඹුව සිටින්නන් තනිව සිටියොත් වඩා ප්‍රතිදායක වන බවය.

> **නුමුත් අවිවාහකයන්ටද වැන්දඹුවන්ටද මා කියන්නේ ඔවුන් මා ලෙසම පැවති සිටියොත් ඔවුන්ට හොඳය කියාය. (1 කොරින්ති 7:8)**

ඔහු මෙවැනි අදහසක් ද ප්‍රකාශ කළෝය:

> **මෙසේ තමාගේ කන්‍යා දුව විවාහකරදෙන තැනැත්තේ යහපතක් කරයි. විවාහ කර නොදෙන තැනැත්තේ වඩා යහපතක් කරයි. (1 කොරින්ති 7:38)**

විවාහය ශාරීරික හා හැඟීම්මය අවශ්‍යතා සපයන බව පාවුල් 1 කොරින්ති 7:2 ප්‍රකාශ කළේය.

> **නුමුත් වේශ්‍යාකම් නිසා එක එක පුරුෂයා තම තමාගේම භාර්යාවද එක එක ස්ත්‍රී තම තමාගේ පුරුෂයාද ඇතිව සිටීවා. (1 කොරින්ති 7:2)**

ඕනෑම අවිවාහක සිටින, පුරුෂයෙක් හෝ ස්ත්‍රියක් ප්‍රබල ලිංගික ආශාවක් ඇති අයෙක් නම් ඔවුන් විවාහ විය යුතුය. පුද්ගලයන් තනිව සිටීමට යෝජනා කිරීම පිළිබඳව තමාගේ අදහස් පාවුල් පවසයි.

> **මා මෙසේ කියන්නේ නුඹලාට මලපතක් තබන පිණිස නොව, සුදුසු දේ සඳහාත්, නුඹලා වියවුල් නොවී ස්වාමින්වහන්සේ කෙරෙහි යෙදී සිටින පිණිසත්, නුඹලාගේම ප්‍රයෝජනයටය.** (1 කොරින්ති 7:35)

ඇදහිලිවතුන් කිතුනුවන් හා සමග පමණක් විවාහ විය යුතුය. අප විවාහයේදී නොඇදහිලිවතුන් සමග "එක්ව බැඳීම" නොකළ යුතුය.

## වැන්දඹුවන්

යැවුම්පත්‍රවල එක් ඡේදයක් අවිවාහක වැන්දඹුවන් ගැන පවසා ඇත.

> **වැන්දඹුවන්ගේ ගණනට ලියවෙන්ට යුතුව සිටින්නී නම්, වයසින් හැටකට අඩු නැත්තාවූ, එකම පුරුෂයෙකුට භාර්යාවව සිටියාවූ, යහපත් ක්‍රියා ගැන ප්‍රසිද්ධවූ දරුවන් ඇති කළාවූ, ආගන්තුක සත්කාරකළාවූ, ශුද්ධවන්තයන්ගේ පාද සේදුවාවූ, පීඩා විඳින්නන්ට උපකාර කළාවූ, සියලු ආකාර යහපත් ක්‍රියාවල යෙදී සිටියාවූ තැනැත්තියක්ය.** (1 තිමෝති 5:9-10)

අවිවාහකව තම සේවය දෙවියන්වහන්සේගේ සේවයට කැප කිරීමට කැමති වැන්දඹුවන් අවම වශයෙන් අවුරුදු 60 ක් වත් වයස ඇති අයෙක් විය යුතුය. එසේම ඇය එක්වරක් පමණක් විවාහ වූ කිතුනු සේවය පිළිබඳව යහපත් කීර්තියක් ඇතිව සිටි අයෙක්ද විය යුතුය. මේ කණ්ඩායමට තරුණ වැන්දඹුවන් ඇතුළත් නොවිය යුත්තේ ඔවුන් නැවත විවාහ වීමට ආශා ඇතිව තමා තනිව දෙවියන්වහන්සේට සේවය කිරීමට කරන ලද පොරොන්දුව කඩ කිරීමට ඉඩ ඇති හෙයින්ය. තමාට සැපයීමට පවුලක් නැති වැන්දඹුවන්ට සභාව විසින් සැපයිය යුතු බව 1 තිමෝති 5 පරිච්ඡේදයේ උපදෙස් දී ඇත.

## වැඩිහිටි සහ තරුණ කාන්තාවන්

පාවුල් තරුණ කාන්තාවන්ට මෙසේ උපදෙස් දෙයි:

> **එබැවින් යෞවන වැන්දඹුවන් විවාහවී දරුවන් වදනවාටත් ගෙදර ආණ්ඩුකරනවාටත් නින්දා කිරීමට කිසි අවකාශයක් විරුද්ධකාරයාට නොදෙනවාටත් මම කැමැත්තෙමි.** (1 තිමෝති 5:14)

වැඩිහිටි කාන්තාවන්ට සුවිශේෂ උපදෙස් දී ඇත.

> **එසේම මහලු ස්ත්‍රීවරුන් ශුද්ධකමට ඔබින ලෙස හැසිරෙන, කේලාම් නොකියන, බොහෝ මුද්‍රික පානයට නොවහල්වූ, යහපත් දේ උගන්වන්නාවූ තැනැත්තියන්ව සිටිය යුතුය. මෙසේ සිටිය යුතු වන්නේ, දෙවියන්වහන්සේගේ වචනයට අපහාස නොපැමිණෙන පිණිස, යෞවන ස්ත්‍රීන් තමුන්ගේ පුරුෂයන්ටත් දරුවන්ටත් ප්‍රේමකරමින්, සිහියෙන් යුක්තව, පිරිසිදුව, ගෙදර වැඩ කරන්නියන්ව, කරුණාවන්තව, තමුන්ගේම පුරුෂයන්ට යටත්ව සිටින්ට ඔවුන් විසින් පුරුදුකරවන පිණිසය.** (තිතස් 2:3-5)

වැඩිහිටි කාන්තාවන් විසින් තරුණ කාන්තාවන්ට උපදෙස් දීම හා ඉගැන්වීම සභා වැඩසටහනෙහි ඉතා වැදගත් කොටසක් විය යුතුය. අද බොහෝ සභාවල මෙම සේවය නොසලකා හැර තිබේ.

## භාර්යාවන්

ලෝකයේ ආරම්භක අවස්ථාවේදීම දෙවියන්වහන්සේ ආදම් සඳහා ඒව මවා දී විවාහය ස්ථාපනය කළ සේක. දෙවියන්වහන්සේගේ මූලික සැලැස්ම වූයේ එක පුරුෂයෙක් සඳහා ජීවිත කාලයටම එක කාන්තාවකි. දික්කසාද කිරීම දෙවියන්වහන්සේගේ මූලික සැලැස්මෙහි කොටසක් නොවූ අතර මනුෂ්‍යයාගේ සිතේ "දැඩිකම" නිසා එය සිදුවිය. පාපය නිසා දැඩිවූ සිත්වල ප්‍රතිඵලයක් ලෙස වේශ්‍යාකම, කාමමිථ්‍යාචාරය සහ අත්හැර දැමීම ඇති වේ. ශුද්ධ ලියවිලිවලට අනුව දික්කසාදයට හේතූන් මේවාය.

සමලිංගික සබඳතාවයන් සහ ව්‍යභිචාරය ලිංගික අපචාරය වූ වේශ්‍යාකමට ඇතුළත් වේ. ඔබේ සහයකයා නොවූ කෙනෙක් සමග ලිංගික සබඳතා පැවැත්වීම කාමමිථ්‍යාචාරයයි, පාවුල් මෙසේ විග්‍රහ කරයි.

**පුරුෂයෙකු ඇති ස්ත්‍රී පුරුෂයා ජීවත්ව සිටින තෙක්, ව්‍යවස්ථාවෙන් ඔහුට බැඳී සිටින්නීය. නුමුත් පුරුෂයා මැරුණොත් පුරුෂයාට බැඳී සිටි ව්‍යවස්ථාවෙන් ඈ මිඳී සිටින්නීය. පුරුෂයා ජීවත්ව සිටියදී ඈ අන් පුරුෂයෙකුට බැඳුණොත්, ඈ කාමමිථ්‍යාචාරිනියයි කියනු ලබන්නීය. නුමුත් පුරුෂයා මැරුණු පසු ඈ අන් කෙනෙකුට බැඳුණත්, ඈ කාමමිථ්‍යාචාරිනියක් නොවන ලෙස ඒ ව්‍යවස්ථාවෙන් නිදහස්ව සිටින්නීය. (රෝම 7:2-3)**

මෙම පද සාමාන්‍ය විවාහ සබඳතාවයට අදාළ නමුත් ඒවා ආදර්ශයක්ය. පාවුල් මෙම උදාහරණ භාවිත කරන්නේ ක්‍රිස්තුස් යේසුස්වහන්සේට අපගේ විවාහ සම්බන්ධය වලංගු කිරීම පිණිස ව්‍යවස්ථාවේ නීතියටත් එහි දඬුවමටත් අප මැරී සිටිය යුතු බව දැක්වීම පිණිසය.

අප කුමන පාපයක් කර තිබුණත් අප යේසුස්වහන්සේ වෙතට පැමිණිවිට පැරණි ගිවිසුමේ නීතියෙන් නියම කර තිබූ දඬුවම්වලින් අප නිදහස් කර ඇත. අප තවදුරටත් නීතිය යටතේ නැතහොත් නීතියට විවාහ වී නොසිටිමුව. එයට අප කෙරෙහි තිබුණ බැඳීම කැඩී ඇත. ක්‍රිස්තුස් යේසුස්වහන්සේ සමග නව සබඳතාවයක් දැන් අපට ඇත. ශුද්ධ ලියවිලිවලට අනුකූල නොවූ හේතූන් නිසා ඔබ දික්කසාද වී සිටියොත් එය සමාව දිය නොහැකි වරදක් නොවේ. අනික් ඕනෑම පාපයකට මෙන් එයටද සමාව දීමට දෙවියන්වහන්සේට පුළුවන.

විවාහය ගෞරවණීයය, එහෙත් විවාහයට බාහිරවූ ලිංගික සබඳතාවයක යෙදීම වැරදිය:

**විවාහය සියල්ලන් අතරේ ගෞරව ඇතුව, යහන නොකිලුටුව තිබේවා, මක්නිසාද වේශ්‍යාකම්කරන්නන්ද කාමමිථ්‍යාචාරිකයන්ද දෙවියන්වහන්සේ විනිශ්චය කරන සේක. (හෙබ්‍රෙව් 13:4)**

තෙසලෝනික පොතේ වාර්තා වන්නේ :

**දෙවියන්වහන්සේගේ කැමැත්ත නම්, නුඹලා ශුද්ධව සිටීමය. නුඹලා වේශ්‍යාකමින් වැළකී. (1 තෙසලෝනික 4:3)**

සභාවේ භාර්යාවන් සහ උපස්ථායකයන් පිළිබඳව සාමාන්‍ය උපදෙස් සමහරක් යැවුම් පත්‍රවල දී ඇත.

**එසේම ස්ත්‍රීවරුන් සන්සුන්වූ, කේලාම් නොකියන්නාවූ, පමණ දැන හැසිරෙන්නාවූ, සියල්ලේදී විශ්වාසවූ අයව සිටින්ට ඕනෑය. (1 තිමෝති 3:11)**

නොඇදහිලිවතුන් හා සමග විවාහ වී සිටින භාර්යාවන්ට පේත්‍රුස් අලංකාර පොරොන්දුවක් වාර්තා කර ඇත.

**එසේම භාර්යාවරුනි, නුඹලාගේ පුරුෂයන්ගෙන් සමහරෙක් වචනයට අකීකරුව සිටිතත්, ඔවුන් නුඹලාගේ පිරිසිදුවූ යටහත් හැසිරීම දුටුවාම, වචනය නැතිව භාර්යාවන්ගේ හැසිරීම කරණකොටගෙන දිනාගන්නා පිණිස, ඔවුන්ට යටත්වෙයල්ලා. (1 පේත්‍රුස් 3:1-2)**

ගැළවීම නොලැබූ ස්වාමි පුරුෂයෙක් සිටින කාන්තාවකට වචනයක්වත් නොමැතිව, තමාගේ ප්‍රේමණීය යටහත්කම තුළින් ස්වාමි පුරුෂයා දෙවියන්වහන්සේ වෙත යොමු කිරීමට හැකියාව තිබේ. පුරුෂයා තම භාර්යාවගේ ශුද්ධවන්ත පැවැත්ම හා ඇගේ දේව භය නිරීක්ෂණය කරනු ඇත. ඇයගේ ජීවිතය තුළ ක්‍රිස්තුස්වහන්සේ විසින් කර ඇති වෙනස ඔහු දැක ඇගේ ආදර්ශය කරණකොටගෙන ගැළවුම්කරුවාණන් වෙත ඇදගනු ලබයි.

නොඇදහිලිවන්ත ස්වාමිපුරුෂයෙක් භාර්යාව සමග ජීවත්වන්ට කැමති නම් ඇයට ඔහු සමග ජීවත් විය හැකි බව පාවුල් පවසා ඇත.

**යම් ස්ත්‍රියෙකුට නොඇදහිලිකාර පුරුෂයෙක් ඇත්නම්, ඔහු ඈ සමග වාසය කරන්ට කැමතිනම්, ඈ ඔහු අත් නොහරීවා,**

**නුමුත් දැන් ඔව්හු ශුද්ධය. නුමුත් නොඇදහිලිකාර පක්ෂය අහක්ව යේනම්, අහක්ව යේවා, මෙබඳු කාරණාවලදී සහෝදරයා හෝ සහෝදරී හෝ බැඳී නැත. (1 කොරින්ති 7:13 සහ 15)**

නොඇදහිලිකාර ස්වාමි පුරුෂයා සමග ජීවත්වීමට භාර්යාවට පැවසීමේ හේතුව පාවුල් මෙසේ දක්වයි.

**මක්නිසාද, භාර්යාව, නුඹ නුඹේ පුරුෂයා ගළවන්නිදෝ නුඹ දන්නේ කොහොමද? (1 කොරින්ති 7:16)**

උපදේශක සේවාවේදී. තම භාර්යාව සහ දරුවන් ශාරීරිකව අපයෝජනය කරන ස්වාමිපුරුෂයන් සමග භාර්යාවන් ජීවත්විය යුතුද යන ප්‍රශ්නය නිතර මතුවේ. මෙම අපයෝජනය දරුවන් සමග ලිංගික අපයෝජනය නම් ශුද්ධ ලියවිලි පදනමෙහි වේශ්‍යාකම නිසා ඇයට දික්කසාද වීමට හැකිවේ. නමුත් පහරදීම වැනි ශාරීරික අපයෝජනය නම් කුමක් කළ හැකිද?

ශරීරය, ශුද්ධාත්මයාණන්වහන්සේගේ මාලිගය බව බයිබලය පෙන්වා දෙයි. එය දෙවියන්වහන්සේට අයිති බැවින් එය අපවිත්‍ර කරන කවරෙක් නමුත් දෙවියන්වහන්සේ විනාශ කරන සේක. තමා සහ දරුවන් ශාරීරිකව අපයෝජනය කරන ස්වාමි පුරුෂයෙක් සමග ජීවත්වීමට තීරණය කරයි නම් ඇය ඔහුව දෙවියන්වහන්සේ විසින් විනාශකරන තත්වයට පත් කරයි. ඔහු උපදේශක සේවාවන් තුළින් තම ප්‍රශ්නයෙන් නිදහස්වන තුරු ඇයත් ඇගේ දරුවනුත් පුරුෂයා වෙතින් ඉවත් කර තැබිය යුතුය.

මේ පරිච්ඡේදය තුළ මේ කරුණ පිළිබඳව 1 කොරින්ති 7 වන පරිච්ඡේදයෙන් උපුටන කීපයක්ම භාවිත කර තිබේ. දැන් මදක් නතරව, අවිවාහකව සිටීම සහ විවාහය ගැන සඳහන් 1 කොරින්ති පරිච්ඡේදය මුළුමනින්ම කියවන්න.

## යටහත්වීම

භාර්යාවන් හා ස්වාමි පුරුෂයන් අතර සම්බන්ධයට අදාළ බොහෝ වෙනත් ජේදයන් යැවුම් පත්‍රවල සඳහන්ව ඇත.

**භාර්යාවෙනි, ස්වාමින්වහන්සේ තුළ සුදුසුව තිබෙන ලෙස, නුඹලාගේ පුරුෂයන්ට යටත්ව සිටපල්ලා. පුරුෂයෙනි නුඹලාගේ භාර්යාවන් කෙරෙහි කර්කශ නොවී ඔවුන්ට ප්‍රේම කරපල්ලා. (කොලොස්සි 3:18-19)**

**භාර්යාවෙනි, ස්වාමින්වහන්සේට මෙන් නුඹලාගේ පුරුෂයන්ට යටත්ව සිටපල්ලා.**

**මක්නිසාද ක්‍රිස්තුස්වහන්සේ සභාවේ හිසව සිටින්නා සේම පුරුෂයාත් භාර්යාවගේ හිසව සිටියි. උන්වහන්සේ වනාහි ශරීරයේ ගැළවුම්කාරයාය.**

**එබැවින් සභාව ක්‍රිස්තුස්වහන්සේට යටත්වෙන්නාක් මෙන් භාර්යාවෝද සියලු දේවලදී තමුන්ගේ පුරුෂයන්ට යටත්වෙත්වා.**

**පුරුෂයෙනි, ක්‍රිස්තුස්වහන්සේ සභාවට ප්‍රේමකොට ඈ උදෙසා තමන්ම පාවාදුන්නාක්මෙන්ම, නුඹලාත් නුඹලාගේ භාර්යාවන්ට ප්‍රේමකරන්න.**

**එසේ කළේ සභාව ශුද්ධව, කැලලක් හෝ රැළි හෝ එබඳු යමක් නැතුව, තේජවත් සභාවක් කොට තමන්ට ඔප්පුකරගැනීම සඳහා වචනය නමැති වතුරෙන් සේදීමෙන්, උන්වහන්සේ එය පවිත්‍ර කොට පිරිසිදුකරන පිණිසය.**

**එසේම පුරුෂයන් විසින්ද තමුන්ගේ භාර්යාවන්ට තමුන්ගේම ශරීරවලට මෙන් ප්‍රේමකටයුතුය. තමාගේ භාර්යාවට ප්‍රේමකරන තැනැත්තේ තමාටම ප්‍රේමකරන්නේය.**

**කිසිවෙක් කිසිකලක තමාගේම මාංසයට වෛරකළේ නැත. ක්‍රිස්තුස්වහන්සේ සභාව ගැන කරන්නාක්මෙන් එකිනෙකා තම තමාගේ මාංසය පෝෂණය කොට රක්ෂාකරගන්නේය.**

**මක්නිසාද අපි උන්වහන්සේගේ ශරීරයේ අවයවයෝය.**

**මේ නිසා මනුෂ්‍යයෙක් තමාගේ පියාද මවුද අත්හැර, තමාගේ භාර්යාවට ඇලුම්වන්නේය. ඔවුන් දෙදෙන එක මාංසය වන්නෝය.**

**මේ රහස මහත්ය. නුමුත් මම ක්‍රිස්තුස්වහන්සේ ගැනත් සභාව ගැනත් කථාකරමි.**

**එසේවී නුමුත් නුඹලා එක් එක්කෙනාත් තම තමාට මෙන් තම තමාගේ භාර්යාවට ප්‍රේමකරන්න. භාර්යාවද පුරුෂයාට භයපක්ෂව සිටින්ට බලාගනිවා. (එපීස 5:22-33)**

ඇතැම්විට, කාන්තාවන් බලහත්කාරයෙන් යටත්කමට ගෙනෙන පිණිස මෙම ජේදයන් වැරදි ලෙස අදාළ කරගැනීම සිදුවේ. මෙම ජේදවලින් යටහත් විය යුතු යයි කියා ඇති නිසා පුරුෂයන් විසින් තම භාර්යාවන් ලවා නපුරු දේ කරවීමට තැත්කරනු ඇත. එමෙන්ම ඔව්හු තම භාර්යාවන්ට "ස්වාමිවරුන්" ලෙස සිටිමින් ඔවුන් සේවකයන් හෝ වහලුන් ලෙස ක්‍රියාකිරීම අපේක්ෂා කිරීමට පුළුවන.

මෙහි විස්තර කර දෙන සත්‍යවූ යටහත්වීමේ සංකල්පය ක්‍රිස්තුස්වහන්සේගේ මනාලිය ලෙස හඳුන්වා දී ඇති සභාවේ සහ ක්‍රිස්තුස්වහන්සේ අතර පවතින සබඳතාවයට සමාන එකකි. 32 පදයේ මේ සබඳතාවය ගැන තමා කථාකරන බව පාවුල් හඟවා දෙයි. යේසුස්වහන්සේ කිසිදාක තම මනාලියට අපචාරයක්වූ දෙයක් කිරීමට නොපවසන සේම ස්වාමිපුරුෂයාද එසේ නොකළ යුතුය.

සප්පිරා අපචාරයක් වූ දෙයක් කිරීමට තම ස්වාමිපුරුෂයා සමග එකඟවූ විට ඇයට කුමක් සිදුවීද යන්න ඔබ ක්‍රියා පොතෙන් ඉගෙන ගනු ඇත. දේව නීතියට පටහැනිවූ සදාචාරාත්මක කරුණුවලදී කාන්තාව යටත් නොවිය යුතුය. ඇය දෙවියන්වහන්සේට ගණන් දිය යුතුව ඇති නිසා, තමාගේ පාපය අනුව ඇය විනිශ්චය කරනු ලබයි.
පාවුල් කොලොස්සි පොතේ මෙම සාකච්ජාව මෙසේ දිගු කරයි.

**භාර්යාවෙනි, ස්වාමින්වහන්සේ තුළ සුදුසුව තිබෙන ලෙස, නුඹලාගේ පුරුෂයන්ට යටත්ව සිටපල්ලා. (කොලොස්සි 3:18)**

යටත්කම ස්වාමින්වහන්සේට සුදුසු ආකාරයෙන්ම විය යුතුය. සදාචාරයට පටහැනි දේ කිරීමට යටත්වීම ස්වාමින්වහන්සේ තුළ නොවන ලෙසම උන්වහන්සේට සුදුසු ලෙසද නොවන්නේය.

ක්‍රිස්තුස්වහන්සේ සහ උන්වහන්සේගේ සභාව අතර සබඳතාවයට සමගාමී වූ ස්වාමි පුරුෂයා සහ භාර්යාව අතර සබඳතාවයට අදාළ තවත් වැදගත් කරුණු ඇත. සභාව යේසුස්වහන්සේට යටහත්වන්නේ බලහත්කාරයෙන් නොව ස්වකැමැත්තෙන්ය. පුරුෂයෙක් තමාට යටහත්වීමට තම භාර්යාවට බල නොකළ යුතුය. තම ස්වාමිපුරුෂයා විසින් දක්වනු ලබන ක්‍රිස්තුස්වහන්සේට සමාන ප්‍රේමය නිසා ඇය ස්වකැමැත්තෙන් යටහත්විය යුතුය.

ක්‍රිස්තුස්වහන්සේ සභාවට ප්‍රේම කළාක් මෙන්ම ස්වාමිපුරුෂයන් විසින් ද තම භාර්යාවන්ට ප්‍රේම කළ යුතු යයි කියා තිබේ. ස්වාමිපුරුෂයන් ක්‍රිස්තුස්වහන්සේගේ සභාවට ප්‍රේම කළ නියම ආත්ම පරිත්‍යාගයෙන් ප්‍රේමකරන්නේ නම් භාර්යාව යටත් වීමටත් සියල්ලේදී තම ස්වාමිපුරුෂයා සතුටු කිරීමටත් සැබෑ ඇදහිලිවන්තයෙක් යේසුස්වහන්සේ සතුටු කිරීමට ආශා වෙන්නාක් මෙන් ආශා වෙයි.

**මතකයේ තබාගන්න:** සභාව උන්වහන්සේට යටත්වීමේදී එය සම්පූර්ණව නොකරතත් සභාවට යේසුස්වහන්සේගේ ප්‍රේමය සම්පූර්ණව සිදුවේ. භාර්යාව දක්වන යටහත්කම සම්පූර්ණයෙන් සිදු නොවුවත් ස්වාමිපුරුෂයා විසින් තම භාර්යාව කෙරෙහි සම්පූර්ණවූ ප්‍රේමයක් ප්‍රදර්ශනය කළ යුතුය. භාර්යාව සැබෑ ඇදහිලිවන්තියෙක් ලෙස ඇය ක්‍රිස්තුස්වහන්සේට යටත් වන ආකාරයටම මේ ආකාරයට තමාට ප්‍රේමකරන පුරුෂයාව සියල්ලේදී ප්‍රසන්න කිරීමටත් ඔහුට යටහත්වීමටත් ක්‍රියා කරයි.

විවාහය ගැන මේ ඡේදය කථා කරන්නේ දේව අභක්තික මනුෂ්‍යයෙකුට නොවන බව තේරුම්ගැනීම වැදගත්ය. එය කථාකරන්නේ ආත්මයෙන් පූර්ණවූ ඇදහිලිවතුන් දෙදෙනෙකුගේ විවාහ ජීවිතයේ සබඳතාවය ගැනය. ඔවුන්ට සභාව සහ ක්‍රිස්තුස්වහන්සේ අතර ඇති ආත්මික සබඳතාවයට සමාන සබඳතාවයක් ස්වභාවික ජීවිතයේ තිබේ. පාවුල් පවසන්නේ ඔබ විවාහවී සිටින්නේ ඔබට මෙවැනි ප්‍රේමයක් දක්වන කිතුනු ස්වාමිපුරුෂයෙක් සමග නම් ඔබ ඔහුට කීකරුවත් යටහත්වත් සිටිය යුතු බවය.

ඔවුන් දෙදෙනා එක මාංශය බැවිනුත් ක්‍රිස්තු ශරීරයේ අවයව බැවිනුත් ස්වාමි පුරුෂයා තම භාර්යාව පෝෂණයකර රැකබලා ගත යුතුය. ස්වාමිපුරුෂයාගේ ජීවිතයේ ඉතාමත්ම වැදගත් තැනැත්තිය තම භාර්යාව විය යුතුය. ඔහු තම පියා, මව සහ අනිකුත් සියලු දෙනා අත්හැර තම භාර්යාවට එක්කෙනෙක් ලෙස සම්බන්ධ විය යුතුය. ඔහු තමාගේම ශරීරයට ප්‍රේමකරන්නාක් මෙන් තම භාර්යාවට ප්‍රේම කළ යුතුය. මේ ස්වභාවය භාර්යාවට තම ස්වාමිපුරුෂයාට ගෞරවණීයව යටහත්වීම ප්‍රීතියෙන් කිරීමට හේතුවේ. ඇය ස්වාමින්වහන්සේට යටහත්වන ආකාරයටම ස්වාමිපුරුෂයාට ද යටහත්විමට ඇයට හැකිවේ.

අප විමසා බැලූ ඡේදයට කලින් ඇති පදය සලකා බලන්න.

> **ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි භය ඇතුව එකිනෙකාට යටත්වෙයල්ලා. (එපීස 5:21)**

පුරුෂ ස්ත්‍රි, භාර්යා පුරුෂ සියලුම ඇදහිලිවතුන් එකිනෙකා ස්වාමින්වහන්සේට ප්‍රසන්න වන පිණිස එකිනෙකාට යටහත්විය යුතුය.

පේත්‍රුස් පැරණි ගිවිසුම් කාන්තාවන් සහ යටහත්වීමේ කාරණය ගැනත් අදහස් දක්වයි.

> **මක්නිසාද පුරාණ කාලයෙහි දෙවියන්වහන්සේ කෙරෙහි බලාපොරොත්තුවුණ ශුද්ධවූ ස්ත්‍රීවරු තමුන්ගේ පුරුෂයන්ට යටත්ව මෙලෙස අලංකාර වුණෝය. එලෙස සාරා ආබ්‍රහම්ට ස්වාමියායයි කියමින් කීකරුවුණාය. (1 පේත්‍රුස් 3:5-6අ)**

සාරා ආබ්‍රහම්ට ගරු සහිතව කථාකර ඔහුට කීකරුවුවද ඇයගේ අදහස් ඔහුට ප්‍රකාශ කිරීමට ඇයට නිදහසක් නොතිබුණ බව එයින් අදහස් නොකරයි. එක් අවස්ථාවක ඉෂ්මායෙල් පිටත දැමීමට ඇය ආබ්‍රහම්ගෙන් ඉල්ලූ නමුත් ආබ්‍රහම් ප්‍රතික්ෂේප කළේය. නමුත් දෙවියන්වහන්සේ ආබ්‍රහම්ට කථා කළ සේක.

> **එවිට දෙවියන්වහන්සේ: ළමයා නිසාත් නුඹේ දාසිය නිසාත් කනගාටු නොවන්න, සාරා නුඹට කියන සියල්ල ගැන ඇගේ හඬට කන් දීපන්න. මක්නිසාද නුඹේ වංශය කියවෙන්නේ ඊසාක්ගෙන්ය. (උත්පත්ති 21:12)**

ආබ්‍රහම් තවමත් ඉෂ්මායෙල්ට බැඳී සිටින බව ස්වාමින්වහන්සේ දැනගෙන සාරාගේ යෝජනාවට සහයෝගය දැක්වූ සේක. දෙවියන්වහන්සේගේ සැලැස්ම වූයේ තමා සහ ආබ්‍රහම් අතර ගිවිසුම සම්පූර්ණ කරන ඊසාක් ආබ්‍රහම්ගේ උරුමකරු වීමය.

## මව්වරුන්

මව්වරුන් කාන්තාවන් ගැන කියවෙන ඡේද ගණනාවක් යැවුම් පත්‍රවල අඩංගුය. ඒවායින් මව්වරුන්ගේ වගකීම මෙසේ දක්වා ඇත.

### දරුවන් පෝෂණය සහ රැකබලාගැනීම :

තෙසලෝනික පොතේ සඳහන් මෙම පදවලින් කිතුනු මව්වරුන්ගේ කාර්යභාරය ගැන පැහැදිලි චිත්‍රයක් පාවුල් ලබා දෙයි.

> **එසේ නොව, කිරිමවක් ඇගේම දරුවන් පෝෂණය කරන්නාක් මෙන්, නුඹලා අතරෙහි අපි මොළොක් ගුණයෙන් සිටියෙමුව. එලෙස අපි නුඹලාට ප්‍රේමාන්විත ඇලුම්කමකින් යුක්තව සිටිය බැවින්, දෙවියන්වහන්සේගේ ශුභාරංචිය පමණක් නොව නුඹලා අපට ඉතා ප්‍රියවූ නිසා අපේම ප්‍රාණත් නුඹලාට දෙන්ට සතුටුව සිටියෙමුව. (1 තෙසලෝනික 2:7-8)**

පාවුල් තම සේවය දරුවෙක් රැකබලාගෙන, පෝෂණය කරමින් ප්‍රේමය සපයන්නාවූ දේව භක්තික මවකගේ චිත්‍රය හා සංසන්දනය කරයි.

## තම නිවස බලාගන්නා තැනැත්තියන් වීම:

කාන්තාවන් නිවසට මගපෙන්වීම දෙමින් නිවස බලාගන්නා අය විය යුතු බව පාවුල් පවසයි.

> **සිහියෙන් යුක්තව, පිරිසිදුව ගෙදර වැඩ කරන්නියන්ව, කරුණාවන්තව, තමුන්ගේම පුරුෂයන්ට යටත්ව සිටින්ට ඔවුන් විසින් පුරුදුකරවන පිණිසය. (තීතස් 2:5)**
>
> **එබැවින් යෞවන වැන්දඹුවන් විවාහවී දරුවන් වදනවාටත් ගෙදර ආණ්ඩුකරනවාටත් නින්දා කිරීමට කිසි අවකාශයක් විරුද්ධකාරයාට නොදෙනවාටත් මම කැමැත්තෙමි.**
> **(1 තිමෝති 5:14)**

ඇතැම් කාන්තාවන් කිතුනු සේවයේ නියුක්තවීම සඳහා යයි කියමින් තම නිවෙස් හා දරුවන් අතපසු කිරීමෙන් දරුවන්ට මගපෙන්වීමක් නොමැතිව නිවෙස් වියවුල්භාවයට පත්වීමට ඉඩහැර ඇත. ඇතැම් අවස්ථාවල තම දරුවන් අයාලයේ ගොසින් මෙන්ම ඔවුන්ගේ විවාහයන් ද විනාශවී ඇත.

මෙම ජේදයන්ගෙන් කාන්තාව නිවස බලාගැනීමේ වගකීම භාරගෙන තම නිවැසියන්ට මගපෙන්විය යුතු බව පෙන්වා දෙයි. එයට දරුවන්ද ඇතුළු විය යුතුය. ඔබ මේ දෙය කරන්නේ නැත්නම් එහි ප්‍රතිඵලය සාතන්ට අයුතු ප්‍රයෝජන ගැනීමට ඉඩ සලසා දී තිබේ. එය දේව වචනය ගෞරවයට පත් කිරීමට වඩා දේව අපහාසයට හේතුවේ.

මෙයින් කිතුනු කාන්තාවන් සේවයේ නියුක්ත විය යුතු නැති බව ගම්‍ය නොවේ. ඔබ ක්‍රියා පොතේ සහ යැවුම් පත්‍රවලින් ඉගෙන ගැනීමේදී විවාහක කාන්තාවන්ට මුල් සභාව තුළ ඵලදායක සේවාවන් තිබුණ බව දැනගන්නට ඇත. නමුත් තම නිවස අපහසුතාවයට පත්වන ආකාරයට කිතුනු සේවයේ හෝ වෙනත් ක්‍රියාවලියක නියුක්තවීම දේව කැමැත්ත නොවේ.

## ඇදහිල්ල තම දරුවන්ට ඉගැන්වීම :

"කුඩාකළ සිටම ඔබ ශුද්ධ ලියවිලි ගැන දැනගෙන සිටියේය" යනුවෙන් පාවුල් තිමෝතිට මතක් කර දෙයි (2 තිමෝති 3:15). පාවුල් තිමෝතිගේ මවගේ සහ ආච්චිගේ ඇදහිල්ල පිළිබඳව ප්‍රශංසාවට පත් කරයි (2 තිමෝති 1:5). කිතුනු මවක් තම දරුවන්ට දේව වචනය ඉගැන්විය යුතුය. ළමා කාලයේ මුල් අවධියේ පටන්ම දේව වචනයේ දැනගැනීම සහ ඔවුන්ගේ ජීවිතවලට ඇති දේව සැලැස්ම ඇය විසින් ඔවුන් තුළ ස්ථාවර කළ යුතුය. මෙම ඉගැන්වීම්වලට, දේව නීතියට හා සමාජය කෙරෙහි විනය ද දෙමව්පියන්ටත් අන් අයටත් ගෞරව දැක්වීම හා සැලකීම ඇතුළත් විය යුතුය.

## කාන්තාවන් සහ දරුවන් බිහිකිරීම

කාන්තාවන් හා දරුවන් බිහිකිරීමට අදාළව විශේෂ ජේදයක් තිමෝති පොතේ අඩංගු වේ.

> **මක්නිසාද පළමුකොට ආදම්ද පසුව ඒවද සාදනු ලැබීය. තවද ආදම් රැවටුනේ නැත. නුමුත් ස්ත්‍රී රැවටී, වරදට වැටී සිටින්නිය. නුමුත් ඔව්හු විනීතභාවයෙන් යුක්තව, ඇදහිල්ලෙහිත් ප්‍රේමයෙහිත් ශුද්ධකමෙහිත් පවතින්නෝ නම්, දරුවන් බිහිකිරීමේදී ගැළවෙනවා ඇත.**
> **(1 තිමෝති 2:13-15)**

සභාවේ කාන්තාවන් නිශ්ශබ්දව සිටිය යුතුය යන කරුණට අදාළව මෙම ජේදය අප විසින් සාකච්ඡා කර තිබේ. මෙම ජේදයේ අඩංගු කරුණුවලට සම්බන්ධ අනිකුත් ප්‍රශ්නය දරුවන් බිහිකිරීමෙන් ගැළවීම ලැබීම යන කරුණට අදාළ වේ.

ලෝකයට පාපය පළමුවෙන්ම කාන්තාවක් කරණකොටගෙන ඇතුල් වුවත් මුළු ලෝකයේ පාපයට ගැළවුම්කරුවාණන්වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පොළොවට එවීම කාන්තාවක් කරණකොටගෙන සිදුකිරීමට දෙවියන්වහන්සේ සැලසුම් කළ සේක. දරුවන් බිහිකිරීමෙන් ගැළවීම පැමිණියේය. මුළු

ලෝකයාම (මුලින්ම පාපය කළ කාන්තාව ද ඇතුළුව) මෙම දරුවන් බිහිකිරීම කරණකොටගෙන ගැළවීම ලබන්නේය.

කාන්තාවක් තුළින් ගැළවුම්කරුවාණන් ලෝකයට එවීමේ කාරණයේදී කාන්තාවගේ භූමිකාව පාවුල් අවධාරණය කරයි.

> **නුමුත් කාලය සම්පූර්ණ වූ කල, දෙවියන්වහන්සේ ස්ත්‍රියෙකුගෙන් උපන්නාවූද ව්‍යවස්ථාව යටතේ උපන්නාවූද තමන් පුත්‍රයාණන්වහන්සේ එවූ සේක. එසේ කළේ අප විසින් පුත්‍රකම ලබන පිණිස උන්වහන්සේ විසින් ව්‍යවස්ථාව යටතෙහි වූවන් මුදාගැනීමටය. (ගලාති 4:4-5)**

දෙවියන්වහන්සේ සමග නිවැරදි සබඳතාවයක් ඇතිකර ගැනීමට හැකිවන ගැළවුම්කරුවාණන්ගේ උත්පත්තිය සඳහා නියම කාලය පැමිණි කල දෙවියන්වහන්සේ කාන්තාවක් භාවිත කළ සේක. කාන්තාව දරුවන් බිහිකිරීම කරණකොටගෙන ගැළවීම ලබන්නේය යන අර්ථය මෙය වන්නේය.

දරුවන් ලැබීම කාන්තාවකට ගැළවීම ගෙන දෙන බව මෙයින් අදහස් නොකරයි. පාපයට කමාව ලබාගැනීම සහ අලුත් උත්පත්තිය ලැබීමේ අත්දැකීම තුළින් පමණක් ගැළවීම ලැබෙන්නේය. එමෙන්ම දරුවන් බිහි නොකරන කාන්තාවන් ගැළවීම නොලබන්නේය යනුවෙන්ද එයින් අදහස් කරන්නේ නැත.

## වෙනත් විවිධ උපුටනයන්

කාන්තාවන් පිළිබඳ විවිධ වෙනත් කරුණුවලට අදාළ උපුටන සමහරක් යැවුම් පත්‍රවල ඇත. පාවුල් මෝඩ කාන්තාවන් ගැන කථා කරයි:

> **මක්නිසාද මොවුන්ගෙන් සමහරු ගෙවල්වලට ඇතුල්වී, පාපවලින් බරවූ, අනේකාකාර තෘෂ්ණාවලින් ගෙනයනු ලබන්නාවූ, නිතර ඉගෙනගන්න නුමුත් කිසිකලෙක සත්‍ය දැනගැනීමට පැමිණෙන්ට බැරිවූ මෝඩ ස්ත්‍රීන් වහල්කරගන්නාවූ අය වෙති. (2 තිමෝති 3:6,7)**

බලය රහිත දේවභක්තික ස්වරූපයක් ඇති අයට විරුද්ධව කෙරෙන අනතුරු ඇඟවීමක් මෙම පදය ඇතුලත් සන්දර්භයට වේ. ඔවුන් ඇදහිලිවන්තයන් යයි හඳුන්වා ගන්නා නමුත් ඔවුන්ගේ ප්‍රකාශයට පදනම් වන ආකාරයේ ශුද්ධවන්ත ජීවිතයක් ගත නොකරති. ඔව්හු අඥාන කාන්තාවන් පාපයට මගපෙන්වති.

යැවුම් පත්‍රවල සඳහන් අනිකුත් කාන්තා වර්ගය නම් හෙබ්‍රෙව් 11 වන පරිච්ඡේදයේ සඳහන් ඇදහිල්ලේ කාන්තාවන්ය. මෙයට තම මළවුන් ජීවනයට ආපසු ලබාගත් කාන්තාවන් ඇතුළත් වේ (35 පදය). ආබ්‍රහම්ගේ භාර්යාව වූ සාරා (11), තමන්ට දෙවියන්වහන්සේ පොරොන්දුවූ දේශයට ඇතුල් වූ ඔත්තුකාරයන් ආරක්ෂා කළ රාහබ් (31). දෙවියන්වහන්සේ කෙරෙහි දැක්වූ ඇදහිල්ල ගැන මෙම කාන්තාවෝ ප්‍රශංසා ලැබූහ.

අවසාන කාලයේ දේව විනිශ්චය ලෝකය මත පැමිණීමට අදාළව දරු ප්‍රසූතියේදී කාන්තාවන්ගේ වේදනාව පිළිබඳව පාවුල් සඳහන් කරයි.

> **සමාදානයය, අනතුරක් නැත කියා කියන විට ගර්භණියට විලිරුජාව පැමිණෙන්නාක් මෙන් හදිසියෙන් ඔවුන් පිටට විනාශය පැමිණේ. ඔව්හුද කිසිසේත් නොගැළවෙන්නෝය.**
> **(1 තෙසලෝනික 5:3)**

දරු ප්‍රසූතියකදී ඇතිවන වේදනාවෙන් බේරීමට නොහැකි ආකාරයෙන්ම පාපකාරී ලෝකයා මත පැමිණෙන විනිශ්චයත් නිසැකය.

## ඇඳුම් සහ චරිත ස්වභාවය

කාන්තාවන්ට අදාළව යැවුම් පත්‍රවල සඳහන්වන අවසාන විෂය කරුණ ඔවුන්ගේ ඇඳුම් සහ චරිත ස්වභාවයට අදාළවය (මෙයින් ඔවුන්ගේ හැසිරීම් හා ආකල්ප අදහස් කරයි). පාවුල් මෙසේ පවසයි.

**එසේම ස්ත්‍රීන් ලජ්ජාවෙන් සහ විනීත භාවයෙන් යුක්තව, ඔබින වස්ත්‍ර ඇඳ, ඉසකේ ගෙතිමෙන්වත් රනින්වත් මුතුවලින්වත් අනර්ඝ වස්ත්‍රවලින්වත් නොව, දේවභක්ති නාමය දරන ස්ත්‍රීන්ට සුදුසු ලෙස යහපත් ක්‍රියාවලින් සැරසෙනවාට කැමැත්තෙමි.** (1 තිමෝති 2:9-10)

පාවුල්ගේ කාලයේ කාන්තාවෝ වෛර්ණ කොණ්ඩා මෝස්තර භාවිත කළහ. ඇතැම් අය තම හිසකෙස් රත්රන් නූල් සහ මැණික් තබා ගෙතූහ. පාවුල් ඔවුන්ගේ බාහිර පෙනුමට දොස් තබනවා නොව, එහෙත් ඔවුන්ට සුදුසුවූ ප්‍රමුඛතාවයන් තිබිය යුතු බව ප්‍රකාශ කරයි. ඔවුන්ගේ අවධාරණය විය යුත්තේ ඇඳුම, හිසකෙස් හෝ මෝස්තරවලට වඩා යහපත් ක්‍රියා කෙරෙහිය.

කාන්තාවන්ගේ ඇඳුම් සහ චරිත ස්වභාවය පිළිබඳව පේත්‍රුස් ද අදහස් දක්වා තිබේ.

**ඔවුන් නුඹලාගේ පිරිසිදුවූ යටහත් හැසිරීම දුටුවාම, වචනය නැතුව භාර්යාවන්ගේ හැසිරීම කරණකොටගෙන දිනාගන්නා පිණිස, ඔවුන්ට යටත් වෙයල්ලා. නුඹලාගේ අලංකාරවීම හිසකේ ගෙතිමද ස්වර්ණාභරණ පැළඳීමද නොහොත් වස්ත්‍ර හැඳීමද යන පිටත අලංකාරය නොව, දෙවියන්වහන්සේ ඉදිරියෙහි ඉතා අනර්ඝව තිබෙන මෘදුවූ නිශ්චලවූ ගතියක් නමැති දිරා නොයන සැරසීමෙන් යුක්තවූ සිතේ ඇතුල් මනුෂ්‍යයා වේවා.** (1 පේත්‍රුස් 3:2-4)

පාවුල්ගේ අදහස් මේ ජේදයෙන් පැහැදිලි කර දෙයි. එම ජේදයෙහිම පවසන ඇඳුම් ඇඳීමේ වරදට වඩා කිසිසේත්ම හිසකෙස් ගෙතීමේ සහ රන් පැළඳීමේ වරදක්ද නැතිබව පේත්‍රුස් පෙන්වා දෙයි. ඔහු අවධාරණය කරන්නේ දෙවියන්වහන්සේ වඩාත් අගය කරන්නේ සිතෙහි අභ්‍යන්තර සැරසීම පිළිබඳවය. බාහිර පෙනුමට වඩා කාන්තාවන් ආත්මීක වර්ධනය කෙරෙහි අවධාරණය යොමු කළ යුතුය.

කාන්තාවන් ඇඳිය යුත්තේ මොනවාද යන්න ගැන නීතිමය උපදෙස් දීමට වඩා පාවුල් සහ පේත්‍රුස් දෙදෙනාම පවසන්නේ කාන්තාවන්ගේ ප්‍රමුඛතාවයන් පිළිබඳවය. පාවුල් සහ පේත්‍රුස් දෙදෙනාම පෙනුම ගැන උගන්වන දේ මෙසේය:

1. කාන්තාවන් සංවර ලෙස ඇඳුම් ඇඳිය යුතුය.
2. බාහිර සැරසීමට වඩා (සිතෙහි සැඟවුණාවූ අභ්‍යන්තර මනුෂ්‍යයාගේ) ආත්මීක වර්ධනය කෙරෙහි ඇය වැඩි අවධාරණය යොමු කළ යුතුය.

"ගැටලු සහගත චාරිත්‍රයන්" වශයෙන් පාවුල් තුමා උගන්වන ඇතැම් ජේදයන්හි සාමාන්‍ය මූලධර්මයන් ගැනද අප විසින් සැලකීමක් දැක්විය යුතුය.

දෙවියන්වහන්සේගේ සැපයීමට ස්තුති කරමින් කෙනෙකුට මස් කෑමට පුළුවන් බව දෙවියන්වහන්සේ පවසා ඇතත් (රෝම 14) යුදෙව් සම්ප්‍රදාය අනුගමනය කෙරුවාවූ සමහර ඇදහිලිවතුන්ට අන් ඇදහිලිවතුන් මස් අනුභව කිරීම බාධාවක් වී තිබුණි. මක්නිසාද ඔවුන් තවමත් පැරණි ගිවිසුම් ආහාර නීතීන් අනුගමනය කරමින් සිටි නිසාය.

මෙවැනි ඇදහිලිවතුන් අතර සිටියදී ඔවුන් බාධාවී තම පණිවුඩය පිළිගැනීමට අපහසු බවට පත් නොවන පිණිස පාවුල් මස් කෑමෙන් වැළකී සිටි බව ඔහු පවසයි. කාන්තාවන් විසින්ද තමන්ගේ බාහිර පෙනුම හා හැසිරීම පිළිබඳව මෙම ආකල්පයට ඉඩදිය යුතුය.

ඔබ දැන් කියවූ ජේද දෙකම කාන්තාවන් මෘදු ගුණ සහිතව සිටිය යුතු බව පවසයි. ඇතැම් අය මෙම පද තමන් අපේක්ෂාකරන ස්ථානයේ කාන්තාවන් තබා ගැනීමට භාවිත කර තිබේ. එහෙත් යේසුස්වහන්සේ තම පිරිමි ගෝලයන් ඇමතීමේදී, "මොලොක් ගුණ ඇත්තෝ ආශිර්වාද ලද්දෝයයි" පැවසූ සේක. මේ පදවල සඳහන් කර ඇති මෘදු ගුණය කිතුනු ස්ත්‍රීන්ට පමණක් අදාළ ගුණයක් සේ සැලකිය නොහැකිය. පිරිමින් විසින් ද මෘදු ගුණය ප්‍රදර්ශනය කළ යුතුය.

කාන්තාවන්ගේ ඇඳුම් හා බාහිර පෙනුම පිළිබඳව මූළු කාරණය හිතෝපදේශය මෙසේ සාරාංශකර දක්වයි.

**රූපශ්‍රීය රැවටිලි සහිතය. ශෝභනකම නිෂ්ඵලය. ප්‍රශංසාව ලැබෙන්නේ ස්වාමින්වහන්සේ කෙරෙහි භය ඇති ස්ත්‍රියටය. (හිතෝපදේශ 31:30)**

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

______________________________________________

______________________________________________

2. 1 කොරින්ති 7:35 අවිවාහකව සිටීමෙන් කුමන ආත්මික ප්‍රතිලාභයන් ඇතිවන බව පාවුල් පවසයිද?

______________________________________________

3. පහත සෑම වාක්‍යයක්ම කියවන්න. එය සත්‍ය ප්‍රකාශනයක් නම් හිස්තැනෙහි “ස” අකුරද එය අසත්‍ය ප්‍රකාශයක් නම් හිස්තැනෙහි “අ” අකුරද යොදන්න.

   a ______ විවාහවීම වැරදි බව පාවුල් විශ්වාස කළේය.

   b ______ ස්වාමින්වහන්සේට සේවය කිරීම පිණිස භාරයන් වන වැන්දඹු ස්ත්‍රීන් වයස 60 ට වැඩි අය විය යුතුය.

   c______ ඇදහිලිවන්තියෙකුගේ ස්වාමිපුරුෂයෙක් තම භාර්යාව සමග සිටින්ට කැමතිනම් ඔහුට එසේ කිරීමට ඇය ඉඩ නොදිය යුතුය.

   d ______ වැඩිහිටි කිතුනු කාන්තාවන් තරුණ කාන්තාවන්ට ඉගැන්විය යුතුය.

   e ______ ස්වාමිපුරුෂයා සහ භාර්යාව අතර තිබිය යුතු යටහත්වීම ක්‍රිස්තුස්වහන්සේ සහ සභාව අතර තිබෙන සබඳතාවයට සමාන එකකි.

   f ______ සදාචාරාත්මකව වැරදි දෙයක් කිරීමට ඉල්ලා සිටීමේදී පවා භාර්යාවන් තම පුරුෂයන්ට යටත් විය යුතුය.

   g ______ ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයම එකිනෙකාට යටහත් විය යුතුය.

   h ______ දරුවන් බිහි කිරීම තුළින් ගැළවීම ලබන පිණිස කාන්තාවන් දරුවන් බිහි කළ යුතුය.

4. කාන්තාවන්ගේ බාහිර පෙනුම පිළිබඳව පාවුල් හා පේත්‍රුස් විසින් උගන්වන ලද ප්‍රධාන සංකල්ප දෙක ලියන්න.

______________________________________________

______________________________________________

(මෙම පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ දක්වා ඇත.)

## වැඩිදුර අධ්‍යයනය සඳහා

යැවුම්පත්‍රවල එන කාන්තාවන් පිළිබඳ අධ්‍යයනය මෙම පරිච්ඡේදයෙන් අවසන් කරයි.

දහවෙනි පරිච්ඡේදයේ "වැඩිදුර අධ්‍යයනය සඳහා" යන කොටසෙන් යැවුම්පත්‍රවල කාන්තාවන් පිළිබඳ සඳහන්වීම් ලයිස්තුගත කර ඇත. ඔබ මේ අධ්‍යයනය සම්පූර්ණ කර ඇත්නම් කාන්තාවන් පිළිබඳ ඇති ඡේදයන්හි සාරාංශයක් ඔබ වෙත තිබේ.

ඔබ කැමති ඇතැම් අංශයන් පිළිබඳව වැඩිදුර තියුණු අධ්‍යයනයක් කිරීමට ඔබට අවශ්‍යතාවයක් තිබෙන්නට පුළුවන. එසේනම් ඔබ කැමති විෂයක් තෝරාගන්න (නිදසුනක් ලෙස, දික්කසාදය ගැන සඳහන් සියලුම ඡේදයන් හෝ වැන්දඹුවන් ගැන සඳහන් සියලුම පද අධ්‍යයනයට ඔබට කැමැත්තක් තිබෙන්නට පුළුවන).

දහවෙනි පරිච්ඡේදයේ "වැඩිදුර අධ්‍යයනය සඳහා" කොටස තුළ ඔබ ලියූ පද සමාලෝචනය කරන්න. ඔබ තෝරාගත් විෂයට අදාළ සියලු පද අධ්‍යයනය කරන්න. මේ බයිබල් අධ්‍යයන ක්‍රමය "මාතෘකා ක්‍රමය" යනුවෙන් හඳුන්වන්නේ එය එක් විශේෂ මාතෘකාවක් පිළිබඳව බයිබලය පවසන්නේ කුමක්ද යන්න අධ්‍යයනය කරන බැවින්ය.

# දොළොස්වන පරිච්ඡේදය

# සේවයේ ඔබගේ ස්ථානය

**අරමුණු:**

මෙම පරිච්ඡේදය අවසන් කිරීමෙන් පසුව ඔබහට කළ හැකි කරුණු :

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- ශුද්ධාත්ම දීමනා හඳුනාගැනීමට
- ඔබට එකක් හෝ ඊට වැඩියෙන් ආත්මික දීමනා තිබෙන බව හඳුනාගැනීමට
- ඔබගේ ආත්මික දීමනාව සොයා ගැනීමට

**ප්‍රධාන පදය**

> **එසේ දුන්නේ ඇදහිමේද දෙවියන්වහන්සේගේ පුත්‍රයා දැනගැනීමේද එකමුතුකමටත්, සම්පූර්ණ පුරුෂකමටත්, ක්‍රිස්තුස්වහන්සේගේ සම්පූර්ණ වූ උස මහතේ ප්‍රමාණයටත් අප සියල්ලන් පැමිණෙන තෙක්, (එපීස 4:12)**

## හැඳින්වීම

මුල් සභාවේ කාන්තාවන්ගේ ස්ථානය පිළිබඳව අධ්‍යයනය වැදගත්වන අතර දැනුම ලබාගැනීමට වඩා අධ්‍යයනයේ වැදගත් පරමාර්ථයන් තිබේ. එම පරමාර්ථය නම් ක්‍රිස්තු ශරීරය වන සභාව තුළ සේවයේ ඔබගේ ස්ථානය සොයාගැනීමය.

සෑම කාන්තාවකටම සභාවේ විශේෂිත සේවයක් ඇත. මෙම සේවය සම්පූර්ණ කිරීම සඳහා කාන්තාවන්ට ආත්මික දීමනාවන් හැකියාව ලබාදෙයි. මෙම විෂය කෙතරම් වැදගත්වේද පවසතොත් හාවස්ට්ටයිම් ජාත්‍යන්තර ආයතනය මගින් සම්පූර්ණ පාඨමාලාවක් මේ සඳහා වෙන් කර ඇත. එක් පරිච්ඡේදයකින් *"ශුද්ධාත්මයාණන්ගේ සේවය"* පිළිබඳව ඇති සියලු කරුණු සම්පූර්ණ වශයෙන් ආවරණය කළ නොහැකි නිසා මෙම පාඩමෙන් ආත්මික දීමනා හඳුනාගැනීම, ඔබට එකක් හෝ ඊට වැඩි දීමනා සංඛ්‍යාවක් තිබෙන බව සහ ඔබට ඔබගේ දීමනා සොයාගැනීම සිදුකරගත හැකිවේ.

## ශුද්ධාත්මයාණන්වහන්සේ

ක්‍රිස්තුස්වහන්සේගේ නැවත නැගිටීමෙන් පසු හා උන්වහන්සේ ස්වර්ගාරෝහණය වීමට කලින් තම අනුගාමිකයන් හට යේසුස්වහන්සේ වැදගත් උපදේශයන් දුන් සේක.

> **බලව මම මාගේ පියාණන්වහන්සේගේ පොරොන්දුව නුඹලා වෙතට එවමි. නුමුත් ඉහළින් නුඹලා බලයෙන් සරසනු ලබන තුරු නුවර නැවතී සිටපල්ලායයි කීසේක. (ලූක් 24:49)**

යේසුස්වහන්සේ මෙම පොරොන්දුවෙන් සඳහන් කළේ ශුද්ධාත්මයාණන්වහන්සේ පිළිබඳවය. යේසුස්වහන්සේ තම අනුගාමිකයන්ට මේ පිළිබඳව කලින් පවසා තිබුණි.

> **මම පියාණන්වහන්සේගෙන් ඉල්ලන්නෙමි. එවිට උන්වහන්සේ නුඹලා සමග සදාකල්ම සිටින පිණිස වෙන සැනසිලිකාරයෙකු නුඹලාට දෙන සේක. ඒ සැනසිලිකාරයාණෝ සත්‍යතාවේ ආත්මයාණන්වහන්සේය. උන්වහන්සේව පිළිගන්ට ලෝකයාට බැරිය. මක්නිසාද ලෝකයා උන්වහන්සේව දකින්නේවත් අඳුනන්නේවත් නැත. නුඹලා උන්වහන්සේව අඳුනන්නහුය. මක්නිසාද උන්වහන්සේ නුඹලා සමග නැවතී සිටින සේක. නුඹලා තුළෙහි සිටින සේක. නුඹලා අනාථව නාරින්නෙමි. නුඹලා වෙතට එමි. (යොහන් 14:16-18)**

ශුද්ධාත්මයාණන්වහන්සේ සැනසිලිදායකයාණන් ද මගපෙන්වන්නා ද ගුරුවරයා ද වන සේක. ශුද්ධාත්මයාණන්වහන්සේට බොහෝ ක්‍රියාකාරකම් ඇති අතර එයින් වඩාත්ම වැදගත් වන්නේ ශුභාරංචිය ප්‍රචාරය කිරීම සඳහා ඔවුන් බලයෙන් සැරසීමය.

> **නුමුත් ශුද්ධාත්මයාණන්වහන්සේ නුඹලා කෙරෙහි පැමිණිකල නුඹලා බලය ලබන්නහුය. එවිට නුඹලා යෙරුසලමෙහිද මුළු යුදයෙහිද සමාරියෙහිද පොළොවේ සීමාව දක්වාද මාගේ සාක්ෂිකාරයෝ වන්නහුයයි කීසේක. (ක්‍රියා 1:8)**

යේසුස්වහන්සේගේ උපදේශවලින් පසු ඇදහිලිවන්තයෝ ශුද්ධාත්මයාණන්වහන්සේ බලාපොරොත්තුවෙන් යෙරුසලමෙහි බලා සිටියහ. ශුද්ධාත්මයාණන්වහන්සේගේ ආරම්භක පැමිණීම පිළිබඳ ක්‍රියා 2 පරිච්ඡේදයේ ඇති වාර්තාව කියවන්න.

## ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනාවන්

පොළොවේ සීමාන්ත දක්වා ශුභාරංචිය ව්‍යාප්ත කිරීමේ ආඥාව නව අනුගාමිකයන්ට දෙමින් යේසුස්වහන්සේ ගිය සේක. මෙම කාර්යභාරය සම්පූර්ණ කිරීම සඳහා ශුද්ධාත්ම බලය ඔවුන්ට හැකියාව දුන්නේය. අන් අයට සේවය කිරීම පිණිස ඇදහිලිවතුන් සන්නද්ධ කිරීමට ශුද්ධාත්මයාණන් කරණකොටගෙන දුන් මෙම බලයෙන් කොටසක් වූයේ ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනාවන්ය.

## ආත්මික දීමනාවන් මොනවාද?

“ආත්මික” යන වචනයේ තේරුම “ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් පාලනය කරන ලද හෝ විදහා දක්වන ලද” යන්නය. දීමනාවක් යනු එක් පුද්ගලයෙකු විසින් තවත් පුද්ගලයෙකුට දෙන ත්‍යාගයකි. ආත්මික දීමනාවක් යනු ශුද්ධාත්මයාණන් විසින් ඇදහිලිවන්තයෙකුට අධිස්වභාවිකව ක්‍රිස්තු ශරීරයේ කොටසක් ලෙස සේවය කිරීම සඳහා දෙනු ලබන හැකියාවකි.

ශුද්ධාත්ම දීමනාව සහ ශුද්ධාත්මයාණන්ගේ දීමනාවන් අතර වෙනසක් ඇත. යේසුස්වහන්සේ දුන් පොරොන්දුවට පිළිතුරක් ලෙස, පෙන්තකොස්ත දිනයේ ශුද්ධාත්මයාණන්වහන්සේගේ පැමිණීමේ ක්‍රියාවලිය (ක්‍රියා 2) ශුද්ධාත්ම ”දීමනාව” හැඳින්විය හැකිය.

> **මම පියාණන්වහන්සේගෙන් ඉල්ලන්නෙමි. එවිට උන්වහන්සේ නුඹලා සමග සදාකල්ම සිටින පිණිස වෙන සැනසිලිකාරයෙකු නුඹලාට දෙන සේක. ඒ සැනසිලිකාරයාණෝ සත්‍යතාවේ ආත්මයාණන්වහන්සේය. උන්වහන්සේව පිළිගන්ට ලෝකයාට බැරිය. (යොහන් 14:16-17අ)**

මෙම පොරොන්දුවට පිළිතුරු වශයෙන් ශුද්ධාත්ම දීමනාව දැනටම දී ඇත. ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනාවන් ඇදහිලිවන්තයන්ට ඵලදායි සේවයක් කිරීම පිණිස ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් අධිස්වභාවිකව දෙන හැකියාවන්ය.

> **ඔව්හු පිටත්ව ගොස්, සියලු තැන්වලම දේශනා කළෝය. ස්වාමීන්වහන්සේද ඔවුන් සමග ක්‍රියාකරමින් ඔවුන් අතින් සිදුවූ ලකුණුවලින් වචනය ස්ථිරකළ සේක. (මාක් 16:20)**

## දීමනාවන් සහ තලෙන්ත

ස්වභාවික තලෙන්ත සහ අත්මික දීමනාවන් අතර වෙනසක් ඇත. තලෙන්තයක් යනු උත්පත්තියෙන් කෙනෙකු උරුමකරගත් ස්වභාවික හැකියාවක් හෝ පුහුණුවක් තුළින් වර්ධනය කරගත් හැකියාවකි. ආත්මික දීමනාවක් යනු අධිස්වභාවික හැකියාවක් වන අතර එය උරුමයෙන් හෝ පුහුණුවෙන් ඇති නොවන හැකියාවකි. එය සුවිශේෂවූ ආත්මික පරමාර්ථයන් උදෙසා භාවිත කරන පිණිස ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් දෙනු ලබන විශේෂ හැකියාවකි.

කෙනෙක් ඇදහිලිවන්තයෙක් බවට පත්වූ පසු ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් ස්වභාවික තලෙන්තයක් සනාථ (අනුමත කර ආශිර්වාද කිරීම) කිරීමට හැකියාවක් තිබිය හැකිය. මෙය සිදුවූ විට තලෙන්තය දීමනාවක් ලෙසත්, තලෙන්තයක් ලෙසත් ක්‍රියා කරයි. නිදසුනක් ලෙස, කෙනෙකුට තමා පුහුණුව ලැබ තිබෙන නිසා පරිපාලනය පිළිබඳ ස්වභාවික තලෙන්තයක් තිබිය හැකිය.

ශුද්ධාත්ම බෞතිස්මය ලැබීමෙන් පසු මෙම තලෙන්තය ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් අනුමත කරනු ලැබ ඔහුව පරිපාලනය පිළිබඳ ශුද්ධාත්ම දීමනාව තුළ භාවිත කරනු ඇත.

හොඳම ස්වභාවික තලෙන්තයට වඩා අතිමහත් ආත්මීක හැකියාවක් ආත්මීක දීමනාවන් කරණකොටගෙන සපයනු ලැබේ. ඔබ ඔබගේ ස්වභාවික තලෙන්ත සියල්ලම ස්වාමින්වහන්සේගේ වැඩය සඳහා භාවිත කළ යුතු නමුත් ඔබට ආත්මික දීමනාවන් අවශ්‍යම වේ.

## දීමනාවන්ගේ පරමාර්ථයන්

එපිස 4:12-15ට ආත්මීක දීමනාවන්ගේ පරමාර්ථයන් ලයිස්තුගත කර ඇත.

> **එසේ දුන්නේ ඇදහිමේද දෙවියන්වහන්සේගේ පුත්‍රයා දැනගැනීමේද එකමුතුකමටත්, සම්පූර්ණ පුරුෂකමටත් ක්‍රිස්තුස්වහන්සේගේ සම්පූර්ණ වූ උස මහතේ ප්‍රමාණයටත් අප සියල්ලන් පැමිණෙන තෙක්, ශුද්ධවන්තයන්ගේ සම්පූර්ණවීම සඳහා සේවය කිරීමේ වැඩය පිණිසත් ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයේ වර්ධනය වීම පිණිසත්ය. තවද අපි තවත් මනුෂ්‍යයන්ගේ වංචාවෙන්ද ප්‍රයෝගයෙන්ද රැවටිලි සහිත උපමාරුවෙන්ද හටගන්න සියලු ආකාර ඉගැන්වීම් නමැති සුළඟින් ඈත මෑත විසිවෙමින් ගෙනයනු ලබන්නාවූ බාලයන් නොවන පිණිසත්, ප්‍රේමයෙන් යුක්තව ඇත්ත කථාකරමින්, හිසව සිටින ක්‍රිස්තුස්වහන්සේ උදෙසා සියලු දේවලදී වැඩෙන පිණිසත්ය. (එපිස 4:12-15)**

මෙම ඡේදයට අනුව ශුද්ධාත්මයාණන්වහන්සේගේ පරමාර්ථ මේවාය:

- ශුද්ධවන්තයන් සම්පූර්ණත්වයට ගෙන ඒම
- සේවයේ වැඩ සඳහා අනුබල දීම
- ක්‍රිස්තුස්වහන්සේ සහ සභාව ගොඩනැංවීම සඳහා

ආත්මීක දීමනාවන්ගේ පරමාර්ථයන් වන්නේ,

- ඇදහිල්ලේ එකමුතුබවට පැමිණීම
- ක්‍රිස්තුස්වහන්සේ පිළිබඳ දැනගැනීමේ අප වර්ධනයවීම
- ක්‍රිස්තුස්වහන්සේ අපගේ ආදර්ශය ලෙස අප සම්පූර්ණත්වයට වර්ධනයවීම
- වැරදි දේවධර්මයන්ගෙන් මුළා නොවී ස්ථාවර බවට පත්වීම
- ක්‍රිස්තුස්වහන්සේ තුළ ආත්මිකව මුහුකුරායාම

## දීමනාවන් බෙදාදීම

අවම වශයෙන් එක් ඇදහිලිවන්තයෙකු සතුව එක් ආත්මික දීමනාවක් හෝ ඇත.

> **දෙවියන්වහන්සේගේ අනේකාකාර කරුණාවේ යහපත් ගබඩාකාරයන් මෙන් එකිනෙකාට ලැබුණු දීමනාවේ හැටියට එයින් එකිනෙකාට සේවය කරපල්ලා. (1 පේත්‍රුස් 4:10)**

නමුත් ශුද්ධාත්මයාණන්වහන්සේ ප්‍රකාශවීම සෑම මනුෂ්‍යයෙකුටම දී ඇත්තේ එයින් ඵලදායක වන පිණිසය.

> **නුමුත් ආත්මයාණන්වහන්සේගේ ප්‍රකාශවීම එකිනෙකාට දී තිබෙන්නේ ප්‍රයෝජනය පිණිසය.**
>
> **නුමුත් ඒ එකමවූ ආත්මයාණන්වහන්සේ තමන් කැමති ලෙස එකිනෙකාට වෙන වෙනම බෙදා දෙමින්, මේ සියල්ල කරවන සේක. (1 කොරින්ති 12:7, 11)**

අවම වශයෙන් ඇදහිලිවන්තයෙකුට එක් ආත්මික දීමනාවක් හෝ තිබෙන හෙයින් අප සෑම කෙනකුටම අපගේ දීමනාව සොයාගෙන එය භාවිත කිරීමේ වගකීමක් ඇත. ඔබව විනිශ්චය කරනු ලබන්නේ ඔබට ඇති ආත්මික දීමනා ගණන අනුව නොවේ. ඔබව විනිශ්චය කරනු ලබන්නේ ඔබට දී ඇති ආත්මික දීමනාවන් විශ්වාසවන්තව භාවිත කිරීම අනුවය. මතෙව් 25:14-30 දක්වා ඇති තලෙන්ත උපමාවෙන් මෙම සත්‍යතාවය සනාථ කරයි.

ආත්මික දීමනාවන් බොහෝ ඇති නමුත් සියලුම ශුද්ධාත්ම දීමනාවන් එක ඇදහිලිවන්තයෙක් සතු නොවේ.

**සියල්ලෝම ප්‍රේරිතයෝද? සියල්ලෝම අනාගතවක්තෘරුද? සියල්ලෝම ගුරුවරුද? සියල්ලෝම ආශ්චර්යය කරන්නෝද? සුවකිරීමේ දීමනා සියල්ලන්ටම ඇත්තේද? සියල්ලෝම අන් භාෂාවලින් කථාකරන්නෝද? සියලෝම තේරුම්කර දෙන්නෝද? (1 කොරින්ති 12:29-30)**

කෙනෙකුට දීමනා එකකට වඩා තිබෙන්ට හැකි නමුත් සියලුම ආත්මයාණන්ගේ දීමනාවන් එක් අයෙකුට නොමැත. එසේ තිබේ නම් ඔහුට ක්‍රිස්තු ශරීරයේ අන් අයගේ අවශ්‍යතාවයන් ඇති නොවනු ඇත.

## බොහෝ දීමනාවන් එහෙත් එක මූලාශ්‍රයකි

එකම මූලාශ්‍රයකින් ඇතිවන බොහෝ දීමනාවන් පිළිබඳව බයිබලය පෙන්වා දෙයි. ආත්මික දීමනාවන්ගේ මූලාශ්‍රය ශුද්ධාත්මයාණන්වහන්සේය. උන්වහන්සේ මෙම දීමනාවන් දෙන අතර ඇදහිලිවතුන්ගේ ජීවිතවල ක්‍රියා කරන සේක.

**ඉතින් නානාප්‍රකාර දීමනා ඇත්තේය. නුමුත් එක ආත්මයාණන් වහන්සේය. නානාප්‍රකාර සේවයකිරීම් ඇත්තේය. නුමුත් එක ස්වාමින්වහන්සේය. නානාප්‍රකාර ක්‍රියාකිරීම් ඇත්තේය නුමුත් සියල්ලන් තුළෙහි සියල්ල කරවන්නේ එක දෙවියන්වහන්සේය. නුමුත් ආත්මයාණන්වහන්සේගේ ප්‍රකාශවීම එකිනෙකාට දී තිබෙන්නේ ප්‍රයෝජනය පිණිසය. (1 කොරින්ති 12:4-7)**

**එහෙයින් අපට දෙන ලද අනුග්‍රහය ලෙස වෙන වෙන දීමනා ඇත්තාවූ අපට ලැබුණේ අනාගතකිම් නම්, අපේ ඇදහිල්ලේ ප්‍රමාණයට අනාගත වචනය කියමු. සේවය නම් අපගේ සේවයෙහි යෙදී සිටිමු. උගන්වන්නා තමාගේ ඉගැන්වීමටත් උපදේශ දෙන්නා තමාගේ උපදේශ දීමටත් භාරවේවා. දෙන තැනැත්තේ ත්‍යාගවන්තකමෙන්ද ආණ්ඩුකරන තැනැත්තේ උනන්දුකමෙන්ද කරුණාව පෙන්වන තැනැත්තේ ප්‍රසන්න ලීලාවෙන්ද එසේ කෙරේවා. (රෝම 12:6-8)**

බොහෝ විවිධවූ දීමනාවන් තිබෙන නමුත් ආත්මික දීමනාවන්ට ඇත්තේ එක මූලාශ්‍රයකි. කිසිම දීමනාවක් අන් දීමනාවකට වඩා වැදගත් නොවේ. ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයේ ඔබගේ ස්ථානය සංසන්දනය කර ඇත්තේ මනුෂ්‍ය ශරීරයක අවයවලටය. ඇස වැනි කඩා අවයවයක් මනුෂ්‍ය ශරීරයේ ක්‍රියාකාරීත්වයට වැදගත් වන අකාරයටම සභාව තුළ පෙනුමෙන් "කුඩාවට" පෙනෙන දීමනාවක් එහි ක්‍රියාකාරීත්වයට මහත් සේ ප්‍රයෝජනවත් වේ. ඇතැම් දීමනාවන් වඩා විශාල වගකීමක් දරන නමුත් කිසිම දීමනාවක් තව දීමනාවකට වඩා වැදගත් වන්නේ නැත.

## දීමනාවන්ගේ භාරකරුවන්

ඔබ ආත්මික දීමනාවන්ගේ භාරකරුවෝ පමණි. භාරකරුවෙක් යනු තමා වැඩකරන කාර්යයේ අයිතිකරුවෙක් නොවේ. ඔහු වෙනත් කෙනෙකු විසින් දුන් දෙයක් ඒ දුන් කෙනාගේ ප්‍රතිලාභය පිණිස භාවිත කරයි. ඔබ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සඳහා භාරකරුවෙකි.

**මනුෂ්‍යයෝ අප ක්‍රිස්තුස්වහන්සේගේ සේවකයන් මෙන්ද දෙවියන්වහන්සේගේ රහස්වල ගබඩාකාරයන් මෙන්ම ගණන් ගනිත්වා. (1 කොරින්ති 4:1)**

ආත්මික දීමනාවන්ගේ භාරකරුවෙක්වීම ඔබේ සේවයේ කොටසකි. යේසුස්වහන්සේට ඵලදායි ලෙස සේවය කිරීම පිණිස ඒවා ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් ඔබට දී තිබේ.

**දෙවියන්වහන්සේගේ අනේකාකාර කරුණාවේ යහපත් ගබඩාකාරයන් මෙන් එකිනෙකාට ලැබුණු දීමනාවේ හැටියට එයින් එකිනෙකාට සේවය කරපල්ලා. (1 පේත්‍රුස් 4:10)**

භාරකරුවෙක් ලෙස ඔබට දී තිබෙන දීමනාව විශ්වාසවන්තව භාවිත කිරීමේ පදනම මත ඔබව විනිශ්චය කරනු ඇත.

**ඇරත් මෙහිදී ගබඩාකාරයන්ගෙන් ඕනෑකරන්නේ එක එක මනුෂ්‍යයා විශ්වාසව සිටීමය. (1 කොරින්ති 4:2)**

## ආත්මයාණන්ගේ දීමනාවන්

ආත්මික දීමනාවන් හඳුනාගැනීම පිණිස ඇති ප්‍රධාන ඡේදයන් නම් රෝම 12:1-8, 1 කොරින්ති 12:1-31, එපීස 4:1-16 සහ 1 පේත්‍රුස් 4:7-11 වේ. මෙම දීමනා විවිධාකාරයෙන් සේවය කිරීම පිණිස දෙවියන්වහන්සේ විසින් දෙන ලද විශේෂ හැකියාවන් බව මතක තබාගත යුතුය. මේවා පිළිබඳ ඇතැම් සාක්ෂි අප සියලු දෙනාගේම ජීවිතවල තිබිය හැකි නමුත් එයින් අපට යම් මෙවැනි දීමනාවක් තිබේයයි අත්‍යවශ්‍යයෙන්ම තේරුම් නොගත යුතුය. නිදසුනක් ලෙස, සෑම ඇදහිලිවන්තයෙකු විසින්ම සේවයේ වැඩයට තම දසයෙන් කොටස් හා සම්මාදම්වලින් දීම සිදුකළ යුතුය. එහෙත් දීම පිළිබඳ ආත්මික දීමනාව දෙවියන්වහන්සේගේ ආත්මයාණන් විසින් පොලඹවනු ලබන අසාමාන්‍ය දීමේ හැකියාවක් වේ.

අධ්‍යයනයේ පහසුව පිණිස දීමනාවන් අප විසින් ප්‍රධාන වර්ග 4 කට බෙදා දක්වා ඇත.

| | |
|---|---|
| - විශේෂ දීමනාවන් | - කතා කිරීමේ දීමනාවන් |
| - සේවය කිරීමේ දීමනාවන් | - ලකුණු වල දීමනාවන් |

බයිබලය දීමනාවන් එවැනි බෙදීමකට ලක්කර නැත. අප විසින් එසේ කර ඇත්තේ වඩා පහසුවෙන් විවිධ වූ දීමනාවන් මතකතබා ගැනීමට උපකාරවන පිණිසය.

## විශේෂ දීමනාවන්

ආත්මික දීමනාවන්ගේ ප්‍රථම වර්ගය විශේෂ දීමනාවන් වශයෙන් අප හඳුන්වන දීමනාවන්ය. මෙම මාතෘකා නාමය අප විසින් භාවිත කිරීමට හේතුව මේ සෑම දීමනාවක්ම සභාවේ විශේෂ නායකත්ව ස්ථානයක් ගන්නා බැවින්ය. විශේෂ නායකත්ව දීමනාවන් නම්:

**අපොස්තුළුවරු :**

අපොස්තුළුවරයෙක් යනු විවිධ ස්ථානවල හා සංස්කෘතීන් තුළ නව සභාවන් වර්ධනය කිරීමටත්, සභාවන් කීපයක් අධීක්ෂණය කරමින් බලාගැනීමට විශේෂ හැකියාවක් ඇති අයෙක්ය. “වෙනත් කෙනෙකු වෙනුවෙන් ක්‍රියාකිරීම පිණිස පූර්ණ බලයද ආධිපත්‍යය ද සහිතව යවනු ලැබූ නියෝජිතයෙක්” යනු අපොස්තුළුවරයා යන්නෙහි අර්ථය වේ. අපොස්තුළුවරයාට ඇදහිලිවතුන්ගෙන් සමන්විත කණ්ඩායම් සංවිධානය කරමින් ලොව පුරා ශුභාරංචිය ව්‍යාප්ත කිරීමට විශේෂ ආධිපත්‍යය හෝ හැකියාව ඇත. වර්තමානයේ අපොස්තුළුවරයා හට මිෂනාරිවරයා සහ සභා පිහිටුවන්නා යන නාමයන් භාවිත කරනු ලැබේ.

**අනාගතවක්තෘවරු:**

අනාගතවක්තෘ දීමනා දෙකක් ඇත. එයින් එකක් නම් අනාගතවක්තෘවරයෙක් වීමට දී ඇති විශේෂිත දීමනාවය. අනික් දීමනාව අනාගතවාක්‍යය ප්‍රකාශ කිරීමට දී ඇති දීමනාවය. පොදුවේ කථාකරන කල, අනාගතවාක්‍යය පැවසීම යනු දෙවියන්වහන්සේගේ විශේෂ දේවානුභාවයෙන් කථා කිරීමය. එම විශේෂ හැකියාව, දෙවියන්වහන්සේගේ ක්ෂණික පණිවුඩයක් ලබාගැනීමටත්, ප්‍රකාශකිරීමටත් දිව්‍යමය ආලේපයන් සහිත ප්‍රකාශයක් ලෙස දෙවියන්වහන්සේගේ සෙනඟට පැවසීමටත් දී තිබේ. අනාගතවක්තෘවරයෙක් සභාවේ නායකයෙක් ලෙසත් අනාගතවාක්‍ය පැවසීමේ දීමනාව ඇති අයෙකු ලෙසත් සැලකේ.

**ශුභාරංචිය ප්‍රකාශකරන්නන් :**

ශුභාරංචිය ප්‍රකාශකයෙක් යනු නොඇදහිලිවතුන් සමග ශුභාරංචිය විශේෂාකාරයකින් බෙදාගැනීමට හැකියාව ඇත්තාවූ හා එමගින් ස්ත්‍රී පුරුෂයන් ශුභාරංචියට ධනාත්මක ප්‍රතිචාරය දී ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයේ වගකීම් දරන අය බවට පත්වීමට ක්‍රියා කරන අයෙකි. “ශුභාරංචි ප්‍රකාශකයා” යන්නෙහි අර්ථය “ශුභාරංචිය ගෙන එන තැනැත්තා” යන්නය.

**පාලකවරුන් :**

ඇදහිලිවතුන් කණ්ඩායමක් ඔවුන්ගේ ආත්මීක ශුභසාධනය පිණිස දීර්ඝ කාලයක් නායකත්වය දී ක්‍රියාකිරීමට භාරගන්නා කෙනෙක් පාලකවරයෙක් වේ. තමාගේ නායකත්වය යටතේ සිටින අයට දේව වචනය උගන්වා ඔවුන්ගේ පුද්ගලික හා ආත්මීක අවශ්‍යතාවයන් සපුරමින් ආත්මිකව රැකබලාගැනිම පාලකවරයෙකු සතු කාර්ය වේ.

**ගුරුවරුන් :**

අසන්නාවූ අය ඉගෙනගෙන, තමා ඉගෙනගත්තාවූ දේ තම ජීවිතයට අදාළ කරගැනීමට හැකිවන ආකාරයට දෙවියන්වහන්සේගේ වචනය ඵලදායක ලෙස සන්නිවේදනය කිරීමට විශේෂ හැකියාවක් සහිත ඇදහිලිවතුන් ගුරුවරුන් ලෙස ගණන් ගැනේ. අනාගතවක්තෘවරයෙකු වීමේ දීමනාවට වඩා අනාගතවාක්‍ය පැවසීමේ දීමනාව වෙනස්වන ආකාරයටම ගුරුවරයෙක් වීමේ විශිෂ්ට දීමනාවද ගුරුවරයෙක් ලෙස ඉගැන්වීමට හැකි දීමනාවට වෙනස් වේ. සියලුම ඇදහිලිවතුන්ට ගුරුවරයෙක්වීමේ විශේෂ දීමනාව හෝ ඉගැන්වීමේ දීමනාව නොමැති නමුත් ශුභාරංචිය බෙදාගැනීමේ කාර්යයේ සියලුම ඇදහිලිවතුන් නියුක්ත විය යුතුය (හෙබ්‍රෙව් 5:12).

**කථාකිරීමේ දීමනාවන්:**

කථාකිරීමේ දීමනාවන් ලෙස දීමනාවන් පහක් දී තිබෙන අතර ඒ හැම එකකටම ශබ්දනගා කථාකිරීම ඇතුළත් වේ. කථාකිරීමේ දීමනාවන් නම්:

**අනාගතවාක්‍ය පැවසීම :**

අනාගතවාක්‍ය පැවසීමේ දීමනාව සහිත අයෙක් දෙවියන්වහන්සේගේ විශේෂ ආනුභාවයෙන් දේව සෙනඟට ක්ෂණික පණිවුඩයක් සන්නිවේදනය කරයි. අනාගතවාක්‍ය පැවසීමේ දීමනාව පමණක් ඇති අයෙක් අනාගතවක්තෘවරයෙකුගේ දීමනාව ඇති අයෙක් ලෙස නොසැලකේ. දෙවියන්වහන්සේ (අනාගතවාක්‍ය පැවසීමේ දීමනාවද සහිත) අනාගතවක්තෘවරු සභාවේ විශේෂ නායකත්වයක පිහිටුවන සේක. අනාගතවාක්‍ය පැවසීමේ දීමනාව සහිත අය අනාගතවක්තෘවරයෙකුගේ විශේෂ නායකත්ව තත්වයේ අනිවාර්යයෙන්ම සිටිය යුතු නැත. ඔවුන් කරන්නේ ආත්මයාණන්ගේ ආනුභාවය යටතේ විශේෂ පණිවුඩයක් ප්‍රකාශ කිරීම පමණකි.

**ඉගැන්වීම :**

අනාගතවක්තෘවරුන් හා අනාගතවාක්‍ය පැවසීම පිළිබඳ නිදසුනෙහි මෙන් ඉගැන්වීමේ දීමනාව සහිත අයෙක් ගුරුවරයෙක් වීමේ විශේෂ දීමනාව සහිත අයෙක් නොවන්නේය. දෙවියන්වහන්සේම (ඉගැන්වීමේ දීමනාවද සහිත) ගුරුවරුන් සභාවේ විශේෂ නායකත්ව තනතුරකට පත්කරන සේක. ඉගැන්වීමේ දීමනාව දෙවියන්වහන්සේගේ වචනය සන්නිවේදනය කිරීම සහිත වන නමුත් සභාවේ විශේෂ නායකත්වයක වගකීම අත්‍යවශයෙන්ම නොදරනු ඇත.

**අනුශාසනය :**

අනුශාසනය කිරීමේ දීමනාව ඇති විට මනුෂ්‍යයන්ගේ අවශ්‍යතාවයන්හිදී ඔවුන්ට සම්පව් දේව වචනයෙන් අවශ්‍ය උපදේශය දී නිවැරදි කිරීමේ හැකියාව ඇත. "අනුශාසනය කිරීම" යන්නෙහි අර්ථය වන්නේ කෙනෙකු පසෙකට ගෙන, උපදේශය දී නිර්දේශකර, අවවාද දී. ධෛර්යවත් කර, සහනයට පත්කිරීමය. අනුශාසනා කිරීම යනු ප්‍රඥාවන්ත ආත්මික උපදේශ දීමට ඇති හැකියාවයි. මෙම දීමනාව ඇති අය, අන් අයට උපකාරයක් වන ආකාරයට දිරිමත් කිරීම, සහනය ඇතිවන ආකාරයට වචනයෙන් සේවය කිරීමේ නියුක්ත වෙති. මෙම දීමනාව සඳහා වර්තමානයේ උපදේශ දීමේ දීමනාව වශයෙන් හඳුන්වන්නට පුළුවන.

**ප්‍රඥාවේ වචන :**

ප්‍රඥාවේ වචන යන්නෙන් විශේෂ අවශ්‍යතාවයන්ට අදාළවන ආකාරයට දැනගැනීම භාවිත කළ යුත්තේ කෙසේදැයි අවබෝධ කර ගැනීමට ඇති හැකියාව අදහස් කරයි. ඕනෑම අවස්ථාවකට අදාළ කරුණු ඉදිරිපත් කළ විට මෙම දීමනාව ඇති කෙනෙකු මේ කරුණු ප්‍රඥාවන්ත විසඳුමක් ලැබෙන ලෙස අදාළ කිරීමට දැනගෙන සිටී.

ප්‍රඥාවේ වචනය යනු සාමාන්‍ය අයෙකුට නොපෙනෙන ආකාරයට පුද්ගලයන් හා අවස්ථාවන් පිළිබඳව දිව්‍යමය අවබෝධයක් ඇති වීමය. මෙය දෙවියන්වහන්සේ විසින් දෙන ලද ප්‍රඥාව, කුමක් කළ යුතුද? එය කෙසේ කළ යුතුද? යන්න සමග සම්බන්ධකර තේරුම්ගැනීමට හැකියාව සලසා දෙයි. මෙම දීමනාව "ප්‍රඥාවේ දීමනාව" යනුවෙන් හඳුන්වනු නොලබන්නේ එයින් කෙනෙකුට දෙවියන්වහන්සේගේ ප්‍රඥාව සම්පූර්ණයෙන් නොදෙන නිසාය. එය ප්‍රඥාවේ වචනයක් පමණි. එය සීමාවක් නැති දෙවියන්වහන්සේගේ ප්‍රඥාවේ කොටසක් පමණක් වේ. ප්‍රඥාවේ වචනය පිළිබඳ දීමනාව අධ්‍යයනය කරණකොටගෙන ඇති නොවේ. එහි මූලාශ්‍රය දෙවියන්වහන්සේමය.

**දැනගැන්මේ වචනය :**

දැනගැන්මේ වචනය යනු අන් අය නොදන්න දේ, අන් අයට අවබෝධකර ගැනීමට නොහැකි දේ, තේරුම් ගැනීමට සහ එම දැනුම ආත්මයාණන්ගේ ආනුභාවයෙන් අන් අය සමග බෙදාගැනීමට දෙන හැකියාවය. ප්‍රඥාව පිළිබඳ වචනය මෙන්ම "දැනගැන්මේ දීමනාව" ලෙස මෙය හඳුන්වනු නොලැබේ. එය "දැනගැන්මේ වචනය" නමැති දීමනාවයි. මක්නිසාද එය දෙවියන්වහන්සේගේ දැනගැන්මෙන් කොටසක් පමණි. දැනගැන්මේ වචනය පිළිබඳ දීමනාව හෙළිදරව් කිරීමේ දැනගැන්මකි. එම දැනුම දෙවියන්වහන්සේ විසින්ම හෙළිදරව් කරන ලද දැනුමක් වන අතර එය අධ්‍යාපනයෙන් හෝ අධ්‍යයනයෙන් ලබාගන්නා ලද දැනුමක් නොවේ.

## සේවය කිරීමේ දීමනාවන් :

අප විසින් සේවය කිරීමේ දීමනාවන් ලෙස හඳුන්වනු ලබන ආත්මික දීමනාවන් නවයක් ඇත. මෙම දීමනාවන් සැළසුම් සැපයීම, සංවිධානය සහ උපකාරය ආත්මික මෙන්ම ප්‍රායෝගික අංශයන්ගෙන් සභාවට සේවය කරයි. සේවය කිරීමේ දීමනාවන් නම්:

**ආත්මික විමසීම :**

ආත්ම විමසීමේ හැකියාව වන්නේ පුද්ගලයන්, දේවධර්මයන් හා අවස්ථාවන් ඒවා දෙවියන්වහන්සේගෙන්ද සාතන්ගෙන්ද යන්න ඇගයීමට ඇති හැකියාවය. විවේචනය කිරීමේ ආත්මයක් සමග ආත්ම විමසීම කිසිවිටකත් පටවලා නොගත යුතුය. මෙම දීමනාව ආත්මික දීමනාවක් වන අතර ආත්මික කරුණු ස්වභාවික මනසකින් විමසීම කළ නොහැකිය.

මෙම දීමනාව ආත්මයන් විමසීමට සීමාවන අතර එය සාමාන්‍ය වශයෙන් විමසීම නොවේ. මෙම දීමනාව සභාවේ සහභාගිකම භේද කිරීමට හේතුවන වැරදි අරමුණු, දේවධර්ම හා ආකල්ප සහිත පුද්ගලයන් හඳුනාගැනීමට උපකාරවන සේවා දීමනාවකි.

**නායකත්ව :**

නායකත්වය පිළිබඳ ආත්මික දීමනාව දෙවියන්වහන්සේගේ පරමාර්ථයන්ට අනුකූලව අරමුණු සකස්කිරීමේත් ඒවා අන් අයට සන්නිවේදනය කිරීමේත් හැකියාව වේ. මෙම දීමනාව සහිත අය මෙම අරමුණු දෙවියන්වහන්සේගේ මහිමය උදෙසා සම්පූර්ණ කිරීමට අන් අය පෙළඹවීම සහ මගපෙන්වීම කරති.

රෝම 12 පරිච්ඡේදයේ නායකත්වය ගැන සඳහන් කර ඇති අතර මෙම දීමනාව සඳහා ඇති සුදුසුකම කෙනෙක් ජ්වලිතකමෙන් මගපෙන්වීම (පාලනය කිරීම) බව සඳහන් කර ඇත. ජ්වලිතකමෙන් යන්නෙන් තමා සම්පූර්ණ කිරීමට භාරගත් කාර්යය නිරන්තර සැලකිල්ලක් හා උද්‍යෝගයක් ඇතිව කරගෙනයාම අදහස් කරයි. කාර්යශීලිබව, අවධානය සහිත බව සහ ආරක්ෂාකාරී බව එයින් අදහස් කරයි.

**පරිපාලනය :**

බයිබලයේ පරිපාලනය පිළිබඳ දීමනාව හඳුන්වා ඇත්තේ "ආණ්ඩු" වශයෙනි. පරිපාලනය කිරීම පිළිබඳ දීමනාව ඇති අයෙකුට අන් අය වෙනුවෙන් මගපෙන්වීම, සංවිධානය කිරීම සහ තීරණ ගැනීමේ හැකියාව තිබේ. පරිපාලනය කිරීම යන වචනයේ අර්ථය නැවක් හැසිරවීම පිණිස නියමුවෙකුට ඇති හැකියාවට සමාන අර්ථයක් ගනී. බයිබලයේ මේ කාරණා දෙකටම භාවිත කර ඇත්තේ සමාන වචනයකි.

මේ දීමනාව සහිත අයෙකුගේ වගකීම, මගපෙන්වීම හා තීරණ ගැනීම වේ. නැවක නියමුවෙක් එහි අයිතිකරුවා නොවන නමුත් මුළු ගමන හැසිරවීමේ වගකීම ඔහුට භාර දී ඇත.

නායකත්වය හා පරිපාලනය සඳහා ඇති දීමනාවන් දෙකම ආත්මික අරමුණු සම්පූර්ණ කරන සංවිධානාත්මක දක්ෂතාවයන්ගෙන් යුක්ත වේ. බොහෝවිට එක ඇදහිලිවන්තයෙක් සතුව නායකත්වයේ හා පරිපාලනයේ දීමනාවන් දෙකම තිබෙන්නට පුළුවන.

එක් අයෙකුට පරිපාලනය කිරීමේ දීමනාව ඇතිව නායකත්ව දීමනාව නොමැතිව තිබෙන විට, ඔහු සමග එකට වැඩ කිරීම පිණිස නායකත්ව දීමනාව ඇති අයෙකුගේ සහයෝගය අවශ්‍ය වේ. පරිපාලනය කිරීමේ දීමනාව ඇති පුද්ගලයාට මගපෙන්වීමේ, සංවිධානය කිරීමේ හා තීරණ ගැනීමේ හැකියාව ඇතත් නායකත්වය පිළිබඳ දීමනාව නොමැතිව ඔහුට අරමුණු සඳහා සෙනඟ මෙහෙයවීමේ හැකියාව නැතිව යයි.

**ඇදහිල්ල :**

ඇදහිල්ලේ දීමනාව සහිත කෙනෙකුට දුෂ්කර අවස්ථාවන්හිදී අධිස්වභාවික නිසැකතාවයක් සහ විශ්වාසයක් දෙවියන්වහන්සේ කෙරෙහි තැබීමට හැකියාවක් තිබේ. එය විශේෂ අවශ්‍යතාවයක් සපුරාලීමට වූ විශේෂ ඇදහිල්ලකි. අපහසුවූ දේ දෙවියන්වහන්සේට කළ හැකි බව ඔහු දනී. අනිකුත් ඇදහිලිවතුන් විශ්වාස නොකළත් ඔහු තම ඇදහිල්ල ක්‍රියාවට නංවයි.

දෙවියන්වහන්සේගේ දීමනාවක් වශයෙන් සෑම කෙනෙකුටම ඇදහිල්ලේ ප්‍රමාණයක් සපයා ඇති බව බයිබලය උගන්වයි (රෝම 12:3අ). අප ගැළවීම ලබා ගන්නේ ද ඇදහිල්ලෙන් බව එය උගන්වයි (එපිස 2:8). එහෙත් ඇදහිල්ලේ දීමනාව ජීවිතයේ සෑම අංශයක් සඳහාම දෙවියන්වහන්සේ විශ්වාස කිරීමට දී ඇති අසාමාන්‍ය හැකියාවකි. දෙවියන්වහන්සේට කළ හැකි දේ ගැන කිසිම සීමාවක් මේ ඇදහිල්ලට නැති අතර උන්වහන්සේට අපහසුවූ කිසිවක් ගැනත් නොදනී.

**දීම :**

දීමේ දීමනාව සහිත කෙනෙක් ස්වාමින්වහන්සේගේ වැඩයට මූල්‍යමය මූලාශ්‍රයන්ගෙන් මෙන්ම ද්‍රව්‍යමය දේ වලිනුත් දීමේ හැකියාව ඇති අයෙකි. මෙම දීමේ දීමනාවට තම කාලය, ශ්‍රමය සහ දක්ෂතා දෙවියන්වහන්සේගේ වැඩයට දීම ද ඇතුළත් වේ.

**උපකාර :**

උපකාර කිරීමේ දීමනාව ඇති අයෙකුට අන් අයගේ ආත්මික දීමනාවන් ඵලදායි ලෙස වර්ධනය කරගැනීම පිණිස දෙවියන්වහන්සේගේ වැඩයට උපකාර කිරීමේ හැකියාව තිබේ. භාරකාර සේවයේ සිට සංගීතය සපයන්නා දක්වා සභාවේ සේවයේ ක්‍රියාකාරීත්වයට උපකාරී වන ඕනෑම දෙයක්, උපකාර කිරීමේ දීමනාවට ඇතුළත් සේ සැලකිය හැකිය.

**සේවය කිරීම :**

රෝම 12:7 පදයෙන් මෙහෙකිරීම යන වචනය සේවය කිරීම වශයෙන් අර්ථ දක්වයි. උපකාර කිරීමේ සේවයට වඩා මෙහි ඇති වෙනස සේවය කිරීමෙන් කෙනෙකුගේ වගකීමෙන් ඔහු නිදහස් කිරීමය. සේවය කරන තැනැත්තා තව කෙනෙක් වෙනත් කාර්යයක් කිරීම පිණිස ඔහුගේ වගකීමෙන් නිදහස් කර තමා ඒ වගකීම භාරගනී.

**කරුණාව :**

කරුණාව යන්නේ තේරුම අනුකම්පා කිරීමය. කරුණාවේ දීමනාව සහිත කෙනෙක් වෙත වේදනාවට පත් අය උදෙසා විශේෂ කරුණාවක් සහිතව ඔවුනට උපකාර කිරීමට හැකියාව තිබේ.

**ආගන්තුක සේවය :**

ආගන්තුක සත්කාර සේවයේ දීමනාව අවශ්‍ය අයට කෑම සහ නවාතැන්දීමට ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය තුළ ඇතැම් සාමාජිකයන් හට දී ඇති දෙවියන්වහන්සේගේ විශේෂ හැකියාවේ දීමනාවකි.

**ලකුණු පිළිබඳ දීමනාවන් :**

ලකුණු පිළිබඳ දීමනාවන් ලෙස හඳුන්වනු ලබන දීමනාවන් හතරක් තිබේ. ඒවා දෙවියන්වහන්සේගේ වචනය සනාථ කිරීම පිණිස ඇදහිලිවතුන් තුළින් ක්‍රියාකරන දෙවියන්වහන්සේගේ බලයේ අධිස්වභාවික ලකුණු වේ. මෙම ලකුණු පිළිබඳ දීමනාවන් නම් :

**හාස්කම් :**

හාස්කම් කිරීමේ දීමනාව සහිත කෙනෙකු තුළින් ස්වභාවික ආකාරයට සිදු කළ නොහැකි වූ හැකියාවෙන් ඔබ්බට ගිය ඉතා ප්‍රබල ක්‍රියා දෙවියන්වහන්සේ ඉටුකරන සේක. දෙවියන්වහන්සේගේ බලය සාතන්ගේ බලයට වඩා බලවත් බවට මේ ක්‍රියාවන් ලකුණක් වන අතර එයින් දෙවියන්වහන්සේ මහිමය ලබන සේක.

**සුවකිරීම් :**

සුවකිරීමේ දීමනාව සහිත ඇදහිලිවන්තයන් හට ස්වභාවික ක්‍රමයන්ගෙන් ලබාගත නොහැකි සම්පූර්ණ සුවයක් ඇති කිරීම පිණිස තමා තුළින් දෙවියන්වහන්සේගේ බලය ගමන් කිරීමට ඉඩදීමේ හැකියාව තිබේ.

**භාෂාවන් :**

භාෂාවන් පිළිබඳ දීමනාව වන්නේ දෙවියන්වහන්සේගේ සෙනඟට කිසිවක් නොදන්නා භාෂාවකින් දෙවියන්වහන්සේගේ පණිවුඩයක් ලබාගැනීමටත් සන්නිවේදනය කිරීමටත් දෙන හැකියාව වේ. "භාෂාවන්" යනු ව්‍යවහාර කරනු ලබන භාෂාවන්ය. මෙම දීමනාව කථාකිරීමේ දීමනාවක් ලෙස නොහඳුන්වා ලකුණු පිළිබඳ දීමනාවක් ලෙස හැඳින්වීමට හේතුව බයිබලය මෙම දීමනාව ලකුණක් පිණිස දෙන ලද දීමනාවක් බව පැහැදිලිව දක්වා ඇති නිසාය. අන්භාෂාවකින් කථා කිරීමේදී එය අසන්නන් විසින් හඳුනාගත හැකි ඔවුන් දන්නා භාෂාවක් වීමට ද පුළුවන.

> **මේ ශබ්දය ඇසුණු කල සමූහයා එකතුව ඇවිත් වියවුල් විය. මක්නිසාද එකිනෙකා තම තමාගේ භාෂාවෙන් ඔවුන් කථා කරනවා ඇසුවේය. ඔවුන් සියල්ලෝ විස්මිතව පුදුමවී, බලව මේ කතාකරන සියල්ලෝ ගලීලයෝ නොවෙද්ද? අප උපන් දේශවල අප එකිනෙකාගේම භාෂාවෙන් ඔවුන් කථාකරනවා කෙසේ අසමුද? (ක්‍රියා 2:6-8)**

එමෙන්ම එය මනුෂ්‍යයන් නොදන්නා භාෂාවක්ද විය හැකිය. මෙය අන්‍ය භාෂා කතාකිරීම යනුවෙන් හඳුන්වනු ලබයි.

> **මක්නිසාද අන් භාෂාවකින් කතාකරන්නා, මනුෂ්‍යයන්ට නොව දෙවියන්වහන්සේට කථාකරන්නේය. ඔහු ආත්මයෙන් රහස් කථාකරන නමුත් කාටවත් තේරෙන්නේ නැත. (1 කොරින්ති 14:2)**

අන් භාෂාවන්ගෙන් කථා කිරීම ශුද්ධාත්ම බෞතිස්මය ලැබූ බවට භෞතික ලකුණ වේ. නමුත් මෙම භාෂා කථාකිරීම, භාෂාවන් පිළිබඳ දීමනාවට වඩා වෙනස් එකකි. භාෂාවන් කථා කිරීමේ දීමනාව යනු දෙවියන්වහන්සේගෙන් ලබාගත් පණිවුඩයක් (ප්‍රකාශ කරන පුද්ගලයා නොදන්නා භාෂාවකින්) සභාවට පණිවුඩයක් ලෙස ලබාදීමේ හැකියාවයි.

**භාෂා පරිවර්තනයේ දීමනාව :**

භාෂා පරිවර්තනයේ දීමනාව වන්නේ අසන්නන්ට තේරුම් යන භාෂාවකින්, අන් භාෂාව තුළින් දෙන ලද පණිවුඩය දීමට ඇති විශේෂ හැකියාවය. මෙම දීමනාව ඇති පුද්ගලයෙකුට ශුද්ධාත්මයාණන්වහන්සේ විසින්ම භාෂා පරිවර්තනය කිරීමේ දීමනාව දෙනු ලබයි. එය පණිවුඩය දුන් භාෂාව දැනගෙන භාෂා පරිවර්තනය කිරීමක් නොවේ. එය ශුද්ධාත්මයාණන්ගේ හෙළිදරව් කිරීමක් ලෙස දෙනු ලැබූවකි.

## ඔබගේ ආත්මික දීමනාවන් සොයා ගැනීම

ඔබ සතු ආත්මික දීමනාවන් ඔබ දන්නේ නැතිනම් ඔබ විසින් හාවස්ට්ටයිම් ජාත්‍යන්තර ආයතනය විසින් සම්පාදනය කර ඇති *"ශුද්ධාත්මයාණන්වහන්සේගේ මෙහෙය"* නම්වූ පාඨමාලාව ලබාගැනීම සුදුසුයයි යෝජනා කරමු. එය ඔබගේ දීමනාවන් සොයාගැනීම පිණිස පහත දැක්වෙන පියවර තුළින් ඔබ ගෙනගොස් උපකාර කරනු ඇත.

### පියවර එක : නැවත උත්පාදනය ලැබීම

ආත්මික දීමනාවන් ලබන පිණිස ඔබ නැවත උත්පාදනය ලැබිය යුතුය. ස්වභාවික භෞතික උත්පත්තිය තුළින් ස්වභාවික තලෙන්ත ලබන ආකාරයෙන්ම නව උත්පත්තිය තුළින් ඔබ ආත්මික දීමනාවන් ලබන්නේය.

> **පේත්‍රුස්: නුඹලා සියල්ලෝම පසුතැවිලිව, පව්කමාව පිණිස යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් බව්තිස්මය ලබන්න. එවිට ශුද්ධාත්ම දීමනාව නුඹලා ලබන්නහුහය. (ක්‍රියා 2:38)**

### පියවර දෙක : ශුද්ධාත්මයාණන්ගේ බෞතිස්මය ලබන්න

*"ශුද්ධාත්මයාණන්ගේ මෙහෙය"* නමැති පාඨමාලාවේ මෙය ලබාගන්නා ආකාරය ගැන මගපෙන්වීම දී තිබේ.

### පියවර තුන : ආත්මික දීමනාවන් දැනගන්න

තිබෙන ආත්මික දීමනාවන් මොනවාදැයි ඔබ නොදන්නේ නම් ඔබට දෙවියන්වහන්සේ විසින් දී ඇති දීමනාවන් හඳුනාගැනීමට නොහැකි වන්නේය. මේ පාඩමේ දී ඇති අර්ථ නිරූපණය නැවත බලන්න. එමෙන්ම *"ශුද්ධාත්මයාණන්ගේ මෙහෙය"* පිළිබඳව ඇති පාඨමාලාව අධ්‍යයනය කරන්න.

### පියවර හතර : දීමනාවන් පිළිබඳ ආදර්ශයන් නිරීක්ෂණය කරන්න

ඔබ ඔබට ඇති දීමනාවන් පිළිබඳව සැලකිමක් දක්වන්නේ නම් විවිධ දීමනාවන් පිළිබඳව ඇති පරිණත ආදර්ශයන් නිරීක්ෂණය කිරීම ඔබට උපකාරී විය හැකිය. පරිණත ආදර්ශයක් යනු දීර්ඝ කාලයක් තිස්සේ දීමනාවන් සාර්ථක ලෙස භාවිත කරන ඇදහිලිවන්තයෙකි.

### පියවර පහ : ආත්මික දීමනාවකට ආශාවන්න

ආත්මික දීමනාවන්ට අශාවන ලෙස බයිබලය පවසයි.

> **නුමුත් වඩා උතුම් දීමනාවලට ආශාවෙන්න. තවද ඊටත් වඩා උතුම් මාර්ගයක් මම නුඹලාට පෙන්වමි. (1 කොරින්ති 12:31)**

### පියවර හය : අත්තැබීම

ඔබගේ ආත්මික නායකයන්ට ඔබ මත අත්තබා දෙවියන්වහන්සේ විසින් ඔබට ඇති දීමනාවන් හෙළිදරව් කර දෙන පිණිස යාච්ඤා කරන ලෙස ඉල්ලන්න.

> **වැඩිමහල්ලන්ගේ අත් තැබීම ඇතුව අනාගතවාක්‍යයෙන් නුඹට දෙන ලද නුඹ තුළ තිබෙන දීමනාව ව්‍යවහාර නොකර නොසිටින්න. (1 තිමෝති 4:14)**

## පියවර හත : ඔබගේ ආත්මික ආශාවන් විශ්ලේෂණය කරන්න

ඔබ දෙවියන්වහන්සේට කරන සේවයේ ඔබ මහත් ප්‍රීතියක් ලබන්නේ බොහෝවිට උන්වහන්සේ විසින්ම ඔබට දීමනා ලෙස දී ඇති අංශයන්හිය. දෙවියන්වහන්සේට ඵලදායි සේවයක් කරන පිණිස යම් සේවයක් පිළිබඳව ඔබට ආශාවක් හෝ බරක් තිබිය යුතුය.

## පියවර අට : කිතුනු නායකයෙකුගේ විශ්ලේෂණය

ඔබගේ ආත්මික හැකියාවන් විශ්ලේෂණය කිරීමට කිතුනු නායකයෙකුට ඉඩ දෙන්න. *"ශුද්ධාත්මයාණන්ගේ මෙහෙය"* පිළිබඳ පාඨමාලාවේ ක්‍රමය සහ උපදේශය භාවිත කරන්න.

## පියවර නවය : ඔබගේ පසුගිය කිතුනු සේවය විශ්ලේෂණය කරන්න

ඔබගේ පසුගිය කිතුනු සේවය විශ්ලේෂණය කරන්න. සේවයේ කුමන අංශවල ඔබ සේවය කර තිබේද? කුමන අංශවල ඔබගේ සේවය සාර්ථකවීද? වඩාත්ම ප්‍රීතියක් ඔබ අත්දුටුවේ කුමන සේවයේද? ඔබ කුමන අංශයක සාර්ථකව සේවයක් කළ බව ඔබගේ ආත්මික නායකයා හෝ අනික් අය දුටුවේද?

**පියවර දහය** : ආත්මික දීමනාවන් පිළිබඳ ප්‍රශ්නාවලිය සම්පූර්ණ කරන්න. *"ආත්මයාණන්ගේ මෙහෙය"* පිළිබඳ පාඨමාලාවේ ඔබගේ දීමනා හඳුනාගැනීමට උපකාරී වන ආත්මික දීමනා ප්‍රශ්නාවලියක් ඇතුළත් වේ. මෙම ප්‍රශ්නාවලිය සම්පූර්ණ කිරීම අත්‍යවශ්‍ය නොවුවත් ඔබගේ ආත්මික දීමනාවන් සොයාගැනීමට එය උපකාරී මෙවලමක් වේ.

## පියවර එකොළහ : ඔබට ඇතැයි ඔබ සිතන්නාවූ දීමනාවන් හඳුනාගන්න

ඔබට ඇතැයි ඔබ සිතන දීමනාවන් පහත කරුණු තුළින් හඳුනාගන්න.

1. දීමනාවන් පිළිබඳ ඔබ අධ්‍යයනය කර දැනගත් කරුණු තුළින්
2. යාච්ඤාවෙන් දෙවියන්වහන්සේ ඔබට එළිදරව් කරදී ඇති දීමනා
3. ඔබ පිළිබඳ කරන ලද විශ්ලේෂණයෙන්
4. ප්‍රධාන කිතුනු නායකයන් විසින් ඔබේ ජීවිතය නිරීක්ෂණයෙන් ලබා ගත් කරුණු
5. ඔබ කලින් කරන ලද සේවාවන්ගේ ඵලදායි බව ගැන කරන ලද විශ්ලේෂණයෙන්
6. ආත්මික දීමනා පිළිබඳ ප්‍රශ්නාවලිය සම්පූර්ණ කිරීමේදී

## පියවර දොළහ : ආත්මික අවශ්‍යතාවයන් හඳුනාගන්න

ඔබගේ සභාවේ, ප්‍රජාවේ සහ අසල්වාසීන්ගේ ආත්මික අවශ්‍යතාවන් විශ්ලේෂණය කරන්න. ඒවායින් කුමන අවශ්‍යතාවයන් සම්පූර්ණ වී නැද්ද?

## පියවර දහ තුන : ආත්මික අවශ්‍යතාවයක් පූර්ණ කරන්න

පියවර දොළහේ ඔබ විසින් සාදන ලද ආත්මික අවශ්‍යතා ලයිස්තුව ඔබට දෙවියන්වහන්සේ දී ඇතැයි විශ්වාස කරන දීමනා සමග සසඳන්න. ඔබට ඇතැයි විශ්වාස කරන දීමනාවට සරිලන ආත්මික අවශ්‍යතාවය හඳුනාගෙන ඒ අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම පිණිස කැපවීමකට පැමිණෙන්න.

## පියවර දාහතර : ඔබගේ සේවයේ අගැයුමක් කරන්න

ඔබගේ දීමනාවට අදාළවූ සේවයේ නියුක්තව සිටියාට පසුව ඔබගේ සේවය පිළිබඳ අගැයීමක් කරන්න. ඔබ පහත පෙනෙන ආකාරයට ක්‍රියාකරන්නේ නම් එයින් ඔබ ඔබගේ ආත්මික දීමනාවන් සොයා දැනගත් බවත් ඒවායේ සුදුසු භාරකාරත්වයක් පෙන්වන්නෙක් වනු ඇත.

- ඔබ සේවය කරන අංශයේ ඔබ ඵලදායකවීම. මෙහි අර්ථය නම් ඔබේ සේවයේ ශුභවාදී ප්‍රතිඵල ඔබ දැකීමය.

- ඔබ තෘප්තිමත් විට . . . ඔබ ඔබගේ සේවය ප්‍රිතියෙන් කරයි. ඔබ කනස්සල්ලට පත්ව සිටින්නෙහි නම් ඔබ සේවය කරන්නේ ඔබට දීමනාවක් නොමැති අංශයක විය හැකිය.

- මම ලබන ප්‍රතිචාරවලින් (ඔබගේ ආත්මික නායකයන්ගෙන් ඔබ ලබන අදහස් පැවතිම්වලින්) ඔබ සේවය කරන ස්ථානයේ ඵලදායි සේවයන් කරන බව අර්ථවත් වේ.

ඔබ කරගෙන යන සේවය ඔබගේ ආත්මික දීමනාවන් සමග නොගැළපෙන විට සහ සේවය ඵලදායක නොවේ නම් නැවත ඔබට තිබිය හැකි දීමනාවන් සලකා බලා ඔබ සේවය කළ යුතු වෙනත් අංශයක් පෙන්වා දෙන ලෙස දෙවියන්වහන්සේගෙන් ඉල්ලන්න.

අධෛර්ය නොවන්න. ඔබ සතුව නොමැති දීමනා මොනවාද යන්න දැනගැනීම මෙන්ම ඔබගේ දීමනාවන් මොනවාදැයි දැනගැනීම එකසේ වැදගත් වේ. ඔබ ඵලදායි නොවන සේවයක ඔබගේ කාලය වැයකිරීම මෙයින් වළක්වාගත හැකිවේ. මෙම ප්‍රායෝගික පියවර ඔබගේ, යාච්ඤාව සමග සම්බන්ධ කරගැනීමෙන් දෙවියන්වහන්සේ ඔබ නියුක්තවීමට තෝරාගෙන ඇති විශේෂිත සේවාව ඔබ ඉක්මනින් සොයාගන්නවා ඇත.

# ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

_______________________________________________

_______________________________________________

_______________________________________________

2. ශුද්ධාත්මයාණන්ගේ දීමනාවන්ගේ පරමාර්ථ තුනක් ලියන්න.

(1) ____________________________________________

(2) ____________________________________________

(3) ____________________________________________

3. ශුද්ධාත්මයාණන්ගේ දීමනාවන්ගේ අරමුණු පහක් සඳහන් කරන්න.

(1) ____________________________________________

(2) ____________________________________________

(3) ____________________________________________

(4) ____________________________________________

(5) ____________________________________________

(මෙම පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ දක්වා ඇත.)

# වැඩිදුර අධ්‍යයනය සඳහා

මෙහි පහත සටහනෙහි දක්වා ඇති පද විශේෂ දීමනාවන් හා සේවාවන්හි නියුක්ත වූ බයිබලීය කාන්තාවන් පිළිබඳ ඔබගේ දැනුම විස්තීර්ණ කරනු ඇත. මෙම සටහනෙහි ආත්මික දීමනා සහ සභා සේවාවන්හි නියුක්ත වූ කාන්තාවන් ගැන පමණක් නොව විවිධ වෘත්තීන්හි සහ නිවෙස් තුළ වැඩ කිරීමේ නියුක්තවූ කාන්තාවන් ගැනද විස්තර ඇතුළත් වේ.

| පද | කාන්තාව | ස්ථානය |
|---|---|---|
| උත්පත්ති 24:59, 35:8 | දෙබෝරා | සාත්තුසේවිකා |
| නික්මයාම 1:15-21 | ෂිප්රා සහ පුවා | දේව භය නිසා හෙබ්‍රෙව් දරුවන් ආරක්ෂා කළ වින්නඹුවන් |
| නික්මයාම 15:20-21 | මිරියම් | අනාගතවක්තෘවරියක්, ප්‍රථම කාන්තා කණ්ඩායම ආරම්භ කළාය. |
| විනිශ්චයකාරයා 4:14 | දෙබොරා | අනාගතවක්තෘවරිය/ජාතික නායිකාව |
| 1 රාජාවලිය 10:1-13 | ෂෙබාහි බිසව | පරිපාලනය |
| 2 රාජාවලිය 4:10 | ෂුනෙම්මීය කාන්තාව | ආගන්තුක සත්කාරය |
| 2 රාජාවලිය 5 | නමක් සඳහන් නැති කාන්තාව | පුද්ගලික ශුභාරංචිය |
| හිතෝපදේශ 31:10-31 | ගුණවත් ස්ත්‍රිය | භාර්යාව/නිවෙස ගොඩනගන්නී, ව්‍යාපාරික ස්ත්‍රිය |
| මතෙව් 9:20-22 | නමක් සඳහන් නොවන | ඇදහිල්ලේ දීමනාව ප්‍රකාශ කළාය. |
| 2 තිමෝති 1:5 | ලොයිස්/එවිනිකි | ඇදහිල්ලේ දීමනාව ප්‍රකාශ කළාය. |
| ලූක් 2:37-38 | ආනා | අනාගතවක්තෘවරිය/ශුභාරංචි ප්‍රකාශිත යුදෙව්වරුන්ට යේසුස්වහන්සේ ගැන දේශනා කළාය. මැදහත්කාර සේවය |
| ලූක් 8:1-3 | යොවන්නා, සුසානා, මරියා | උපකාර කිරීමේ දීමනාව |
| ලූක් 10:40 | මාර්තා | නිවෙස ගොඩනගන්නී/ආගන්තුක සත්කාරය |
| යොහන් 4 | සමාරිතානු ස්ත්‍රිය | පුද්ගලික ශුභාරංචි සේවය |
| ක්‍රියා 1:14, 16:13 | මරියා සහ නම සඳහන් නැති කාන්තාව | මැදිහත්කාරියන් |
| ක්‍රියා 9:36-41 | ලිදියා | ව්‍යාපාරික කාන්තාව/වැන්දඹුවන්ට සේවය |
| තිතස් 2:3-4 | වැඩිමහල් කාන්තාවන් | ඉගැන්වීම |
| රෝම 16:1-2 | පේබී | උපස්ථායිකාව/සේවිකාව |
| රෝම 16:3,7 | ප්‍රිස්කිලා | අපොස්තලික සේවය( පාවුල් සමග හවුල් සේවය) |
| රෝම 16:1-2 ක්‍රියා 18:26, පිලිප්පි 4:3 | විවිධ කාන්තාවන් | සභා සේවය/ නිවෙස් සභාවල නායකත්වය දැරීම. |

## දහතුන්වන පරිච්ඡේදය

# අභියෝගයන් සහ විශිෂ්ටතාවයන්

**අරමුණු:**

මෙම පරිච්ඡේදය අවසන් කිරීමෙන් පසුව ඔබහට කළ හැකි කරුණු :

- බයිබලයේ සඳහන් කාන්තාවන්ගේ සුවිශේෂී විශිෂ්ටතාවයන් ලයිස්තුගත කිරීම.
- කාන්තාවන්ගේ බලවත් බලපෑම හඳුනාගැනීම.
- කාන්තාවන්ට ඇති විශේෂ බයිබලීය අභියෝගයන් භාරගැනීම.

**ප්‍රධාන පදය**

> **ස්වාමින්වහන්සේ වචනය දෙන සේක. ආරංචිය පතුරුවන ස්ත්‍රීහු මහත් සේනාවක්ය. (ගීතාවලිය 68:11)**

**හැඳින්වීම**

බයිබලයේ කාන්තාවෝ විශේෂ විවිධ විශිෂ්ටතාවයන් දරති. මේ පරිච්ඡේදය තුළ ඔබ ඒවා පිළිබඳව හා දෙවියන්වහන්සේ විසින් කාන්තාවන්ට දෙන ලද විශේෂ අභියෝගයන් පිළිබඳවද ඉගෙන ගන්නවා ඇත. එමෙන්ම කාන්තාවන් සතුව ඇති බලය පිළිබඳවද ඒවායේ ශුභවාදී හා අශුභවාදි ශක්තීන් ගැනද ඉගෙන ගන්නවා ඇත.

**සුවිශේෂී විශිෂ්ටතාවයන්**

බයිබලීය ඉතිහාසය පුරාම දෙවියන්වහන්සේගේ සැලැස්මේ ප්‍රධාන අවස්ථාවන්හිදී කාන්තාවන් විශේෂ හවුල්කරුවන්ව සිටිති. පැරණි ගිවිසුම මිරියම්, දෙබොරා, රූත්, එස්තර් අබිගායිල් සහ තවත් ස්ත්‍රීන්ගේ දායකත්වය වාර්තා කරයි. මෙම පාඨමාලාවේ අවසාන පරිච්ඡේදය තුළ මේ අය ගැනත් තවත් අය ගැනත් අධ්‍යයනයට ඔබට අවස්ථාවක් ලැබේ.

යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පොළොවේ සේවය තුළ සහ ශුභාරංචිය ව්‍යාප්ත කිරීමේ සේවය තුළ කාන්තාවන් විවිධ ප්‍රධාන අවස්ථාවන්හිදී වැදගත් විය. ඒවා දේව සැලැස්ම තුළ කාන්තාවන් ශුභාරංචි පණිවුඩයේ සේවකයන් ලෙස ඇතුලත් කිරීමට තිබුණු සැලැස්ම එළිදරව් කරන බැවින් අප මේ විශිෂ්ටතාවයන් පිළිබඳව උනන්දුවක් දක්වමු.

**මෙසියස්වහන්සේගේ මව :**

පළමුවෙන්ම පාපය ලෝකයට ඇතුළු වූයේ ඒව නම් කාන්තාවක් කරණකොටගෙනය. එහෙත් ලෝකයට ගැළවීම පැමිණියේත් මරියා නම් කාන්තාවක් කරණකොටගෙනය :

> **ඈ පුත්‍රයෙකු වදන්නිය, උන්වහන්සේට යේසුස් යන නාමය තබාපන්න. මක්නිසාද, තමන්ගේ සෙනඟ ඔවුන්ගේ පාපවලින් ගළවන්නේ උන්වහන්සේයයි කීසේක. (මතෙව් 1:21)**

ශුභාරංචි පණිවුඩය වූ වාක්‍යාණෝ, යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ස්වරූපයෙන් පොළොවට පැමිණියේ කාන්තාවක් කරණකොටගෙනය.

**ගැළවීම ප්‍රථමයෙන්ම දේශනා කිරීම :**

ඒ කාලයේ යුදෙව්වරු අතර තිබුණ චාරිත්‍රයකට අනුකූලව ආශිර්වාද ලබන පිණිස යේසුස්වහන්සේ කුඩා බිළිදෙක්ව සිටියදී උන්වහන්සේගේ දෙමව්පියන් විසින් උන්වහන්සේ ස්වාමින්වහන්සේ වෙත ඉදිරිපත් කිරීමට දේව මාලිගාවට ගෙනයන ලදී. ඔවුන් යේසුස්වහන්සේ දේව මාලිගාවේ සේවකයා වෙත ඉදිරිපත් කළ විට, ලෝකයා පාපයෙන් ගළවාගැනීම පිණිස පොරොන්දුවූ මෙසියස්වහන්සේ

උන්වහන්සේ බව ඔහු හඳුනා ගත්තේය. සිමියොන් මේ ආකාරයට තම ප්‍රශංසාව දෙවිඳුන්ට එසවූයේය.

> **මක්නිසාද අන්‍යජාතීන්ට එළිදරව් කිරීමට ආලෝකයක් ද ඔබගේ ඉශ්‍රායෙල් සෙනඟගේ තේජසද වූ සියලු මනුෂ්‍යයන් ඉදිරියෙහි ඔබ විසින් පිළියෙල කළාවූ, ගැළවීම මාගේ ඇස්වලින් දුටිමියි කීවේය. (ලූක් 2:30-32)**

මේ සිද්ධියට ආනා නම්වූ කාන්තාවක් විසින් සාක්ෂි දරන ලදි. ඇය අනාගතවක්තෘවරියක් බවත් වැන්දඹුවක්ව සිටි ඇය දේව මාලිගාවේ නිරාහාරයෙන්ද යාච්ඤාවෙන්ද දිගටම සේවය කළ තැනැත්තියක් බවත් බයිබලය හෙළිදරව් කරයි (ලූක් 2:36-37). ආනා පොරොන්දුවූ මෙසියස්වහන්සේ යේසුස්වහන්සේ බව හඳුනාගෙන ක්‍රිස්තුස්වහන්සේ තුළින් ඇති මිදීමේ පණිවුඩය ප්‍රථමයෙන්ම ප්‍රකාශ කළ තැනැත්තිය වූවාය.

> **ඇද ඒ පැයෙහිම ඇවිත් දෙවියන්වහන්සේට ස්තුති කොට, යෙරුසලමේ මිදීම ගැන බලාසිටි සියලුදෙනාට උන්වහන්සේ ගැන කථා කළාය. (ලූක් 2:38)**

මනුෂ්‍ය වර්ගයාගේ මුල්ම පාපය කාන්තාවක් කරණකොටගෙන විය. දැන් කාන්තාවක් පාපයෙන් ගැළවීමේ සැලැස්ම එළිදරව් කිරීමේ කරුණටද හේතු වූවාය. යුදෙව්වන්ට ප්‍රථමයෙන්ම ශුභාරංචිය ප්‍රකාශ කළ දේශිකාව ආනා වූවාය.

## මෙසියස්වහන්සේ පිළිබඳ එළිදරව්ව ලැබූ ප්‍රථමයා වීම :

යේසුස්වහන්සේ තමන්වහන්සේ මෙසියස්වහන්සේ බව පළමු වරට එළිදරව් කළේ කාන්තාවකටය. ගලිලයට යන මාර්ගයේ යේසුස්වහන්සේ සමාරිය පසුකර යමින් සිටි සේක. තමන්වහන්සේගේ ගෝලයන් කෑම මිලදී ගැනීමට ගොස් සිටි අතර, යේසුස්වහන්සේ සමාරියේ සිඛාර් නම් ස්ථානයේ ළිඳක් අසල විවේක ගත් සේක.

සමාරිතානු ස්ත්‍රියක් වතුර ගෙනයාමට පැමිණි අතර යේසුස්වහන්සේ ඇයට කථා කළ සේක. යොහන් 4 පරිච්ඡේදයේ ඔවුන්ගේ සාකච්ඡාව වාර්තා කර ඇත. සාකච්ඡාව අතරතුරදී යේසුස්වහන්සේ ප්‍රථම වරට තමන්වහන්සේ මෙසියස්වහන්සේ බව පිළිගත් සේක.

> **ස්ත්‍රී උන්වහන්සේට කථාකොට : (ක්‍රිස්තුස් යයි කියන) මෙසියස්වහන්සේ එන බව දනිමි. උන්වහන්සේ ආවාම සියල්ල අපට දන්වන සේකැයි කීවාය. නුඹ සමග කථාකරන්නාවූ මම උන්වහන්සේයයි යේසුස්වහන්සේ ඈට කී සේක. (යොහන් 4:25-26)**

## වෙනස් සංස්කෘතීන් අතර ප්‍රථම ඉවැන්ජලිස්ත වරයා :

යොහන් 4 පරිච්ඡේදයේ සඳහන් සිද්ධිය තෙක් යේසුස්වහන්සේගේ මෙහෙය යුදෙව්වරුන්ගෙන් ඔබ්බට පැතිරගොස් නොතිබුණි. උන්වහන්සේ සමාරිතානු ස්ත්‍රියට තමන්වහන්සේ එළිදරව් කිරීමෙන් පසු ඇය ප්‍රථම සංස්කෘතීන් අතර ශුභාරංචි දේශිකාව වූවාය. ඇය සමාරිතානුවන්ට දේශනා කළ අතර බොහෝ දෙනෙක් යේසුස්වහන්සේ අදහාගත්හ (යොහන් 4:41).

ආනා, යේසුස්වහන්සේ පිළිබඳ පණිවුඩය යුදෙව්වරුන් වෙත ගෙනයාමේ ප්‍රථම කාන්තාව වූවා සේම සමාරිතානු ස්ත්‍රියද අන්‍යජාතීන් වෙත ශුභාරංචිය ගෙන යන ලද ප්‍රථම කාන්තාව වූවාය. සමාරිතානු ස්ත්‍රිය කාමමිථ්‍යාචාරියක් වූවාය. ඇය යේසුස්වහන්සේ හමුවන අවස්ථාව වන විට ඇය පස්වරක් විවාහ වී සිටි අතර ඇය එවිට ජීවත්වූ පුරුෂයා ද ඇයගේ ස්වාමිපුරුෂයා නොවූයේය. එසේවුවත් යේසුස්වහන්සේ ඇයට එළිදරව් වූ සේක. ඇය ඇයගේ සෙනඟට සේවය කළාය.

ඔබගේ අතීතය කුමක් වුවත් දෙවියන්වහන්සේට ඔබට තමන්වහන්සේ එළිදරව් කිරීමට අවශ්‍යය. එසේම ඔබේ ජීවිතය වෙනස්කර උන්වහන්සේගේ මහිමය උදෙසා ඔබ භාවිත කිරීමට අවශ්‍යය. සමාරිතානු ස්ත්‍රියගේ ආකාරයෙන්ම ක්‍රිස්තුස්වහන්සේගේ මෙහෙය තුළ ඔබට මහත් ප්‍රීතිදායක ස්ථානයක් සොයාගත හැකිය.

යුදයේ සිට ගලීලයට යන මාර්ගයේ සමාරිය පසුකර යෑම යේසුස්වහන්සේට අත්‍යවශ්‍ය නොවීය. සැබෑව නම් එය මාර්ගයෙන් බැහැරව යාමකි. එහෙත් ශුභාරංචිය අවශ්‍ය එක ආත්මයක් හෝ සිටී නම් කුමන ස්ථානයක් හෝ මාර්ගයෙන් බැහැරව යාමක් නොවේ. මාර්ගයෙන් බැහැර යයි

ගණන්ගත හැකි ඇත පිටිසර ගමක් නැත. බොහෝ දුරස්ථවූ නගරයක් ද නැත. ඔබට යම් ස්ථානයක එක් අයෙකුට ශුභාරංචිය ප්‍රකාශකිරීම කළ හැකි වනු ඇත. ඔවුන්ට මුළු ප්‍රජාවටම පිබිදීම ගෙන ඒමට හැකියාව ඇත.

මෙම ස්ත්‍රිය වෙතට ළඟාවීම පිණිස යුදයේ සිට ගලීලයට යන ප්‍රධාන මාර්ගය අත්හැර යාමට යේසුස්වහන්සේට අවශ්‍ය විය. පොළොවේ සීමාන්ත කොටස් දක්වා ශුභාරංචිය ගෙනයාම අපට අවශ්‍ය නම් අපගෙන් ඇතැම් අයට ජීවිතයේ ප්‍රධාන මාර්ගය අත්හැරීමට සිදුවනු ඇත. අපට මාර්ගයෙන් බැහැරව ගොස් දුෂ්කර මාර්ග තෝරා ගැනීමට සිදුවේ.

මෙම එක කාන්තාව කරණකොටගෙන සම්පූර්ණ නගරයකට ශුභාරංචිය ගෙනයාමට හැකි විය. මෙම මුණගැසීමේදී යේසුස්වහන්සේ ශුභාරංචිය දේශනාකිරීම පිළිබඳව වැදගත් මූලධර්මයක් ප්‍රදර්ශනය කළ සේක. තම සෙනඟ අතර ශුභාරංචිය ගෙන යා හැකි විශ්වාසවන්ත පුරුෂයන් හා ස්ත්‍රීන් වෙත අප යා යුතුය.

> **බොහෝ සාක්ෂිකාරයන් ඉදිරියෙහි නුඹ මාගෙන් ඇසූ දේම වෙන අයටත් උගන්වන්ට සමර්ථවූ විශ්වාසවූ මනුෂ්‍යයන්ට භාරදීපන්න. (2 තිමෝති. 2:2)**

ඔබට මෙවැනි අය පුහුණු කළ හැකි නම්, ඔවුන්ට මහත් සමූහයන් වෙතට ළඟාවීමට හැකිවනු ඇත.

## අවසානයේ කුරුසිය ළඟ :

යේසුස්වහන්සේ පොළොවේ තමන්වහන්සේගේ මෙහෙය කල කාලය තුළ කැපවීමෙන් සේවය කළ කාන්තාවන් අවසානයේ කුරුසිය ළඟ සිටි බව බයිබලය වාර්තා කරයි. යේසුස්වහන්සේ මැරුණ කල:

> **ඔවුන් අතරේ උන්වහන්සේ ගලීලයේ සිටි කල්හි උන්වහන්සේ කැටුව ගියාවූ, උන්වහන්සේට උපස්ථානකළාවූ මග්දලායේ මරියාත් කුඩා යාකොබ්ගේද යෝසෙස්ගේද මවුවූ මරියාත් සලෝමිත් උන්වහන්සේ සමග යෙරුසලමට ආවාවූ වෙන බොහෝ ස්ත්‍රීවරුත් සිටියෝය. (මාර්ක් 15:40-41)**

යේසුස්වහන්සේ වෙත දැක්වූ ප්‍රේමය නිසා මෙම කාන්තාවෝ උන්වහන්සේගේ මරණය දක්වා කුරුසිය ළඟ බලා සිටියහ. සමූහයාගේ ප්‍රශංසා මැද යේසුස්වහන්සේ යෙරුසලමට ඇතුල්වූ අවස්ථාවේ දැක්වූ විශ්වාසවන්ත භාවය ලෙසම උන්වහන්සේගේ මරණය අවස්ථාවේදීත් ඔව්හු විශ්වාසවන්තව සිටියහ.

## සොහොන් ගෙය ළඟ ප්‍රථමයන් වීම :

මග්දලාවේ මරියා ද යෝසෙස්ගේ මව්වූ මරියාද උන්වහන්සේගේ ශරීරය කුරුසියෙන් ඉවත්කර ගත් පසු යේසුස්වහන්සේ භූමදාන කිරීම දැකගැනීමට බලා සිටියහ (මාර්ක් 15:47). සබත් දින විවේකයෙන් පසු සතියේ පළමුවෙනි දින ඔව්හු උදෑසනින්ම නැගිට ඒ කාලයේ සිරිත ලෙස යේසුස්වහන්සේගේ ශරීරය සුවඳ වර්ගවලින් ආලේපකරන පිණිස ගියහ. ඔව්හු සොහොන්ගෙය වෙත පැමිණිකල යේසුස්වහන්සේ එහි නැතිබව දැන ගත්හ. තමන්ට මේ ආකාරයට පැවසූ දේවදූතයන් දෙදෙනෙකු ඔව්හු දුටුවහ.

> **උන්වහන්සේ මෙහි නැත. උන්වහන්සේ නැගිටුණු සේක. මනුෂ්‍ය පුත්‍රයා පව්කාර මිනිසුන්ගේ අත්වලට පාවාදෙනු ලබන්ටත් කුරුසියෙහි ඇණ ගසනු ලබන්ටත් තුන්වෙනිදා නැවත නැගිටින්ටත් ඕනෑය කියා උන්වහන්සේ ගලීලයේ සිටියදී කථාකළ හැටි සිහිකරපල්ලා යයි ඔවුන්ට කීවෝය. (ලූක් 24:6-7)**

යේසුස්වහන්සේගේ නැවත නැගිටීම පිළිබඳ එළිදරව්ව ප්‍රථමයෙන්ම ලබාගැනීමට හැකි වූයේ සොහොන්ගෙය වෙත සිටි මේ කාන්තාවෝ වූහ.

## නැවත නැගිටීම දේශනා කිරීමේ ප්‍රථමයෙක් වීම :

මේ ප්‍රීතිදායක ආරංචිය ඇසූ කාන්තාවෝ :

> **මේ සියල්ල එකොළොස් දෙනාටද අනික් සියල්ලන්ටද දැන්වූවෝය, මේ වචන ඔවුන්ට නිරර්ථක කථාවක් මෙන් පෙනී, ඔව්හු ඔවුන් අවිශ්වාස කළෝය. (ලූක් 24:9 සහ 11)**

## ක්‍රිස්තුස්වහන්සේ දැකීමේ ප්‍රථමයෝ වූහ :

ක්‍රිස්තුස්වහන්සේ මරණයෙන් නැවත නැගිටීමෙන් පසු ප්‍රථම දර්ශනය වූයේ මග්දලාහි මරියාට විය. මෙම කථාව යොහන් 20:11-18 වාර්තා කර ඇත. ඉන්පසු මරියා ශුභාරංචිය බෙදාගත්තාය . . .

> **මග්දලායේ මරියා ඇවිත්, ඈ ස්වාමින්වහන්සේ දුටු බවද උන්වහන්සේ ඒ දේවල් ඈට කී බවද ගෝලයන්ට දැන්වූවාය. (යොහන් 20:18)**

## යේසුස්වහන්සේ වෙතට හැරුණ ප්‍රථම යුරෝපියයා වීම :

පාවුල් කරණකොටගෙන යේසුස්වහන්සේ වෙතට හැරුණ ප්‍රථම යුරෝපීය කාන්තාව ලිදියා නැමැත්තියක් වූවාය.

> **තියතිරා නුවර විසූ රත්නිල් පිළී විකුණන්නාවූ ලිදියා නම් දේවභක්ති ස්ත්‍රියෙක් අපේ වචන අසාගන සිටියාය. පාවුල් විසින් කියනලද කාරණා සලකන ලෙස ස්වාමින්වහන්සේ ඇගේ සිත විවරකළ සේක. (ක්‍රියා 16:14)**

## කාන්තාවන්ගේ බලවත් බලපෑම

දෙවියන්වහන්සේගේ සැලැස්මේ කාන්තාවන් භාවිත කරන ලද විශේෂ මාර්ගවලට අමතරව ඔවුන්ගේ බලවත් බලපෑම පිළිබඳව සහ බලය නිසි ආකාරයට භාවිත කිරීම පිළිබඳ ප්‍රවේශම්වීම ගැනත් හඳුනාගැනීමත් වැදගත් වේ. කාන්තාවකගේ ප්‍රථම ප්‍රධාන බලපෑම ඒව විසින් ආදම් පාපයට ඇදගැනීම වේ. ප්‍රථම පාපය, පුරුෂයා හා ස්ත්‍රිය අතර ඇති බලවත් බැඳීම යහපතට හෝ නපුරට භාවිත කළ හැකි බව විස්තර කරයි.

මේ හේතුව නිසා ඉශ්‍රායෙල් සෙනඟට අන්‍යජාතික භාර්යාවන් විවාහ කරගැනීම දෙවියන්වහන්සේ තහනම් කළ සේක. මෙම කාන්තාවන්ට තම ස්වාමිපුරුෂයන්ගේ සිත් දෙවියන්වහන්සේ වෙතින් හැරවීමට ඇති බලය ගැන අනතුරු හැඟවූ සේක.

> **ඉශ්‍රායෙල් රජවූ සාලමොන් මේ දේ කිරීමෙන් පව් කළා නොවේද? බොහෝ ජාතීන් අතරේ ඔහුට සමාන රජෙක් සිටියේ නැත. ඔහුගේ දෙවියන්වහන්සේද ඔහුට ප්‍රේමකොට මුළු ඉශ්‍රායෙල් කෙරෙහි ඔහු රජකළ සේක. එසේවී නමුත් ඔහු පවා අන්‍ය ජාති ස්ත්‍රීන් විසින් පව්කරන්ට සලස්වන ලද්දේය. (නෙහෙමියා 13:26)**

සලමොන්ගේ හිතෝපදේශ ඔබ අධ්‍යයනය කළ කල එහි “අමුතු” කාන්තාවන් පිළිබඳ සඳහන් කිරීම් බොහෝ ඔබට හමුවී ඇත. දේව අභක්තික කාන්තාවන්ගේ බලවත් බලපෑම, තමාට ඇති වුනාවූ ශෝකය තුළින් සලමොන් ඉගෙනගෙන තිබුණි. ඊට සමාන වූ තේමාවන් අනුගමනය කරමින් දේශනාකාරයා පොත තුළ මළපත් වැනි සිත් සහ බන්ධන වැනි අත් ඇති දේව අභක්තික කාන්තාවන් පිළිබඳව ඔහු සඳහන් කරයි.

> **එවිට මලපත් සහ දැල් වැනි සිතක්ද බැඳුම් වැනි අත්ද ඇති ස්ත්‍රිය මරණයට වඩා තික්ත බව දැනගතිමි. දෙවියන්වහන්සේ ඉදිරියෙහි යහපත්ව සිටින්නා ඇගෙන් ගැළවෙන්නේය. නුමුත් පව්කාරයා ඈට අසුවන්නේය. (දේශනාකාරයා 7:26)**

සලමොන් පිළිබඳව බයිබලය මෙම කරුණු හෙළිදරව් කරයි.

**ඔහුට කුමාරිකා භාර්යාවන් සත්සියයක්ද උපභාර්යාවන් තුන්සියයක්ද සිටියෝය. ඔහුගේ භාර්යාවෝ ඔහුගේ සිත හරවාගත්තෝය. එසේය, සලමොන් මහලුවූ කල ඔහුගේ භාර්යාවෝ ඔහුගේ සිත අන් දෙවිවරුන් වෙතට හැරෙවුවෝය. ඔහුගේ සිතද තමාගේ පියවූ දාවිත්ගේ සිතමෙන් තමාගේ දෙවිවූ ස්වාමින්වහන්සේ කෙරෙහි සම්පූර්ණව නොතිබුණේය. (1 රාජාවලිය 11:3-4)**

ඉශ්‍රායෙල් සෙනඟට මිදීම ගෙනදීමට දෙවියන්වහන්සේ විසින් තෝරාගනු ලැබූ මනුෂ්‍යයෙක් වූ සැම්සන් කාන්තාවක්ගේ බලවත් බලපෑමෙන් වෙනතකට හරවනු ලැබීය. විනිශ්චයකාරයා පොතේ 13-16 පරිච්ජේදවල සඳහන් සැම්සන් සහ දෙලිලා පිළිබඳ කතාන්තරය කියවන්න.

අභක්තික කාන්තාවන්ගේ නායකත්වය නිවැරදි මාර්ගයෙන් ඉශ්‍රායෙල් සෙනඟ ඉවතට හැරවීමට හේතුවූ බව යෙසායා වාර්තා කරයි.

**මාගේ සෙනඟගේ පීඩාකාරයෝ නම් දරුවෝය. ස්ත්‍රියෝ ඔවුන් කෙරෙහි ආණ්ඩුකරති. මාගේ සෙනඟෙනි, නුඹට මගපෙන්වන්නෝ නුඹ මුළාකර නුඹ යායුතු මාර්ගය නැතිකරදමති. (යෙසායා 3:12)**

භක්තිවන්ත සහ කුලවන්ත යුදෙව් කාන්තාවන් මුල් සභාවට විරුද්ධව බලවත් පීඩාවක් ගෙන ආ බව නව ගිවිසුමෙහි වාර්තා කර ඇත.

**නුමුත් යුදෙව්වරු භක්තිවන්ත කුල ස්ත්‍රීන්ද නුවර ප්‍රධානීන්ද පොලඹවා, පාවුල් සහ බාර්ණබස්ට විරුද්ධව පීඩාවක් උපදවා, තමුන්ගේ සීමාවලින් ඔවුන් පිටතට ලුහුවෝය. (ක්‍රියා 13:50)**

කාන්තාවන්ගේ බලවත්වූ බලපෑම වැරදි නොවේ. කාන්තාවන්ට බලයත් හැකියාවත් දුන්නේ දෙවියන්වහන්සේය. එය නපුරට භාවිත කළ කල්හි එය විනාශකාරී වේ. ශුද්ධාත්මයාණන් වහන්සේ විසින් භාවිත කරනු ලැබූ කල එය මුළු ජාතියක ඉරණම සහ මනුෂ්‍යයන්ගේ හදවත් වෙනස් කළ හැකි බලයක් විය හැකිය. දෙබොරා සහ එස්තර් වැනි කාන්තාවන් පිළිබඳ බයිබලීය වාර්තාව මෙය පැහැදිලි කරයි.

## කාන්තාවන්ට ඇති විශේෂිත අභියෝගයන්

කාන්තාවන්ගේ බලවත් බලපෑමට අදාළව, කාන්තාවන්ට ඇති විශේෂ අභියෝගයන් බයිබලයේ ඉදිරිපත් කර ඇත.

### භක්තියට අභියෝගයක් :

සැබවින්ම දෙවියන්වහන්සේට කැපවූ කාන්තාවන් සෙවීමේ සාලමොන්ගේ දේවානුභාව විමසීම තුළ ප්‍රථම අභියෝගය අපට හමුවේ. ඔහු මෙසේ ලියයි.

**මට සම්බ නුණාවූ, මාගේ සිත තවමත් සොයන්නාවූ, කාරණයක් මෙසේය. දහසක් අතරෙහි එක මිනිහෙක් මට සම්බවුණ නමුත් එපමණ දෙනෙක් අතරෙහි එක ස්ත්‍රියක් මට සම්බ නොවිය. (දේශනාකාරයා 7:28)**

දෙවියන්වහන්සේට හදවතින්ද ජීවිතයෙන්ද කැපවූ ස්ත්‍රියක් දහසක් කාන්තාවන් අතරින් සොයාගැනීම කෙබඳු අභියෝගයක්ද?

### ජීවිතයට මගපෙන්වීමක් තිබීමේ අභියෝගය :

කාන්තාවන් තම ජීවිතය පිළිබඳව මගපෙන්වීමක් සහිතව සිටීම දෙවියන්වහන්සේට අවශ්‍යය. එය දිව්‍යමය පරමාර්ථයක් ඇති ජීවිතයක් ජීවත්වීම උදෙසාය. බයිබලයේ ඇති අභියෝග මෙසේය:

**ස්වාමින්වහන්සේ වචනය දෙන සේක. ආරංචිය පතුරුවන ස්ත්‍රීහු මහත් සේනාවක්ය. (ගීතාවලිය 68:11)**

කාන්තාවන් විසින් තමන් හට සැලසුම් කරගන්නා බොහෝ පරමාර්ථයන් සදාකාලික නොවේ. ඔව්හු විවාහය, අධ්‍යාපනය සහ වෘත්තිය පිළිබඳ එල්ලයන් සාදාගනිති. මෙම එල්ලයන් සම්පූර්ණ කරගත් පසු ජිවිතයට පරමාර්ථයක් දීමට ඉතුරුවන්නේ මොනවාද?

දෙවියන්වහන්සේ, අරමුණක් සහිත ජිවිතයක් සඳහා කාන්තාවන්ට අභියෝග කරයි. ඔවුන් ගෘහණියන්, ශිෂ්‍යයන් හෝ වෘත්තිමය කාන්තාවන් විය හැකි නමුත් ඔවුන් ලෝකයා වෙත ශුභාරංචිය ගෙනයාමේ නියුක්ත විය යුතුය. ඔබ නගරයක ජීවත්වුවත්, ගමක ජිවත්වුවත්, ඈත පිටිසර ගෝත්‍රයක වාසය කළත් පොදු අරමුණක් ඇති ජාත්‍යන්තර ජාලයක කොටසක්වීමට ඔබට හැකියාව ඇත. එනම් යේසුස්වහන්සේ ගැන ශුභාරංචිය ප්‍රකාශ කිරීමයි.

## හික්මවීමට ඇති අභියෝගය :

දෙවියන්වහන්සේ යෙසායා කරණකොටගෙන කාන්තාවන්ට විශේෂ අභියෝගයක් ප්‍රකාශ කළ සේක.

> **එම්බා නොසැලකිලි ස්ත්‍රිවරුනි, නැගිටිල්ලා. මාගේ හඬ අසාපල්ලා. අප්‍රවේසම් දූවරුනි, මාගේ බසට ඇහුම්කන්දියල්ලා. (යෙසායා 32:9)**

යෙසායා 32:10-20 දක්වා ඇති දෙවියන්වහන්සේගේ සම්පූර්ණ පණිවුඩය කියවන්න. මෙම ජේදය ලියා ඇත්තේ යුදාහි පාපය නිසා ආක්‍රමණික හමුදාවක් විසින් යුදා අත්පත්කර ගැනීමට ආසන්න අවස්ථාවකය. එහෙත් එය තමුන්ගේ සිත්, ලෝකයත් එහි ආශාත් කෙරෙහි යොමු කර ඇති ඕනෑම කාන්තාවන්ට අදාළ වේ.

දෙවියන්වහන්සේ කථාකළේ ඔවුන්ට මුදල් සහ ප්‍රිතිය තිබීම නිසා නොසැලකිලිමත් පහසු ජිවිත ගතකළ කාන්තාවන්ටය. ඔව්හු දෙවියන්වහන්සේ වෙතින් ලෝක ආශාවලට සිත් හරවා ගත්හ. ඔවුන් ජිවත්වූ දේශය හා නගර විනාශකිරීමට ආසන්නව තිබෙන නමුත් මේ පැමිණෙන්ට තිබෙන විනාශය පිළිබඳව ඔව්හු නොදැනුවත්ව සිටියහ.

එම අභියෝගයම කාන්තාවන්ට දෙවියන්වහන්සේගෙන් අදත් ගලා එයි. බොහෝ දෙනෙක් තාවකාලික වූ ආශාවන් සම්පූර්ණ කරගනිමින් පහසු ජිවිත ගත කරති. තමා අවට සිටින සියලු ජනයා ක්‍රිස්තුස්වහන්සේ නොමැති සදාකාල විනිශ්චයකට මුහුණ දෙන බව ඔව්හු නොදැන සිටිති. දෙවියන්වහන්සේ නොමැති විප්ලවයන්ට තම ජාතින් අසුවෙමින් සිටිද්දී කිතුනු කාන්තාවන් පහසු ජිවිත ගත කරති. අදේවවාදීන් පාලනයේ ආධිපත්‍යය ලබා ගන්නා අතර කිතුනු කාන්තාවන් ලෝක ආශාවන් වින්දනය ලබමින් සිටිති. ඔවුන්ට දෙවියන්වහන්සේගේ පණිවුඩය නම් “නැගිටින්න” යන්නය.

දෙවියන්වහන්සේ යෙසායා අනාගතවක්තෘ කරණකොටගෙන ඔවුන්ගේ ඉඩම්, ගෙවල් සහ කෙත් විනාශ කරන බව කාන්තාවන්ට පැවසූ සේක. ලෝකාකාරවූ සියල්ලම තාවකාලිකය. ඔවුන් ඇලී සිටින ඒ සියලු දේ විනාශවන්නේය. විනිශ්චයෙන් බේරීමට ඔවුන්ට ඇති එකම මාර්ගය දෙවියන්වහන්සේගේ නාමයෙන් නැගී සිට තමා සිටින පහසුකම් ගසා දමා, දේව පණිවුඩය අසා එයට අනුකුලව ක්‍රියා කිරීමය. අවාසනාවකට මෙම පණිවුඩය පවසන ලද යුදා කාන්තාවන් අවනත නොවිය. විනිශ්චය පැමිණ දෙවියන්වහන්සේ අවවාද කළ ආකාරයට නගර විනාශ කරන ලදී.

එහෙත් බලාපොරොත්තුවේ පොරොන්දුවක් තිබුණි. එනම් විනිශ්චයෙන් පසු දෙවියන්වහන්සේගේ ආත්මය වගුරුවන බවය.

> **එසේවන්නේ උපස්ථානයෙන් ආත්මය අප කෙරෙහි වගුරුවන්ටත් කාන්තාරය උයනක් වෙන්ටත් උයන වනයක් කොට ගණන්ගනු ලබන්ටත් යෙදෙන තුරුය. එකල යුක්තිය කාන්තාරයෙහි වාසය කරන්නේය. ධර්මිෂ්ඨකම උයනෙහි පවතින්නේය. (යෙසායා 32:15-16)**

ශුද්ධාත්මයාණන්ගේ බලය කරණකොටගෙන පාළුකරන ලද දේශය කෙතරම් වර්ධනයක් ඇති වන්නේද යත් එය ඵලදායක කෙතක් බවටද ඉන්පසු වනාන්තරයක් බවටද පත්වන බව කීය. දෙවියන්වහන්සේ දඬුවම් කරන නමුත් තමන්වහන්සේ විනිශ්චය කළ දේ මත උන්වහන්සේගේ ආත්මය වැගිරීම පිණිස ආපසු එන සේක. පාළුකරන ලද දේශය තුළින් ඉතා මහත්වූ අස්වැන්නක් පැන නගින්නේය.

පහසුගෙන සිටින කාන්තාවන් මෙම හික්මවීමේ අභියෝගය ලැබ ස්වාමින්වහන්සේට සවන් දෙන්නේ නම් ඔවුන් මත දඬුවම නොපැමිණෙන්නේය. තමන් නියුක්තව සිටින ලෝකාකාර දේ දැන ඔබගේ ආත්මික ස්වභාවය හඳුනාගන්නේ නම් ඔබගේ පව් කියාදෙන්න. උන්වහන්සේ කමාව දෙනු ඇත.

පුද්ගලික අදාළත්වයෙන් ඔබ්බට පණිවුඩය ව්‍යාප්ත වේ. එනම් එම ආත්මික පිබිදීම මුළු ජාතිය මත පැමිණෙන්ට ඇති විනිශ්චයෙන් වළක්වනු ඇත. මෙම ආත්මික පිබිදීම ගෙන ඒම පිණිස දෙවියන්වහන්සේ පැවසුවේ යුදා කාන්තාවන්ටය. දෙවියන්වහන්සේ පැවසුවේ, කාන්තාවෙනි නුඹලා මාගේ අවවාදයට සවන් දෙන්නහු නම් නැගිට ක්‍රියාකාරී වන්න. ජාතිය මත පැමිණෙන විනිශ්චය වැළැක්වීමට ඔබට හැකිවනු ඇත".

කාන්තාවන්ට මෙම කැඳවීම අද ලෝකය පුරා ගමන් කරයි.
"පහසුගෙන සිටින කාන්තාවෙනි, නැගිටින්න, , මාගේ හඬට සවන්දෙන්න . . . මාගේ කථාවට කන් දෙන්න"

- ලෝකාකාර ආශාවන් අත්හැර දමන්න.
- ආත්මිකව ඔබ නවීකරණය වන්න
- ඔබවත් ඔබගේ ජාතිනුත් පුබුදුවාගන්න. එවිට දෙවියන්වහන්සේ විනිශ්චය ඔබ මත පතිත නොවනු ඇත.

## කැපවීමට අභියෝගය :

දේව භක්තික කාන්තාවන් ලෙස නැගිට අපගේ නියමිත ස්ථාන ගැනීම පිණිස කැපවීම අවශ්‍යය. කාන්තාවන් ඇතුළු සියලුම ඇදහිලිවතුන්ට පාවුල් අභියෝගයක් ඉදිරිපත් කරයි. එය කැපවීමට කැඳවීමකි.

> **එබැවින් සහෝදරයෙනි, නුඹලාගේ ශරීරයන් ජීවමානවූ, ශුද්ධවූ, දෙවියන්වහන්සේ විසින් පිළිගත හැකිවූ යාගයක් කොට ඔප්පුකරන හැටියට දෙවියන්වහන්සේගේ දයාවන් නිසා නුඹලාගෙන් ඉල්ලමි. එය නුඹලාගේ ආත්මික සේවය වේ. නුඹලා මේ ලෝකයේ ආකාරයට සමාන නොවී, දෙවියන්වහන්සේගේ කැමැත්ත එනම් යහපත්වූ පිළිගත යුතුවූ සම්පූර්ණ දෙය කුමක්ද කියා දැනගන්නා පිණිස, සිත අලුත් කරගැනීමෙන් අන්‍යාකාර ඇත්තෝ වෙයල්ලා. (රෝම 12:1-2)**

දෙවියන්වහන්සේට කැපවීම සහ දේව මාර්ගයට අවතීර්ණවීමේ හික්මවීමට පැමිණීම ඔබේ ජිවිතයේ දෙවියන්වහන්සේගේ පූර්ණ කැමැත්ත දැනගැනීමේ දිශාවට ඔබ යොමු කිරීමේ ප්‍රතිඵලය ඇති කරයි.

# ස්වයං පරීක්ෂණය

1. මෙම පරිච්ඡේදයේ සාකච්ඡා කරන ලද කාන්තාවන්ගේ විශේෂිතවූ විශිෂ්ටතාවයන් හතරක් ලියන්න.

   (1) ____________________

   (2) ____________________

   (3) ____________________

   (4) ____________________

2. ප්‍රධාන පදය කටපාඩමෙන් ලියන්න.

____________________

____________________

____________________

3. සෑම ප්‍රකාශනයක්ම කියවන්න. ප්‍රකාශනය සත්‍ය නම් ඉදිරියෙන් ඇති හිස්තැනෙහි “ස” අකුරත්, ප්‍රකාශනය වැරදි නම් හිස්තැනෙහි “අ” අකුරත් ලියන්න.

   අ. ............... තමාගේ සිත දෙවියන්වහන්සේ අනුව යාමෙන් ඉවතට හැරවූ බොහෝ භාර්යාවන් සලමොන්ට සිටියේය.

   ආ. ............. පාවුල් සහ බාර්ණබස් ඇතුළුව මුල් සභාවට කාන්තාවෝ පීඩා කළහ.

   ඇ. ............. කාන්තාවන් සතු බලවත් බලපෑම සාතන්ගෙනි.

   ඈ. .............. තමන්ගේ ජාතීන්ගේ ආත්මික තත්වය පිළිබඳව කළ හැකි කිසිවක් කිතුනු කාන්තාවන්ට නැත.

   ඉ. .............. ඔබට ජීවිතයට මගපෙන්වීමක් ලබාගැනීම පිණිස කැපවීම හා දෙවියන්වහන්සේගේ නික්මවීමට අත්‍යවශ්‍යයෙන් අවශ්‍ය නොවේ.

(මෙම පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ දක්වා ඇත.)

# වැඩිදුර අධ්‍යයනය සඳහා

කාන්තාවන් පිළිබඳ විෂයට අදාළ අමතර අධ්‍යයනය සඳහා බයිබල් අකාරාදියක් ඔබට උපකාරී වේ. බයිබලයේ භාවිත කර ඇති ප්‍රධාන පද සහ මෙම වචන භාවිත කර ඇති ස්ථාන පිළිබඳ සඳහන් කිරීම් අකාරාදියක සපයා තිබේ.

ඔබට අකාරාදියක් තිබේනම් පහත වචන තිබේදැයි බලන්න.

කාන්තාව
කාන්තාවන්
භාර්යාවන්
භාර්යාව
මව
විවාහක
විවාහය
විවාහවීම
වැන්දඹුව

මේ සෑම වචනයක් ගැනම විවිධ බයිබලීය සඳහන්කිරීම් ඔබට සොයාගත හැකිවේ. මෙම සටහන් කියවා බලමින් කාන්තාවන් පිළිබඳව බයිබලය උගන්වන දේ පිළිබඳව අධ්‍යයනය දිගටම කරන්න.

ඔබට අකාරාදියක් සොයාගැනිමට නොමැති නම් ඔබ බයිබලය කියවාගෙන යන අතර කාන්තාවන් පිළිබඳව සඳහන් කිරීම් යටින් ඉරිගසන්න. ක්‍රමානුකූලව කාන්තාවන් පිළිබඳ බයිබලීය සඳහන් කිරීම් සියල්ල ඔබට හමුවේ.

## දාහතරවන පරිච්ඡේදය

# කාන්තාවන්ට සේවය කිරීම

### අරමුණු :

මෙම පරිච්ඡේදය අවසන් කිරීමෙන් පසුව ඔබහට කළ හැකි කරුණු :

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීම
- කාන්තාවන් උදෙසා සේවයක් සංවිධානය කිරීම
- කාන්තාවන්ගේ අවශ්‍යතා හඳුනාගැනීම

### ප්‍රධාන පදය

> **එවිට ආරොන්ගේ සහෝදරීවූ මිරියාම් ප්‍රොපේත දූ තොමෝ රබානක් අතින් ගත්තිය. සියලු ස්ත්‍රීහු රබන්ද නැටුම්ද ඇතුව ඈ පස්සේ ගියෝය. මිරියාම් ඔවුන්ට උත්තරදෙමින් : ස්වාමීන්වහන්සේට ගායනා කරව්, මක්නිසාද උන්වහන්සේ තේජාන්විත ලෙස ජයගත් සේක. උන්වහන්සේ අශ්වයා සහ අසරුවා මුහුදට හෙළූසේකැයි කීවාය. (නික්මයාම 15:20-21)**

### හැඳින්වීම

සැම හාවස්ට්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ අධ්‍යයන අත්පොතකම කරුණු, කණ්ඩායමක භාවිත කිරීම පිළිබඳව මගපෙන්වීම් සපයා දී තිබේ. මෙම පොතේ මුලට පෙරලා මේ උපදේශයන් සොයාගන්න. ඔබ ඉගෙනගත් දේ අනික් අයට සන්නිවේදනය කිරීමට මෙම මගපෙන්වීම් උපකාරී වේ.

ඔබ මෙම පාඨමාලාව අධ්‍යයනය කළ පසු කාන්තාවන් සඳහා සේවයකට විශේෂ කැඳවීමක් ඔබට ඇති බව හැගෙන්නට ඇත. මෙම පරිච්ඡේදය තුළ කාන්තාවන් උදෙසා සේවයක් ආරම්භ කිරීමට අදාළ මගපෙන්වීම් ඇතුලත් වේ. එයට ඔබගේ කණ්ඩායම සංවිධානය කිරීම ප්‍රචාරණය කිරීම පිළිබඳ යෝජනා ද කාන්තාවන්ගේ විශේෂ ආත්මික අවශ්‍යතාවයන් හඳුනාගැනීමට උපදේශයන් ද ඇතුළත් වේ.

### කාන්තා සේවයක් ශුද්ධ ලියවිල්ලට අනුකූලද?

ප්‍රථම කාන්තා කණ්ඩායම මෝසෙස්ගේ සොහොයුරිය වූ මිරියම් සංවිධානය කළාය. එය මෙසේ වාර්තා කරයි.

> **එවිට ආරොන්ගේ සහෝදරීවූ මිරියාම් ප්‍රොපේත දූ තොමෝ රබානක් අතින් ගත්තිය. සියලු ස්ත්‍රීහු රබන්ද නැටුම්ද ඇතුව ඈ පස්සේ ගියෝය. මිරියාම් ඔවුන්ට උත්තරදෙමින් : ස්වාමීන්වහන්සේට ගායනා කරව්, මක්නිසාද උන්වහන්සේ තේජාන්විත ලෙස ජයගත් සේක. උන්වහන්සේ අශ්වයා සහ අසරුවා මුහුදට හෙළූසේකැයි කීවාය. (නික්මයාම 15:20-21) (නික්මයාම 15:20-21)**

මිරියම් දෙවියන්වහන්සේට ප්‍රශංසා කිරීමේ හා මහිමයට පත්කිරීමේ පරමාර්ථය උදෙසා කාන්තාවන් සංවිධානය කළාය.

නව ගිවිසුමෙහි ක්‍රියා 9:36-41 දක්වා දොර්කස්ට වැන්දඹු කාන්තාවන් උදෙසා සේවයක් තිබුණ බව වාර්තා කරයි. පාවුල් විසින් ලාබාල කාන්තාවන්ට ඉගැන්වීමට වැඩිහිටි කාන්තාවන්ට උපදෙස් දෙන ලදී (තීතස් 2:3-4). මෙම නිදසුන්වලින් කාන්තාවන් උදෙසා සේවය දේව වචනයට අනුකූලබව පෙනේ.

## කාන්තාවන් උදෙසා සේවයක් අවශ්‍ය ඇයි?

කාන්තාවන් උදෙසා සේවයක ඇති වැදගත්කම පිළිබඳ හේතු කිහිපයක් මෙහි දැක්වේ.

### කාන්තාවන්ට ශුභාරංචිය අවශ්‍යය :

මේ කාලයේ ලෝක ජනගහනයෙන් අඩක් කාන්තාවන්ය. යේසුස්වහන්සේ කරණකොටගෙන ඇති ගැළවීම පිළිබඳ ශුභාරංචිය ඔවුන් ඇසීම අවශ්‍යය.

### කාන්තාවන්ට විශේෂිතවූ ගැටලු ඇත :

සෑම ජාතියකටම අයත් කාන්තාවන්ට ආත්මික, ශාරීරික සහ හැඟීම්මය අවශ්‍යතා තිබේ. පුරුෂයන්ට බොහෝසෙයින් වෙනස්වූ ගැටලු, අභියෝගයන් සහ අවශ්‍යතාවයන් ඔවුන්ට තිබේ. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ තම ගැටලුවලට විසඳුම් ඇති බව කාන්තාවන් දැනගත යුතුය.

### කාන්තාවන් ආත්මිකව වර්ධනය විය යුතුය :

කාන්තාවන් විසින් දේව භක්තිය, කැපවීම, හික්මවීම සහ පිවිතයට මගපෙන්වීම වර්ධනය කරගත යුතුය.

### කාන්තාවන්ට දේව සැලැස්මේ විශේෂ ස්ථානයන් තිබේ :

ක්‍රිස්තු ශරීරය තුළ තමන්ට ඇති හැකියාව, පරමාර්ථය හා සේවයේ ස්ථානය පිළිබඳව ඔවුන් තේරුම් ගත යුතුය.

## කාන්තාවන් උදෙසා සේවයක් ආරම්භ වන්නේ කෙසේද?

කාන්තාවන් උදෙසා සේවයක් ආරම්භ කිරීමේදී ඔබට උපකාරී විය හැකි පියවර හතක් මෙසේය :

### ප්‍රථම පියවර :

ඔබේ පළාතේ කාන්තාවන් සඳහා සහ ඔවුන් සඳහා දෙවියන්වහන්සේගේ මගපෙන්වීම ඉල්ලා යාච්ඤා කරන්න.

### දෙවන පියවර :

සේවය සංවිධානය කරගැනීම පිණිස කුඩා කිතුනු කණ්ඩායමක් කැඳවාගන්න. සමාන ආත්මික දර්ශනයක් සහ පරමාර්ථයක් උදෙසා දෙවියන්වහන්සේ විසින් තම හදවත් ස්පර්ශ කළ අය සොයාගන්න. ඔබගේ ප්‍රජාව තුළ සිටින කාන්තාවන් ගැන සාමූහිකව යාච්ඤා කරන්න.

### තෙවන පියවර :

මෙම යාච්ඤා කාලයන් තුළදී ඔබගේ කාන්තා සේවයේ පරමාර්ථයන් හඳුනාගැනීමට ඔබට උපකාර කරන ලෙස ස්වාමින්වහන්සේගෙන් ඉල්ලන්න. ඔබගේ "පරමාර්ථය පිළිබඳ ප්‍රකාශනය" මෙම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතුය. "අප ජීවත්වන්නේ ඇයි?" අප තුළින් දෙවියන්වහන්සේට සම්පූර්ණ කරවා ගැනීමට අවශ්‍ය මොනවාද?

මෙම පරමාර්ථය තිරණය කර ගැනීම වැදගත්වන්නේ බයිබලය මෙසේ පවසා ඇති හෙයින්ය. "දර්ශනයක් නැති කල සෙනඟ විනාශ වන්නෝය". පුද්ගලයන් වශයෙන් එකිනෙකාට ජීවත්වීමේ පරමාර්ථයක් තිබිය යුතුවා සේම, කණ්ඩායමකටත් තමන් පැවතීමේ පරමාර්ථයක් තිබිය යුතුය.

කාන්තා සේවාවක් ස්ථාපනය කිරීමේ විවිධ වෙනස්වූ පරමාර්ථයන් තිබිය හැකිය. පහත දැක්වෙන පරමාර්ථයන්ගෙන් එකක් හෝ කිහිපයක් කණ්ඩායමකට තිබිය හැකිය.

**යාච්ඤාව :** ඔබට ඔබගේ ප්‍රජාවට, ඔබගේ ජාතියට, ඔබගේ නායකයන්ට සහ ලෝකයා උදෙසා යාච්ඤා කිරීමට එක්විය හැකිය. යාච්ඤාව කරණකොටගෙන ඔබට ලෝකයේ සෑම ප්‍රදේශයක් හරහා සාර්ථක ලෙස විනිවිද ගමන් කරමින් ශුභාරංචි සේවයේ පෙරමුණේ ගමන්කරන අයගේ අභ්‍යන්තරය ශක්තිමත් කරන බලවේගය බවට පත්වීමට හැකිවේ.

**බයිබල් අධ්‍යයනය :** ඔබගේ කණ්ඩායමේ පරමාර්ථය බයිබල් අධ්‍යයනය තුළින් කාන්තාවන් ආත්මිකව පරිණතභාවයට ගෙන එමෙන් ඔවුන් නායකත්වය කරා ගෙන යෑම විය හැකිය.

**ශුභාරංචි සේවය :** ඔබගේ පරමාර්ථය විවිධාකාර ශුභාරංචි ප්‍රචාරක වැඩ තුළින් ඔබගේ ප්‍රජාව, ඔබගේ නගරය හෝ ග්‍රාමය වෙත ශුභාරංචිය ගෙනයාම විය හැකිය.

**තරුණ කාන්තාවන්ට සේවය කිරීම :** ඔබට, බයිබලිය මූලධර්මයක්වූ වැඩිහිටි කිතුනු කාන්තාවන් විසින් තරුණ කිතුනුවන්ට ඉගැන්වීම විය හැකිය. එසේනම් ඔබගේ පරමාර්ථය පිළිබඳ ප්‍රකාශනය දැනටම තිතස් 2:3-4 පදවල ලියා ඇත.

**විශේෂ කණ්ඩායම් සේවාව :** ඔබට විශේෂ කාන්තා කණ්ඩායම්වලට සේවය කිරීමට හැකිය. අවිවාහක මව්වරුන්, මත්ද්‍රව්‍යවලට යොමුවූ කාන්තාවන්, මත්පැන්වලට යොමුවූ කාන්තාවන්, සිරගෙවල සිටින කාන්තාවන්, ළමුන්, බාලාපරාධකරුවන්, ඔබ නගරයේ සරසවි විද්‍යාලවල කාන්තාවන් හෝ විශ්‍රාම නිවෙස්වල සහ ආරෝග්‍යශාලාවල සිටින කාන්තාවන්, ඇතැම් භූගෝලීය ප්‍රදේශවල හෝ ආර්ථිකව හීනතාවය ඇති ප්‍රදේශ වැනි පීඩනයට පත්වූවන් ඇති ප්‍රදේශවල සේවය කිරීමට කැඳවීමක් ඔබට ඇතැයි සිතෙන්ට පුළුවන.

විශේෂිත කණ්ඩායම් සේවය තුළ කාන්තා කණ්ඩායමකට අසීමිත සේවය කිරීමේ හැකියාවන් උදාවනු ඇත. ඔබගේ ප්‍රදේශය විශ්ලේෂණය කරන්න. ආත්මික අවශ්‍යතාවයන් ඇති කුමන කණ්ඩායම් වෙත ළඟාවී නැද්ද? ඔබට ඇති විශේෂිත අභියෝගය මෙය වීමට පුළුවන.

**සභාවේ අතිරේක කණ්ඩායමක් ලෙස :** ඔබ සභාවේ අතිරේක කණ්ඩායමක් ලෙස සේවය කිරීමට කාන්තාවන් ඔබට සංවිධානය කළ හැකිවේ. සභාවේ විවිධවූ වැඩසටහන්වලට උපකාර කිරීම ඔබගේ පරමාර්ථය විය හැකිය.

**ධර්මදූත ව්‍යාපාරයේ සහයක කණ්ඩායමක් ලෙස :** මෙම කණ්ඩායමේ පරමාර්ථය මිෂනාරි සේවය සඳහා යාච්ඤාවෙන්, මූල්‍යමය වශයෙන් හා ද්‍රව්‍යමය වශයෙන් උපකාර කිරීම විය හැකිය.

**ලෝකයේ කිතුනුවන් :** මෙම කණ්ඩායමේ පරමාර්ථය යේසුස්වහන්සේගේ ශුභාරංචිය පොළොවේ සීමාන්ත දක්වා ගෙනයාමේ මෙහෙයට අවධානය යොමුකිරීමෙන්, යාච්ඤාවෙන් හා ක්‍රියාකාරීත්වයෙන් උපකාර කිරීමය.

## සිව්වන පියවර :

ප්‍රථම රැස්වීමේ දිනය, වේලාව හා ස්ථානය නියම කරගන්න.

## පස්වන පියවර :

දිනය, වේලාව, ඔබගේ රැස්වීම්වල පරමාර්ථයන් ගැන ඔබගේ ප්‍රජාව තුළ සිටින කාන්තාවන් දැනුවත් කිරීම පිණිස ඔබගේ කාන්තා කණ්ඩායම පිළිබඳ දැන්වීමක් පල කරන්න. ගමක් තුළ කට වචනයෙන් කෙරෙන ප්‍රචාරණයක් ලෙස හෝ නගරයක් තුළ කෙරෙන සංකීර්ණ දැන්වීම් ප්‍රචාරක ක්‍රමයකින් හෝ ඔබගේ පණිවුඩය හරියාකාරව ප්‍රචාරයවීමට සලස්වන්න. නව ගිවිසුමේ ආඥා කරන ආකාරයට “මහාමාර්ගවලද අතුරු මාර්ගවලද හැම කෙනෙකුගේ පැමිණීම අනිවාර්ය කරන්න”,

ඔබගේ කණ්ඩායම ප්‍රචාරණය කිරීම පිළිබඳ යෝජනා කීපයක් පහත දැක්වේ. ඔබ භාවිත කරනු ලබන අදහස් ඔබගේ භූගෝලීය පිහිටීම නිසා ප්‍රචාරය සඳහා ඇති මුදල් මත රඳා පවතී.

1. සභාවේ දැන්වීම් පුවරුවේ සහ වැඩිහිටි සබත් පාසල් පංති කාමරයේ දැන්වීම් පලකිරීමට ඔබේ පාලකවරයාගේ අනුමැතිය ලබාගන්න.

2. සෑම රැස්වීමකටම කලින් එන ඉරුදින දැන්වීම්වලදී මේ ගැන දැන්වීමට පාලකවරයාට දන්වන්න.

3. ඔබගේ සභාවේ මුද්‍රිත සඟරාවන් මුද්‍රණය කරනවා නම් එහි දැන්වීමක් ලෙස මුද්‍රණය කර පලකිරීමට පාලකවරයාට දැනුම් දෙන්න.

4. ඔබගේ කිතුනු පොත්හලෙහි දැන්වීම් කොළ තබන්න. එක් දැන්වීමක් දැන්වීම් පුවරුවේ පලකර දැන්වීම් මිටියක් ඉදිරියේ තබන ලෙස අයිතිකරුට දන්වන්න.

5. ඔබගේ නගරයේ ආර්ථික විමසුම් මධ්‍යස්ථානයක් තිබේ නම් මුද්‍රිත දැන්වීමක් (ඔබ විසින් සපයනු ලබන) ජන සමාජය ගැන විස්තර දැනගැනීම එහි පැමිණෙන නව පදිංචිකරුවන්ට දීම පිණිස එහි තබන්න.

6. ඔබගේ අසල්වැසියෝ, සභාවේ, කාන්තා සංවිධානවල සහ ඔබගේ රැකියා ස්ථානයේ කාන්තාවන්ට දැන්වීම් පත්‍රිකා දෙන්න.

7. රෙදි පිරිසිදුකරන ස්ථාන, වෙළඳම්පල සහ විලාසිතා සාප්පු වැනි කාන්තාවන් විශේෂයෙන් ගැවසෙන ස්ථානවලට දැන්වීම් පත්‍රිකා සපයන්න. (සාප්පුවේ පරිපාලනයෙන් අවසර ලබාගැනීමට නිසැකව ක්‍රියා කරන්න).

8. ප්‍රදේශීය දැන්වීම් සඳහා පොදු පුස්තකාලයේ ස්ථානයක් තිබෙන්ට පුළුවන. එසේ ඇත්නම් එයට සපයන්න.

9. කැඳවීම් ලිපියක් මේ අයට යවන්න.

- පාලකවරුන්ගේ භාර්යාවන්ට
- ප්‍රදේශික කාන්තාවන්ගෙන් ලබාගන්නා ලයිස්තුවකට
- ලෞකික කාන්තා කණ්ඩායම්වල නායකයන්ට
- ප්‍රාදේශික සභාවන් හා නිකායයන්ගෙන් ලබාගන්නා කාන්තා නම් ලයිස්තුවකට

10. ඔබගේ ප්‍රදේශයේ මෙම පහසුකම් තිබේනම් ගුවන් විදුලියේ රූපවාහිනියේ හා ප්‍රවෘත්ති පත්‍රයේ ඔබගේ රැස්වීම ප්‍රචාරය කරන්න.

## හයවන පියවර :

නව කණ්ඩායමක් ලෙස රැස්වීම ආරම්භ කිරීමට දැන් ඔබ සූදානම්ය. ඒ සඳහා යම් යෝජනා කිහිපයක් මෙහි දැක්වේ.

## ප්‍රථම රැස්වීම :

1. පැමිණි සෑම කෙනෙකුගේ නම් සහ ලිපිනයන් ලබාගන්න. අනාගත රැස්වීම් සඳහා මෙම කාන්තාවන් සම්බන්ධ කර ගැනීම එයින් හැකිවනු ඇත.

2. රැස්වීමට කලින් ඔබ කණ්ඩායමේ නම සහ පරමාර්ථය ආදී විස්තර පත්‍රිකාවන් සකස් කරන්න. ප්‍රථම රැස්වීමේදී එය බෙදාහැර ඒ ගැන විස්තරයක් කරන්න.

3. ඔබේ කණ්ඩායම සඳහා සැලසුම් සාකච්ජා කරන්න. නිදසුනක් ලෙස, සේවය සඳහා ඇති අවස්ථාවන්, සහභාගිකම්, පුහුණුවීම් ආදී දේ. සහභාගිවීමේ පුද්ගලික ආත්මික ප්‍රතිලාභයන් සහ ප්‍රාදේශීය සැලසුම තුළ ඔවුන්ට ඇති අභියෝගය කාන්තාවන් හඳුනාගත යුතුය.

4. පැමිණ සිටින අයගේ අවශ්‍යතා පිළිබඳව යාච්ඤා කිරීමට, දේව වචනයෙන් ඔවුන්ට මෙහෙකිරීමට සහ ප්‍රශංසාවට හා නමස්කාරයට අවස්ථා සලසා දෙන්න. මෙම ප්‍රථම රැස්වීමේ සේවා කොටස ඉතාම වැදගත් වේ. කාන්තාවන්ට තමන්ගේ ආත්මික අවශ්‍යතා සම්පූර්ණවීම සහ දේවවචනය පිළිබඳව වඩා දැනුමක් ලැබීම ඉදිරි රැස්වීම්වලට නැවත පැමිණීමට හේතුවනු ඇත.

5. පැමිණ සිටින අයට පත්‍රිකා හෝ පෝස්ටර් සැපයීම සහ අනික් කාන්තා කණ්ඩායම්වලට ඔබේ කණ්ඩායම ගැන පැවසීමට උපදෙස් සැපයීමක් කරන්න. අන් අයට රැස්වීමට පැමිණීමට උනන්දුකිරීම පිණිස මෙම විස්තර පත්‍රිකා උපයෝගි කර ගන්න.

**පසුව පවත්වන රැස්වීම් :**

අනාගත රැස්වීම් පිළිබඳව යෝජනා කිපයක් පහත දැක්වේ.

1. සැමවිටම අමුත්තන් සාදරයෙන් පිළිගන්න, එමෙන්ම ලියා පදිංචි කරගන්න. කණ්ඩායමේ පරමාර්ථය හා නම සඳහන් පිටපත් ඔවුන්ට සපයන්න.

2. පුද්ගලික අවශ්‍යතාවලට යාච්ඤා කිරීමට, දේව වචනයේ මෙහෙයට සහ ස්තුති ප්‍රශංසා හා නමස්කාරයට අවස්ථාව සපයා දෙන්න.

3. "කාන්තාව පිළිබඳ බයිබලිය දැක්ම" යන මෙම පාඨමාලාව අධ්‍යයනය කිරීම ආරම්භ කිරිමට ඔබට අවශ්‍යවන්ට පුළුවන. එමෙන්ම හාවස්ට්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ වෙනත් පාඨමාලාවන් භාවිත කිරීමට ද ඔබට අවශ්‍ය විය හැකිය.

## හත්වන පියවර :

ඊළඟ රැස්වීමට කලින් ප්‍රථම රැස්වීමට සහභාගිවූ සැම කාන්තාවක්ම කාඩ්පතක් මගින්, දුරකථන පණිවුඩයක් මගින් හෝ බැහැදැකීමෙන් සම්බන්ධ වන්න. ඉදිරි රැස්වීම්වලට පැමිණෙන සැම ආගන්තුකයන් සඳහා මෙම ක්‍රමය අනුගමනය කරන්න. ආපසු පැමිණීමට ඔවුන් උනන්දුකර ඔබ කණ්ඩායමේ නිතර සහභාගිත්වයට ඇතුළත් කරගන්න.

## කණ්ඩායමේ විශ්ලේෂණය

මෙම ප්‍රශ්න පිළිබඳව සලකා බලන්න. ඔබේ කණ්ඩායමේ සිටින කාන්තාවන් කුමන වර්ගයට අයත්වේද? ඔවුන්ගේ විශේෂිත අවශ්‍යතාවයන් මොනවාද? ඔවුන්ට ඵලදායක සේවයක් කිරිම පිණිස මේ කරුණු ඔබ දැනගැනිම අවශ්‍ය වේ.

**විවාහක තත්වය :** ඔබගේ කණ්ඩායමේ කාන්තාවන්ගේ විවාහක/පවුල්වල තත්වය කුමක්ද? එකිනෙකාගේ අවශ්‍යතා වෙනස්වන බැවින් මෙය වැදගත් වේ. නිදසුනක් ලෙස තනිව සිටින කාන්තාවක් තනිකම අත්දකිනු ඇත. එමෙන්ම දරුවන් සහිත විවාහක කාන්තාවකට තනිව සිටීමේ කාලය අඩුවන්ට පුළුවන. දික්කසාද වී හෝ වැන්දඹු කාන්තාවක් ලෙස දරුවන් තනිවම හදාගන්නා කෙනෙකුට විශේෂිත අවශ්‍යතා තිබේ. මෙහි පහත දැක්වෙන ආකාරයේ විවිධ විවාහක සහ පවුල් අවශ්‍යතාවයන් ඇති කාන්තාවන් ඔබ කණ්ඩායමේ සිටිය හැකිය.

- අවිවාහක
- දරුවන් නොමැති විවාහක
- දරුවන් ඇති විවාහක
- දරුවන් ඇති වැන්දඹු
- දරුවන් නැති වැන්දඹු
- තනිවම දරුවන් හදාගන්නා දික්කසාද වූ හා නැවත විවාහ නොවූ
- දික්කසාදව හා නැවත විවාහ නොවූ, දරුවන් නොමැති
- දික්කසාදව නැවත විවාහවී දරුවන් නොමැතිව
- දික්කසාදව නැවත විවාහවී දරුවන් ඇතිව

**වෘත්තින් :** වෙනස් වෘත්තින් ඇති කාන්තාවන්ගේ අවශ්‍යතාවන් වෙනස්ය. ඔබ කණ්ඩායම නියෝජනය කරන වෙනස් වෘත්තින්ට අයත් කාන්තාවන් පහත දැක්වෙන වර්ගවලට අයත්වීමට හැකිය. විවිධ වෘත්තින් එකිනෙක හා සම්බන්ධවන අවස්ථාද ඔබට හඳුනාගත හැකිය.

නිදසුනක් ලෙස ගෘහණියක් තමාගේ නිවසින් බැහැරව ද වැඩකරනු ඇත.

- පාසලක ශිෂ්‍යයෙක්

- සේවයේ නියුක්ත කාන්තාවන්
- ව්‍යාපාර/වෘත්තිමය වැඩවල නියුක්ත අය
- විශ්‍රාමික කාන්තාවන්
- ගෘහණියන්
- කම්කරුවන්

**පදිංචිය :**
ඔබේ කාන්තාවන් ජීවත්වන්නේ කොහේද? ඔවුන්ගේ පරිසරය විශේෂිත අවශ්‍යතා සහ අභියෝගයන් ඇති කරයි.

- නගරවල
- ගම්වල
- දුෂ්කර ප්‍රදේශයන්
- සංස්කෘතිකව හෝ මූල්‍යමය ලෙස ඌනතා ඇති ප්‍රදේශ
- සශ්‍රික ප්‍රදේශයන්
- මධ්‍යම පාංතික ප්‍රදේශයන්

**සබඳතාවයන් :**
කාන්තාවන් බොහෝ පුද්ගලික සබඳතා ඇතිකර ගනිති. ඇතැම්විට ඔවුන් මේ අය සමග සබඳතා ගැටලු අත්දකිති.

- පවුල/ස්වාමිපුරුෂයා/දරුවන්
- ව්‍යාපාර සගයන්
- සභාවේ/සේවයේ සම්බන්ධ අය
- මිත්‍රයන්
- අසල්වැසියන්

**අධ්‍යාපනය :**
ඔබගේ කණ්ඩායමේ අධ්‍යාපනික තත්වය විශ්ලේෂණය කරන්න. සුදුසු පුහුණු විෂය කරුණු ඉදිරිපත් කිරීමේදී මෙය වැදගත් වේ. ඔවුන්ගේ අධ්‍යාපනික මට්ටම මෙසේ විය හැකිය.

- නූගත් (අධ්‍යාපනය නොලැබූ)
- ප්‍රාථමික
- ද්විතියික
- විද්‍යාල
- පශ්චාත් උපාධි

**අවශ්‍යතාවයන් :** කාන්තාවන්ගේ අවශ්‍යතාවන් ආත්මික, භෞතික, හැඟිම්මය හෝ ද්‍රව්‍යමය විය හැකිය. ඊට අමතරව ඔවුන් විශේෂිත ගැටලු සමග පොරබදමින් සිටිනවා විය හැකිය. නිදසුනක් ලෙස මත්පැන්වලට හෝ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීම වැනි කාන්තාවන්ගේ අවශ්‍යතාවයන් හඳුනාගැනීම පිණිස පහත ඇති දේ උපකාරී වනු ඇත.

ආත්මික අවශ්‍යතාවයන් :

- ගැළවීම.
- පවිත්‍ර කරනු ලැබීම/ ශුද්ධබව
- වතුර බව්තිස්මය
- ශුද්ධාත්ම බව්තිස්මය
- සුවකිරීම හා නිදහස් කිරීම
- ශුද්ධාත්ම දීමනා, ආත්මයාණන්ගේ ඵල, දේව කැමැත්ත දැනගැනීම, ජීවිත අර්බුද සමග ගනුදෙනු කිරීම සහ පරීක්ෂාවන් සමග ගනුදෙනු කිරීම ඇතුළුව ආත්මික පරිණතබව.

**හැඟිම්මය අවශ්‍යතාවන් :**

- බිය
- තනිකම
- අධෛර්යට පත්වීම
- තිත්තකම
- සමාව නොදීම
- පුද්ගල සංකල්පය
- කෝපය
- වෛරය.
- දෝෂාරෝපණය
- ඊර්ෂ්‍යාව

**මූල්‍යමය අවශ්‍යතාවන් :**

- මූලික අවශ්‍යතාවන් සපුරාගැනීමට මුදල් නැතිකම
- රැකියා අවශ්‍යතාවන්

**ශාරීරික අවශ්‍යතාවන්**

- රෝගීබව
- ශරීර තරබාරු බව පිළිබඳ ප්‍රශ්න
- පෙනුම පිළිබඳ ප්‍රශ්න

**විශේෂ අවශ්‍යතාවන් :** ඔබගේ කණ්ඩායමේ විශේෂිත ගැටලුවලට පහත සඳහන් දෑ ඇතුලත් වේ.

- දික්කසාදය
- සියදිවි නසාගැනීමට ඇති ප්‍රවණතාවයන්
- සදාචාරය.
- ගබ්සාකිරීම
- මත්ද්‍රව්‍ය
- සිගරැට්
- මත්පැන්
- ව්‍යාජ ධර්ම
- පූර්ව විනිශ්චය
- යක්ෂාත්ම බලපෑම/ආවේශය
- මරණය සමග ක්‍රියාකිරීම

සේවයට සහ සමාජිකයන්ගේ අවශ්‍යතාවන්ට උපදේශනය සාර්ථක කාන්තා සේවයක අන්තර්ගත වේ. ශුද්ධාත්මයාණන්ගේ ආලේපය කරණකොටගෙන ඔබගේ කාන්තාවන්ගේ අවශ්‍යතාවන් හඳුනාගන්න. එම අවශ්‍යතාවන් පූර්ණකිරීමට ප්‍රේමයෙන් සහ අනුකම්පාවෙන් ළඟාවන්න.

# ස්වයං පරීක්ෂණය

1. බයිබලයේ වාර්තා කර ඇති ප්‍රථම කාන්තා කණ්ඩායම සංවිධානය කළේ කවුද?

________________________________________

2. පරමාර්ථය පිළිබඳව ප්‍රකාශනයක් වැදගත්වන්නේ ඇයි?

________________________________________

3. කාන්තාවන් සඳහා සේවයක් ආරම්භ කිරීමේ පියවර හත සඳහන් කරන්න.

(1) ____________________________________

(2) ____________________________________

(3) ____________________________________

(4) ____________________________________

(5) ____________________________________

(6) ____________________________________

(7) ____________________________________

4. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

________________________________________

________________________________________

________________________________________

(මෙම පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ දක්වා ඇත.)

## වැඩිදුර අධ්‍යයනය සඳහා

ඔබට කාන්තාවන් සඳහා සේවාවක් සංවිධානය කිරීමට ආශාවක් තිබේනම් "නයෝමි ජාලයේ" ශාඛාවක් ආරම්භ කිරීම ඔබට කළ හැකිය. "නයෝමි ජාලය" හාවස්ට්ටයිම් ජාත්‍යන්තර ජාලයේ කාන්තා සහයක සේවාවකි. ප්‍රදේශිය ශාඛාවක් ආරම්භ කිරීම පිණිස පහත දැක්වෙන මගපෙන්වීම් භාවිත කළ හැකිය.

### අපගේ නාමය

මෙම ජාත්‍යන්තර, අන්තර් නිකායික සංවිධානයේ "නයෝමි ජාලය" යන නාමය එහි පරමාර්ථය පිළිබිඹු කරයි.

**නයෝමි . . .**

ශුද්ධ බයිබලයේ රූත් පොතේ එන ප්‍රධාන චරිතයන් ඇසුරින් "නයෝමි" නාමය ලබාගෙන තිබේ. මේ නාමයෙන් "ප්‍රසන්න" යන අර්ථය ගම්‍ය වුවත් නයෝමිගේ ජීවිතය නිතරම ප්‍රසන්න නොවීය.

දරුණු සාගත කාලයක් තුළ නයෝමි, ඇගේ ස්වාමිපුරුෂයා හා පුත්‍රයන් දෙදෙනා සමග තම ඉශ්‍රායෙලයේ පවුලේ නිවසින් මෝවබ් නම් නපුරු රටකට ගියාය. මේ පුත්‍රයන් දෙදෙනාම පාපකාරී පවුල්වලින් භාර්යාවන් පාවා ගත්තෝය. කල්ගතවීමේදී නයෝමිගේ පුත්‍රයන් දෙදෙනාත් ස්වාමිපුරුෂයාත් මරණයට පත්විය. ඕර්පා නම්වූ එක් ලේලියක් ඇයගේ දේව අභක්තික නෑදැයින් වෙතට හැරී ගියාය. සිත් බිඳුණ, තිත්තකමට පත්වූ නයෝමි ඇයට තවදුරටත් "නයෝමි" යනුවෙන් ආමන්ත්‍රණය නොකරන ලෙසත්, "මාරා" යන නමින් ආමන්ත්‍රණය කරන ලෙසත් පැවසුවාය. ඇයගේ තික්ත ජීවන තත්වය නිසා ඇයගේ ජීවිතයට අර්ථයක්, පරමාර්ථයක් සහ ඉදිරි අනාගතයක් ගැන බලාපොරොත්තුවක් නැතිවිය.

එහෙත් දෙවියන්වහන්සේ භාස්කම් තුළින් නයෝමිගේ ජීවිතය වෙනස් කළ සේක. උන්වහන්සේ ඇයව තම මව්රටට ආපසු ගෙනැවිත් ඇයට නැතිව ගිය සියල්ල ආපසු ලබාදුන් සේක. කල්යාමේදී තමාගේ ලේලිය වූ රූත්ට දෙවියන්වහන්සේගේ දිව්‍යමය සැලැස්මට මගපෙන්වීමට නයෝමිට හැකි විය.

ලෝකයේ සෑමතැනකම දෙවියන්වහන්සේ විසින් තම ජීවිත වෙනස් කළ යුතු කාන්තාවන් සිටී. ඔව්හු තමන්ගේ ජීවිතයට පරමාර්ථයක් සහ ගමන්කිරීමට දිශාවක් නොමැතිව තනිවී, අධෛර්යයට පත්ව වේදනාවටත් තිත්තකමටත් පත්ව සිටිති. ඔවුන්ට අවශ්‍යවන්නේ කාන්තා සහභාගිත්වයක් හෝ බයිබල් අධ්‍යයන කණ්ඩායමකට වඩා වැඩිවූ දෙයකි. දේව වචනයේ උගන්වා ඇති මූලධර්මයන් ජීවිතයට අදාළ කරගැනීම තුළින් දේව සැලැස්මේ තම ජීවිතය සඳහා ඇති විශේෂිත පරමාර්ථය සොයාගැනීම පිණිස උපකාර කළ හැකි කණ්ඩායමක් ඔවුන්ට අවශ්‍ය වේ. තමාගේ ජීවිතයේ නැතිවී ගිය සියල්ල නැවත ආපසු ගොඩනගාදී, ඔවුන් පුහුණුකර, පොලඹවා, සන්නද්ධකර ජාත්‍යන්තර ආත්මික අස්වැන්නක පංගුකාරත්වය උදෙසා මේ ලෝකයේ සිටින "මාරා" කාන්තාවන් වෙත ළඟාවීමට "නයෝමි ජාලය" අරමුණු කර තිබේ.

**ජාලය . . .**

"ජාලය" යන වචනයෙන් අපගේ මූලික සංවිධාන සැලැස්ම පිළිබිඹු කරයි. අප සුවිශේෂී පරමාර්ථයක් උදෙසා බොහෝ සංස්කෘතීන්ගෙන්, ජාතීන්ගෙන් සහ නිකායයන්ගෙන් එකට එකතුකර කැපවීමකට කැඳවූ කාන්තාවෝ වෙමු.

### අපගේ පරමාර්ථය

සාර්ථක කිතුනු ජීවිතයේ පදනම භක්තිය. කැපවීම, හික්මවීම සහ නිර්දේශනය යන මූලධර්මයන් මත පදනම් වන බව අපි විශ්වාසකරමු. මෙම සංවිධානයේ පරමාර්ථය මේ ආකාරවූ ජාත්‍යන්තර කාන්තාවන්ගේ ජාලයක් ගොඩනැඟීමය.

**භක්තිකවූ :** දෙවියන්වහන්සේ වචනය පුද්ගලිකව තේරුම් ගැනීමටත් ප්‍රායෝගිකව අදාළ කරගැනීමටත් සහ එය ඵලදායි ලෙස සන්නිවේදනය කිරීම පිණිස භක්තිමත් අය වීම.

**ස්වාමිනි, සදාකාලේටම ඔබගේ වචනය ස්වර්ගයෙහි පිහිටා තිබේ. (ගීතාවලිය 119:89)**

දෙවියන්වහන්සේ වචනය තුළ උන්වහන්සේගේ එළිදරව්වීම ගෙනෙන්නේ මනුෂ්‍යයන්, මූලධර්මයන්, අනාගතවාක්‍යයන්ගෙන් හා පොරොන්දුවලින් වේ. අවබෝධකරගැනීම සහ ප්‍රායෝගික අදාළකිරීම තුළින් දේව වචනයට භක්තිවන්තවීම රෝම 12:1-2 විස්තරකරන ආකාරයට කැපවීමට, හික්මවීමට සහ නිර්දේශික ජීවිතයකට මගපෙන්වීම සිදුවේ.

**දෙවියන්වහන්සේගේ ක්‍රමවලට කැපවූ :** ශුද්ධාත්මයෙන් පූර්ණව, ක්‍රිස්තුස්වහන්සේගේ ස්වභාවයට පරිවර්තනය වන පිණිස දේව වචනයට කැපවීම.

**එබැවින්, සහෝදරයෙනි, නුඹලාගේ ශරීරයන් ජීවමානවූ, ශුද්ධවූ, දෙවියන්වහන්සේ විසින් පිළිගත හැකිවූ යාගයක් කොට ඔප්පුකරන හැටියට දෙවියන්වහන්සේගේ දයාවන් නිසා නුඹලාගෙන් ඉල්ලමි. එය නුඹලාගේ ආත්මික සේවය වේ. (රෝම 12:1)**

**දෙවියන්වහන්සේගේ සැලැස්ම තුළ හික්මවීමට පත්වීම :** තම ජීවිතයේ සෑම අංශයකම මෙන්ම සේවයේත් දේව සැලැස්මේ දිව්‍යමය පරමාර්ථය හා අරමුණු උදෙසා හික්මවීමට පත්වීම. එය ලෝක සම්ප්‍රදායන්ට අනුකූල වීමෙන් නොව, දෙවියන්වහන්සේගේ දිව්‍යමය සැලැස්මට අනුකූලවීමෙන් සිදුවීම.

**නුඹලා මේ ලෝකයේ ආකාරයට සමාන නොවී, දෙවියන්වහන්සේගේ කැමැත්ත එනම් යහපත්වූ පිළිගත යුතුවූ සම්පූර්ණවූ දෙය කුමක්ද කියා දැනගන්නා පිණිස, (රෝම 12:2අ)**

**දෙවියන්වහන්සේගේ කැමැත්තට නිර්දේශ වීම :** අපේ ලෝකයේ ආත්මික අස්වැන්න කෙත්වල සේවය කිරීම පිණිස දේව කැමැත්තට අනුව පුහුණුවී සහ ක්‍රියාකාරී වූ කම්කරුවන් ලෙස සිටීම.

**දෙවියන්වහන්සේගේ කැමැත්ත එනම් යහපත්වූ පිළිගත යුතුවූ සම්පූර්ණවූ දෙය කුමක්ද කියා දැනගන්නා පිණිස, සිත අලුත්කරගැනීමෙන් අන්‍යාකාර ඇත්තෝ වෙන්න. (රෝම 12:2 ආ)**

## අපගේ ස්ථාවරය

සැබෑ ඇදහිලිවතුන් ලෙස අපව එක්සත් කරන, නිදසුන් ලෙස දේවානුභාවය සහ බයිබලීය සත්‍යතාවයන් වැනි මහත්වූ ප්‍රධානවූ බයිබලීය දේවධර්මයන් ඇත (ගීතාවලිය 119:89). මහා අණදාවේ අභියෝගය නම්වූ (මතෙව් 28:19-20) එක් ප්‍රධාන පරමාර්ථයක් උදෙසා කැපවීමක් අපට තිබේ. මූලික දේවධර්මයන් උදෙසා කැපවූ නායෝම් ජාලයට අයත් සාමාජිකයන් ද සමග දෙවියන්වහන්සේ සඳහා බලවත් ආත්මික බලවේගයන් ඇතිවේ.

මෙම ජාලගතවීමේ සබඳතාවයන් තුළ නිකායයන් අතර තරගයකට ඉඩදීමක් සිදුනොවේ. ඒ වෙනුවට, සෑම කාන්තාවක්ම තරඟකාරී නොවූ ඇදහිලිවන්ත සමාජයක් ලෙස පරමාර්ථයෙන්ද ආත්මයෙන්ද එක්සත්කරනු ලබයි.

**ඉතින්, සහෝදරයෙනි, නුඹලා සියල්ලන් විසින් එකම දේ කථාකරන හැටියටද, නුඹලා අතරෙහි භේද නැතුව එක සිතින් හා එක කල්පනාවෙන් එකඟව සම්පූර්ණව සිටින හැටියටද අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් නුඹලාගෙන් ඉල්ලමි. (1 කොරින්ති 1:10)**

**දෙවියන්වහන්සේ අඩුකම් ඇති කොටසට වඩා නම්බු දී, ශරීරය සංයෝජනය කළ සේක. (1 කොරින්ති 12:25)**

## සංවිධානාත්මක සැලැස්ම

"නයෝමි ජාලය" එහි ජාත්‍යන්තර මූලස්ථානය ඇමරිකා එක්සත් ජනපදයේ පිහිටුවා ඇති හාවස්ට්ටයිම් ජාත්‍යන්තර ජාලයේ අනුබද්ධ සේවාවක් වේ. පහත දැක්වෙන සංවිධානාත්මක මගපෙන්වීම යටතේ අනුබද්ධිත ශාඛාවන් නයෝමි ජාලය තුළ ස්වාධීනව ක්‍රියාත්මක වෙයි.

**නයෝමි ජාල ශාඛාවක අධ්‍යක්ෂවරිය පහත සුදුසුකම් ඇති අයෙක් විය යුතුය.**

- නව උත්පත්තිය ලැබූ ආත්මයෙන් පූර්ණ අයෙක්වීම
- නයෝමි ජාලයේ ස්ථාවරයට හා සංවිධානාත්මක පරමාර්ථය උදෙසා කැපවූ අයෙක්වීම
- ශාඛාවේ ක්‍රියාකාරීත්වයන් පිළිබඳව වාර්ෂික වාර්තාවක් මූලස්ථානයට සැපයීම

**අනෙකුත් ප්‍රාදේශීය ශාඛාවන්හි නිලධාරීන් :** මේ සඳහා සහකාර අධ්‍යක්ෂක, ලේකම්, භාණ්ඩාගාරික සහ විවිධ බාහිර සේවාවන්ගේ නායකයන් ඇතුළත් වේ.

**ශාඛාවන් හාවස්ට්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ පුහුණු විෂය මාලාව තම වැඩසටහන් වල යොදාගත යුතුය.** ඔවුන්ගේ සෑම රැස්වීමකදීම මෙම විෂය කරුණු භාවිත කළ යුතුයයි අදහස් නොකෙරේ. ශුද්ධාත්මයාණන්ගේ මගපෙන්වීම අනුව ප්‍රධාන ආරාධිත දේශකයාගේ දේශනය සහ අනිකුත් වැඩසටහන් අතර සමබරතාවය පවත්වාගැනීම කළ හැකිය. නයෝමි ජාලයේ පරමාර්ථය භක්තිමත්වූ කැපවීමෙන් යුක්ත හික්මවීම හා නිර්දේශයන් ඇති කාන්තාවන් ගොඩනැගීම බැවින් එල්ලයන් සාර්ථක කරගැනීම පිණිස සංවිධානාත්මක අධ්‍යයන සැලැස්මක් අත්‍යවශ්‍ය වේ. එවැනි සැලසුමක් හාවස්ට්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ විෂය කරුණු තුළින් සපයනු ඇත.

**ශාඛාවන් තම සාමාජිකයන්ට ප්‍රාදේශකව මෙන්ම ජාත්‍යන්තරවද සේවයන් සඳහා අවස්ථාවන් සැපයීම කළ යුතුවේ:-**
නයෝමි ජාලය තවත් කිතුනු කාන්තා සහභාගිකමක් හෝ ඒකාකාර බයිබල් අධ්‍යයනයක් නොවේ. අපගේ විශේෂිත පරමාර්ථය පුහුණුව ක්‍රියාකාරීව සහභාගිවන අපගේ ලෝකයේ ආත්මීක අස්වැන්න කෙත්වල සේවය කිරීම පිණිස කාන්තාවන් දේව කැමැත්තට යොමු කරවීමය.

**රැස්වීම් ජාත්‍යන්තර ශුභාරංචි සේවය කෙරෙහි අවධානය යොමු කළ යුතුවේ.**

- විශේෂිත ජාතීන් උදෙසා යාච්ඤා කළ යුතු අතර, සාමාජිකත්වයේ අවධානය ලෝකයේ අස්වැන්න සහිත කෙත්වලට අවශ්‍ය වැඩකරුවන්ගේ අවශ්‍යතාවය ගැන යෙදවිය යුතුවේ.

- තම ශාඛාව, නියුක්තව සිටින විවිධ ප්‍රාදේශීය සහ ජාත්‍යන්තර සේවාවන් පිළිබඳව වාර්තා සැපයීම කළ යුතුය.

- රැස්වීමේදී ආරාධිත දේශකයෙක්, චිත්‍රපටියක් හෝ හාවස්ට්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ විෂය කරුණු පාඩම් ලෙස මොනම දෙයක් තිබුනත් නයෝමි ජාලයේ ප්‍රකාශිත පරමාර්ථය උදෙසා එය කැපවිය යුතුවේ.

**ප්‍රාදේශීය ශාඛාවක් තරුණ කාන්තාවන්ට මගපෙන්වන වැඩිහිටි කාන්තාවන්ගේ ශුද්ධ ලියවිලි පුහුණුවක් සඳහා අවස්ථාව සලසා දිය යුතුය:** මෙම ජාල සබඳතාවය තීතස් 2:3-5 දක්වා සඳහන් කර ඇති අරමුණු සම්පූර්ණ කළ යුතුය.

**ජාලයීය සබඳතාවයන් දිරිමත් කළ යුතුය:** සැලසුම්කරන ලද රැස්වීම්වලදී ඔබගේ සාමාජිකයන් අතර ජාලයීය සබඳතාවය දිරිගන්වන්න. මෙයට, සේවය, යාච්ඤාව, අධ්‍යයනය සහ පුද්ගලික හා ඉතා සමීප පදනමක සහභාගිකම සඳහා අවස්ථාවන් ඇතුළත් වේ.

## පහළොස්වන පරිච්ඡේදය

# බයිබලයේ සඳහන් සියලු කාන්තාවෝ

**අරමුණු :**

මෙම පාඩම සම්පූර්ණ කළ පසු පහත සඳහන් දේ කිරිමට ඔබට හැකියාව ලැබෙනු ඇත. "*කාන්තාව පිළිබඳ බයිබලිය දැක්ම* " පිළිබඳ ඔබගේ පුද්ගලික අධ්‍යයනය දිගටම කිරිමට.

**ප්‍රධාන පදය**

> **ඒ සියල්ල, ආදර්ශයක් වශයෙන් ඔවුන්ට සිද්ධ වුණේය. ඒවා ලියා තිබෙන්නේ කාලවල කෙළවරට පැමිණ සිටින්නාවූ අපට අවවාද පිණිසය. (1 කොරින්ති 10:11)**

### හැඳින්වීම

මෙම පාඩමාලාව තුළ මැව්මේ ආරම්භයේ සිට සභායුගය දක්වා කාන්තාවන්ගේ භූමිකාව පිළිබඳව අධ්‍යයනය කර තිබේ. මෙහි ප්‍රධාන අවධානය වුයේ කාන්තාවන්ගේ චරිත කථාවන් අධ්‍යයනය නොව ඔවුන්ගේ බයිබලිය භූමිකාවය. එයට හේතුව වුයේ ක්‍රිස්තු ශරීරයේ ඔබගේ ස්ථානය සොයා දැනගැනීමට උපකාර කිරීම විය.

බයිබලිය කාන්තාවන්ගේ චරිත කථාවන් අධ්‍යයනය කිරිමෙන් කාන්තාවන් ලෙස ඔබගේ භූමිකාව පිළිබඳව බොහෝ දේ ඉගෙන ගැනීමට ඇත. බයිබලිය කාන්තාවන් ගැන ඔබගේ පුද්ගලික අධ්‍යයනය පහසුවන පිණිස මෙම පරිච්ඡේදයේ බයිබලයේ එන සෑම කාන්තාවකගේ නම සහ සඳහන සපයා දී ඇත. කාන්තාවන්ගේ ජීවිත පිළිබඳ චරිත කථාවන් අධ්‍යයනය කිරීම තුළින් ඔබගේ අධ්‍යයනය දිගටම කරගෙන යාමට ඔබ දිරිමත් කරමු.

### චරිත කථාවන් අධ්‍යයනය

චරිත කථාවන් යනු කෙනෙකුගේ ජීවිතය පිළිබඳ කථාන්දරයකි. චරිත කථාවන් බයිබල් අධ්‍යයන ක්‍රමය බයිබලිය පුද්ගලයන්ගේ ජිවිතය කෙරෙහි අවධාරණය යොමු කරයි. බයිබලිය චරිතයන්ගේ ජීවිත අධ්‍යයනය තුළින් ඔවුන්ගේ ජීවිත අත්දැකීම්වලින් ඔබට ඉගෙන ගැනීමට හැකියාව ලබාදෙයි. බයිබලය මෙසේ ප්‍රකාශ කර ඇත.

> **ඒ සියල්ල, ආදර්ශයක් වශයෙන් ඔවුන්ට සිද්ධ වුණේය. ඒවා ලියා තිබෙන්නේ කාලවල කෙළවරට පැමිණ සිටින්නාවූ අපට අවවාද පිණිසය. (1 කොරින්ති 10:11)**

බයිබලය පුද්ගලයන්ගේ ජිවිතවල සිදුවූ දේ ශුද්ධාත්මයාණන්ගේ ආනුභාවයෙන් ඔබේ ප්‍රයෝජනය සඳහා වාර්තා කර තිබේ. ඔවුන්ගේ අත්දැකීම්වලින් ඔබට බලවත් ආත්මික පාඩම් ඉගැන්විය හැකිය. ඔවුන්ගේ වැරදීම් නිරීක්ෂණයෙන් ඔබට ආත්මික වැරදිවලින් බේරීමට ඉගෙන ගත හැකිය. එමෙන්ම ඔවුන්ගේ සාර්ථකත්වයන් නිරීක්ෂණයෙන් ඔබගේ ජිවිතයේ ශුභවාදී ආත්මික ගුණයන් ඔබට වර්ධනය කරගත හැකිවේ.

චරිත කථාවන් අධ්‍යයනයක් කරන්නේ කෙසේද යන්න මෙහි දැක්වේ :

### ප්‍රථම පියවර : අධ්‍යයනය කිරීමට අවශ්‍ය කාන්තාව තෝරාගන්න.

ඔබට විශේෂිත ආශාවක් තිබෙන කාන්තාවක් තෝරාගැනීමට පුළුවන. හෙබ්‍රෙව් 11 පරිච්ඡේදය, ගලාති 3:7 හෝ ලූක් 4:27 හි එන ලයිස්තුවලින් ඔබට තෝරාගැනීමට හැකිය.

## දෙවන පියවර : කරුණු රැස්කරගන්න.

මෙම කාන්තාව පිළිබඳව බයිබලයේ එන සියලුම විස්තර සොයාගන්න. බයිබල් අධ්‍යයනය පොත් ඔබට සොයාගැනීමට හැකිනම්, ඔබ අධ්‍යයනය කරන තැනැත්තිය පිළිබඳව කරුණු සොයගැනීමට ඒවා භාවිත කරන්න. නිදසුනක් ලෙස, ඔබට බයිබල් අකාරාදියක් තිබේනම් එහි එම කාන්තාවගේ නම සොයාගෙන ඇය ගැන බයිබලයේ ඇති සඳහන් ලයිස්තුවක් ලබාගන්න.

ඔබට අකාරාදියක් සොයාගැනීමට නැත්නම් කෙළින්ම ඇය ගැන ඇති සඳහන්කිරීම් බයිබලයෙන්ම එකතු කරගන්න. තෝරාගත් බයිබල් චරිතයක් පිළිබඳ තොරතුරු බොහෝවිට එක පොතක් තුළ හෝ ඊළඟ පොත් පෙළක් තුළ සොයාගත හැකිවේ. මේ පරිච්ඡේදයේ එන, වැඩිපුර අධ්‍යයනය සඳහා යන කොටසේ සඳහන් ලයිස්තුව ද භාවිත කළ හැකිය. ඔබ අධ්‍යයනය කරන කාන්තාව ගැන බයිබලයේ ඇති සියලුම විස්තර සඳහන් ස්ථාන ලයිස්තුවක් සාදා ඉන්පසු සෑම ඡේදයක්ම කියවමින් අධ්‍යයනය කරන්න.

## තෙවන පියවර : විස්තර විශ්ලේෂණය කරන්න.

චරිත කථාවන් අධ්‍යයන ක්‍රමයේ දී ඔබ විසින් අධ්‍යයනය කළ යුතු ඇතැම් කරුණු පිළිබඳ හඳුනාගැනීමක් ඔබට පහත ලයිස්තුවෙන් කරගත හැකිවේ. මෙම අයිතමයන් සියල්ල ගැනම කරුණු සෑම චරිත කථාවක් අධ්‍යයනයනය පිළිබඳව බයිබලයේ සොයාගත නොහැකිවුවත් ඔබ අධ්‍යයනය කරන කාන්තාව පිළිබඳව අඩංගු සෑම දෙයක්ම ඇතුළත් කිරීමට උත්සාහ කරන්න.

මෙම පරිච්ඡේදයේ සපයා ඇති පෝරමය ඔබ එකතු කරන විස්තර වාර්තා කිරීමටත් විශ්ලේෂණය කිරීමටත් භාවිත කරන්න. ලබාගැනීමට ඇති චරිත කථාවන් අධ්‍යයන ක්‍රමයේ කරුණුවලට මේ දේවල් ඇතුළත් වේ.

- නම සහ නමේ අර්ථය
- නෑදෑයන් : දෙමව්පියන්, සහෝදරයන්, සහෝදරියන් මුතුන්මිත්තන් සහ දරුවන්
- උත්පත්තිය : ස්ථානය, උත්පත්තියේ වැදගත්කම, උත්පත්තිය වටා ඇති අසාමාන්‍ය සිදුවීම්
- ළමා කාලය හා මුල් ළමා පුහුණු කාලය
- භූගෝලීය පිහිටීම : මේ කාන්තාවගේ ජීවිතයට අදාළ කථාන්තරය සිදුවූයේ කොහේද?
- මිත්‍රයන් සහ ඇසුරු කළ අය : පුද්ගලික සම්බන්ධතාවයන්
- රැකියාව හෝ වෘත්තිය :
    - මේ කාන්තාව දැරුවේ කුමන ස්ථානයක්ද හෝ තනතුරක්ද? ඇය තම යැපීම උපයාගත්තේ කෙසේද?
- ශරීර ස්වභාවය විස්තර කිරීම
- ශුභවාදී චරිත ලක්ෂණ
- අශුභවාදී චරිත ලක්ෂණ
- වැදගත් සිද්ධීන් :
    - දෙවියන්වහන්සේ ප්‍රථමයෙන්ම හමුවීම
    - හැරීම
- සේවයට කැඳවීම
- කාන්තාවගේ ජීවිතයේ ප්‍රබලම අර්බුදය හෝ හැරීමේ ස්ථානය
    - නිදසුනක් ලෙස, රූත් නයෝමි අනුව යාමට තෝරාගත් අවස්ථාව
- මරණය : කවදාද? කොහේදීද? අසාමාන්‍ය සිදුවීම්

## සිව්වන පියවර : ඔබ උගත් දේ අදාළ කරන්න.

ඔබ අධ්‍යයනය කරන ලද කාන්තාවගේ ජීවිතයෙන් ඔබේ පුද්ගලික ජීවිතයට අදාළ කරගන්න. නිදසුනක් ලෙස, ඇයගේ ශුභවාදී චරිත ලක්ෂණ මොනවාද? ඒවා ඔබගේ ජීවිතය තුළ වර්ධනය කරගැනීමට උපකාර කරන ලෙස දෙවියන්වහන්සේගෙන් ඉල්ලන්න. ඇයගේ ජීවිතයේ අශුභවාදී චරිත ලක්ෂණ මොනවාද? මේවායෙන් කුමක් හෝ ඔබගේම ජීවිතයේ ඔබ දකින්නේද? ඒවායෙන් ජයගැනීමට දෙවියන්වහන්සේගේ උපකාරය ඉල්ලන්න.

මේ කාන්තාව පිළිබඳව ඔබ විසින් ඉගෙන ගන්නා ලද ප්‍රබලම සත්‍යතාවය සාරාංශ කෙරෙන වාක්‍යයක් නිර්මාණය කරන්න. නිදසුනක් ලෙස, ඒවගේ ජීවිතය පිළිබඳ මෙවැනි ප්‍රකාශනයක් විය හැකියි. "අකීකරුකමට නිතරම දඬුවමක් තිබේ".

## අවසාන අභියෝගයක්

මෙම අවසාන අභියෝගය සමග "කාන්තාව පිළිබඳ බයිබලීය දැක්ම" නම් අධ්‍යයනය ඔබ අවසන් කරයි. උන්වහන්සේගේ වචනයේ ඔබ ගැන දෙවියන්වහන්සේ පවසන්නේ කුමක්ද යන්න දැනගැනීම ඔබට ප්‍රීතියක් යයි බලාපොරොත්තු වෙමු. අපගේ යාච්ඤාව නම් මෙම අධ්‍යයනයෙන් ඔබ ලබාගත් දැනුම භාවිතකර ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයේ ඔබගේ විශේෂිත සේවා ස්ථානයට ඔබ පිවිසෙන පිණිසය. එමෙන්ම ඔබ ඉගෙන ගත් දේ තමන්ගේ ජීවිතවල ක්‍රිස්තුස්වහන්සේ තුළ අනන්‍යතාවය සොයන අන් කාන්තාවන්ට සන්නිවේදනය කරන පිණිස මෙම අත්පොත භාවිත කිරීම අපගේ අපේක්ෂාවය.

දැන්, පහත දැක්වෙන පෝරමය සහ සඳහන් කිරීම් "වැඩිදුර අධ්‍යයනය සඳහා" යන කොටස තුළ සඳහන් විස්තර සමග අධ්‍යයනය දිගටම කරගෙන යන්න.

## චරිත කථාවන් අධ්‍යයන ක්‍රමය පිළිබඳ බයිබල් අධ්‍යයනය

**ප්‍රථම පියවර : අධ්‍යයනය කිරීම සඳහා පුද්ගලයා තෝරාගන්න.**

**දෙවන පියවර : කරුණු රැස්කරගන්න.**

මෙම තැනැත්තියගේ ජීවිතය පිළිබඳව කරුණු සඳහන් බයිබල් පද ලයිස්තුගත කරන්න.

**තෙවන පියවර : කරුණු විශ්ලේෂණය කරන්න.**

නම සහ නමෙහි අර්ථය:

නෑදෑයන් : දෙමව්පියන්, සහෝදරයන් සහ සහෝදරියන්, මුතුන් මිත්තන් හා දරුවන් :

උත්පත්තිය : ස්ථානය, උත්පත්තියේ වැදගත්කම, උත්පත්තියට අදාළ අසාමාන්‍ය සිදුවීම්:

ළමා කාලය සහ මුල් පුහුණුව :

භූගෝලීය පිහිටීම :

මිතුරන් සහ සහකරුවන්, පුද්ගලික සබඳතාවයන් :

රැකියාව හෝ වෘත්තිය:

ශාරීරික විස්තරය :

ශුභවාදී චරිත ලක්ෂණ :

අශුභවාදී චරිත ලක්ෂණ :

විශේෂිත සිදුවීම් :

ප්‍රථමයෙනි දෙවියන්වහන්සේ මුණගැසීම :

හැරීම :

සේවයට කැඳවීම :

ප්‍රබලම අර්බුදය හෝ හැරීමේ ස්ථානය :

මරණය :

**සිව්වන පියවර : ඔබ ඉගෙන ගත් දේ අදාළ කර ගන්න.**

ඔබ වර්ධනය කරගත හැකි ශුභවාදී චරිත ලක්ෂණ:

මා විසින් වැළකිය යුතු අශුභවාදී චරිත ලක්ෂණ:

මෙම චරිත අධ්‍යයනයෙන් මා ඉගෙනගත් ප්‍රබලම සත්‍යතාවය නම් :

# වැඩිදුර අධ්‍යයනය සඳහා

## බයිබලයේ සඳහන් සියලුම කාන්තාවන්

**එකම නමකින් කාන්තාවන් එක් අයෙකුට වඩා සිටින අවස්ථාවලදී මිරියම් 1, මිරියම් 2 ආදී වශයෙන් අංක යෙදීමෙන් වෙනස දැක්විය හැකිය.**

අබී (අබියා) - 2 රාජාවලිය 18:2, 1 ලේකම් 2:24

අබිගායිල් 1 - 1 සාමුවෙල් 25:3-42, 27:3, 30:5, 2 සාමුවෙල් 2:2, 2:3, 1 ලේකම් 3:1

අබිගායිල් 2 - 2 සාමුවෙල් 17:25, 1 ලේකම් 2:16, 17

අබිහයිල් 1 - 1 ලේකම් 2:29

අබිහයිල් 2 - 2 ලේකම් 11:28

අබිෂග් - 1 රාජාවලිය 1:3, 15, 2:17, 21, 22

අබිටල් - 2 සාමුවෙල් 3:4, 1 ලේකම් 3:3

අක්සා - යොෂුවා 15:16, 17, විනිශ්චයකාරයා 1:12, 1 ලේකම් 2:49

ආදා 1 - උත්පත්ති 4:19, 20, 23

ආදා 2 - උත්පත්ති 36:2

අහිනොවම් 1 - 1 සාමුවෙල් 14:50

අහිනොවම් 2 - 1 සාමුවෙල් 25:43, 27:3, 30:5, 2 සාමුවෙල් 2:2, 3:2, 1 ලේකම් 3:1

ඔහොලා - එසෙකියෙල් 23:4,5, 36, 44

ඔහොලිබා - උත්පත්ති 36:2, 5, 14, 18, 25

ආනා - ලූක් 2:36-38

අනා - උත්පත්ති 36:2

අපියා - පිලෙමොන් 1:2

ආසෙනත් - උත්පත්ති 41:45, 50, 46:20

අටාරා - 1 ලේකම් 2:26

අතලියා - 2 රාජාවලිය 8:26, 11:1-3, 13-20, 2 ලේකම් 22:2, 10-12, 23:12, 13, 21, 24:7

අසුබා 1 - 1 ලේකම් 2:18, 19

අසුබා 2 - 1 රාජාවලිය 22:42, 2 ලේකම් 20:31

බයරා - 1 ලේකම් 8:8

බසෙමත් 1 - උත්පත්ති 26:34

බසෙමත් 2 - උත්පත්ති 36:3

බාසෙමත් 3 - 1 රාජාවලිය 4:15

බැත්-ෂෙබා - 2 සාමුවෙල් 11:3, 12:24, 1 රාජාවලිය 1:11, 15. 16, 28, 31, 2:13, 18, 19,

බැත්-ෂුවා - 1 ලේකම් 3:5

බර්නිකි - ක්‍රියා 25:13, 23, 26:30

බිල්හා - උත්පත්ති 29:29, 30:3-7, 35:22, 25, 46:25, 1 ලේකම් 7:13

බිතියා - 1 ලේකම් 4:17

ක්ලොයි - 1 කොරින්ති 1:11

කලෞදියා - 2 තිමෝති 4:21

කොස්බී - ගණන්කථාව 25:15, 17

දමරිස් - ක්‍රියා 17:34

දෙබොරා 1 - උත්පත්ති 35:8

දෙබොරා 2 - විනිශ්චයකාරයා 4:4, 5, 9, 10, 14, 5:1, 7, 12, 15

දෙලීලා - විනිශ්චයකාරයා 16:4, 6, 10, 12, 13, 18

දීනා - උත්පත්ති 30:21, 34:1, 3, 5, 13, 25, 26, 46:15

දොර්කස් (තබීතා) - ක්‍රියා 9:36, 39

දෘසිල්ලා - ක්‍රියා 24:24

එග්ලා - 2 සාමුවෙල් 3:5, 1 ලේකම් 3:3

එලිසබෙත් - ලූක් 1:5, 7, 13, 24, 36, 40, 41, 57

එලිෂෙබා - නික්මයාම 6:23

ඒපා - 1 ලේකම් 2:45

එප්‍රාතා - 1 ලේකම් 2:50, 4:4

එප්‍රාත් - 1 ලේකම් 2:19

එස්තර් - එස්තර් පොත

එවුනිකී - 2 තිමෝති 1:5

එවෝදියා - පිලිප්පි 4:2

ඒව - උත්පත්ති 3:20, 4:1, 2 කොරින්ති 11:3, 1 තිමෝති 2:13

ගොමෙර් - හොෂියා 1:3

හදස්සා (එස්තර්) - එස්තර් පොත

හාගර් - උත්පත්ති 16:1, 3, 4, 8, 15, 16, 21:9, 14, 17, 25:12, ගලාති 4:24, 25

හග්ගීත් - 2 සාමුවෙල් 3:4, 1 රාජාවලිය 1:5, 1 රාජාවලිය 2:13, 1 ලේකම් 3:2

හම්මොලෙකෙත් - 1 ලේකම් 7:18

හමුතල් - 2 රාජාවලිය 23:31, 24:18, යෙරෙමියා 52:1

හන්නා - 1 සාමුවෙල් 1:2-22, 2:1, 21

හග්ශෙලෙල්පොනි - 1 ලේකම් 4:3

හෙලෙයා - 1 ලේකම් 4:5, 7

හෙප්ශිබා - 2 රාජාවලිය 21:1

හෙරොදියස් - මතෙව් 14:3, 6, මාක් 6:17, 19, 22, ලූක් 3:19

හොඩෙෂ් - 1 ලේකම් 8:9

හෝදියා - 1 ලේකම් 4:19

හොග්ලා - ගණන්කථාව 26:23, 27, 1, 36:11, යොෂුවා 17:13

හුල්දා - 2 රාජාවලිය 22:14, 2 ලේකම් 34:22

හුෂීම් - 1 ලේකම් 8:8, 11

ඊකාබොද්ගේ මව - 1 සාමුවෙල් 4:19-22

මිල්කා - උත්පත්ති 11:29

යායෙල් - විනිශ්චයකාරයා 4:17, 18, 21, 22, 5:6; 24;

යෙකොලියා - 2 රාජාවලිය 15:2, 2 ලේකම් 26:3

යෙදීදා - 2 රාජාවලිය 22:1

යෙහෝයද්දීන් - 2 රාජාවලිය 14:2, 2 ලේකම් 25:1

යෙහෝෂෙබා - 2 රාජාවලිය 11:2

යෙමිමා - යෝබ් 42:14
යෙප්තාගේ දියණිය - විනිශ්චයකාරයා 11:34, 35, 40
යෙරියොත් - 1 ලේකම් 2:18
යෙරුෂා - 2 රාජාවලිය 15:33, 2 ලේකම් 27:2
යෙසබෙල් 1 - 1 රාජාවලිය 16:31, 18:4, 13, 19; 19:12; 21:5-25; 2 රාජාවලිය 9:7. 10, 22, 30,36, 37
යෙසබෙල් 2 - එළිදරව් 2:20
යොවන්නා - ලූක් 8:3; 24:10
යෙබෙබෙද් - නික්මයාම 6:20; ගණන්කථාව 26:59
යුදා - යෙරමියා 3:7, 8, 10
ජුඩිත් - උත්පත්ති 26:34
ජුලියා - රෝම 16:15
කොරෙන්-හප්පුක් - යෝබ් 42:14
කෙතුරා - උත්පත්ති 25:1, 4, 1 ලේකම් 1:32, 33
කේශියා - යෝබ් 42:14
ලෙයා - උත්පත්ති 29:16-32; 30:9-20; 31:4,14,33; 33:1,2,7; 34:1; 35:23,26; 46:15, 18; 49:31;
රූත් 4:11
ලොයිස් - 2 තිමෝති 1:5
ලෝ-රුහාමා - හොෂියා 1:6, 8
ලොත්ගේ භාර්යාව - උත්පත්ති 19:26, ලූක් 17:32
ලිදියා - ක්‍රියා 16:14, 20
මයකා 1 - 2 සාමුවෙල් 3:3, 1 ලේකම් 3:2
මයකා 2 - 1 රාජාවලිය 15:2, 2 ලේකම් 11:20-22
මයකා 3 - 1 රාජාවලිය 15:10, 13; 2 ලේකම් 15:16
මයකා 4 - 1 ලේකම් 2:48
මයකා 5 - 1 ලේකම් 7:15, 16
මයකා 6 - 1 ලේකම් 8:29; 9:35
මාලා 1 - 1 ලේකම් 7:18
මාලා 2- ගණන්කථාව 26:33; 27:1; 36:11, යෝෂුවා 17:3
මහලත් 1 - උත්පත්ති 28:9
මහලත් 2 - 2 ලේකම් 11:8
මානෝවාගේ භාර්යාව - විනිශ්චයකාරයා 13:2-23
මාරා - රූත් 1:20
මාර්තා - ලූක් 10:38, 40, 41; යොහන් 11:1, 5, 9, 20, 24, 30, 39
මරියා, යේසුස්වහන්සේගේ මව - මතෙව් 1:16, 18, 20; 2:11; 13:55; මාක් 6:3; ලූක් 1:27-56; 2:5,16,19,34;
ක්‍රියා 1:14
මරියා, මග්දලාහි (2) - මතෙව් 27:56, 61; 28:1; මාක් 15:40, 47; 16:1, 9; ලූක් 8:2;
යොහන් 19:25; 20:1, 11, 16, 18
මරියා, බෙතානියේ (3) - මාක් 14:3-9; ලූක් 10:39, 42; යොහන් 11:1-45; 12:3
මරියා 4 - මතෙව් 27:56, 61; 28:1; මාක් 15:40, 47; 16:1; ලූක් 24:10; යොහන් 19:25
මරියා 5 - ක්‍රියා 12:12
මරියා 6 - රෝම 16:6

මත්රෙද් - උත්පත්ති 36:39; 1 ලේකම් 1:50

මෙහෙතාබල් - උත්පත්ති 36:39; 1 ලේකම් 1:50

මෙෂුල්ලෙමෙත් - 2 රාජාවලිය 21:19

මීකායා - 2 ලේකම් 13:2

මීකල් - 1 සාමුවෙල් 14:49; 2 සාමුවෙල් 3:13, 14; 6:16, 20, 21, 23; 1 ලේකම් 15:29

මිල්කා 1 - උත්පත්ති 11:29; 22:20, 23, 24; 15:24, 47

මිල්කා 2 - ගණන්කථාව 26:33; 27:1; 36:11; යොෂුවා 17:3

මිරියම් 1 - නික්මයාම 15:20, 21, ගණන්කථාව 12:1, 4, 5, 10, 15; 20:1, ද්විතියකථාව 24:9,
1 ලේකම් 6:3, මීකා 6:4

මිරියම් 2 - 1 ලේකම් 4:17

නාමා - උත්පත්ති 4:22

නායමා - 1 රාජාවලිය 14:21, 31. 2 ලේකම් 12:13

නයරා - 1 ලේකම් 4:5,6

නයෝමි - රූත්පොත

නෙහුෂ්තා - 2 රාජාවලිය 24:8

නොවාදියා - නෙහෙමියා 6:14

නෝවා - ගණන්කථාව 26:33; 27:1; 36:11; යොෂුවා 17:3

ඔර්පා - රූත් 1:4, 14

පෙනින්නා - 1 සාමුවෙල් 1:2,4

පර්සිස් - රෝම 16:12

ඵානුයෙල් - ලූක් 2:36

ජේබ් - රෝම 6:1, 2

පිලාත්ගේ භාර්යාව - මතෙව් 27:19

පොතිපර්ගේ භාර්යාව - උත්පත්ති 39:7, 8, 9, 12, 19

ප්‍රිස්කිලා - ක්‍රියා 18:2, 18. 26; රෝම 16:3; 1 කොරින්ති 16:19; 2 තිමෝති 4:19

පුවා - නික්මයාම 1:15

ෂෙබාහි රැජිණ - 1 රාජාවලිය 10:1, 4, 10, 13; 2 ලේකම් 9:1, 3, 9, 12; මතෙව් 12:42; ලූක් 11:31

රාකෙල් - උත්පත්ති 29:16-31; 30:1-25; 31:4-34; 33:1, 2, 7; 35:16-25; 46:19-25; රූත් 4:11;
1 සාමුවෙල් 10:2; යෙරෙමියා 31:15; මතෙව් 2:18

රාහබ් 1 - යොෂුවා 2:1, 3, 6; 17:23, 25; හෙබ්‍රෙව් 11:31; යාකොබ් 2:25

රාහබ් 2 - මතෙව් 1:5

රෙබෙකා - උත්පත්ති 22:23; 24:25; 26; 27; 28; 29:12; 35:8; 49:31; රෝම 9:10

රෙයුමා - උත්පත්ති 22:24

රොදා - ක්‍රියා 12:13

රිශ්පා - 2 සාමුවෙල 21:8, 10, 11

රූත් - රූත් පොත

සලෝමි - මතෙව් 20:20; 27:56; මාක් 16:1-8

සමාරිතානු ස්ත්‍රිය - යොහන් 4:7-42

සප්පිරා - ක්‍රියා 5:1

සාරා 1 - උත්පත්ති 11:12; 16-18; 20; 21; 23-25; 49:31; යෙසායා 51:2; රෝම 4:19; 9:9; හෙබ්‍රෙව් 11:11;
1 පේතෘස් 3:6

සාරා 2 - උත්පත්ති 46:17, නෙහෙමියා 26:45; 1 ලේකම් 7:30
ෂෙලොමිත් 1 - ලෙවිකථාව 24:11
ෂෙලොමිත් 2 - 1 ලේකම් 3:19
ෂෙලොමිත් 3 - 2 ලේකම් 11:2
ෂේරා - 1 ලේකම් 7:24
ෂිමෙත් - 2 රාජාවලිය 12:21, 2 ලේකම් 24:25
ෂිම්රිත් - 2 ලේකම් 24:26
ෂිප්රා - නික්මයාම 1:15
ෂෝමර් - 2 රාජාවලිය 12:21, 2 ලේකම් 24:25
ෂුනෙම්මිය - 2 රාජාවලිය 4:8-37, 8:1-6
සුසානා - ලූක් 8:3
සින්තකි - පිලිප්පි 4:2
සිරෝපිනිසියානු කාන්තාව - මතෙව් 15:21-28, මාක් 7:24-30,
තබීතා (දොර්කස්) - ක්‍රියා 9:36-39
තපෙනිස් - 1 රාජාවලිය 11:19, 20
තාමාර් 1 - උත්පත්ති 38:6, 11, 13, 24; රූත් 4:12; 1 ලේකම් 2:4
තාමාර් 2 - 2 සාමුවෙල් 13:1-32; 1 ලේකම් 3:9
තාමාර් 3 - 2 සාමුවෙල් 14:27
තාමාර් 4 - මතෙව් 1:3
තාපාත් - 1 රාජාවලිය 4:11
තිම්නා - උත්පත්ති 36:12
තිර්සා - ගණන්කථාව 26:33; 27:1; 36:11; යොෂුවා 17:3
තෘපේනා - රෝම 16:12
තෘපෝසා - රෝම 16:12
වෂ්ති - එස්තර් 1:9, 11, 2:15-17, 19; 2:1,4,17
ගුණවත් ස්ත්‍රිය - හිතෝපදේශ 31:10-31
ශාරපෙත්හි වැන්දඹුව - 1 රාජාවලිය 17:8-24; ලූක් 4:25, 26
එන්දෝර්හි කාන්තාව - 1 සාමුවෙල් 28:7-25
තේබේෂ් ජාතික කාන්තාව - විනිශ්චයකාරයා 9:53
සෙබුදා - 2 රාජාවලිය 23:36
සෙරෙෂ් - එස්තර් 5:10, 14; 6:13
සෙරුයා - 1 රාජාවලිය 11:26
සෙරුයියා - 1 සාමුවෙල් 26:6; 2 සාමුවෙල් 2:13, 18; 3:39; 8:16; 14:1; 16:9-23;
1 රාජාවලිය 1:7; 2:5, 22; 1 ලේකම් 2:16; 11:6, 39; 18:12, 15; 26:28; 27:24
සිබියා - 2 රාජාවලිය 12:1, 2 ලේකම් 24:1
ශිල්ලා - උත්පත්ති 4:19,22,23
ශිල්පා - උත්පත්ති 29:24; 30:9,10;35:26;37:2;46:18
ශිප්පොරා - නික්මයාම 2:21 ;4:25;18:2

# ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු

## පළමුවන පරිච්ඡේදය :

1. ප්‍රධාන උපුටා ගැනීම් නම් උත්පත්ති 2:18 සහ 21-24. ඔබ උත්පත්ති 1:27ද භාවිත කර තිබිය හැකිය.

2. නගර සහ ප්‍රජාවන් සංවිධානය කිරීම. උත්පත්ති 1:28

3. ශාරීරික පමණක් නොව ආත්මිකද වූ සම්බන්ධතාවයකි.

4.

| **සම්බන්ධතාවය** | **උපුටා ගැනීම** |
|---|---|
| ප්‍රේමය | එපීස 5:25-26 |
| සහකාරීත්වය | උත්පත්ති 2:18 |
| උපකාර කරන්නා | උත්පත්ති 2:18 |
| කැපවීම | උත්පත්ති 2:24 |

5. දෙවියන්වහන්සේ තම ජනතාව උදෙසා උපකාර කරන තැනැත්තා මෙන් විය යුතුය.

6. "දෙවියන්වහන්සේ තමන් ස්වරූපයෙන් මනුෂ්‍යයා මැවූ සේක. දෙවියන්වහන්සේගේ ස්වරූපයෙන් ඔහු මැවූ සේක. පුරුෂයාද ස්ත්‍රියද කොට ඔවුන් මැවූ සේක." (උත්පත්ති 1:27)

## දෙවන පරිච්ඡේදය :

1. (උත්පත්ති 3:15)

2. මම තා සහ ස්ත්‍රිය අතරෙහිද තාගේ වංශය සහ ඇගේ වංශය අතරෙහිද සතුරුකම තබන්නෙමි. ඒ වංශය තාගේ හිස පොඩි කරන්නෙහිය. තෝ ඔහුගේ විලුඹ පොඩි කරන්නෙහියයි කී සේක. (උත්පත්ති 3:15)

3. අ. සත්‍යය  ආ. අසත්‍යය  ඇ. අසත්‍යය  ඈ.සත්‍යය.  ඉ. සත්‍යය.

4.

| | |
|---|---|
| අ. පු. ස්. උත්පත්ති 3:3 | ඈ. සා උත්පත්ති 3:15 |
| ආ. පු. ස්. උත්පත්ති 3:7 | ඉ. පු. උත්පත්ති 3:17 |
| ඇ. පු. ස්. උත්පත්ති 3:10 | ඊ. ස්. උත්පත්ති 3:16 |

## තුන්වන පරිච්ඡේදය :

1. රූපශ්‍රීය රැවටිලි සහිතය. ශෝභනකම නිෂ්ඵලය. ප්‍රශංසාව ලැබෙන්නේ ස්වාමීන්වහන්සේ කෙරෙහි භය ඇති ස්ත්‍රියටය. (හිතෝපදේශ 31:30)

2. හිතෝපදේශය යනු "බොහෝ වචන රාශියක් වෙනුවට කෙටි ප්‍රකාශනයකි."

3. අන්‍ය ස්ත්‍රිය යනු දෙවියන්වහන්සේගෙන් තොරවූ, ශුද්ධ නොවූ, අධර්මිෂ්ඨ කාන්තාවය.

4. ගුණවන්ත ස්ත්‍රිය යනු දෙවියන්වහන්සේගේ, ශුද්ධ වූ, ධර්මිෂ්ඨ කාන්තාවය.

5. ඔබට මෙම ප්‍රශ්න කිසිවක් අතපසු වූවා නම් නැවත වතාවක් තුන්වන පරිච්ඡේදයෙහිදී පුනරීක්ෂණය කරන්න.

i. අ
ii. අ
iii. අ
iv. අ
v. ශු
vi. අ
vii. අ
viii. ශු
ix. අ
x. අ
xi. අ
xii. ශු
xiii. ශු
xiv. අ
xv. අ
xvi. ශු
xvii. ශු
xviii. ශු

## හතරවන පරිච්ඡේදය :

1. 3, 1, 2, 6, 5, 4

2. ඔබගේ ලැයිස්තුව හතරවන පරිච්ඡේදයෙහි සපයා දී ඇති පරමාර්ථ ලැයිස්තුව සමඟ සංසන්දනය කර බලන්න.

3. රූත් පොතෙහි සිදුවීම් විනිශ්චයකාරවරුන්ගේ යුගයෙහිදී සිදුවිය.

4. මෝවබ් සහ බෙත්ලෙහෙම

5. කතෘ නොදනී.

6. රූත් කියන්නී: නුඹ අත්හැර හැරී යන ලෙස මට පෙරැත්ත නොකරන්න. මක්නිසාද නුඹ යන තැනට මමත් යමි, නුඹ නවතින තැන මමත් නවතිමි. නුඹේ සෙනඟ මාගේ සෙනඟ වන්නේය, නුඹේ දෙවියන්වහන්සේ මාගේ දෙවියන්වහන්සේ වන සේක. නුඹ නසින තැන මමත් නැසී, එතැනම තැන්පත් කරනු ලබන්නෙමි. මරණය මිස වෙන කිසිවක් නුඹත් මාත් වෙන් කළොත්, ස්වාමීන්වහන්සේ එසේද ඊට වැඩියෙන්ද මට කරන සේකවයි කීවාය.
(රූත්ගේ කථාව 1:16-17)

7. අ. සත්‍යය ආ. අසත්‍යය. ඇ. අසත්‍යය. ඈ. අසත්‍යය. ඉ. අසත්‍යය. ඊ. සත්‍යය.

## පස්වන පරිච්ඡේදය :

1. එස්තර් 1:14

2. පස්වෙනි පරිච්ඡේදයෙහි සඳහන් පරමාර්ථ ලැයිස්තුව කියවා බලා ඔබගේ පිළිතුරු සෝදිසි කරන්න.

3. 4, 1, 2, 3.

4. කතෘ නොදනියි.

5. ස්ථානය නම් ෂුෂන් මාළිගාවය.

## හයවන පරිච්ඡේදය :

1. ඔබ දෙවි පියාණන්ගේ කැමැත්ත ඉටු කරනවාද නැතිද යන වගය.

2. මක්නිසාද ස්වර්ගයෙහි සිටින මාගේ පියාණන්වහන්සේගේ කැමැත්ත කරන කවුරු නුමුත් මාගේ සහෝදරයාත් සහෝදරීත් මෑණියොත්යයි කීසේක. (මතෙව් 12:50)

3. 3, 7, 1, 6, 5, 4, 2

## හත්වන පරිච්ඡේදය :

1. යේසුස්වහන්සේ කළ වෙනත් බොහෝ දේවල්ද ඇත්තේය. ඒවා එකින් එක ලියනලද්දේ නම් ලියනු ලබන පොත් දරන්ට ලෝකයත් මදියයි සිතමි. යොහාන් 21:25

2. නැතිවූ කාසිය ලූක් 15:8-10
   දිගටම කන්නලව් කළ ස්ත්‍රිය ලූක් 18:1-8
   කන්‍යාවන් දසදෙනා මතෙව් 25:1-13
   මුහුන් සතුවූ කාන්තාව මතෙව් 13:33

3. පේත්‍රුස්ගේ නැන්දම්මා මතෙව් 8:1-15
   මහ ලේ රෝගී ස්ත්‍රිය මතෙව් 9:20-22
   කානානිය ස්ත්‍රියගේ දුව මතෙව් 15:21-28
   කුදු ස්ත්‍රිය ලූක් 13:11-13
   යායිරස්ගේ දියණිය මතෙව් 9:18-19
   නායින්හි වැන්දඹුවගේ පුත්‍රයා ලූක් 7:11-15
   මාර්තා සහ මරියාගේ සොහොයුරා යොහන් 11:1-44

## අටවන පරිච්ඡේදය :

1. එසේය, ඒ දවස්වලදී මාගේ දාසදාසීන් කෙරෙහි මාගේ ආත්මය වගුරුවන්නෙමි. ඔව්හු අනාගතවාක්‍ය කියන්නෝය. (ක්‍රියා 2:18)

2. මෙම පරිච්ඡේදයෙහි අනු-මාතෘකා කියවා බලන්න. මෙම මාතෘකාවන්හි ක්‍රියා පොතෙහි ඇතුලත් කාන්තාවන් නිරත වූ සේවාවන් පෙන්වාදෙයි. ඔබගේ පිළිතුර ඒ අනුව සසඳා බලන්න.

3. අ. අසත්‍යය. ආ. අසත්‍යය. ඇ. අසත්‍යය. ඈ. අසත්‍යය.

## නමවන පරිච්ඡේදය :

1. එබැවින් විසුරුවනු ලැබූ ඔව්හු ගිය ගිය ස්ථානවල වචනය දේශනා කළෝය. (ක්‍රියා 8:4)

2. 2, 4, 5, 3, 1

## දහවන පරිච්ඡේදය

1. නුඹලා සියල්ලන් ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ එක්කෙනෙක්ව සිටින නිසා, යුදෙව්වෙක් හෝ ග්‍රීකයෙක් නැත්තේය, දාසයෙක් හෝ නිර්දාසයෙක් නැත්තේය, පුරුෂයෙක් හා ස්ත්‍රියක් නැත්තාහ. (ගලාති 3:28)

2. අ. සත්‍යය. ආ. අසත්‍යය. ඇ. අසත්‍යය. ඈ. සත්‍යය. ඉ. සත්‍යය. ඊ. අසත්‍යය. උ. අසත්‍යය. ඌ. සත්‍යය.

## එකොළොස්වන පරිච්ඡේදය :

1. ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි භය ඇතුව එකිනෙකාට යටත්වෙන්න. (එපීස 5:21)

2. ඔබගේ අවධානය වෙනතකට නොගොස් ස්වාමීන්වහන්සේට මෙහෙ කිරීමට හැකිවන පිණිස.

3. අ. අසත්‍යය. ආ. සත්‍යය. ඇ. අසත්‍යය. ඈ. සත්‍යය ඉ. සත්‍යය. ඊ. අසත්‍යය. උ. සත්‍යය. ඌ. අසත්‍යය.

4. කාන්තාව තම ඇඳුමින් විනීත විය යුතු අතර බාහිර අලංකාරයට වඩා ආත්මික සංවර්ධනය අවධාරණය කළ යුතුය.

## දොළොස්වන පරිච්ඡේදය :

1. එසේ දුන්නේ ඇදහිමේද දෙවියන්වහන්සේගේ පුත්‍රයා දැනගැනීමේද එකමුතුකමටත්, සම්පූර්ණ පුරුෂකමටත්, ක්‍රිස්තුස්වහන්සේගේ සම්පූර්ණ වූ උස මහතේ ප්‍රමාණයටත් අප සියල්ලන් පැමිණෙන තෙක් ශුද්ධවන්තයන්ගේ සම්පූර්ණ වීම සඳහා සේවය කිරීමේ වැඩය පිණිසත් ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයේ වර්ධනය වීම පිණිසත්ය. (එපීස 4:12)

2. එපීස 4:12
   ශුද්ධවන්තයන් සම්පූර්ණ කිරීම
   සේවයේ වැඩය සඳහා
   ක්‍රිස්තු ශරීරයේ වර්ධනය

3. අප :
   ඇදහිල්ලෙනක් එකමුතුවෙමු
   ක්‍රිස්තුස්වහන්සේ ගැන අපගේ දැනගැනීම වර්ධනය කරමු
   ක්‍රිස්තුස්වහන්සේ අපගේ ආදර්ශය කොට සම්පූර්ණත්වයට වර්ධනය වෙමු
   වැරදි දේවධර්මයන්ට නොරැවටී ස්ථාවරව සිටිමු
   ක්‍රිස්තුස්වහන්සේ තුළ ආත්මිකව පරිණත වෙමු

   එපීස 4:12-15 බලන්න

## දහතුන්වන පරිච්ඡේදය :

1. දහතුන්වන පරිච්ඡේදයේ අනු මාතෘකා කියවන්න. මෙම විශිෂ්ටතාවයන් ඔබට ලයිස්තුගත කළ හැකිය.

2. ස්වාමින්වහන්සේ වචනයේ බලය දෙන සේක : පණිවුඩය දරන සහ එය ප්‍රචාරය කරන කාන්තාවෝ බලවත් සේනාවක් වෙති (ගීතාවලිය 68:11)

3. අ. සත්‍යය ආ. සත්‍යය ඇ. අසත්‍යය ඈ. අසත්‍යය ඉ. අසත්‍යය

## දාහතර වන පරිච්ඡේදය :

1. මිරියම්

2. ජනයාට ජීවත්වීමට පරමාර්ථයන් ඇතිව සිටින්නාක්මෙන් කණ්ඩායමේ පැවැත්මට පරමාර්ථයක් අවශ්‍යය. පරමාර්ථය මෙම ප්‍රශ්නවලට පිළිතුරු සපයයි. අප පවතින්නේ ඇයි? අපට ඉටුකිරීමට ඇත්තේ කුමක්ද?

3. එක : යාච්ඤා කිරීම

   දෙක : සංවිධානය කිරීම පිණිස උපකාර කිරීමට කාන්තා කණ්ඩායමක් කැඳවන්න.
   තුන : කණ්ඩායමේ පරමාර්ථය ස්ථාපනය කරන්න
   හතර : සංවිධාන සැලසුම් පිළියෙල කරන්න.
   පහ : ප්‍රථම රැස්වීමේ දිනය, වේලාව සහ ස්ථානය තීරණය කරන්න.
   හය : රැස්වීම ප්‍රචාරය කරන්න

හත : ප්‍රථම රැස්වීමට පැමිණි සියලු දෙනාටම කථා කරන්න.

4. එවිට ආරොන්ගේ සහෝදරිවූ මිරියාම් ප්‍රොපේත දූ තොමෝ රබානක් අතින් ගත්තිය. සියලු ස්ත්‍රීහු රබන්ද නැටුම්ද ඇතුව ඈ පස්සේ ගියෝය. මිරියාම් ඔවුන්ට උත්තරදෙමින් : ස්වාමින්වහන්සේට ගායනා කරව්, මක්නිසාද උන්වහන්සේ තේජාන්විත ලෙස ජයගත් සේක. උන්වහන්සේ අශ්වයා සහ අසරුවා මුහුදට හෙළූසේකැයි කීවාය. (නික්මයාම 15:20-21)

## පහළොස්වන පරිච්ඡේදය :

ස්වයං පරීක්ෂණය මෙම පරිච්ඡේදයේ නැත.